199 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 199 - இல. 11
**Volume 199 - No. 11**

2011 ජූනි 21 වන අඟහරුවාදා
2011 யூன் 21, செவ்வாய்க்கிழமை
**Tuesday, 21st June, 2011**



# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

තොරතුරු ලබා ගැනීමේ නිදහස පනත් කෙටුම්පත: [ගරු කරු ජයසූරිය මහතා] - නිෂ්ප්‍රභ විය

මඩහපොල ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා] - පළමුවන වර කියවන ලදී

ශ්‍රී ලංකා මනෝවිද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) - [ගරු තිලංග සුමතිපාල මහතා] - පළමුවන වර කියවන ලදී

**විසර්ජන පනත:**

යෝජනා

**කල් තැබීමේ යෝජනාව:**

විමධ්‍යගත අරමුදල් වැඩි කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி உறுப்பினர் சட்டமூலங்கள்**

தகவல் சுதந்திரம் சட்டமூலம் – [மாண்புமிகு கரு ஜயசூரிய]– நிராகரிக்கப்பட்டது

மடஹபொல ஸ்ரீ ரத்னபாலராம விகாரையின் பௌத்த கல்வி அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு நெரன்ஜன் விக்கிரமசிங்க] – முதன்முறை மதிப்பிடப்பட்டது

இலங்கை உளவியல் கழகம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு திலங்க சுமதிபால]– முதன்முறை மதிப்பிடப்பட்டது

**ஒதுக்கீட்டுச் சட்டம்:**

தீர்மானங்கள்

**ஒத்திவைப்புப் பிரேரணை:**

பன்முகப்படுத்தப்பட்ட நிதியினை அதிகரித்தல்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

PRIVATE MEMBERS' BILLS:

Freedom of Information – [The Hon. Karu Jayasuriya] – Negatived.

Madahapola Sri Ratnapalarama Religious and Buddhist Educational Development Foundation (Incorporation) – [The Hon. Neranjan Wickremasinghe] – Read the First time

Sri Lanka Psychological Association (Incorporation) – [The Hon. Thilanga Sumathipala] – Read the First time

APPROPRIATION ACT:

Resolutions

ADJOURMENT MOTION:

Increase of Decentralized Funds

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2011 ජුනි 21 වන අඟහරුවාදා***
*2011 யூன் 21, செவ்வாய்க்கிழமை*
*Tuesday, 21st June, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி. ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p. m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, 2009 වර්ෂය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජල සම්පාදන හා ජලාපවහන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

(81 වැනි අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 63 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එම ආඥාපනතේ 6 සහ 10 වැනි වගන්ති යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නියෝග. - [අධිකරණ අමාත්‍ය ගරු රවුෆ් හකීම් මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2010 වර්ෂය සඳහා ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රගති වාර්තාව. - [ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍ය ගරු වාසුදේව නානායක්කාර මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු පී. දයාරත්න මහතා (ආහාර සුරක්ෂිතතාවය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. தயாரத்ன - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. P. Dayaratna - Minister of Food Security)

ගරු කථානායකතුමනි, මම අම්පාර, රජගලතැන්න, නුගේලන්ද, අංක 36/36 දරන ස්ථානයේ පදිංචි එන්. ඩබ්ලිව්. එස්. ඩබ්ලිව්. පාලිත ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில், வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

Mr. Speaker, I present a petition received from Mrs. N. Patritia of No. 106, Thirunavakulam, Vavuniya.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ටී.බී. ඒකනායක මහතා මහතා - පැමිණ නැත.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා - පැමිණ නැත.

**ගරු ජගත් බාලසූරිය මහතා (ජාතික උරුමයන් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜகத் பாலசூரிய - தேசிய மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. Jagath Balasuriya - Minister of National Heritage)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) බෙලිගල, කටුකුරුන්ද හි පදිංචි ඒ.ආර්. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ශ්‍රාවස්තිපුර, 4 ඇළ, නාච්චදූව පාර හි පදිංචි ඩබ්ලිව්. පද්මසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා - පැමිණ නැත.

**ගරු දුමින්ද දිසානායක මහතා (යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க - இளைஞர் அலுவல்கள், திறன் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Duminda Dissanayake - Deputy Minister of Youth Affairs and Skills Development)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) උඩුගම්පොල, දොරනාගොඩ, අංක 112 /සී. දරන ස්ථානයෙහි පදිංචි එම්.බී. රත්බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) අනුරාධපුර, ශ්‍රාවස්තිපුර, ඉහළවැව, අංක 05/ඒ. දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ. ගුණතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

[ගරු දුමින්ද දිසානායක මහතා]

(3) කුරුණෑගල, මීගමු පාර, තාබ්ෲ මාවත, අංක 21 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එස්. මහානාම මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු වීරකුමාර දිසානායක මහතා - පැමිණ නැත.

ගරු අනුර දිසානායක මහතා - පැමිණ නැත.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු කථානායකතුමනි, මම කොට්ටුකච්චිය, කිවුල, අංක 195 දරන ස්ථානයෙහි පදිංචි එල්.එස්.එම්. ජුසේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

ගරු කථානායකතුමනි, මම මාතලේ, මහවෙල, දෙල්ගොල්ල, අංක 25 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්. බන්දුල හේරත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனி)
(The Hon.Victor Antony)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) නල්ලදරන්කට්ටුව, අත්තන්ගනය හි පදිංචි ඩැනියල් ගුණසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) අළුත්වැවයාය, නැ/කරවිටාගාර හි පදිංචි ඒ.පී. දයාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) නවගත්තේගම, කැලේවැව, 41 බී. ගම්මානය, අංක 102 දරන ස්ථානයේ පදිංචි ආර්.එම්. සුදර්ශනී රත්නායක මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)

ගරු කථානායකතුමනි, මම කළගෙඩිහේන, හල්ගම්පිටිය, වෙස්ටර්න් පාර්ක්, අංක 83 දරන ස්ථානයේ පදිංචි ටී.ඩී.පී.කේ. වීරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ගාල්ල, ඕල්කොට් මාවත, අංක 2015/18 දරන ස්ථානයේ පදිංචි ලීලානි දිල්රුක්ෂි ජාගොඩගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අහංගම, මැළියගොඩ, හික්ගහවත්ත හි පදිංචි ශාන්ත කුමරප්පෙරුම මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 1-0040/'10-(4), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාස දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කරුණාකරලා මීට වැඩිය අවධානය යොමු කරලා අපට මේ උත්තරය ලබා දෙන්න කියන්න ගරු කථානායකතුමනි. ගිය වතාවේ මේ ප්‍රශ්නය ඉදිරිපත් කළාම අපට කිව්වා සුමාන දෙකකින් උත්තර ලබා දෙනවා කියලා. මේ තොරතුරු ලබා ගන්න අපහසුතාවක් තිබෙනවාද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු කථානායකතුමනි, රජයට -රටට- අවුරුදු දහයකට වැඩි කාලයක් තිස්සේ ලැබුණු හැම ආධාරයක් සහ ණයක් පිළිබඳ සහ ආපසු ගෙවීම් පිළිබඳ සියලුම දත්ත තමයි මේ ඉල්ලන්නේ. ඒවා නිවැරැදිව සහ සවිස්තරාත්මකව ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙන නිසායි කාලය ඉල්ලන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ඒ ලැබෙන පිළිතුර තුළින් දැනුවත් කරන්නේ මේ රටේ අය වැයක් හදන්න බැරි තත්ත්වයක් තිබෙන බවයි. අවුරුදු 10ක හොයා ගන්න බැරි නම් අය වැයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ කොහොමද? [බාධා කිරීම්] මේ ප්‍රශ්නය අහන්නේ හතරවැනි වතාවට.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කල් නොගෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයුවොත් වඩා හොඳයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අදක්ෂතාවක් තිබෙනවාද, නැත්නම් ලේකම්වරුන්ගේ ප්‍රශ්නයක් තිබෙනවාද දන්නේ නැහැ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 2-0330/'10-(3), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Deputy Minister of Ports and Highways)
ගරු කථානායකතුමනි, මම හිතන්නේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය දෙවැනි වතාවට අහන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තුන්වැනි වතාවට.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
තුන්වැනි වතාවට. ගරු කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම ඒක තමයි කිව්වේ- [බාධා කිරීමක්]

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, මේ ගැන පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නය හතරවැනි වතාවටයි ඇහුවේ. මම අහන්නේ තුන්වැනි වතාවටයි. මේ ආණ්ඩුවට වෙන වැඩක් නැද්ද? මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න මෙච්චර කාලයක් ගන්නේ ඇයි? [බාධා කිරීමක්]

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තුන්වැනි වතාව කියන්නේ ගරු කථානායකතුමනි, මාස ගණනක් ගිහින් තිබෙනවා. [බාධා කිරීමක්] ඒ ගොල්ලන්ට ඕනෑ ඒවා හදිසියේ කරනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි,-[බාධා කිරීමක්] මේ පිළිබඳව පැහැදිලි කිරීමකට ඔබතුමාගෙන් අවසර ඉල්ලනවා. මෙතුමා ඉල්ලන්නේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේලාත් පොඩ්ඩක් කල්පනා කරන්න ඕනෑ. මේ ප්‍රශ්නයේ පළමුවැනි කොටසෙන්ම ඉල්ලන්නේ පසු ගිය වසර 20ක විස්තර. එක කාරණයක් සොයන්නම කාලයක් යනවා. අමාරුයි. [බාධා කිරීමක්]

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අවුරුද්දෙන් අවුරුද්දට අපේ අය වැයවලට මේවා ඉදිරිපත් කරනවා. ඒවා තුළින් තමයි ඇස්තමේන්තු හදන්නේ. මේවා නිකම් තිබෙන ඒවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මම හිතන්නේ මේ අමාත්‍යාංශවල ලේකම්වරුන්ටත් වග කීමක් තිබෙනවා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් අහන ප්‍රශ්නයකට හැකි තරම් ඉක්මනට පිළිතුරු සපයන්න.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවසරය පතනවා මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න. මෙතුමා ප්‍රශ්නය අහන්නේ පසු ගිය අවුරුදු 20ක කාලය තුළ මහාමාර්ග ඉදි කිරීම සඳහා වාර්ෂිකව පවරා ගත්ත ඉඩම්වලට ගෙවන වන්දි පිළිබඳ විස්තර වාර්තාවක්. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න මන්ත්‍රීතුමා. පොඩ්ඩක් හොඳට හැසිරෙන්න කෝ. [බාධා කිරීම්] මන්ත්‍රීතුමා, අහගෙන ඉන්න කෝ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ගරු ඇමතිතුමා උත්තරයක් දෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,-

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
අහ ගෙන ඉන්න කෝ මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්] නිකම් වාරයක් නැතිව ඔබතුමා- [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අවුරුදු 20ක තොරතුරු දෙපාර්තමේන්තුවක තියා ගන්නේ නැහැ. [බාධා කිරීම්] සොයන්න අමාරුයි. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි,-

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
පක්ෂය තුළ බෙදීම පක්ෂයේ තියා ගන්න. මේ උත්තරයට ඇහුම් කන් දෙන්න.

ගරු කථානායකතුමනි, 1990 ඉඳලා- [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා කියන්නේ අවුරුදු 20ක් අදාළ නැත්නම්, අවුරුදු 20කට-

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අවුරුදු 20ක් අදාළ නැත්නම් එතුමාට කියන්න පුළුවන්-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේත් සාධාරණව මේ ප්‍රශ්නය දිහා බලන්න. බලලා හිතන්න කිසි කෙනකුට මේ තොරතුරු ඉක්මනට ගන්න පුළුවන්ද කියලා. ඒකත් බලන්න ඕනෑ නේ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, 1990 ඉඳලා 2001 දක්වා ඉඩම් අත් පත් කර ගත්තේ ඉඩම් අමාත්‍යාංශය විසින්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අවුරුදු 20ක ඒවා ඉල්ලුවාට අවුරුදු පහකට විතරක් නම් හිඟය තිබෙන්නේ ඒ තොරතුරු දුන්නා නම් ඉවරයි නේ. අවුරුදු 20 ගැනම අපි අහන්නේ නැහැ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
උත්තරයක් තිබෙනවා ගරු මන්ත්‍රීතුමා. පොඩ්ඩක් ඉන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අවුරුදු 20 ගැනම අපි අහන්නේ නැහැ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
මන්ත්‍රීතුමා කලබල වෙන්න එපා. ඔබතුමාගේ කලබලය හන්දා නේ ඔය පැත්තේත් හැම තිස්සේම ගහ ගන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙපාර්තමේන්තුවකින් තොරතුරු රැස් කරන එක ලෙහෙසි පහසු වැඩක් නොවෙයි. ලංකාව පුරාම ඒවා ඕනෑ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට ගෞරවයෙන් මේ කියන්නේ. අපි අවුරුදු 20ක ඒවා ඉල්ලුවා. ආණ්ඩුවට අවුරුදු 20ක්ම ගෙවන්න නැත්නම්, අවුරුදු 20ක්ම ගෙවන්න නැහැ, පසු ගිය අවුරුදු දෙක තුනේ ඒවා තමයි ගෙවන්න තිබෙන්නේ කියලා කිව්වා නම්, ඒ තොරතුරු ටික දුන්නා නම් ඇති නේ. අවුරුදු 20 හින්දා හතරවැනි පාර, පස්වැනි පාර කියලා උත්තර දෙන එක කල් දමනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමා, මේක උසාවි ගිහිල්ලා විසඳා ගන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි ජාතික සංවිධායක ප්‍රශ්නයේදී වාගේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හැබැයි, මේ ප්‍රශ්නයේ හතරවැනි එකට නම් උත්තර දෙන්න පුළුවන්. අනෙක් ඒවාට උත්තර දෙන්න අමාරුයි.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, 1990 ඉඳලා 2001 දක්වා ඉඩම් අමාත්‍යාංශයෙන් තමයි අදාළ වන්දි ගෙවීමේ කටයුතු කරලා තිබෙන්නේ. ඉඩම් අමාත්‍යාංශය සහ මහාමාර්ග අමාත්‍යාංශය එකතු වෙලා ලංකාවේ තිබෙන සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් මේ තොරතුරු ලබා ගන්න මේ වන විට පියවර අර ගෙන තිබෙනවා. ඒ හින්දා මාස තුනකින් පස්සේ පැහැදිලිවම මේ පිළිබඳව උත්තරයක් දෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි ඉල්ලන්නේ අවුරුදු 20ක කාලය තුළ ඒවා. නමුත් ඔක්කෝම ගෙවන්න නැහැ නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විපක්ෂ නායකතුමාට පහර දෙන්නයි මේ හදන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වාර්ෂිකව පවරා ගත්තු ඉඩම් ගැන අහනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුන්සිය ගණනකින් ඒ තොරතුරු එක්කාසු කර ගන්නත් එපායැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම පිළිගන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විපක්ෂ නායකතුමාගේ ගනුදෙනු ගැන අහන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඉඩම් අමාත්‍යාංශයක් තිබෙන්නේ මේකට තමයි.

දැන් මේ හදිසියේ ප්‍රශ්නයක් අහනතුරු ඉන්නට ඕනෑ නැහැ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට කථා කරලා පවරා ගත් ඉඩම් ටික ගැන අහන්න. ඒ තොරතුරු අනිවාර්යයෙන්ම ඉඩම් අමාත්‍යාංශයේ තිබෙනවා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, අපි ඊළඟ ප්‍රශ්නයට යමු. මේක ගැන විවාද කරන්න දෙන්න බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධව ප්‍රශ්නයක් අහන්නද? මෙතැන ඉදිරිපත් කර තිබෙනවා, රජයේ ගිණුම්. මේ ගිණුම්වල - [බාධා කිරීමක්] අපි අහලා තිබෙන්නේ අනාගතය ගැන නොවෙයි. [බාධා කිරීමක්]

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, දයාසිරි ජයසේකර ගරු මන්ත්‍රීතුමාට අවශ්‍ය නම් එතුමාගේ කවුරු හරි කෙනෙක්- [බාධා කිරීමක්]ගැන තොරතුරු දැන ගන්න, ඒ පිළිබඳව ඉතා ඉක්මනින්ම තොරතුරු සොයලා කියන්න පුළුවන්. විපක්ෂ නායකතුමා ගැන වුණත් කමක් නැහැ. විපක්ෂ නායකතුමාට ගහන්න නේද හදන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හැබැයි, නිලධාරින් උනන්දු වනවා නම් මේක ප්‍රමාද වන්නේත් නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමා කරුණාකරලා මේ ගැන නිලධාරින්ට උපදෙස් දෙන්න.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඩිප්ලෝමාධාරී ගුරු සිසුන්: පත්වීම්
டிப்ளோமாதாரி ஆசிரிய மாணவர்கள்: நியமனம்
DIPLOMA HOLDER TEACHER TRAINEES : APPOINTMENTS

0800/'10

3. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) දැනට ක්‍රියාත්මක වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ දාහතකින් ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හා සීමාවාසික පුහුණුව සාර්ථකව නිම කළ, මෙතෙක් ගුරු පත්වීම් නොලැබූ ගුරු ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විශාල පිරිසක් සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 දෙසැම්බර් සිට මේ දක්වා ගුරු පත්වීම් නොලබා සිටින එම ඩිප්ලෝමාධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරු ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා පත්වීම් ලබා දීමේ ක්‍රමවේදයක් මේ වන විට සකසා තිබේද;

(iii) එසේ නම්, 2010 හා 2011 වර්ෂ තුළ පත්වීම් ලබා දෙනු ලබන ගුරු සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2010 හා 2011 වර්ෂවලදී එම පත්වීම් ලබා දෙන දින වකවානු කවරේද;

(v) එම පත්වීම් ලබා දීම සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(vi) එසේ නම්, 2010 හා 2011 වර්ෂ සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vii) එම ප්‍රතිපාදනයන් වෙන්කරන ලද වැය ශීර්ෂ හා ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) தற்போது இயங்கிவரும் தேசிய கல்வியற் கல்லூரிகள் பதினேழில் கல்வியில் டிப்ளோமா கற்கைநெறி மற்றும் உள்ளகப் பயிற்சியை வெற்றிகரமாக நிறைவுசெய்து, இதுவரை ஆசிரியர் நியமனம் பெறாத அனேகமான ஆசிரிய மாணவ/மாணவிகள் உள்ளனரென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) 2009ஆம் ஆண்டு டிசம்பரிலிருந்து இற்றை வரை, ஆசிரியர் நியமனம் பெறாதுள்ள குறித்த டிப்ளோமா தாரிகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்,

(ii) இந்த ஆசிரிய மாணவ/மாணவிகளுக்கு நியமனங் களை வழங்குவதற்கான செயல் முறையொன்று தற்போது ஏற்படுத்தப்பட்டுள்ளதாவென்பதையும்,

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iii) அவ்வாறாயின் 2010 மற்றும் 2011ஆம் ஆண்டு களில் நியமனங்கள் வழங்கவிருக்கும் ஆசிரிய மாணவர்களின் எண்ணிக்கை வெவ் வேறாக எவ்வளவென்பதையும்,

(iv) 2010 மற்றும் 2011ஆம் ஆண்டுகளில் குறித்த நியமனங்கள் வழங்கப்படும் திகதிகள் யாவை யென்பதையும்,

(v) குறித்த நியமனங்களை வழங்குவதற்காக தற்போது நிதி ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்,

(vi) அவ்வாறாயின் 2010 மற்றும் 2011ஆம் ஆண்டுக ளுக்கென ஒதுக்கப்பட்ட நிதியின் அளவு வெவ் வேறாக எவ்வளவென்பதையும்,

(vii) குறித்த நிதி ஒதுக்கப்பட்ட செலவினத்தலைப்பு மற்றும் செயல் முறை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that there are a large number of teacher trainees who have not been appointed as teachers so far though they have successfully completed the Teaching Diploma Course and internship at seventeen National Colleges of Education functioning at present ?

(b) Will he inform -

(i) the number of Diploma holders who have not been appointed as teachers, from December 2009 up to now ;

(ii) whether a methodology has been formulated to grant appointments to those teacher trainees;

(iii) if so, the number of teacher trainees to be granted appointments within the years 2010 and 2011separately ;

(iv) the dates by which appointments will be granted in 2010 and 2011;

(v) whether financial provisions have been made by now for granting those appointments ;

(vi) if so, the amounts allocated for 2010 and 2011 separately ;and

(vii) the head under which provisions have been made and the methodology adopted to do so?

(c) If not, why ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) මෙතෙක් පුහුණුව සාර්ථකව නිම කළ ශික්ෂණලාභීන් සියලු දෙනාට පත්වීම් ලබා දීමට අධ්‍යාපන

අමාත්‍යාංශය පියවර ගෙන ඇත.

(ආ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(vii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවලින් මේ වනකොට සමත් වෙලා තිබෙන ජාතික ශික්ෂණවේදී ඩිප්ලෝමාධාරින් සියලු දෙනාටම - සියයට 100කට- පත්වීම් දීලා අවසන් කියලා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට සහතික වන්න පුළුවන්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

සත්තකින්ම ගරු කථානායකතුමනි. සියලු දෙනාටම පත්වීම් දීලා අවසන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඒ පත්වීම් ලබා දීමේදී 2,500ක් පමණ වන අවසාන කණ්ඩායමෙන් 2,000ක්ම පත් කරලා තිබෙන්නේ ජාතික පාසල් 369කටයි. රටේ පළාත් සභා පාසල් 9,000කට වඩා තිබෙනවා. ඒ සියල්ලටම ලැබී තිබෙන්නේ 500කට අඩු ගුරු පිරිසක්. මේක සාධාරණයි කියා ගරු නියෝජ්‍ය ඇමතිතුමා හිතනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, ඒ සංඛ්‍යා ලේඛන සම්බන්ධයෙන් එතුමා වෙනම ප්‍රශ්නයක් අහන්න ඕනෑ. එහෙම වුණොත් උත්තර දෙන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මේක ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරින්ට අදාළ ප්‍රශ්නයක්. ඒකට වෙනම ප්‍රශ්නයක් ඇසිය යුතු නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

වෙන ප්‍රශ්නයක් නොවෙයි. නමුත් සංඛ්‍යා ලේඛන පිළිබඳ ප්‍රශ්නයක්. සංඛ්‍යා ලේඛන නිවැරදිව දෙන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මොකක්ද, ඒකේ තේරුම?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ඉතා වග කීමක් ඇතිවයි මා කියන්නේ. 2,500කට ආසන්න ගුරු සංඛ්‍යාවෙන් 2,000කට ආසන්න පිරිසකට පත්වීම් දීලා තිබෙන්නේ 369ක්වූ ජාතික පාසල්වලටයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගුරු පත්වීම් නොලැබූ සංඛ්‍යාවයි අහලා තිබෙන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, සංඛ්‍යා ලේඛන පිළිබඳව නිවැරදිව පිළිතුරු දිය යුතු නිසා තමයි ගරු මන්ත්‍රීතුමාට ඒ සම්බන්ධයෙන් වෙනම ප්‍රශ්නයක් අහන්න කිව්වේ. නමුත් ගරු කථානායකතුමනි, මධ්‍යම රජයේ -

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, සංඛ්‍යා ලේඛන පැත්තකින් තියමු. 2,500ක් පත් කරපු ගුරු පිරිසෙන් 2,000ක් පත් කරලා තිබෙන්නේ 369ක්වූ ජාතික පාසල්වලටයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමා කියන එක ඇහෙන්නේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අනික් අතුරු ප්‍රශ්නය මොකක්ද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒක අසාධාරණයි කියලායි මා කියන්නේ. 9,000ක් පමණ වන පළාත් සභා පාසල්වලට ගුරුවරුන් 500යි පත් කරලා තිබෙන්නේ. මේකේ සාධාරණත්වයක් තිබෙනවාද කියලායි මා අහන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා තේරුම් ගත යුතු කාරණාවක් තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙතෙක් ගුරු පත්වීම් නොලැබූ ගුරු ශිෂ්‍යා/ශිෂ්‍යාවන් විශාල පිරිසක් සිටින බව දන්නවාද කියලායි අහලා තිබෙන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඒ තේරුම් ගත යුතු කාරණාව මේකයි. පසු ගිය කාල වකවානුවේ මධ්‍යම රජයෙන් පාලනය වන ජාතික පාසල්වල විශාල ගුරු හිඟයක් තිබුණා. උදාහරණයක් වශයෙන් මහියංගනය පාසලේ ගුරුවරුන් 47 දෙනකුගේ හිඟයක් තිබුණා. එක පැත්තකින්, ඒ ජාතික පාසල් පද්ධතියේ ගුරු හිඟය අවසන් කිරීමට අවශ්‍ය වුණා. අනික් කාරණාව තමයි ගරු කථානායකතුමනි, පළාත් පාසල්වලට ගුරුවරුන් බඳවා ගැනීමට පළාත් සභාවලට බලය තිබීම. මා මහ ඇමති කාලයේ ගුරුවරුන් 5,644ක් බඳවා ගත්තා. ඩිප්ලෝමා, උපාධි ගුරුවරුන් බඳවා ගැනීමේ බලය තිබෙන්නේ පළාත් සභාවටයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය. එතුමා ඌව පළාත ගැන සංයුක්ත කරලායි කථා කළේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ, මම උදාහරණයකුයි කිව්වේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නමුත් රටේම ජාතික පාසල්වලට සාපේක්ෂව බැලුවත් වැඩි ප්‍රතිශතාත්මක ගුරු හිඟයක් තිබෙන්නේ පළාත් සභා පාසල්වලයි. එතුමාගේ කාලයේ එතුමා ඌව පළාතේ ඒ බඳවා ගැනීම් කරන්න ඇති. නමුත් දැන් ඒ සඳහා මොකක්ද ගන්න ක්‍රියා මාර්ගය මේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරින්-

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව ගුරුවරුන්ගේ අනුපාතය සංඛ්‍යා ලේඛන ඇතිව මට දෙන්න පුළුවන්, එතුමා වෙනම මේ ප්‍රශ්නය අහනවා නම්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මේකෙන් පෙන්වන්නේ ආපසු වතාවක් අර "කොළඹට කිරි - ගමට කැකිරි" කියන කාරණයයි. ඒක ඉතා පැහැදිලියි.

## කොළඹ වරායේ නව කන්ටේනර් පර්යන්තය: පිරිවැය
## கொழும்புத் துறைமுக புதிய கொள்கலன் இறங்குதுறை: செலவினம்
## NEW CONTAINER TERMINAL AT COLOMBO HARBOUR : COST

0926/'10

4. **ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) කොළඹ වරායේ නව කන්ටේනර් පර්යන්තය ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැය;

(ii) එම සම්පූර්ණ පිරිවැයෙන් දේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(iii) විදේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

(iv) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබෙන මාර්ග;

(v) සම්පූර්ණ පිරිවැයෙන් ණය වශයෙන් ලැබෙන ප්‍රමාණය;

(vi) ණය මුදල් ප්‍රදානය කරනු ලබන රටවල්, අදාළ පොලී ප්‍රමාණයන් සහ ණය පියවීමේ කාල සීමාවන්;

(vii) සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට ගතවන කාල සීමාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ශ්‍රමිකයන් බඳවා ගන්නා ක්‍රමය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு துறைமுகத்தின் புதிய கொள்கலன் இறங்குதுறையை நிர்மாணிக்கும் கருத்திட்டத்திற்கு மதிப்பீடு செய்யப்பட்ட மொத்த செலவினம் யாதென்பதையும்;

(ii) அந்த மொத்தச் செலவினத்தில் உள்நாட்டிலிருந்து பெறப்படும் தொகை யாதென்பதையும்;

(iii) வெளிநாடுகளிலிருந்து பெறப்படும் தொகை யாதென்பதையும்;

(iv) அந்தக் கருத்திட்டத்திற்கு நிதி கிடைக்கும் வழிகள் யாவையென்பதையும்;

(v) மொத்தச் செலவினத்தில் கடனாகக் கிடைக்கும் தொகை யாதென்பதையும்;

(vi) கடன் தொகைகளை வழங்கும் நாடுகள், குறிப்பிட்ட வட்டி வீதங்கள் மற்றும் கடனை அடைக்கும் கால எல்லைகள் யாவையென்பதையும்;

(vii) முழுமையான கருத்திட்டத்தையும் பூர்த்தி செய்ய எடுக்கும் காலம் யாதென்பதையும்

அவர் இச்சபையில் குறிப்பிடுவாரா?

(ஆ) இந்தக் கருத்திட்டத்தின் பணிகளுக்காக ஊழியர்களை ஆட்சேர்ப்புச் செய்யும் விதி முறை யாதென்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways :

(a) Will he inform this House -

(i) the total estimated cost for the project to construct the new container terminal at the Colombo Harbour;

(ii) out of this total cost, the amount to be met locally;

(iii) the amount to be met through foreign funds;

(iv) the sources of funding of the aforesaid project;

(v) out of the total cost, the amount being received as loans;

(vi) the names of countries granting loans, the relevant interest rates and the loan repayment periods; and

(vii) the timeframe for the completion of the entire project ?

(b) Will he state the method of recruiting workers for the activities of the aforesaid project ?

(c) If not, why ?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawela )

ගරු කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) අදියර 01 - දිය කඩනය ඉදි කිරීම (පොදු අරමුදල් යොදවා ඉදි කරනු ලැබේ)

අදියර 02 - බහලුම් පර්යන්තය ඉදිකිරීම

(පළමු බහලුම් පර්යන්තය BOT ක්‍රමය යටතේ පෞද්ගලික සමාගමක් විසින් ඉදි කිරීමට හා උපකරණ සැපයීමට නියමිතය. සෙසු බහලුම් පර්යන්තයන් දෙක ඉදිරි අනාගතයේදී ඉදි කිරීමට නියමිතය.)

| | දිය කඩනය | පළමු බහලුම් පර්යන්තය |
|---|---|---|
| (i) | ඇ.ඩො. මිලියන 333 (ආසන්න වශයෙන්) | ඇ.ඩො. මිලියන 500 |
| (ii) | ඇ.ඩො. මිලියන 46 | ඇ. ඩො. මිලියන 67.5 |
| (iii) | ඇ.ඩො. මිලියන 287 | ඇ. ඩො. මිලියන 432.5 |
| (iv) | විදේශීය අරමුදල් - ADB ණය | China Development Bank Corporation - |
| | දේශීය අරමුදල් - | ඇ.ඩො. මිලියන 350 |
| | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | China Merchant Holdings (International) Co. Ltd. ඇ.ඩො. මිලියන 82.5 |
| | | Aitken Spense PLC සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය - ඇ.ඩො. මිලියන 67.5 |
| (v) | ඇ. ඩො. මිලියන 287 | පෞද්ගලික සමාගම (Colombo International Container Terminals Ltd.) වෙත ලැබෙන ඇ. ඩො. මිලියන 350 |
| (vi) | රට - ADB | රට - චීනය |
| | පොලී ප්‍රමාණය - LIBOR + 0.6 per cent | පොලී ප්‍රමාණය - LIBOR + 3.6 per cent |
| | ණය පියවීමේ කාල සීමාව - අවු. 5 ක සහන කාලය ද ඇතුළත්ව අවු. 25 යි | ණය පියවීමේ කාල සීමාව - අවු. 5 ක සහන කාලය ද ඇතුළත්ව අවු. 14 යි |
| (vii) | 2012 අප්‍රේල් | 2016 ජුනි (බහලුම් පර්යන්තයේ පළමු 600m හි මෙහෙයවීම් කටයුතු 2013 දෙසැම්බර් මස ආරම්භ කිරීමට නියමිතය) |

(ආ) ඉදි කිරීම් කටයුතු විදේශීය පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමකට පවරා ඇත. දැනට දේශීය ශ්‍රමිකයන් 2000ක්පමණ කොන්ත්‍රාත් සමාගම සමඟ සේවයේ යෙදී ඇත. — ඉදි කිරීම් කටයුතු පෞද්ගලික සමාගම මගින් සිදු කිරීමට නියමිත අතර, දේශීය ශ්‍රමිකයන් සැලකිය යුතු ප්‍රමාණයක් ඉදි කිරීමේ කටයුතු හා මෙහෙයවීම් කටයුතු සඳහා යොදා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ඇ) පැන නොනඟී.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි. දැනට කොළඹ වරායේ නව කන්ටේනර් පර්යන්තය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ වැඩ කොච්චර ප්‍රමාණයකින් අවසන් කරලා තිබෙනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
භෞතික වශයෙන්ද ගරු මන්ත්‍රීතුමනි?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
වෙන මොනවාද? භෞතික වශයෙන් පෙනෙන්න-

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඒ කියන්නේ පෙනෙන්න තිබෙන ප්‍රමාණය.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඔව්. පෙනෙන්න තිබෙන ප්‍රමාණය.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
සාමාන්‍යයෙන් සියයට පනහකට වාගේ එහා පැත්තට ගිහිල්ලා තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
සියයට 50යි. ඉතුරු සියයට 50 කරන්න කොච්චර කාලයක් ගත වෙනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
සාමාන්‍යයෙන් අවුරුදු දෙකහමාරක් විතර.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේ දැන් කියන්නේ සාමාන්‍ය වශයෙන්. ගිවිසුම අනුව මේ වැඩේ නිම කරන්න කොච්චර කාලයක් ගත වෙනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන්නෙත් සාමාන්‍ය වශයෙන්. මේක ප්‍රායෝගිකව පොළොවේ පෙනෙන්න තිබෙන දෙයක්. ඒ නිසා මේ පිළිබඳව පැහැදිලි කර ගැනීමක් කර ගන්න අවශ්‍ය නම් ඔබතුමාට ආරාධනා කරනවා මේක බලන්න යමුය කියා. අපට ප්‍රවාහන පහසුකම් දෙන්න පුළුවන්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අර හම්බන්තොට වරායේ ගල කඩන්න ගියා වාගේ. ගරු කථානායකතුමනි,-

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඔබතුමන්ලාට පෙනුණේ නැති වුණාට හම්බන්තොට වරාය පිළිබඳව මේ රටේ සියලු ජනතාවගේ හෘදය සාක්ෂියේ ලියවිලා තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, මම ඇහුවේ බොහොම පැහැදිලි ප්‍රශ්නයක්.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලා මේ ප්‍රශ්න අහන්නේ හිතේ අමාරුවට, නැතුව වෙන එකකට නොවෙයි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු පිරිවැය-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
"මේ ගිවිසුම අනුව" කියලා නේ එතුමා අහන්නේ. ඉතා සරල ප්‍රශ්නයක් අහන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මේ ගිවිසුම අනුව.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ගිවිසුම අනුව කවදාද අවසන් වෙන්නේ කියලායි අහන්නේ. ඉතින් ඒක කියන්න අමාරුවක් නැහැ නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මාව ගෙන්වන්න ඕනෑත් නැහැ. වාහන දෙන්න ඕනෑත් නැහැ. යන්න ඕනෑත් නැහැ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
කොයි කොටස ගැනද ඔබතුමා අහන්නේ? දිය කඩනයේද, බහලුම් පර්යන්තයේද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කරුණාකරලා මට කියන්න ගිවිසුම අනුව කවදාද අවසන් වන්නේ කියලා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමනි, කොයි කොටසෙද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කොළඹ වරායේ නව කන්ටේනර් පර්යන්තය ඉදි කිරීමේ ව්‍යාපෘතිය ගැන මම අහලා තිබෙන්නේ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමනි, උත්තරයක් දුන්නා. දියකඩනය පිළිබඳව ද ඔබතුමා අහන්නේ? බහලුම් පර්යන්තය පිළිබඳව ද අහන්නේ? [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේලා එක එක කෑලි කඩ කඩා එක එක කොම්පැනිවලට දීලා තිබෙනවා, එක එක ණය යෝජනා ක්‍රම යටතේ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඔබතුමා අහන්නේ කොයි කොටස ගැනද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මේ ගැන ගිවිසුමක් තිබෙනවා ද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
පැහැදිලිව ගිවිසුමක් තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගිවිසුමේ හැටියට වැඩ අවසන් වන්නේ කවදා ද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
දියකඩනයේ වැඩ අවසන් වන්නේ 2012 වර්ෂයේ අප්‍රේල් මාසයේ. බහලුම් පර්යන්තයේ වැඩ අවසන් වන්නේ 2016 ජූනි මාසයේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
නැහැ, නැහැ. ගිවිසුම අනුව.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගිවිසුම අනුව තමයි කියන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හොඳයි. තමුන්නාන්සේට පුළුවන් ද ගිවිසුම දැන් සභාගත කරන්න?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඔබතුමා ඒ ගැන ආපසු ප්‍රශ්නයක් ඇහුවොත් මම සභාගත කරන්නම්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දැන් අද ඒ ප්‍රශ්නය අහලා තියෙනවා නේ. ගරු කථානායකතුමනි, මා මේ ප්‍රශ්නය අසා තිබෙනවා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නයටයි මා උත්තර දෙන්නේ. ඔබතුමා ගිවිසුම ගැන නැවත ප්‍රශ්නයක් ඇහුවොත් ඒක සභාගත කරන්න පුළුවන්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මේ ප්‍රශ්නයෙන් පිට මොකුත් අහන්නේ නැහැ. ඔබතුමා කියනවා, ගිවිසුම අනුව 2012 වර්ෂයේ එක කොටසක් අවසාන වෙනවාය කියා. හොඳයි, ඒ ගිවිසුම තමුන්නාන්සේට සභාගත කරන්නට පුළුවන් ද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, මෙතුමා අසා තිබෙන ප්‍රශ්නයේ කොහේ හරි තිබෙනවා ද මේ ගිවිසුම පිළිබඳව? ගිවිසුම සභාගත කරන්නටය කියා කොහේ හරි තිබෙනවා ද? [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම ඉල්ලලා නැහැ. ගිවිසුම සභාගත කරන්න නියෝජ්‍ය අමාත්‍යතුමා සූදානම් වෙලා නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඉල්ලලා නැහැ. දැන් එතුමා කියනවා නේ ගිවිසුමක් තිබෙනවාය කියා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගිවිසුමක් තිබුණාට ඒක ඉල්ලලා නැති නිසා එතුමා සූදානම් වෙලා නැහැ ඒක ඉදිරිපත් කරන්නට.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම අහන්නේ 2012 වර්ෂයේදී ඒක සම්පූර්ණ වශයෙන්ම ඉවර වෙනවා ද, කොටස් වශයෙන් ඉවර වෙනවා ද කියලායි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න තුනයි අහන්න පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න තුන විත්තිය මාත් දන්නවා. අහන ප්‍රශ්නයට පැහැදිලිව කෙටියෙන් උත්තර දෙනවා නම් ඔය තරම් දිගට යන්නේ නැහැ. [බාධා කිරීම්] අහන ප්‍රශ්නයට ඉතාමත් සරලව එක උත්තරයක් දුන්නාම ඇති. පැහැදිලි කිරීම් කරන්න ගියාම තමයි පොඩ්ඩක් ප්‍රශ්න මතු වන්නේ. [බාධා කිරීම්]

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට පිළිතුරු ලැබෙයි පැහැදිලිව ප්‍රශ්නය අහනවා නම්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අහලා තිබෙන ප්‍රශ්නයට කෙළින් පිළිතුරක් දුන්නා නම් - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අහන්න කී දෙනෙක් ඉන්නවාද? දැන් මෙතැන හැම කෙනාම ප්‍රශ්න අහනවා නේ. එතකොට කොහොමද උත්තර දෙන්නේ?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයේ (අ) කොටසේ (vii) වැනි අංකයට මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට ගත වන කාල සීමාවයි මම අහන්නේ. ඒකට උත්තර දෙන්න කියන්න.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, අදාළ ගිවිසුම අනුව 2016 ජුනි මාසයේ කියලා පැහැදිලි පිළිතුරක් දුන්නා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
2016 දී. හොඳයි.

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
කන් ඇහෙන්නේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
2016 ජුනි මාසයේ කියලා කිව්වා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා හයියෙන් කියන්න. තමුන්නාන්සේ කියනවාද, මම හයියෙන් කියන්නද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම ආණ්ඩුවට හොඳ කියන්න හදන්නේ. 2016 දී නිම කරන්න තිබෙන මේ ව්‍යාපෘතියේ වැඩ දැනට සියයට 50ක් අවසන් කරලා තිබෙන්නේ? එහෙමද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු කථානායකතුමනි, අදාළ ව්‍යාපෘතිය කොටස් දෙකකින් සමන්විතයි. එකක්, දිය කඩනය. අනෙක බහලුම් පර්යන්තය. එතුමා අහන කොටස මොකක්ද කියලා එතුමාවත් දන්නේ නැතිවයි මේ ප්‍රශ්න කරන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මම කොටස් වශයෙන් ප්‍රශ්නය අහලා නැහැ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කොටස් වශයෙන් අහලා නැති වුණාට කොටස් වශයෙන් තමයි මේ ව්‍යාපෘතිය තිබෙන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේට තේරුම් ගන්න බැරි වුණාට මට කරන්න දෙයක් නැහැ. මම කොටස් වශයෙන් ප්‍රශ්නය අහලා නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊට පස්සේ ගරු මන්ත්‍රීතුමා ඇහුවා, සියයට කොපමණ ප්‍රමාණයක් අවසන් කරලා තිබෙනවාද කියලා. සියයට 50ක් කියලා උත්තරය දුන්නා. ඉතිරි ටික අවසන් කරන්න කොච්චර කාලයක් යනවාද කියලායි මන්ත්‍රීතුමා අහන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඔව්, බොහොම පැහැදිලියි.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawela)

ගරු කථානායකතුමනි, ඒකට උත්තරය දුන්නා නේ. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, දිය කඩනයේ කටයුතු සියයට 50ක් අවසන් වෙලා තිබෙන්නේ. ඒක 2012 අප්‍රේල් මාසයේ ඉවර වෙනවා. ඊට පස්සේ අනෙක් එක. පැහැදිලි කළාමත් එතුමාට තේරුම් ගන්න බැහැ නේ. ඒ පැත්තේ පැහැදිලිතාවක් නැති එක නේ වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්] හිතේ අමාරුව තිබෙන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු කථානායකතුමනි, ප්‍රශ්න අංක 4. (ආ) මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ශ්‍රමිකයින් බඳවා ගන්නා-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් අතුරු ප්‍රශ්න තුනකට වඩා ඇහුවා නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු කථානායකතුමනි, මම අහන්නේ අතුරු ප්‍රශ්න නොවෙයි. එතුමා දුන් පිළිතුරකට පැහැදිලි කිරීමක් කර ගන්නයි අහන්නේ. ප්‍රශ්න අංක 4. (ආ) මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ශ්‍රමිකයින් බඳවා ගන්නා ක්‍රමය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ඒක කිව්වා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඇමතිවරු කී දෙනෙක් ඉන්නවාද? මම නම් දැන ගෙන හිටියේ එක්කෙනායි. බලනකොට මෙතැන 50ක් විතර ඉන්නවා නේ. නියෝජ්‍ය ඇමතිතුමාට උත්තර දෙන්න ඉඩ දීලා පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

මට ඕනෑ කරන්නේ මේ ශ්‍රමිකයින් බඳවා ගැනීම වරාය අධිකාරියෙන් කරනවාද, කොන්ත්‍රාත්කරුවන් කරනවාද කියලා දැන ගන්නයි.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

අදාළ කොටස් දෙකම දෙගොල්ලන්ම කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අතුරු ප්‍රශ්න අහන කොට ඉතා කෙටියෙන් අහනවා නම් හරියට පිළිතුරක් දෙන්න පුළුවන්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

දිගට ඇහුවොත් මේ ගොල්ලන්ට උත්තර දෙන්න බැහැ. දිගට ඇහුවොත් එරෙනවා. ඒක තමයි ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 5-1174/'11-(1), ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 6-1201/'11-(1), ගරු එම්.ටී. හසන් අලි මහතා.

**ගරු එම්.ටී. හසන් අලි මහතා**
(மாண்புமிகு எம்.ரீ. ஹஸன் அலி)
(The Hon. M.T. Hasen Ali)

Sir, I ask Question No. 6.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 7-0582/'10- (2), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මොකක්ද මේකේ තේරුම? මා හිතුවා, මුදල් අමාත්‍යාංශයේ විතරයි මේ ලෙඩේ තිබෙන්නේ කියා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

උසාවියෙත් ඔය ලෙඩේ තිබෙනවා. සති දෙකෙන් දෙකට කල් යනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මාතර දිස්ත්‍රික්කය තුළ ඇති පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන : විස්තර

### மாத்தறை மாவட்டத்திலுள்ள முன்பிள்ளைப்பருவ அபிவிருத்தி நிலையங்கள்: விபரம்

### EARLY CHILDHOOD DEVELOPMENT CENTRES IN MATARA DISTRICT : DETAILS

0933/'10

8. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මාතර දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මක පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව, ඒවායේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම මධ්‍යස්ථානවල ක්‍රියාත්මක විෂය නිර්දේශයන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියමයන්ට අනුව සකස් කර තිබේද;

(ii) නොඑසේ නම්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂය නිර්දේශයන්ට අනුව එම විෂය නිර්දේශ සකස් කරනු ලබන්නේද;

(iii) ඒවායේ සේවයේ නියුතු ගුරුවරුන් සඳහා නිත්‍ය සේවා තනතුරක් ඇති කර ඔවුන් එම තනතුරෙහි ස්ථිර කිරීමට සහ විධිමත් වැටුප් ක්‍රමයක් සකස් කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தில் தற்போது இயங்குகின்ற முன் பிள்ளைப்பருவ அபிவிருத்தி நிலையங்களின் எண் ணிக்கை, அவற்றின் பெயர்கள், முகவரி மற்றும் தொலைபேசி இலக்கங்கள் யாவையென்பதை பிரதேச செயலாளர் மட்டத்தில் வெவ்வேறாக அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி நிலையங்களில் நடைமுறையிலுள்ள பாடவிதானங்கள் கல்வித் திணைக்களத்தின் நியமங்களுக்கேற்ப தயாரிக்கப்பட்டுள்ளதா என்ப தையும்,

(ii) இல்லையெனில், கல்வி அமைச்சின் பாடவிதானங் களுக்கேற்ப மேற்படி பாடவிதானங்கள் தயாரிக்கப் படுமா என்பதையும்,

(iii) இவற்றில் பணியாற்றும் ஆசிரியர்களுக்கு நிரந்தர சேவைப் பதவிகளை உருவாக்கி இவர்களை இப்பதவியில் நிரந்தரமாக்குவதற்கும் முறைசார்ந்த ஒரு சம்பளத் திட்டத்தை தயாரிப்பதற்கும் நடவடிக்கையெடுப்பாரா என்பதையும்,

(iv) ஆமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்கு மென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Child Development and Women's Affairs :

(a) Will he state separately the number of Early Childhood Development Centres currently operative in Matara District, their names, addresses and telephone numbers, in relation to each Divisional Secretary's Division ?

(b) Will he inform this House-

(i) whether the syllabuses in use at those centres have been prepared according to the regulations of the Ministry of Education;

(ii) if not, whether those syllabuses will be prepared according to the syllabuses of the Ministry of Education;

(iii) whether measures will be taken to create a substantive post for the teachers serving at those centres, confirm them in that post and formulate a proper salary scale for the post; and

(iv) if so, the period of time required for that ?

(c) If not, why ?

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)

(අ) මාතර දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මක පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් සංඛ්‍යාව 655කි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

[ගරු තිස්ස කරල්ලියද්ද මහතා]

දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් ලියාපදිංචිය සහ අධීක්ෂණය පළාත් සභා වෙත පැවරී ඇති අතර දකුණු පළාත තුළ ක්‍රියාත්මක වන පෙර පාසල් ප්‍රඥප්තියට අනුකූලව ඒ සම්බන්ධ කටයුතු සිදු කරනු ලබයි. එම නිසා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ලිපිනයන් සහ දුරකථන අංක ජාතික මට්ටමින් තබා ගැනීමක් සිදු නොවන අතර එම තොරතුරු දකුණු පළාත් සභාවේ තිබිය යුතුය.

(ආ) (i) ඔව්.

දකුණු පළාත තුළ භාවිතා කිරීම සඳහා, එම පළාත් සභාව විසින් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ඉගෙනුම් ක්‍රියාකාරකම් ඇතුළත් පොත් කට්ටලයක් හඳුන්වා දී ඇත.

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් පෙර පාසල් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කරනු ලබන අතර එහි නිසි බලධාරියා වන්නේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂයි.

ඒ අනුව මුල් ළමාවිය සංවර්ධනයට දකුණු පළාත තුළ සියලුම පොත්පත් සහ ලිපි ලේඛන නිකුත් කරනු ලබන්නේ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිවයි.

(ii) පැන නොනඟී.

(iii) නැත.

(iv) පැන නොනඟී.

(ඇ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:***

*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு:*

*Annex tabled:*

පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

| අනු අංකය | පෙර පාසලේ නම | පෙර පාසලේ ලිපිනය |
|---|---|---|
| 1 | දිලාන් පෙර පාසල | බොරලම්පොත. දම්පහල.(බ) |
| 2 | අසෝක පෙර පාසල | අසෝකාරාමය. පොත්දෙනිය |
| 3 | උදය පෙර පාසල | ගොමිල. මාවරල |
| 4 | සිගිති පෙර පාසල | උඩුනුපිටිය. බෙරලපනාතර |
| 5 | ප්‍රියදර්ශී පෙර පාසල | ප්‍රාදේශීය සභා උප කාර්යාලය. බෙංගමුව |
| 6 | සමාධි පෙර පාසල | පාතවිට. බෙරලපනාතර |
| 7 | ප්‍රගති පෙර පාසල | අගුරුමැලේ කන්ද. ගින්තලිය. ඌරුබොක්ක |
| 8 | ආසිරි මල් පෙර පාසල | ගින්තලිය. දකුණ. අලංකොලදෙනිය. ඌරුබොක්ක |
| 9 | පිපෙන කැකුළු පෙර පාසල | මොරිස්ටන් විහාරය. හුලංකන්ද |
| 10 | හෙළ මල් තරු පෙර පාසල | 1/350. යහලමුල්ල. කලබෝවිටියන |
| 11 | සරණ සිරි පෙර පාසල | පොල අසල. ගෝමිල. මාවරල |
| 12 | ශ්‍රී මහේන්ද්‍රාරාමය පෙර පාසල | ශ්‍රී මහේන්ද්‍රාරාමය. පුවක්ගහ හේන. ගොමිල. මාවරල |
| 13 | පෙරමග පෙර පාසල | පෙරමග පෙර පාසල. රොටුඹ |
| 14 | ළහිරු පෙර පාසල | ශ්‍රී රතනාරාමය. ආදලුව |
| 15 | නවෝදය පෙර පාසල | පූර්ව ළමා විය. සං. ම.. බුදල්නාගම. පස්ගොඩ |
| 16 | සුපිපි පෙර පාසල | පාසල් මාවත. තලපල කන්ද. දෙනියාය |
| 17 | මුදිතා පෙර පාසල | ශ්‍රී පරම විශුද්ධාරාමය මො/කි |
| 18 | නිපුණ පෙර පාසල | බෙරලපනාතර |
| 19 | රන් කැකුළු පෙර පාසල | විලයාය. දම්පහල |
| 20 | දිමුතු පෙර පාසල | පූජා ශාලාව. හසරැලිගම. ඌරුබොක්ක |
| 21 | හංසි පෙර පාසල | කැටවලගම. බෙරලපනාතර |
| 22 | මුදිතා පෙර පාසල | තලවත්ත. කැටවලගම |
| 23 | සත්මග පූර්ව ළමා විය සං. ප. | ජනපදය. රොටුඹ |
| 24 | තුසිත සිගිති පූර්ව ළමා විය සං. ප. | තුසිතාරාමය. ඌරුබොක්ක |
| 25 | සුමුදු පෙර පාසල | නවගම්මානය. බොරලම්පොත. ද/බ |
| 26 | සිගිති සෙවන පෙර පාසල | ග්‍රාමීය බැංකුව ඉදිරිපිට. පහල ගම් බැද්ද. ගින්තලිය |
| 27 | පුබුදු ළදරු උයන(සිගිති සං. ම.) දිවා සුරැකුම් | මොරගල. කිරිලිපන. (දෙනියාය හරහා) |
| 28 | සිංහ පෙර පාසල | මොලොග්ගමුව උතුර. මො/කිරිලිපන |
| 29 | විකිරි පෙර පාසල | බෝධිරාජාරාමය. දෙන්කන්දලිය |
| 30 | සම්බුදු පෙර පාසල | ගල්බොක්ක. බෙරලපනාතර |
| 31 | මුදිතා පෙර පාසල | පනාකඩුව. බටහිර |
| 32 | විජය පෙර පාසල | විජයගම. බෙරලපනාතර |
| 33 | නවෝදය පූර්ව ළමා විය සං. ප. | නවෝදය. රොටුඹ පාර. පස්ගොඩ |
| 34 | සමාධි පෙර පාසල | තුම්බැවුල. රජමහා විහාරය. මොලොග්ගමුව |
| 35 | පර්සි අබේවර්ධන පෙර පාසල | කොබෝමැල්ල. බෙරලපනාතර |
| 36 | ශ්‍රී ධර්මාරාම පෙර පාසල | ශ්‍රී ධර්මාරාම පෙ පා. ඌරුබොක්ක |
| 37 | ශ්‍රී සුමනජෝති සත්සර | ශ්‍රී සුධර්මාරාමය. පට්ටිගල. |
| 38 | සමනල පෙර පාසල | ඉංදොල. බෙංගමුව |
| 39 | දිලිරුස් පෙර පාසල | බටාදූර. උතුර |
| 40 | ලක්මුතු පූර්ව ළමා විය සං. ප. | ඇහැල කන්ද. ගොමිල. මාවරල |
| 41 | සමගි පූර්ව ළමා විය සං. ප. | ශ්‍රී බෝධිරුක්ඛාරාමය. කිරිපිටිය |
| 42 | පුබුදු පෙර පාසල | ශ්‍රී ජයමංගලාරාමය. දම්පහල |
| 43 | මිහිඳු පෙර පාසල | ගින්තලිය. ඌරුබොක්ක. |
| 44 | ලිට්ල් ඒන්ජල් මොන්ටිසෝරි | ශ්‍රී පාලි ඌරුබොක්ක |

පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

| අනු අංකය | පෙර පාසලේ නම | පෙර පාසලේ ලිපිනය |
|---|---|---|
| 1 | කසුන් | 48 දැරංගල III පියවර |
| 2 | ස්බෝධි පෙර පාසල | 4 පියවර කිරිවැල්කැලේ |
| 3 | ශ්‍රී සීලරත්න | අභිනවාරාමය සි.බ. |
| 4 | ළහිරු පෙර පාසල | තාරංදොල කැකුනදෙනිය බෙරලනාතර |
| 5 | මුදිත | කඳුරුවාන පිටබැද්දර |
| 6 | ශ්‍රී සාරානන්ද පෙර පාසල | එලමැල්දෙනිය පිටබැද්දර |
| 7 | උදාර පෙර පාසල | සර්වෝදය මධ්‍යස්ථානය මලිදූදනැල්ල පිටබැද්දර |
| 8 | සිතුමිණි පෙර පාසල | ඉහල ආයිනගම සියඹලාගොඩ |
| 9 | ඉසුරු පෙර පාසල | තෙළුවපාර කළුබෝවිටියන |
| 10 | සමනල පෙර පාසල | ගොරකවෙල පිටබැද්දර |
| 11 | මිහිඳු පෙර පාසල | ලෙවුපොත්දෙනිය බෝපෙගොඩ |
| 12 | ළහිරු පෙර පාසල | සුමන බෞද්ධ මධ්‍යස්ථානය අසල කළුබෝවිටිය |
| 13 | ඉසුරු පෙර පාසල | පොඩි 10 කන්ද 3 පියවරදැරංගල |
| 14 | නවෝදා පෙර පාසල | නවෝදා පෙර පාසල මොරවක |
| 15 | දීප්ති පෙර පාසල | ගංගාරාමය වැලිව මොරවක |
| 16 | මහාමායා | වැලිව මොරවක |
| 17 | ශාන්ති පෙර පාසල | දෙවන පියවර දැරංගල පිටබැද්දර |
| 18 | විශ්ව පෙර පාසල | හාවහේන අලපලාදෙනිය |
| 19 | අම්ල සිගිති හමුව | අම්ල සිගිති හමුව බාතගල |
| 20 | මෙත්සිරි පෙර පාසල | දැරංගල 3 පියවර කි/කැලේ |
| 21 | මිහිඳු පෙර පාසල | එලමල්දෙනිය පිටබැද්දර |
| 22 | සිසුර පෙර පාසල | විමසුම වැලිව මොරවක |
| 23 | පුබුදු පෙර පාසල | දංගල අලපලාදෙනිය |
| 24 | ලිට්ල් සවුත්ඩ් පෙර පාසල | දොඩම්ගස් කඩේ කොස්තිල්ගොඩ |
| 25 | ලක්මල්තරු | දෙනියාය පාර මොරවක |
| 26 | ලිට්ල් ස්ටාර් | කීර්තිගම දැරගල පිටබැද්දර |
| 27 | පිටබැද්දර ප්‍රාදේශීය සභා හරිතසං සුරැම් ළදරු පාසල | |
| 28 | පුබුදු පෙර පාසල | කොඩිකාරගොඩ මොරවක |
| 29 | රෝයල් කිඩ්ස් | රෝයල් කිඩ්ස් වරාමුල්ලවත්ත මොරවක |
| 30 | රන් කැකුළු පෙර පාසල | සියඹලාගොඩ නැගෙනහිර පිටබැද්දර |
| 31 | ශ්‍රී සුමංගල පෙර පාසල | ශ්‍රී බෝධිරාජ් විහාරය තැන්නහේන පිටබැද්දර |
| 32 | රෝස් බඩ්ස් පෙර පාසල | ටෙලිකොම් අසල පිටබැද්දර |
| 33 | තක්සිලා පෙර පාසල | දංගල අලපලාදෙනිය |
| 34 | පිපෙන කැකුළු පෙර පාසල | දියදාව සියඹලාගොඩ නැගෙනහිර පිටබැද්දර |
| 35 | රත්මල් පෙර පාසල | වරකගහතැන්න පූජා ශාලාව පිටබැද්දර |
| 36 | පරම විශුද්ධාරාම පෙර පාසල | පරම විශුද්ධාරාමය හුලංදුව පිටබැද්දර |
| 37 | විජය ළදරු පාසල | ශ්‍රී විජිතාරාමය අලපලාදෙනිය |
| 38 | සුරක්‍ෂා පෙර පාසල | සුරක්‍ෂා පෙර පාසල පිරිස්වත්ත පිටබැද්දර |
| 39 | කීර්ති ශ්‍රී නජිකෝ ළදරු අධ්‍යාපන ආයතනය | දෙනියාය පාර මොරවක |
| 40 | සමගි පෙර පාසල | අඹේවෙල පාර කළුබෝවිටියන |

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යතුමාගෙන් මා අසන පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ සම්බන්ධයෙන් අමාත්‍යතුමා නියෝජනය කරන අමාත්‍යාංශය පළාත් සභා සඳහා මාර්ගෝපදේශ ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද, මුළු රටක් විධියට සලකන විට එකම තලයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා?

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)
දැනට අපෙන් උපදේශනය ඇහුවොත් ලබා දීමක් කරනවා. මීට කලින් ප්‍රශ්න අහන වෙලාවකදී මම ඔබතුමාට පොත් පිංචක් බාර දුන්නා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒක කියවලා තමයි මා මේ ප්‍රශ්නය අහන්නේ. ගරු කථානායකතුමනි, මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ වැඩ පිළිවෙළේදී ජාතික මට්ටමේ එකම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්න පළාත් සභාව සමඟ සම්බන්ධ වන වාර්තාවක් මේ සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)
ඔබතුමා ඒ ගැන ප්‍රශ්නයක් ඇහුවොත් ඒ ගැන සාකච්ඡා කරලා කටයුතු කරන්න මට පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9-0958/'10-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya )
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සති තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 10-1175/'11-(1), ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමා කල් ඉල්ලන ඇමති වෙලා වගෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙපැත්තටම එක වාගේ නේ. කලබල වෙන්න එපා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11-1202/'11-(1), ගරු එම්.ටී. හසන් අලි මහතා.

**ගරු එම්.ටී. හසන් අලි මහතා**
(மாண்புமிகு எம்.ரீ. ஹஸன் அலி)
(The Hon. M.T. Hasen Ali)
Sir, I ask Question No. 11.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## උතුරු සහ නැඟෙනහිර පළාත්වල බිම් බෝම්බ ඉවත් කිරීම : විස්තර

### வடக்கு மற்றும் கிழக்கு பிரதேசங்களில் கண்ணிவெடியகற்றல்: விபரம்

### DE-MINING IN NORTHERN AND EASTERN PROVINCES: DETAILS

0692/'10

12. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උතුරු සහ නැඟෙනහිර පළාත්වල බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතුවල යෙදී සිටින රටවල නම් කවරේද;

[ගරු රවි කරුණානායක මහතා]

(ii) බිම් බෝම්බ ඉවත් කිරීම සඳහා ඉහත රටවලට ලබා දී ඇති උතුරු සහ නැඟෙනහිර පළාතේ භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් වර්ග කිලෝමීටර කොපමණද;

(iii) අද වන විට බිම් බෝම්බ ඉවත් කර ඇති භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බිම් බෝම්බ ඉවත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් දරන ලද වියදම කොපමණද;

(ii) බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සඳහා ලැබුණු ප්‍රදානයන් කොපමණද;

(iii) ඉහත සඳහන් ප්‍රදානයන් ලබා දුන් රටවල හෝ පෞද්ගලික සමාගම්වල නම් කවරේද;

(iv) උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට ගතවන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் கண்ணி வெடியகற்றும் பணியில் ஈடுபட்டுள்ள நாடுகளின் பெயர்களையும்,

(ii) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் கண்ணி வெடியகற்றுவதற்காக மேற்படி நாடுகளுக்கு வழங்கப்பட்டுள்ள பகுதிகளின் பரப்பளவை சதுர கிலோமீற்றர்களில் வெவ்வேறாகவும்,

(iii) இற்றைவரை கண்ணிவெடியகற்றப்பட்ட பகுதியின் பரப்பளவை சதுர கிலோமீற்றரிலும்

அவர் தெரிவிப்பாரா?

(ஆ) (i) கண்ணிவெடிகளை அகற்றுவதற்காக இலங்கை அரசாங்கத்திற்கு ஏற்பட்ட செலவு யாதென் பதையும்,

(ii) கண்ணிவெடி அகற்றல் செயற்பாடுகளுக்காக நன் கொடையாக கிடைத்த தொகை யாதென்பதையும்,

(iii) மேற்படி நன்கொடைகள் வழங்கிய நாடுகள் அல்லது கம்பனிகள் ஆகியவற்றின் பெயர்கள் யாதென்பதையும்,

(iv) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் கண்ணி வெடியகற்றும் செயற்பாடுகளை பூரணப்படுத்து வதற்கு இன்னும் எவ்வளவு காலம் அவசியம் என்பதையும்

அவர் தெரிவிப்பாரா?

(இ) இன்றேல். ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state-

(i) the names of the countries involved in de-mining in the Northern and the Eastern Provinces ;

(ii) the area in square kilometres entrusted to the aforesaid countries for clearing up in the Northern Province and the Eastern Province separately; and

(iii) the area in square kilometres that have been cleared to date?

(b) Will he also state-

(i) the cost incurred by the Government of Sri Lanka for de-mining;

(ii) the amount of grants received for the de-mining activities;

(iii) the names of the countries or the private companies from which the aforesaid grants were received; and

(iv) the time duration that will be taken to complete the de-mining activities in the North-East area?

(c) If not why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ස්විට්සර්ලන්තය, ඩෙන්මාර්කය, මහා බ්‍රිතාන්‍යය හා ඉන්දියාව

(ii) ස්විට්සර්ලන්තය සඳහා වර්ග කිලෝමීටර් 258.51 (වර්ග කිලෝමීටර් දෙසිය පනස්අටයි දශම පහයි එකයි.)

ඩෙන්මාර්කය සඳහා වර්ග කිලෝමීටර් 1336.29 (වර්ග කිලෝමීටර් එක්දහස් තුන්සිය තිස්හයයි දශම දෙකයි නවයයි), මහා බ්‍රිතාන්‍යය සඳහා වර්ග කිලෝමීටර් 690.59 (වර්ග කිලෝමීටර් හයසියඅනූවයි දශම පහයි නවයයි) හා ඉන්දියාව සඳහා වර්ග කිලෝමීටර් 1273.90 (වර්ග කිලෝමීටර් එක්දහස් දෙසිය හැත්තෑතුනයි දශම නවයයි) භූමි ප්‍රමාණයක්ද ලබා දී ඇත. ලබා දී ඇති භූමි ප්‍රමාණය උතුරු හා නැඟෙනහිර වශයෙන් වෙන් වෙන්ව සටහන්ව නොමැත.

(iii) 2002 වසරේ සිට මේ දක්වා ඉහත දැක්වූ රටවල්, අනෙකුත් ආයතන හා යුද හමුදාව විසින් නිසැක කර ඇති භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර 5594.89 (පන්දහස් පන්සිය අනූහතරයි දශම අටයි නවයයි) වේ.

(ආ) (i) රුපියල් 1,492,810,000.00 (මිලියන එක්දහස් හාරසිය අනූදෙකයි දශම අටයි එකයි)ක් පමණ වේ.

(ii) ඇමෙරිකා එක්සත් ජනපදය, චීන රජය, ඕස්ට්‍රේලියානු රජය, එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ කොමිෂන් සභාව - UNHCR, විගමනිකයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධාන - IOM, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය බිම් බෝම්බ ඉවත් කිරීමට අවශ්‍ය උපකරණ සපයා ඇති අතර, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (යුනිසෙෆ්) විසින් කාර්යාල උපකරණ ප්‍රදානය කර තිබේ. මීට අමතරව ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල - UNICEF - හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් විවිධ වර්ගයේ වාහන 65ක් පමණ ප්‍රදානය කර ඇත.

(iii) ඇමෙරිකා එක්සත් ජනපදය, චීන රජය, ඕස්ට්‍රේලියානු රජය, එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ කොමිෂන් සභාව - UNHCR-, විගමනිකයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධාන - IOM-, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල - UNICEF- හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වේ.

(iv) 2020 වර්ෂයේදී උතුරු නැගෙනහිර ප්‍රදේශයේ බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

(ඇ) අදාළ නොවේ.

ඒ වාගේම මා ප්‍රකාශ කරන්න කැමැතියි ගරු කථානායකතුමනි, සමහර ප්‍රදේශවල අපි බලාපොරොත්තු වෙච්ච ඉලක්කයට කලින් මේ කටයුතු හමාර කිරීමට හැකි වී තිබෙන බව.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ අහපු ප්‍රශ්නයකට උත්තරයක් වශයෙන් මේ ඇමතිතුමාම පිළිතුරක් දුන්නා, 1,12,000ක් විතර අවතැන් වූ පිරිසක් සිටිනවාය කියලා. දැන් මේ de-mining activities ඉවර වෙලා තිබෙනවා කියනවා. ඒ අවතැන් අය තවමත් අවතැන් කඳවුරුවල සිටිනවාද කියන ප්‍රශ්නයට උත්තර දෙන්න පුළුවන් වෙයිද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ ප්‍රශ්නයෙන් අහන්නේ බිම් බෝම්බ ගැන.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, ඉතින් බිම් බෝම්බ නිසා නේ-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
බිම් බෝම්බ ගැන අහලා, වෙන බෝම්බයක් අත අරින්නයි දැන් ලෑස්ති වන්නේ ගරු කථානායකතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි බෝම්බ නිෂ්ක්‍රිය කර කර යනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ප්‍රශ්නයකට අදාළව, තාවකාලිකව තැන් අහිමි වුණු අයගේ පදිංචිය පිළිබඳව පසු ගිය මාස හය තුළ මම මේ සභාවේ පිළිතුරු දීලා තිබෙනවා. ඒ වාගේම හදිසි නීතිය දීර්ඝ කරන අවස්ථාවලදී අගමැතිතුමාත් විස්තරාත්මක පිළිතුරු දීලා තිබෙනවා. ඉතින් කෙළින්ම ප්‍රශ්නය ඒ සම්බන්ධයෙන් ඇහුවා නම් ඒක වෙනම දෙයක්. නමුත් මේ අහලා තිබෙන්නේ බිම් බෝම්බ පිළිබඳ ප්‍රශ්නයක්. ශ්‍රී ලංකා රජය හැටියට අපි ආඩම්බර වනවා, මේ වන විට ඒ පළාතේ විශාල ප්‍රදේශයක බිම් බෝම්බ ඉවත් කර තිබෙන නිසා, ඒ ප්‍රදේශවල ජීවත් වුණු ජනතාව යළිත් ගොස් ඒ ප්‍රදේශවල ගොවිතැන් බත් කරමින් කෘෂිකාර්මික සංවර්ධනය ආරම්භ කරලා තිබෙන එක ගැන. ඒ අයට අවශ්‍ය සියලු පහසුකම් අපි සපයනවා. ගොස්, එය දැක බලා ගැනීමට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට පුළුවන් බවත් මම ප්‍රකාශ කරන්නට කැමැතියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
යන්න දෙන්නේ නැහැ නේ. ගහනවා නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කවුරුවත් ගහන්නේ නැහැ. කිසි කෙනෙක් ගහන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මන්ත්‍රීතුමාත් හිටියා, ඔබතුමන්ලාගේ,- [බාධා කිරීම්] ඔය ඉන්නේ සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මන්ත්‍රීතුමා. ඒක අහගන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඇවිල්ලා ඉන්න විත්තිය දැන් රටම දන්නවා. ඒ නිසා පොඩ්ඩක් නිශ්ශබ්ද වනවා නම් හොඳයි. [බාධා කිරීම්] මේ රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ වෙලාව.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, දැන් තමයි බිම් බෝම්බවලට උත්තර ලැබෙන්නේ. [බාධා කිරීම්]

දෙවෙනි අතුරු ප්‍රශ්නය. ඉතුරු ප්‍රදේශය සම්පූර්ණයෙන්ම -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම එකඟ නැහැ, එතුමා කරන ප්‍රකාශයට ගරු කථානායකතුමනි. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා අය වැය ලේඛනය පිළිබඳ විවාදයේදී බිම් බෝම්බ ඉවත් කරපු ඒ ගම් නියම්ගම් පවා ඉතා පැහැදිලිව ප්‍රකාශ කළා. එතුමා කියන විධියට දැන් නොවෙයි මේ විස්තර ලැබෙන්නේ. බොහොම කනගාටුයි. අපේ පාර්ලිමේන්තුව මේ රටේ වැදගත්ම ප්‍රශ්නයකදී මෙසේ හැසිරිය යුතු නැහැ. අපි ජාත්‍යන්තර-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කාටද මේ කථා කරන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමන්ලාටත් ලෝකයට ඇත්ත කියන්න පුළුවන්කම තිබෙනවා. තමුන්නාන්සේලා ඒක විකෘති කරන්න එපා. එච්චරයි මම ඉල්ලන්නේ. විකෘති කරන්න හදන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේ ඇමතිතුමා පීලි පැන්නාය කියලා අපට ප්‍රශ්නයක් නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පීලි පැනලා තිබෙන්නේ අපි නොවෙයි. පීලි පැනලා තිබෙන්නේ ජාතික සංවිධායකකම.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොනවාද මේ කියන්නේ. අපි රට වෙනුවෙන් -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැන් ඒ සංවිධායකකම උසාවියේ පීල්ලට ගිහිල්ලා. සංවිධායකකම උසාවියේ වහළයේ; පීල්ලේ. මොනවාද ඔය කථා කරන දේවල්. ඔබතුමාට ඉල්ලන විස්තර ඔක්කෝම දීලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකක්ද මේ උත්තරය?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි ඊළඟ ප්‍රශ්නයට යමු ගරු කථානායකතුමනි. ඊළඟ ප්‍රශ්නයට යන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි අහන්නේ ඉතිරි බෝම්බ නිෂ්ක්‍රිය කරලා සම්පූර්ණයෙන්ම ඉවර කරන්න පුළුවන් වන්නේ කවදාද කියලායි. උත්තර දෙන්නේ නැහැ. නිකම් බොරුවට හිනා වෙවී රූපවාහිනියට පෙනෙන්න කථා කරන්නයි හදන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා දැක්කාම හිනා යනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා දැන් පිළිතුර පැහැදිලි කළා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම උත්තර දුන්නා, 2020 දී කියලා. නමුත් ඊට කලින් හමාර කරන්න පුළුවන්. මම උත්තර දුන්නා නේ. ඔබතුමාට ඇහෙන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරියට ඇහෙන්න කියන්න කෝ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොකක්ද කියන්න ඕනෑ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කිව්වාය කියන එක.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම ප්‍රශ්නවලට උත්තර දුන්නා. ඔබතුමා අහන දේට උත්තර දුන්නා. අදාළ වර්ෂ කිව්වා. ඔබතුමා තව අහන්නේ මොකක්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කොයි කාලයේද ඉවර කරන්නේ? 2020 කියලාද කිව්වේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මම උත්තර දුන්නා. අහන දේට මම පිළිතුරු දීලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කාල වේලාව නාස්ති කරන්නත් ඕනෑ නැහැ.

## මාතර දිස්ත්‍රික්කය තුළ ඇති පළාත් පාලන ආයතන : විස්තර

மாத்தறை மாவட்டத்திலுள்ள உள்ளூராட்சி நிறுவனங்கள் : விபரம்

LOCAL AUTHORITIES IN MATARA DISTRICT : DETAILS

0934/'10

13. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා සංඛ්‍යාව කොපමණද;

(ii) එම පළාත් පාලන ආයතනවල බලප්‍රදේශයන්ට අයත් භූමි ප්‍රමාණයන් වෙන වෙනම, දළ වශයෙන් කොපමණද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(iv) 2009 ඡන්දහිමි නාම ලේඛනය අනුව මාතර දිස්ත්‍රික්කයේ සිටින ලියාපදිංචි ඡන්ද දායකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යාව, ජන සංයුතිය හා භූගෝලීය පිහිටීම සලකා පළාත් පාලන ආයතන සංඛ්‍යාව අඩු හෝ වැඩි කිරීමට ඉදිරියේදී කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, නව පළාත් පාලන ආයතන සීමා නිර්ණය කරනු ලබන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்திற்குச் சொந்தமான பிரதேச சபைகள், நகர சபைகள் மற்றும் மாநகர சபைகள் எத்தனையென்பதையும்,

(ii) மேற்படி உள்ளூராட்சி நிறுவனங்களின் ஆளுகைப் பிரதேசங்களுக்குரிய நிலப் பரப்புக்கள் தனித் தனியாக எவ்வளவென்பதையும்,

(iii) மாத்தறை மாவட்டத்தில் உள்ள பிரதேச செயலகப் பிரிவுகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்,

(iv) 2009 ஆம் ஆண்டுக்கான தேருநர் இடாப்பின் படி மாத்தறை மாவட்டத்தில் உள்ள பதிவு செய்யப்பட்ட வாக்காளர்களின் எண்ணிக்கை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மாத்தறை மாவட்டத்தின் மக்கள் தொகை, மக்கள் உள்ளடக்கம், புவியியல் அமைப்பு என்பவற்றை கருத்திற் கொண்டு உள்ளூராட்சி நிறுவனங்களின் எண்ணிக்கையைக் குறைப்பதற்கு அல்லது கூட்டு வதற்கு எதிர்காலத்தில் நடவடிக்கை எடுக்கப் படுமா என்பதையும்,

(ii) ஆமெனில் புதிய உள்ளூராட்சி நிறுவனங்களுக் கான எல்லைகள் நிர்ணயிக்கப்படும் கால எல்லை யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Will he state-

(i) the number of Pradeshiya Sabhas, Urban Councils and Municipal Councils in the Matara district;

(ii) separately, the approximate extent of land coming under the areas of the aforesaid Local Authorities;

(iii) the number of Divisional Secretary's Divisions in the Matara District; and

(iv) the number of registered voters in the Matara district according to the Electoral Register—2009?

(b) Will he inform this House-

(i) whether action will be taken in the future to increase or decrease the number of Local Authorities in the Matara District considering the population, the ethnic composition and the geographical location of the said district; and

(ii) if so, the period of time within which delimitation of new Local Authorities will be completed ?

(b) If not, why ?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)

(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)

ගරු කථානායකතුමනි, මම පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i)

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය සභා | 15 | |
| නගර සභා | 1 | |
| මහ නගර සභා | 1 | |
| මුළු ගණන | 17 | කි. |

(ii)

| පළාත් පාලන ආයතන | භූමි ප්‍රමාණය දළ වශයෙන් ව.කි.මී. |
|---|---|
| මාතර මහ නගර සභාව | 12.08 |
| වැලිගම නගර සභාව | 6.65 |
| වැලිගම ප්‍රාදේශීය සභාව | 101.04 |
| මාතර ප්‍රාදේශීය සභාව | 41.01 |
| දික්වැල්ල ප්‍රාදේශීය සභාව | 51.02 |
| පස්ගොඩ ප්‍රාදේශීය සභාව | 149.5 |
| මුලටියන ප්‍රාදේශීය සභාව | 114.5 |
| කොටපොල ප්‍රාදේශීය සභාව | 177.43 |
| අකුරැස්ස ප්‍රාදේශීය සභාව | 149 |
| දෙවිනුවර ප්‍රාදේශීය සභාව | 39.9 |
| පිටබැද්දර ප්‍රාදේශීය සභාව | 162.04 |
| හක්මන ප්‍රාදේශීය සභාව | 48.4 |
| මාලිම්බඩ ප්‍රාදේශීය සභාව | 36.32 |
| තිහගොඩ ප්‍රාදේශීය සභාව | 52.8 |
| කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව | 60.86 |
| අතුරලිය ප්‍රාදේශීය සභාව | 63 |
| කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව | 38 |

(iii) 16 කි.

(iv) 584,800 කි.

(ආ) (i) අවශ්‍යතාව මත ඉදිරියේදී කටයුතු කරමි.

(ii) දැනට පැන නොනඟී.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අසන මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. දැනට වැලිගම ප්‍රාදේශීය සභාවට අයිති වෙලා තිබෙන වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වැලිපිටිය ප්‍රාදේශීය සභාව නමින් වෙන් කරන්න සියලු කටයුතු මේ වන විට සූදානම් වෙලා තිබෙද්දීත්, එය සිදු නොකරන්නේ මන්ද?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)0
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, ඊළඟ පළාත් පාලන මැතිවරණය වන විට ඒ සඳහා අවශ්‍ය කටයුතු කරනවා. මේ වන විට ඒ සියලු කටයුතු සූදානම් කර තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. පසුගිය දිනවල සීමා නිර්ණය කරන ලද ග්‍රාම නිලධාරි වසම් මේ පළාත් පාලන බල ප්‍රදේශවලට ගැළපෙන ආකාරයට බද්ධ කරන්නේ කුමන ආකාරයටද?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය මේකට අදාළ නැහැ. මේකට අදාළ ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මේකට අදාළ වෙනවා. මොකද, ප්‍රශ්නයේ (ආ) (i) කොටසට දී ඇති පිළිතුර අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක සීමා නිර්ණය වෙන කොට ඒකට යම් ග්‍රාම නිලධාරි වසම් ප්‍රමාණයක් ඇතුළත් වෙනවා. දැනට කොට්ඨාස සීමා නිර්ණය කරන්නේ පරණ ක්‍රමයටයි.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, අපි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක් ස්ථාපිත කරන්නේ විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ආවරණය වන පරිදියි. ඒ නිසා ඒ පිළිබඳව මෙවැනි ගැටලුවක් පැන නඟින්නේ නැහැ. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම ප්‍රාදේශීය සභාවක් ස්ථාපිත කරන්න තමයි ඉදිරියේදී අපි කටයුතු කරන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය පැන නඟින්නේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියපු කාරණයෙනුයි. මාතර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට පළාත් පාලන ආයතන දෙකක් තිබෙනවා. ඒ තමයි, මාතර මහ නගර සභාව සහ මාතර ප්‍රාදේශීය සභාව. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියන ආකාරයට මේ දෙක එකක් බවට පත් වෙනවාද? සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම පළාත් පාලන ආයතනයක් බවට පත් වෙනවා නම් මාතර මහ නගර සභාවයි, මාතර ප්‍රාදේශීය සභාවයි දෙකම එකක් වෙන්නට ඕනෑ. ඒ අනුව ඔබතුමා කියන ආකාරයට අනාගතයේදී මේ දෙක එකක් බවට පත් වෙනවාද?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ඒක අදාළ නැහැ, ගරු කථානායකතුමනි. නගර සභාව එහෙම වෙන්නේ නැහැ, මන්ත්‍රීතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 14 -0959/'10- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇයි එච්චර කාලයක් ඉල්ලන්නේ?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඇයි ඉතින් අසූ නවයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ හිටපු ජෝසිම්ගේ ඉඳලාම කැසිනෝ පිළිබඳ විස්තර දෙන්න ඕනෑ. ඔබතුමා ජෝසිම්ගේ කාලයේ ඉඳලාම විස්තර ඉල්ලනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම බොහොම ගෞරවයෙන් මේ ප්‍රශ්නය ඇහුවේ. මෙතුමා ජෝසිම් ගැන කතා කරනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඊයේ පෙරේදා විස්තර නොවෙයි, ඔබතුමා ජෝසිම්ගේ කාලයේ ඉඳලාම විස්තර ඉල්ලනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් මේ රටට ජෝසිම්ලා කී දෙනෙක් ගෙනල්ලා ඉන්නවාද? කැසිනෝ පනත ගෙනල්ලා ජෝසිම්ලා නොවෙයි, ජෝසිම්ලාගේ පුතාලාත් ගෙනල්ලා ඉන්නේ. ප්‍රශ්නයක් ඇහුවාම ඒකට උත්තරයක් දෙන්න ඕනෑ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට ගහන්න අහපු ප්‍රශ්නයක් මේක. ඒ නිසා මේක අපට දමන්න එපා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කල් ගන්නේ ඇයි කියලා බොහොම ගෞරවයෙන් ඇහුවාම ඒකට වෙන කතා කියනවා. කට කැඩිච්ච කතා කියනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
කැතයි කැතයි වැඩේ. සිරිකොත ඇතුළේ අර්බුද මෙතැනට ගෙනෙන්න එපා. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් කැසිනෝ ඇරපු ආණ්ඩුවක් මේ තිබෙන්නේ. තව කතා කරනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, පළමුවන වතාවට අහපු ප්‍රශ්නයක් මේක. කල් ඉල්ලන්නේ ඒ නිසයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ප්‍රශ්න අසන වෙලාවේ වාද විවාද කරන්න අවසර දෙන්න බැහැ. ඇමතිතුමා යම් පිළිතුරක් දුන්නොත් කරුණාකරලා ඒකට අවනත වෙන්න. නැතුව බැහැ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මම බොහොම ගෞරවයෙනුයි එතුමාගෙන් ඒ ප්‍රශ්නය ඇහුවේ කල් ගන්නේ ඇයි කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්. ඉතින් එතුමා ගෞරවයෙන් උත්තර දුන්නා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
2600 වැනි සම්බුද්ධත්ව ජයන්තිය සමරන මේ කාලයේ -[බාධා කිරීමක්]

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15-1176/'11-(1), ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා. එක්සත් ජාතික පක්ෂයේ වෘත්තිය සමිති මධ්‍යස්ථානය පිහිටලා තිබෙන්නේ මෙම ස්ථානයේයි. ඒ ගැන පරීක්ෂා කර බලලා සති දෙකකින් උත්තරයක් දෙනවා ගරු කථානායකතුමනි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මට එක ප්‍රශ්නයක් මතු කරන්න ඕනෑ. අපි ප්‍රශ්නයක් ඇහුවා. ඒ ප්‍රශ්නයට ඒ විධියට පිළිතුරු දෙන්න ඕනෑ. දැන් මොකක්ද කියන්නේ මේ එක්සත් ජාතික පක්ෂය මෙතැනට යනවා කියලා? මේ සම්පූර්ණම අගල පුරවලා අගල ආරක්ෂා කරලා තිබෙන්නේ මෙතැන විතරයි. ඔබතුමන්ලා කියනවා, මේ රටේ ප්‍රශ්න විසඳන්න අපට එකතු වෙන්න කියලා. දැන් බලන්නේ ඇතුළට ගිහින් මේකට ගහන්නද? ගරු ඇමතිතුමනි, අපි දන්නවා නේ ඇත්ත. මෙතැන ආරක්ෂා කරලා තිබෙන්නේ අගල තිබෙන තැන විතරයි. වෙන එකක් තියා අලකේශ්වර සොහොන ආරක්ෂා කරන්න බැරි වෙලා තිබෙනවා. මෙතුමාත් දන්නවා. මොකක්ද මේ බලන්නේ? [බාධා කිරීම්] මුළු ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේම- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා නියමිත කාලය ඉවරයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රදේශයේ මම ඕනෑ තරම් පෙන්වන්නම් පුරාවිද්‍යා ස්ථාන තිබෙන ඉඩම් ටික. පුරා විද්‍යාත්මක වටිනාකමක් තිබෙන ඉඩම් ටික ඔක්කොම අපි පෙන්වන්නම්. ඔබතුමන්ලාට ඇවිල්ලා මේවා-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ ඒකට එක්සත් ජාතික පක්ෂයේ නම මතක් කරපු එක වැරැදියි. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි. දැන් එයට පිළිතුරු දුන්නා. ගරු ජගත් බාලසූරිය ඇමතිතුමනි, ඔබතුමා ඒකට සති දෙකක් කල් ඕනෑය කිව්වා නේ. වාචික පිළිතුරු-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයේ නම මතක් කරලා කථා කරපු එක තමයි වැරැද්ද.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයේ තිබෙන්නේ ඒ නම තමයි. ප්‍රශ්නය අහලා තිබෙන්නේ ඒ නමින්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, ජාතික සේවක සංගමය කියලා අහලා තිබෙන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ආ, ඔව්, ජාතික සේවක සංගමය කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එක්සත් ජාතික පක්ෂයේ නම මොකටද පාවිච්චි කරන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්. ඒක වැරැදියි. ජාතික සේවක සංගමය කාගේද මම දන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, කරුණාකර ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා. [බාධා කිරීමක්] හොඳයි. යෝජනා අංක 1. ගරු කරු ජයසූරිය මහතා.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### තොරතුරු ලබා ගැනීමේ නිදහස පනත් කෙටුම්පත
### தகவல் சுதந்திரம் சட்டமூலம்
### FREEDOM OF INFORMATION BILL

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"නිල තොරතුරු ලබා ගැනීමේ නිදහස වෙනුවෙන් විධිවිධාන සැලැස්වීමත්, තොරතුරු ලබා ගැනීම-"

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අපේ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාගේ point of Order එකක් තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ යෝජනාව පිළිබඳ රජය වෙනුවෙන් යම් කිසි ප්‍රකාශයක් මේ ගරු සභාවට අපි කර තිබෙනවා.

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
Point of Order එක මොකක්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි යම්කිසි ප්‍රකාශයක් කරලා තිබෙනවා, මේ ගරු සභාවට. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේලා අහගෙන ඉන්න. [බාධා කිරීමක්] වාඩි වෙන්න. අපි ඒක බලා ගන්නම්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
රජය විසින් ප්‍රතිඥාවක් මේ ගරු සභාවට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම අධිකරණ ඇමතිතුමාත් ලබා දුන්නා. පක්ෂ නායක කමිටුවේදී පැමිණි එකඟතාවට පටහැනිව යළිත් වරක් මේ යෝජනාව ඉදිරිපත් කිරීමේ උත්සාහයට ඉඩ දිය නොහැකියි. පාර්ලිමේන්තුවේ යම් කිසි දෙයක් ගැන එකඟතාවකට පැමිණියාම ඒ එකඟතාව සියලු පාර්ශ්වයන් අනුගමනය කළ යුතුයි. ඒ නිසා ගරු මන්ත්‍රීතුමාට මම ඉතාම ගෞරවයෙන් කියනවා, මේ උත්සාහය නවත්වලා රජය එක්ක මේ ප්‍රශ්නය කථා කරලා මෙය ඉදිරිපත් කරන්නය කියලා.

ඒ වාගේම අද දින ඉදිරිපත් කරන මේ කාරණාවම පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක අන්තර්ගත කරලාත් තිබෙනවා. එකම යෝජනාවක් විවිධ තැන්වල එසේ ඉදිරිපත් කරන්න පාර්ලිමේන්තුවට අවසර දිය නොහැකියි. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ගරු කථානායකතුමා අවසර දුන්නේ නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
පක්ෂ නායක රැස්වීමේදී- [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්, අපි ඊට පස්සේ ගරු කථානායකතුමාට කිව්වා. අපේ ස්ථාවරය වෙනස් වෙන්නේ නැහැ. මේ හිතුවක්කාර සරුංගල් යැව්ලිවලට පාර්ලිමේන්තුව ලක් කරන්න බැහැ. මේවා පක්ෂ නායකයන් අතර පැමිණි එකඟතාවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් මේ යෝජනාවට ආණ්ඩු පක්ෂයෙන් විරෝධතාව දක්වනවා නම්, ඒ මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත් කළාට පස්සේ අපට කැමැත්ත විමසලා වැඩි පැත්ත අනුව ඒක පරාජය කරන්නත් පුළුවන්. ගරු මන්ත්‍රීතුමා ඒ යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
ගරු කථානායකතුමනි, කථා කරන්නත් අවසර දෙන්නේ නැහැ. ඒකද ප්‍රජාතන්ත්‍රවාදය?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"නිල තොරතුරු ලබා ගැනීමේ නිදහස වෙනුවෙන් විධිවිධාන සැලැස්වීමත්; තොරතුරු ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීමට පාදක වන කරුණු නිශ්චිතව සඳහන් කිරීමත්; තොරතුරු ලබා ගැනීමේ නිදහස පිළිබඳ කොමිෂන් සභාව ස්ථාපනය කිරීමත්; තොරතුරු නිලධාරින් පත් කිරීමත්; තොරතුරු ලබා ගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ ක්‍රියා පටිපාටිය සකස් කිරීමත්; ඊට අදාළ සහ ඊට ආනුෂංගික කරුණු පිළිබඳවත් වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

ගරු කථානායකතුමනි, පැමිණි එකඟත්වය තමයි ඉතා ඉක්මනින් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම. ඒකටත් දැන් මාස නවයක් ගියා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යෝජනාව ඉදිරිපත් කළාම ඇති.

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
මාස නවයක් ගිය නිසා මගේ අයිතියක් තිබෙනවා ජනතාව වෙනුවෙන් කථා කරන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යෝජනාව ස්ථිර කළ යුතුයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විරුද්ධයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යෝජනාව ස්ථිර කරන්න. [බාධා කිරීම්] ඒ යෝජනාව ස්ථිර කරන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මම මේ යෝජනාව-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කථා පවත්වන්න බැහැ. යෝජනාව ස්ථිර කරන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මම මේ යෝජනාව - [බාධා කිරීම්] හරි ඉතින්. මට ඉඩ දෙන්න කෝ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යෝජනාව ස්ථිර කරන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව- [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )
යෝජනාව ස්ථිර කරන්න කිව්වාම එතුමා කථා පවත්වනවා නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
හරි ඉතින්, ඉන්න කෝ. එතුමාට තේරෙන්නේ නැහැ නේ. මේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමා යෝජනා කරලා තිබෙන, "නිල තොරතුරු ලබා ගැනීමේ නිදහස වෙනුවෙන් විධිවිධාන සැලැස්වීමත්; තොරතුරු ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීමට පාදක වන කරුණු නිශ්චිතව සඳහන් කිරීමත්; තොරතුරු ලබා ගැනීමේ නිදහස පිළිබඳ කොමිෂන් සභාව ස්ථාපනය කිරීමත්;..." [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක කියවන්න වැඩක් නැහැ. ස්ථිර කළාම ඇති.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
"තොරතුරු නිලධාරීන් පත් කිරීමත්, තොරතුරු ලබා ගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ ක්‍රියා පටිපාටිය...." ඒක මම ස්ථිර කරන්නේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විපක්ෂ නායකතුමා එම යෝජනාව ස්ථිර කරනවා. ආණ්ඩු පක්ෂය?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඒ එක්කම ගරු කථානායකතුමනි,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කථාවක් පවත්වන්න දෙන්න බැහැ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඕනෑම යෝජනාවක් ස්ථිර කළාම මේ ස්ථාවර නියෝග යටතේ කථා කරන්න ඉඩ තිබෙනවා. ඉතින් මම අහන්නේ, 2004 ඉඳන් අප සියලු දෙනාම ඉල්ලපු මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න විරුද්ධ ඇයි කියලායි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විපක්ෂ නායකතුමා, තමුන්නාන්සේ මේ ස්ථාවර නියෝග ගැන හොඳට දන්නවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
හරි ඉතින්. මම අහන්නේ එච්චරයි. ස්ථාවර නියෝග යටතේ මට කථා කරන්න අයිතිය තිබෙනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විවාද කරන්න ඉඩ දෙන්න බැහැ. යෝජනාව ස්ථිර කළා. ආණ්ඩු පක්ෂය?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
විරුද්ධයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ආණ්ඩු පක්ෂය යෝජනාවට විරුද්ධයි. කටහඬින් කැමැත්ත විමසීම.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
විරුද්ධයි. විරුද්ධයි. [බාධා කිරීම්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඇයි බයද? [බාධා කිරීම්]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
බය නැහැ. විරුද්ධයි. [බාධා කිරීම්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඇයි, තොරතුරු දෙන්න බයද? [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇයි මේ භූමිතෙල් ගෑවුණු ගැරඩි වාගේ කෑ ගහන්නේ? [බාධා කිරීම්]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බහුතරයක් ඉන්න ආණ්ඩුව ඇයි ඔච්චර බය? [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වැඩි ශබ්දයට ජයග්‍රහණය- [බාධා කිරීම්] ඒ හන්දා ඒක- [බාධා කිරීම්]

*ප්‍රශ්නය විමසන ලදී.*
*කටහඬවල් අනුව " විරුද්ධ" මන්ත්‍රීන්ට ජය බව කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.*
*வினா விடுக்கப்பட்டது.*
*குரல்களின்படி "இல்லை" மேலோங்கிற்று என சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.*
*Question put.*
MR. SPEAKER., *having collected the Voices, declared that the "Noes" had it.*

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Divide by name!

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක අනුමත නැහැ. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
Divide by name!

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
No.- [*Interruption.*]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Divide by name! - [*Interruption.*]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
Divide by name! - [*Interruption.*] ලෝකය දැන ගත්තාවේ. එච්චරයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Divide by name!

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්, අස්වර් මන්ත්‍රීතුමා නමින් ඉල්ලා සිටිනවා. කැමැත්ත නමින් ගන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

உத்தியோகபூர்வ தகவல்களைப் பெற்றுக்கொள்வதற்கான சுதந்திரத்திற்கும், எதன் அடிப்படையில் இவற்றைப் பெற்றுக் கொள்வது மறுக்கப்படலாம் என்பது பற்றிய ஒரு மடமையான பிரேரணையை இவர் கொண்டு வந்திருக்கின்றார்.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මෙහි සීනුව නාද වෙනවා. Point of Order ගෙනෙන්න බැහැ. කරුණාකර වාඩි වෙන්න. [බාධා කිරීම්]

***පාර්ලිමේන්තුව 43 වන ස්ථාවර නියෝගය යටතේ අවසර දීමට පක්ෂව 32 ; විරුද්ධව 99 ; නොපැමිණි 93 යනුවෙන් බෙදුණේය.***
*பாராளுமன்றம் 43 ஆம் நிலைக் கட்டளைப்படி பிரிந்தது : சார்பாக 32; எதிராக 99, வராதோர் 93.*

*The Parliament divided under Standing Order No. 43: Ayes 32; Noes 99; Absent 93*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ අනුව පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට අවසර ලැබෙන්නේ නැත.

***පක්ෂව***
*சார்பாக*
*Ayes*

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

**ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி)சந்திராணி பண்டார ஜயசிங்க)
(The Hon. (Mrs.) Chandrani Bandara Jayasinghe)

**ගරු කරු ජයසූරිය මහතා**
දැන් අපට වුවමනා තරම් ආහාර ද්‍රව්‍ය තිබෙනවා. සහල් වුවමනා තරම් තිබෙනවා. පසු ගිය සතියේ පැවැත්වූ ආහාර සුරක්ෂිත කිරීමේ කමිටු රැස්වීමේ දී ගණන් බැලූ විධියට ඉදිරි මාස තුනකට අවශ්‍ය කරන සහල් අපේ රටේ තවමත් තිබෙනවා. ඒ වාගේම ලබන මාසයේ අවසානය වන විට මේ කන්නයේ අස්වැන්න ලැබෙන විධියට දැන් ගොවිතැන් කරලා තිබෙනවා. පසු ගිය කාලයේ පැවති වර්ෂාව නිසා කන්නය ටිකක් ඉක්මනින් වගා කිරීම සඳහා වුවමනා කරන බිත්තර වී සියල්ලම අපි නොමිලයේ ලබා දුන්නා. ඒ සඳහා ලෝක ආහාර සංවිධානයේ සහයෝගයත්

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

ඇතිව, රජයේ විශේෂ අවධානයත් යොමු කරලා වර්ෂාවෙන් හානි වුණු සියලුම ගොවීන්ගේ අවශ්‍යතාවන් ඉටු කර දෙන්න පුළුවන් හැම තැනකදීම අපි කටයුතු කළා. ඒ වාගේම ඒ උදවියට පොහොර සහනාධාරය දෙවරක් ලබා දුන්නා. සීමාවක් නැතිව ඒ අවස්ථාවේදී ඒ සහනයත් ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි, බිම් සකස් කිරීම සඳහා අක්කරයකට වුවමනා කරන රුපියල් 4,000ක මුදලත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා අපි ලබා දුන්නා. එහි ප්‍රතිඵලය තමයි අද මේ වන විට අපි බුක්ති විඳින්නේ. අද ඒ ගොවීන් විශාල වශයෙන් තමන්ගේ කුඹුරු ගොවිතැන් කරලා තිබෙනවා. ඒ නිසා අපි මේ කන්නයේත් හොඳ සරු අස්වැන්නක් බලාපොරොත්තු වනවා.

ගරු කථානායකතුමනි, මේ සියල්ලටම හේතු වුණේ අතිගරු ජනාධිපතිතුමා කෘෂිකර්ම ක්ෂේත්‍රයට දැක් වූ විශේෂ සහයෝගයයි; විශේෂ උනන්දුවයි. අපේ රටේ කෘෂිකර්මාන්තය කෙරෙහි එතුමා තුළ දැඩි විශ්වාසයක් තිබෙනවා. ඒ වාගේම අපේ අවශ්‍යතාවන් අපිම සපුරා ගැනීම සඳහා අපි කටයුතු කළ යුතුය කියන දැඩි විශ්වාසයකින් කටයුතු කරන මුදල් අමාත්‍යවරයෙක් තමයි අපේ අතිගරු ජනාධිපතිතුමා. ඒ නිසා තමයි සෑම වෙලාවේම අපට අවශ්‍ය කරන දේවල් ලබා දෙන්නේ. අද අපි මේ මුදල් අනුමත කරවා ගන්නේත් ඒ අරමුණේ අඩු පාඩුවක් සම්පූර්ණ කරවා ගන්නට ඕනෑ නිසායි.

ගරු කථානායකතුමනි, ඒ නිසා අපි සතුටින් මේ යෝජනා ඉදිරිපත් කරනවා. මේ වන විට අපේ රටේ ආහාර සුරක්ෂිතභාවය ඉතාමත් සාර්ථකව ක්‍රියාත්මක වනවා. ඒ නිසා අපි මේ වැඩ පිළිවෙළ තවදුරටත් ශක්තිමත් කර ගෙන, සියලුම ගොවීන් සම්බන්ධ කර ගෙන කටයුතු කරනවා. විශේෂයෙන් මේ වන විට උතුරු, නැඟෙනහිර පළාතේ ගොවීන් විශාල වශයෙන් ගොවිතැන් කරලා ඒ නිෂ්පාදන දැන් අපේ වෙළෙඳ පොළට එමින් පවතිනවා. ඒ ගොල්ලන්ගේ දායකත්වය අපේ රටේ මිල පාලනයටත් ඒ වාගේම ආහාර සුරක්ෂිතභාවයටත් දැඩි ලෙස බලපෑවා. එයින් අපට විශාල පිටුවහලක් ලැබුණා. ඒ නිසා ඒ ගොවීන්ටත් ලබා දෙන්න පුළුවන් උපරිම පහසුකම් මේ කාලය වන විට අපි ලබා දී තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වැඩසටහන් තුළ ඉදිරි අනාගතය වෙනුවෙනුත් විශාල සැලසුම් රාශියක් තිබෙනවා. විශේෂයෙන්ම උතුරු නැඟෙනහිර පළාත්වල සහ උතුරු මැද පළාතේ ගොවීන් පුනරුත්ථාපනය කිරීම සඳහා අවශ්‍ය කරන වැඩ පිළිවෙළත් දැන් සකස් වෙමින් පවතිනවා. ඒකත් විශාල වැඩ පිළිවෙළක් ගරු කථානායකතුමනි. ඒක ගමේ ගොවිතැනට, ගොවීන්ට අවශ්‍ය කරන සියලුම පහසුකම් ලබා දීමේ වැඩසටහනක්. නව තාක්ෂණය විතරක් නොවෙයි, කෘෂිකර්මාන්තයට අදාළ පාරවල් හදා දෙන්න, ගෙවල් දොරවල් හදා දෙන්න, ඒ වාගේම අවශ්‍ය කරන අනිකුත් පහසුකම් සහ උපකරණ ලබා දෙන්න, සියලුම පහසුකම් එක්ක ගොවිතැනට වුවමනා කරන සියලුම අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා තමයි දැන් මේ වැඩ පිළිවෙළ සකස් වෙමින් යන්නේ. ඒ සඳහා විදේශ ආධාර ලැබේවිය කියා අපි බලාපොරොත්තු වෙනවා. අපට ඒ වැඩ පිළිවෙළ ඉක්මනින් හදා දෙන්න, ඒ සඳහා අවශ්‍ය කරන මුදල් ආධාර අපට ලබා දෙනවාය කියලා මේ වනකොටත් ඒ උදවිය පොරොන්දු වෙලා තිබෙනවා.

මේ වැඩ පිළිවෙළ තුළ තමයි අපේ රටේ කෘෂි කර්මාන්තයේ ඉදිරි අනාගතය දියුණු කරන්නට අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා මෙවැනි වෙලාවකදී පසු ගිය කාලයේදී ආවා වගේ පහරවල් අපට වදින්න පුළුවන්. අපි නිෂ්පාදනය කරන හාල්වල ආසනික් තිබෙනවාය ආදී වශයෙන් විවිධාකාරයේ ගැටලු, ප්‍රශ්න තිබෙනවාය කියා පහර වදින්න පුළුවන්. දැන් අපේ රටේ පාන් පිටි භාවිතය අවම මට්ටමට ඇවිල්ලා තිබෙනවා. දැන් ජනතාව පාන් කන්නේ නැහැ. තුන් වේලටම බත් කන්න තරම් අපේ ජනතාවට වුවමනා කරන සහල් දැන් අපේ රටේ තිබෙනවා. ඒ නිසා සමහරු ඒකටත් අපට යම් යම් ප්‍රශ්න දමනවා. ඒ නිසා අපි ඒ උදවියගෙන් ඉල්ලා සිටිනවා, දෙවියන්ගේ හාල් කැවා නම් කරුණාකරලා නිශ්ශබ්දව ඉන්නය; අනවශ්‍ය කරදර ඇති කරලා අපේ රටේ නැති ප්‍රශ්න හදන්න එපාය කියා. කාලයක් පොල් තෙල්වලටත් ඔය ප්‍රශ්නය මතු කළා.

ගරු කථානායකතුමනි, අපි අපනයනය කරන භාණ්ඩවලින් සියයට 80ක් විතර කෘෂිකර්මය පදනම් කර ගත් අපනයනයි. ඇඟලුම් හැරුණු කොට අනික් සියල්ලම කෘෂිකර්මය පදනම් කර ගත් අපනයනයි. ඉතින් එහෙම වෙලාවක අපි ඒ ගැන කල්පනා කරන්න ඕනෑ. මේ අපනයන අපි ආරක්ෂා කර ගන්න ඕනෑ. අපේ අපනයන වෙළෙඳ පොළ තිබෙන්නේ අප කෙරෙහි විශාල විශ්වාසයක් ඇතිවයි. ඇසිඩ් වර්ෂාවල් ලබන්න තරම් අපේ රට තවමත් අවාසනාවන්ත වෙලා නැහැ. අපේ පරිසරය එහෙම අපවිත්‍ර වෙලා නැහැ. අපේ රටේ පරිසරය ඉතාමත් හොඳයි. තවමත් අපට පිරිසිදු ජලය තිබෙනවා. ඒවා අපිරිසිදු වෙලා නැහැ. අපේ මිනිස්සු කටෙන් මේවා අපිරිසිදු කරන්න හදනවා. වැඩක් නැති දේවල් කතා කරලා මේක අපිරිසිදු කරන්න හදනවා. එහෙම කරන්න එපා. යම් යම් පටු අවශ්‍යතාවන් තිබෙනවා නම් ඒවා වෙනම ලබා ගන්න. දේශපාලන වශයෙන් හෝ තමන්ට වෙන මොනවා හෝ අවශ්‍යතාවක් තිබෙනවා නම් අපේ රටේ account එකට මේවා බැර කරන්නේ නැතිව, රටේ අනාගතය අනතුරේ හෙළන්නේ නැතුව ඒවා වෙනම ලබා ගන්න. එහෙම කටයුතු කිරීම තමයි අපි කාගේත් යුතුකම වෙන්නේ. මේක අපේ රට. අපේ රටේ මොනවා හරි දෙයක් නරකයි කියනවා නම් අපියි ඒ වගකීම භාර ගන්න ඕනෑ. ඒ නිසා අපි එවැනි තත්ත්වයකට යා යුතු නැහැ. ඒ නිසා හැම තිස්සේම ඉවසීමෙන් යුක්තව, විශාල වග කීමෙන් යුතුවයි අපි මේ කටයුතු ගැන ප්‍රකාශ කරන්නේ.

අපි සහල්වල ආසනික් තිබෙනවාය කියන තත්ත්වය දැන ගත්ත දවසේම, මේ චෝදනාව එල්ල කරපු දවසේ ඉඳලාම නියමාකාරයෙන් ඒ අදාළ පර්යේෂණ කළා. නමුත් අවසානයේදී ඒ ගොල්ලත් කියනවා, සහල්වල ආසනික් නැහැ කියා. කෘෂි රසායනවල, වල් නාශකවල මේවා තිබෙන්න පුළුවන්. කවුද නැහැ කියන්නේ? ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, අපි බොන වතුරේත් තිබෙන්න පුළුවන්. අපි ඒ ගැන සොයා බලන්න ඕනෑ. අපි කෘෂි රසායන ද්‍රව්‍ය, කෘමි නාශක ද්‍රව්‍ය ප්‍රතික්ෂේප කරන්නේ ඒ නිසායි. අපි කියනවා, මේවා පාවිච්චි කරන්න එපාය කියා. ඒකෙන් ඇති වැඩක් නැහැ. ඒකෙන් වෙන ලාභයක් නැහැ. බතලගොඩ වී පර්යේෂණායතනයේ අපි පර්යේෂණයක් කර තිබෙනවා, ගරු කථානායකතුමනි. පසු ගිය අවුරුදු 35 ඇතුළත එහි එක කොටසකට පොහොර දමන්නේ නැහැ. වල් නාශක, කෘමි නාශක යොදන්නේත් නැහැ. ඒ කොටසේ ගොයම් ගහ වවන එක විතරයි කරන්නේ. ඉතින් ඒකත් පැහෙනවා. ඒ එක්කම තවත් තැනක තිබෙන වගාවට ඔය කියන ඒවා සේරම කරනවා. ඒකත් පැහෙනවා. නමුත් ඒ දෙක අතරේ වෙනස තමයි අස්වැන්න අඩුකම. කෘෂි රසායන යොදපු එකෙන් 100ක් ලැබෙනවා නම් කෘෂි රසායන නොයෙදූ එකෙන් 60ක් විතර ලැබෙනවා. ඉතින් ඒ 40 ගන්න නේ මේ සා විශාල මුදලක් වියදම් කරන්නේ. කෘමි නාශක, වල් නාශක, පොහොර ආදි දේවල් සියල්ලම යොදලත් අතිරේකව ලැබෙන්නේ 40ක් විතරයි. සමස්තයක් වශයෙන් ගණන් බැලුවාම, අර 40 ලබා ගන්න, 60 ලබා ගන්න යෙදුවාට වැඩිය වියදමක් ගිහින් තිබෙනවා. පසට කරන හානිය, ඒ වාගේම රටේ විශාල ධනස්කන්ධය, පොහොර සහනාධාරය ගැනත් මෙහිදී බලන්න ඕනෑ. නිකම් වාගේ දෙන නිසා අපි පොහොර සහනාධාරය ගන්නවා. නමුත් මේ යූරියා පොහොරවල බරපතළ විසක් තිබෙනවා. ඒකෙන් සියයට 20යි ගොයම් ගහට උරා ගන්නේ. අනික් සියයට 80ම පරිසරයට එකතු වෙනවා. අපේ සමහර ගොවීන් මේක දන්නේ නැහැ. ඒ නිසා තමයි කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් හැම ගමකටම, හැම ගොවිජන

සේවා මධ්‍යස්ථානයකටම ගිහිල්ලා ගොවීන් මුණ ගැහිලා මේවායින් වෙන අපිරිසිදුභාවය සහ මේවායින් වෙන හානිය ගැන කියා දී අපි මේ වැඩ පිළිවෙළ ගෙන යන්නේ.

ඒ වැඩ පිළිවෙළ දැන් ක්‍රියාත්මක කර ගෙන යනවා. ඒක මේ කලබල වෙන්න කලින්, මේ අදහස් ප්‍රකාශ කරන්න කලින් අප ගෙන ගිය වැඩ පිළිවෙළක්. ඉතින් ඒ වැඩ පිළිවෙළ ඉතාම සාර්ථකයි. කෘමිනාශක, වල්නාශක භාවිත කරන්නේ නැතිව, ස්වාභාවික කෘෂිකර්මයෙන් අපට ලබා ගන්න පුළුවන් උපරිම ඵල ලබා ගැනීම සඳහා ගොවීන් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළ දීර්ඝ කාලයක් තිස්සේ අප කර ගෙන ගියා. ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ ඉඳලා තමයි අපි මේ වැඩේ හරියට ආරම්භ කළේ. දැන් ඒ වැඩ සටහන කෙරී ගෙන යනවා. අපි මාතර දිස්ත්‍රික්කය තුළ දැනුවත් කිරීම සම්පූර්ණයෙන් කරලා ඉවර කෙරුවා. සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන සම්බන්ධ කර ගෙන මහාචාර්ය කන්දෙගම මැතිතුමා ගිහිල්ලා දේශන පැවැත්වූවා. උදේ නවයට පටන් ගෙන හවස හතර වනතුරු ඒ දේශන මාලාව අපි ඒ ගොවීන්ට පැවැත්වූවා. ඒ සමහරු ඉතා අගය කෙරුවා ඒ වැඩසටහන. ඒ වැඩ සටහනට ලොකු ඉල්ලුමක් තිබෙනවා. ගරු කථානායකතුමනි, දැන් අපි හම්බන්තොට දිස්ත්‍රික්කයටත් - ඔබතුමාගේ දිස්ත්‍රික්කයට- එනවා මේ වැඩ සටහන අරගෙන. මේ විධියට ලංකාව පුරාම අප මේ වැඩ සටහන ගෙන යනවා. කාලයක් යනවා මේ කටයුත්ත ඉවර කරන්න.

අපේ ගොවියෝ යූරියාවලට පුරුදු වෙලා, ලෙහෙසියටයි, පහසුවටයි ඒවා යොදන්නේ. යූරියා ගැහුවාම සතියක් යන කොට හොඳට ගොයම කොළ පාට වෙලා බොහොම අපූරුවට පෙනෙනවා. ඉතින් ඒක දැක්කාම ආයෙත් සැරයක් යූරියා ගහන්න හිතෙනවා. ගොවියා හිතනවා යූරියා වැඩියෙන් ගැහුව තරමට වැඩියෙන් ලාභ ලැබෙනවා කියලා. අපි අඩුවෙන්, සියයට දහයකට වාගේ මිලකට දැන් පොහොර ලබා දෙන්නේ. ඒ සහනාධාරය නිසා මේ පොහොර භාවිතාව වැඩි වෙලා තිබෙනවා. අපි ඒ ගැන කිව්වාම සමහරු කියනවා, "දැන් මේ පොහොර සහනාධාරය ආණ්ඩුවට දරන්න බැහැ, පොහොර සහනාධාරය නවත්වන්න තමයි මේ කථා කරන්නේ" කියලා. එහෙමත් කියනවා ගරු කථානායකතුමනි. ඒකට තමයි මෙහෙම කියන්නේ කියනවා. එහෙම දෙයක් නැහැ. පොහොර සහනාධාරය මේ රජය තිබෙන තුරු දෙනවාය කියලා අපේ ජනාධිපතිතුමා පැහැදිලිව ප්‍රකාශ කෙරුවා. ඉතින් ඒ ගැන නොවෙයි මේ අපි කථා කරන්නේ. අපි කථා කරන්නේ මේකෙන් වෙන හානිය ගැන. මේ පොහොර යෙදීමෙන් අපේ පසට සහ පරිසරයට බරපතළ හානියක් සිද්ධ වෙනවා. මොකද, පසට උරා ගන්නේ නැති යූරියා ප්‍රමාණය අපේ ජල පද්ධතියට එකතු වෙනවා; ජල පද්ධතිය හරහා අපේ ළිංවලට වැටෙනවා; ළිංවලට වැටුණාම අපි බොනවා; එහෙම නැත්නම් නානවා; ඊට පස්සේ අපි විවිධාකාර රෝගවලට ගොදුරු වෙනවා. මේ තත්ත්වය අපි ගොවි ජනතාවට තේරුම් කරලා දෙන්න ඕනෑ. ඉතින් ඒ වැඩ පිළිවෙළ තමයි ගරු කථානායකතුමනි, හෙමින් සැරේ අපි මේ කර ගෙන යන්නේ.

මෙම වැඩ සටහනට අපි වැඩි ප්‍රචාරයක්, ප්‍රසිද්ධියක් දෙන්න ගියේ නැහැ. ඒක අවශ්‍යත් නැහැ. අපට ඕනෑ, මේ ගැන දැන ගන්න ඕනෑ එක්කෙනා දැන ගන්න එක විතරයි. ගොවියා මේක දැන ගත්තා නම් අපට ඒ ඇති. ඒ වැඩ පිළිවෙළයි ගරු කථානායකතුමනි අප ක්‍රියාත්මක කර ගෙන යන්නේ. මේ විස්තර රූපවාහිනී වැඩසටහන්වලට දීලා, පත්තරයට කියලා, පත්තරයේ headline එකට දමා ගන්න, "අපි තමයි මේකේ වීරයෝ" කියලා රූපවාහිනියේ ලොකුවට මුහුණ දමා ගන්න අපට අවශ්‍ය නැහැ. ගොවියාත් එක්ක ඉතා නිශ්ශබ්දව, ඉතා සාර්ථකව මේ ගමන යැමයි අපට වුවමනා කළේ.

ගරු කථානායකතුමනි, මේ මුදල් අපතේ යන්නේ නැහැ. කෘෂිකර්මාන්තයට කොයි ආකාරයෙන් මුදල් යෙදුවත් ඒවා අපතේ යන්නේ නැහැ. ඒක රටේ ජාතික ධනයට කරන ආයෝජනයක්. පාර්ලිමේන්තුවේ මොන නීතිය රීතිය කඩලා හරි මේ නියම සම්මත කරලා දෙන එක අපේ වග කීමක්, යුතුකමක් වෙනවා. එහෙම විශාල, බරපතළ නීතියක් කැඩුණාත් නොවෙයි. දින කීපයක් පරක්කු වුණා කියලායි මේ චෝදනාවක් එල්ල කරන්නේ. එහෙම වෙන්න පුළුවන් ඉතින්. මේ පාර්ලිමේන්තුව ඉතාම කාර්ය බහුල ආයතනයක්. මේ කටයුතුවලදී සතියක් දෙකක් ප්‍රමාද වනවාය කියන එක බරපතළ තර්ජනයක් හැටියට, අවභාවිතයක් හැටියට සලකන්න නරකයි.

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා මේ සෑම මුදලක්ම අපට දෙන්නේ මේ රටේ සංවර්ධනය සඳහා; මේ රටේ යහපත සඳහා. ඒකට කවුරුවත් හරස් වෙන්න නරකයි. ඒක හොඳ නැහැ. මොකද, මේක අප කාගේත් රට. අප මොනවා කථා කළත් අවසානයේ මේක අපේ රට. මේ රටේ නරකක් වුණොත් අපි සියලු දෙනාටම නරකයි. මේ රටේ හොඳක් වුණොත් අප සියලු දෙනාටම, නැත්නම් කීප දෙනෙකුට හරි හොඳක් වෙයි. ඉතින් ඒ නිසා මේ වැඩ පිළිවෙළ අපි අගය කරනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා අපට දුන්නු සහයෝගයට -මේ වැඩ පිළිවෙළට මේ මුදල් අනුමත කර දෙන්නට ඔබතුමා දරන සහයෝගයට- මගේ ගෞරවණීය ප්‍රණාමය සහ ස්තුතිය පළ කරමින් මගේ වචන ස්වල්පය හමාර කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා[ගරු චන්දිම වීරක්කොඩි මහතා ] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

[අ. භා. 3.15]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන රටක පුරවැසියකු වශයෙනුත්, ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙනුත් මම අද කථා කරන්නේ බොහොම කනගාටුවෙන්.

1946 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය තොරතුරු ලබා ගැනීමේ නිදහස මූලික මිනිස් අයිතිවාසිකමක් වශයෙන් පිළිගෙන තිබෙනවා. ඒ අනුව තමයි විපක්ෂය වෙනුවෙන් මම අද ඉදිරිපත් කළේ, ලෝකයේ රටවල් 85ක දැනටම නීතිගත කරලා තිබෙන, ඒ වාගේම තවත් රටවල් 16ක් නීතිගත කරන්න බලාපොරොත්තු වන, ප්‍රජාතන්ත්‍රවාදි රටවල් අගය කරන තොරතුරු ලබා ගැනීමේ නිදහස පිළිබඳ පනත් කෙටුම්පත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තේරුම් ගන්න අමාරුයි විපක්ෂයේ මන්ත්‍රීවරයකු ඉදිරිපත් කළාම ඇයි මේ තරම් මේ පනත් කෙටුම්පතට විරුද්ධ වන්නේ කියලා. මේ පනත්

[ගරු කරු ජයසූරිය මහතා]

කෙටුම්පතම රජයෙන් ගෙනාවොත් ඒක අනුමත කරන්න පුළුවන් නම්, ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන විපක්ෂයේ මන්ත්‍රීවරයකු සද්භාවයෙන් ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කළාම මේ විධියට විරුද්ධ වෙලා, ඝෝෂා කරලා පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම සම්පූර්ණයෙන්ම කඩාකප්පල් කිරීමට දරන උත්සාහය පිළිබඳව මට තේරුම් ගන්න අමාරුයි. මම ඒ ගැන කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි ඒ වාගේම ඔබතුමාගේ දැන ගැනීම සඳහා මම කියනවා, සාක් රටවල් අතරින් ඉන්දියාවත්, පාකිස්තානයත්, නේපාලයත්, බංග්ලාදේශයත් මෙවැනි පනත් කෙටුම්පතක් අනුමත කරලා තිබෙන බව. ඒ වාගේම මේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියේ වටිනාකම තේරුම් ගත්තු 2001-2004 රනිල් වික්‍රමසිංහ රජය 2004 දී මේ තොරතුරු ලබා ගැනීමේ පනත් කෙටුම්පත පළමු වරට ඉදිරිපත් කළා. නමුත් 2004 දී රජය හදිසියේ විසුරුවා හැරුණු නිසා මේ පනත් කෙටුම්පත අහෝසි වුණා. මට මතකයි එදා අප මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන කොට එවකට පැවැති විපක්ෂය මේ සඳහා අපට සම්පූර්ණයෙන්ම සහාය දුන් බව. අද ඒ විපක්ෂය ආණ්ඩු බලයේ ඉන්න කොට ඊට වෙනස් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමත් මට තේරුම් ගන්න අමාරුයි.

ලෝකයේ ඕනෑම තැනක සිදු වන දේ සැණෙකින් දැන ගැනීමේ අවස්ථාව දැන් ලැබී තිබෙනවා. විශේෂයෙන්ම තාක්ෂණය දියුණු වීමත්, ජනතාවගේ දැනීම පුළුල් වීමත් මේ සඳහා ප්‍රමුඛ වෙනවා. පොදු ජනතාවට මේ අයිතිය නැති, දකුණු ආසියාවේ එකම රට ලංකාවයි. ඒකත් කනගාටුදායක කරුණක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය රජයන සමාජයක් ශක්තිමත් වන්නේ මෙන්න මෙවැනි අයිතීන් ලබා දීමෙන්. මා කාරණයක් සඳහන් කරන්න කැමැතියි. ඇමෙරිකා එක්සත් ජනපදයේ උපජනාධිපති ධුරයට රිපබ්ලිකන් පක්ෂයෙන් තරග වැදුණු ඇලස්කාවේ හිටපු ආණ්ඩුකාර සාරා පැරින්ට දැනට සති කීපයකට පෙර නීතියෙන් අණ කෙරුණා, ඇයගේ නිල කාලය තුළ යවන ලද සියලුම විද්‍යුත් තැපැල් හා ලිය කියවිලි මහ ජනතාවට විවෘත කරන ලෙස. ඒ නීතිය හඳුන්වන්නේ තොරතුරු ලබා ගැනීමේ අයිතිය ලබා දෙන නීතියක් වශයෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුද්ධය කාලයේ සිදු වූ අපි ගනුදෙනු පරීක්ෂා කිරීමට පත් කළ කොමිසමේ වාර්තාව ජනාධිපතිතුමාට භාර දී ඇතත්, විවිධ හේතූන් මත එය හෙළි නොකිරීමට තීරණය කර ඇති බව පුවත් පත්වල තිබෙනවා අපි දැක්කා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව ජූනි 12වැනි දා "Sunday Island" පුවත් පතේ පළ වූ ඉතාම වැදගත් කතුවැකිය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරන්න කැමැතියි.

හිටපු හමුදාපතිවරයාට -ජනාධිපති අපේක්ෂකයාට- සුළු චෝදනාවකට හමුදා අධිකරණය මඟින් දඬුවම් ලැබී තිබෙනවා. පසු ගිය දා වෙළඳ කලාපයේ සිදු වූ තරුණ ඝාතනය ගැන පත් කළ ඒක පුද්ගල කමිටුවේ වාර්තාවත් ජනතාවගෙන් තවදුරටත් වසන් කරලා තිබෙනවා. කිලෝමීටරයකට රුපියල් මිලියන 20ක් පමණ වියදම් කරපු පාරක් ගැන පසු ගිය දා මේ පාර්ලිමේන්තුවේදී විවේචනය වුණා. ඒ වාගේම අසීමිත මුදලකට ලබා ගත් පාලම් ගැනත් පසු ගිය දා මේ සභාවේ විවේචනය වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප විශ්වාස කරන අන්දමට මේ තොරතුරු ජනතාවට ලබා දීමෙන් රජයට කීර්තියක්, ගෞරවයක් මිස අපකීර්තියක් හෝ අගෞරවයක් ලැබෙන්නේ නැහැ. අද ඉන්දියාවේ සිවිල් සමාජයේ නායකයන් වන අනා හසාරේ හා බබා රන්දෙව් වැනි ඇය සමහර කරුණුවලදී ඉන්දියානු ජන නායකයන්ගේ හා රජයේද සහයෝගයෙන් දූෂණයට විරුද්ධව ක්‍රියා කිරීම අපට, මේ රටට ආදර්ශයක්.

විපක්ෂයේ මන්ත්‍රීවරයකුගේ අයිතිය සුරක්ෂිත කරමින් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ගරු කථානායකතුමාටත්, ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால)
(The Hon. H.R. Mithrapala)

ගරු මන්ත්‍රීතුමනි, පොඩි පැහැදිලි කිරීමක් කර ගන්න පුළුවන්ද?

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

මම කථා කරලා ඉවර වුණාට පසුව පැහැදිලි කරන්නම්.

මේ අවස්ථාවේ දී අප රජයට කියන්නේ රජයෙන් ඉදිරිපත් කළත්, විපක්ෂයෙන් ඉදිරිපත් කළත්, එය ජාතික වැදගත්කමින් යුත් පනත් කෙටුම්පතක් බවයි. එය ඉදිරිපත් කළේ සද්භාවයෙන්. රජය අපහසුතාවට පත් කිරීමට හෝ අපට ලකුණු දමා ගැනීමේ අවශ්‍යතාවක් හෝ අප තුළ නැහැ. මෙම පනත් කෙටුම්පත මුලින්ම අප ඉදිරිපත් කළේ පසුගිය සැප්තැම්බර් මාසයේ යි. ඒ අවස්ථාවේ රජය විසින් පනත් කෙටුම්පතක් ගෙන එන බවටත්, ඒ වාගේම ඉක්මනින් ඉදිරිපත් කරන බවටත්, එදා ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සඳහන් කළ නිසා අපි ඒ පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගත්තා. ඒ නිසා අපි සිවිල් සමාජයේ දෝෂාරෝපණයටත් ලක් වුණා. දැනටමත් මාස නවයක් කල් ගත වී ඇති නිසා අපේ යුතුකමක් තිබෙනවා, මේ වැදගත් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට. ඒ නිසා අපට කොච්චර දෝෂාරෝපණය කළත් මේක විපක්ෂයේ අපේ යුතුකමක් කියලා අප කල්පනා කළා. පොදුවේ විපක්ෂයේ අප සියලු දෙනාම එකතු වෙලා තමයි මෙය තීරණය කළේ. මේක මගේ පෞද්ගලික මතයක් නොවෙයි. මුළු විපක්ෂයේම මතය වන්නේ, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට තවත් කල් ගත කරන්නට බැහැ කියන එකයි. ලෝකයේ රටවල් අසූ ගණනක් මෙය පාවිච්චි කරනවා නම්, තවත් රටවල් 16ක් දැනට මේ ගැන කටයුතු කරගෙන යනවා නම්, දකුණු ආසියාවේ අපට පමණක් නොමැති මේ අයිතිය මේ රටේ ජනතාවට ලබා දීම අපේ යුතුකමක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා රජයෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, රජය ඉදිරිපත් කරන පනත් කෙටුම්පතත්, මේකත් දෙකම එකට එකතු කරලා බලලා, මෙහි අඩු පාඩු තිබෙනවා නම් සකස් කරලා, වෙනම පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්නය කියලා. අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි කිසිම විටක කියන්නේ නැහැ, මේ අපි ඉදිරිපත් කළ පනත් කෙටුම්පතම පිළිගන්නය කියලා. මේ පනත් කෙටුම්පතේ යම් යම් යෝජනා තිබෙනවා. එම යෝජනාත් බලලා, රජයෙන් ඉදිරිපත් කරන පනත් කෙටුම්පතත් බලලා, මේ අයිතිය මේ රටේ ජනතාවට ලබා දෙන්නය කියලා තමයි විශේෂයෙන්ම මේ අවස්ථාවේ දී අපි රජයෙන් ඉල්ලා සිටින්නේ.

අවසාන වශයෙන් මේ ගැනත් මා සඳහන් කරන්නට කැමැතියි. මේ ගැන කථා කරනකොට ජෝන් කෙනඩි ජනාධිපතිවරයාගේ ප්‍රසිද්ධ කියමනක් මට මතක් වුණා.

"The nation that is afraid to let its people judge the truth or falsehood is a nation that is afraid of its people.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

The dangers of unwarranted concealment of pertinent facts far outweigh the dangers which are cited to justify it".

සත්‍ය හෝ අසත්‍ය කුමක් දැයි තීරණය කිරීමේ අයිතිය සිය ජනතාවට ලබා දීමට බිය පත් වන ජාතිය තමන්ගේ ජනතාව ගැන බියෙන් පසු වන ජාතියක්. අදාළ වන කරුණු සැඟවීමට ගන්නා අනවශ්‍ය උත්සාහයේ පවතින අනතුරු එසේ සාධාරණීකරණය කිරීමට තැත් දරන අනතුර ඉක්මවා යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට ගරු රෝහණ දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා.

[අ. භා. 3.23]

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2010 අංක 7 දරන විසර්ජන පනත යටතේ යෝජනා 10ක් සාකච්ඡා කරන මේ වෙලාවේ ඒ පිළිබඳව වචනයක් කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා සතුටු වෙනවා.

විශේෂයෙන් මෙහිදී සාකච්ඡා කෙරෙන කරුණු කාරණා දිහා බලපුවාම රජයේ කර්මාන්තශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම, දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම, අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම, කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම ඒ වාගේම බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු අත්තිකාරම් ගිණුම, වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා අත්තිකාරම් ගිණුම ආදී වශයෙන් කරුණු 10ක් සම්බන්ධයෙනුයි සාකච්ඡා කරන්නේ.

ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු දැන ගැනීම සම්බන්ධයෙන් වූ එතුමාගේ යෝජනාව ගැන එතුමා මේ වෙලාවේ කථා කළා. එතුමා පිළිබඳව මා පෞද්ගලිකව දන්නවා. එතුමා කොළඹ නගරාධිපතිවරයා වශයෙන් කටයුතු කරන කාලයේ මා මාතලේ මහ නගරාධිපතිවරයා වශයෙන් එතුමා සමඟ ඉතාමත් කිට්ටු සම්බන්ධතාවකින් කටයුතු කළා. එතුමාගේ අදහස් උදහස් ගැන අපි නිරන්තරයෙන් අවබෝධ කර ගෙන සිටිනවා. හැබැයි එතුමා අද ගෙනාපු යෝජනාවත් එක්ක මා එකඟ වෙන්නේ නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකට හේතුවක් තිබෙනවා. අද ලෝකය දිහා බලපුවාම ලෝකය ඉතාම වේගයෙන්, ශීඝ්‍රයෙන් නව තාක්ෂණයත් එක්ක ඉස්සරහට යනවා. අද අපි මේ ලෝකයට කියනවා විශ්ව ගම්මානයක් - Global Village - කියලා. මේ විශ්ව ගම්මානය තුළ තාක්ෂණය දියුණුයි. අද ඇමෙරිකාවේ මේ මොහොතේ සිද්ධ වන දේ, රුසියාවේ මේ මොහොතේ සිද්ධ වන දේ, ඉන්දියාවේ මේ මොහොතේ සිද්ධ වන දේ පිළිබඳව තොරතුරු අන්තර් ජාලය ඔස්සේ අපට බොහොම ලෙහෙසියෙන්, පහසුවෙන් බලා ගන්න පුළුවන් යුගයකටයි අපි පිවිසිලා ඉන්නේ. අපි අභ්‍යවකාශය ජය ගත්තා. අපි සඳ ජය ගත්තා. ඒ වාගේම අඟහරු ඇතුළු වෙනත් ග්‍රහලෝකවලට යන යුගයකයි අපි අද ඉන්නේ. විශේෂයෙන් අද නාසා ආයතනයේ යම් කිසි වැඩක් කරන කොට, රුසියාවේ යම් කිසි වැඩක් කරන කොට, සොයිස් යානා යවන කොට අපට ලංකාවේ ඉඳ ගෙන ඒක බලන්න පුළුවන් දියුණු තත්ත්වයකට අද ලෝකය පත් වෙලා තිබෙනවා.

විශේෂයෙන් අපේ රට දිහා බලපුවාම අපේ තොරතුරු තාක්ෂණය ඉතාම දියුණුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මෙම සාකච්ඡාව පැවැත්වෙන නිසා මම උදේ අන්තර්ජාලයට ගිහිල්ලා වෙබ් පිටුව ඔස්සේ ලංකා ගමනාගමන මණ්ඩලය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ඒ වාගේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අලුත් වැඩසටහන් පිළිබඳව බැලුවා. අන්තර්ජාල පහසුකම් මත අපට ඒ තොරතුරු සියල්ල වහාම ලබා ගන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුවේ ගරු මැති ඇමතිවරුන් 225 දෙනකුට විමර්ශන නිලධාරින් 225 දෙනෙක් දීලා ඉන්නවා. ඒ, උපාධිධාරි නිලධාරි මහත්වරුන්. ඒ නිලධාරි මහත්වරුන් ලවා නිසි ලෙස, කලට වේලාවට, ලතාවට, කලාවට මේ ඔක්කෝම තොරතුරු ලබා ගැනීමේ හැකියාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දීලා තිබෙනවා. ඉතින් මේ තරම් තාක්ෂණය දියුණු අවස්ථාවක, බොහොම වේගයෙන් කටයුතු කරන අවස්ථාවක, විශ්ව ගම්මානයක අපි අලුතින් තොරතුරු දැන ගැනීමට ගෙන ආ යුතු පනත් මොනවාද කියා මට නම් තේරෙන්නේ නැහැ. ඒ නිසා මා එතැනදී ඒ කාරණයට එකඟ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉදිරිපත් කර තිබෙන යෝජනා සම්බන්ධයෙන් අපේ ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා කථා කළා. අද අපේ රටේ නිෂ්පාදන පිළිබඳව, අපේ ජාතික ආර්ථිකය දියුණු කිරීම පිළිබඳව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ අප රජය ඉතා සුවිශේෂී ක්‍රියාමාර්ග රාශියක් අරගෙන තිබෙන වෙලාවක් මේ. "දිවි නැඟුම" වැඩ පිළිවෙළ, "මඟ නැඟුම" වැඩ පිළිවෙළ ඒ වාගේම "අපි වවමු - රට නඟමු" වැඩ පිළිවෙළ මේ වන විට ක්‍රියාත්මක වනවා. මේ රටේ ජාතික ආර්ථිකය දියුණු කරන්න හැම ක්ෂේත්‍රයක් ඔස්සේම මේ වන විට කටයුතු කරලා තිබෙනවා. දැන් ඊයේ පෙරේදා වනකම් කින්නියා පාලම මේ රටේ දිගම පාලම බවට පත් වෙලා තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෙට අනිද්දා වන කොට ඔබතුමා නියෝජනය කරන දකුණු පළාතේ අධිවේගී මාර්ගය විවෘත කෙරෙන කොට දිගම පාලම් එහි තිබෙන පාලම් බවට පත් වෙනවා. ඉතින් රජය ගන්නා සංවර්ධන ක්‍රියාමාර්ග දවසින් දවස, මොහොතින් මොහොත වෙනස් වන අවස්ථාවකයි අපි ඉන්නේ.

විශේෂයෙන් මා ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කරන මේ අවස්ථාව, දුම්රිය දෙපාර්තමේන්තුව සහ ප්‍රවාහන අමාත්‍යාංශය මේ රටේ මේ අලුත් සංවර්ධනයත් එක්ක එකට බද්ද වෙලා, එකට අනුගත වෙලා අවධියෙන් සිටින ක්ෂේත්‍රයක් වශයෙන් සංවර්ධනය කරන්න කටයුතු කරන අවස්ථාවක් බව කියන්න ඕනෑ. අද දින දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුමත් මෙහිදී සාකච්ඡා කරනවා. දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම මිලියන 1,300 ඉඳලා මිලියන 1,800 දක්වා වැඩි කරන්නයි අපි අද සාකච්ඡා කරන්නේ.

ඔබතුමා දන්නවා, 1864 වර්ෂයේ තමයි මුලින්ම අපේ රටේ දුම්රියක් කොළඹ සිට අඹේපුස්සට ගියේ කියලා. එතැනින් පස්සේ අද වෙන කොට කිලෝමීටර් 1508ක දුරකට මේ රටේ දුම්රිය ක්‍රියාත්මක වනවා. විශේෂයෙන් අද වන කොට දුම්රිය මගීන් සංඛ්‍යාව දිනකට 2,47,233ක් වෙනවා. ඒක දවසින්, දවස යම් ආකාරයක වෙනස් වීම් වෙනවා. ඒ වාගේම දිනකට ධාවනය වන කිලෝ මීටර් සංඛ්‍යාව 25,363ක්. ඒ වාගේම අපට දුම්රිය එන්ජින් 81ක් තිබෙනවා. ඊයේ වෙන කොට දුම්රිය 51ක් ධාවනය වෙනවා. ඒ වාගේම බලවේග කට්ටල - power sets - 51ක් තිබෙනවා.

[ගරු රෝහණ දිසානායක මහතා]

දුම්රිය ගමන් ප්‍රවේශපත්‍ර සඳහා මසකට වියදම් කරන මුදල රුපියල් 74,16,990ක්. වාර ප්‍රවේශ පත්‍රයක සාමාන්‍ය මුදල ශත 55ක්. ඒ වාගේම මාසික වාර ප්‍රවේශපත්‍ර ආදායම රුපියල් 85,043,684ක්. සේවකයින් 16,100ක් ඉන්නවා. 2010 ආදායම රුපියල් 401,835,371ක්. මම හිතන්නේ මේ ආදි වශයෙන් දුම්රිය සේවාව අද අලුත් සංවර්ධනයට දායක වනවාය කියායි. මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයට සියයට හයයි දශම ගණනකින් දුම්රිය සම්බන්ධ වෙනවා. විශේෂයෙන් රාජ්‍ය සේවකයන්, පාසල් ශිෂ්‍යයන්, කම්කරු ජනතාව, ඒ වාගේම කෘෂිකර්මික වගාවන් කරන අයගේ කෘෂිකාර්මික භෝග, ඒ කර්මාන්ත මේ රටට ගෙන එන්න, කොළඹට ගෙන එන්න දුම්රිය ක්ෂේත්‍රය සම්බන්ධ වෙනවා. දුම්රිය මඟින් ආදි කාලයේ නම් තේ ගෙනාවා; කෝපි ගෙනාවා.

විශේෂයෙන් මේ කටයුතු ක්‍රියාත්මක කරන ගමන් අද දවසේ තෙල් ප්‍රවාහනයෙන් සියයට 70ක් දුම්රිය මඟිනුයි සිදු කරන්නේ. අපි බලාපොරොත්තු වනවා, මේ තෙල් ප්‍රවාහනය කරන ප්‍රමාණය ඊට වඩා වැඩි කරන්න. ඒ වාගේම අපි බලාපොරොත්තු වනවා, සියයට 6ක් වන මඟී ප්‍රවාහනය "මහින්ද චින්තන ඉදිරි දැක්ම" ක්‍රියාත්මක කිරීම තුළ අඩුම තරමින් සියයට 15ක් දක්වා ගෙන එන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා එවැනි කටයුතු කරන්න අපි ගාව තිබෙන බලවේග කට්ටල, එන්ජින් දිහා බැලුවාම, විශේෂයෙන් 1955 ගෙනාපු එම්1 දුම්රිය එන්ජින් එකත් අපි ගාව තවම තිබෙනවා. ඒක අද ධාවනය කරනවා. ඒ වාගේම එම්2, එම්4, එම්5 විතරක් නොවෙයි අද වෙන කොට එම්9 දුම්රිය එන්ජිමත් ධාවනය වෙනවා. අපට මතකයි එම්9 දුම්රිය එන්ජින් එක 2000 දී ප්‍රංශයෙන් ගෙනාපු බව. ඒ සමාගම අද නැහැ. එදා පළමු වැනි දුම්රිය එන්ජින් ගෙනාපු සමාගම අද දකින්න නැහැ. ඒ සැපයුම්කරුවන් අද දකින්න නැහැ. හැබැයි ඒ සැපයුම්කරුවන් අද දකින්න නැති වුණාට දුම්රිය අයිතමයන් අපේ ගබඩාවල තිබෙනවා.

අපේ දුම්රියක් කැඩුණු ගමන් -break down වුණු ගමන්- අපට පුළුවන්කම තිබෙන්න ඕනෑ දුම්රිය එන්ජින් එක අංගනයට ගෙන ගිහිල්ලා නවත්වලා වහාම ඒක පහුවදාට නැවත සේවය යෙදවීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න. දුම්රිය ගබඩාවේ ලක්ෂ ගණනක් අයිතමයන් තිබෙනවා. දුම්රිය එන්ජින් එකක් හදන්න මම හිතන්නේ අයිතමයන් 66,000ක් අවශ්‍යයි කියායි. අලුතෙන් එවලා තිබෙන ජීප් එකක්, කාර් එකක් හදන්න 2,75,000ක් විතර කෑලි අවශ්‍යයි. නට්ස් වෙන්න පුළුවන්, රබර් වෙන්න පුළුවන්, බ්‍රේක් වෙන්න පුළුවන්, වොෂර් වෙන්න පුළුවන් මේවා සඳහා අමතර කොටස් අවශ්‍ය වෙනවා. දුම්රිය අංගනයේ අතිරේක ගබඩා ගිණුමට අනුව මේවාට අවශ්‍ය අමතර කොටස් අපි ගබඩා කරලා - store කරලා - තියන්න ඕනෑ. ඒ වාගේම දුම්රිය එන්ජින් එකක් ආවාම, මැදිරියක් ආවාම, ෆෑන් එකක් ගැලවුණාම, මඟී ජනතාවට පහසු ලෙස ඒ ගමන් බිමන් යන්න, ඔවුන්ට අවශ්‍ය දේ ලබා දෙන්න අපි අවශ්‍ය වැඩ කටයුතු සකස් කරන්න ඕනෑ. ඉතින් ඒක නිසා තමයි අපි ඉල්ලන්නේ මේක මිලියන 1300 ඉඳලා 1800 දක්වා වැඩි කරන්න කියලා. මේකත් මදි.

විශේෂයෙන් අපි කියන්න ඕනෑ අද මේ රටේ ජනතාවට විවිධාකාරයේ සහනාධාර ලබා දෙන බව. ඩීසල් සහනාධාරය, ත්‍රීවීලර් සඳහා ලබා දෙන පෙට්‍රල් සහනාධාරය, සමෘද්ධි සහනාධාරය, සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන සහනාධාරය, පොල් සහනාධාරය, තේ සහනාධාරය, එළවලු ආදී දේවල් නිෂ්පාදනය කරන්නට ලබා දෙන සහනාධාරය වාගේ විශාල සහනාධාර ප්‍රමාණයක් ලබා දෙන රටක් තමයි අපේ රට. අද අපි ආසනික් ගැන කථා කරනවා. නොයෙක් කුමන්ත්‍රණකාරී විධියට සතියෙන්, සතිය අලුත් මාතෘකා යොදා ගෙන මේ රජය අප්‍රසාදයට පත් කරන්න කථා කරනවා. හැබැයි රුපියල් කෝටි 20,000ක් පමණ වියදම් කර මේ ලබා දෙන සහනාධාර ගැන කිසි කෙනෙකු කථා කරන්නේ නැහැ. අධ්‍යාපන ක්ෂේත්‍රය, සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන කථා කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ආරෝග්‍යශාලාවකට ගිහිල්ලා පුංචි operation එකක් කරන්න රුපියල් ලක්ෂ තුනක් විතර වියදම් වෙනවා. හැබැයි, ඒ operation එක -ඒ ශල්‍යකර්මය- කර ගත්තු ඒ අසනීප වුණු කෙනා දන්නේ නැහැ ඔහු වෙනුවෙන් රජය ලක්ෂ තුනක් වියදම් කළා කියලා. මම නියෝජනය කරන මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මහ රෝහල ගැන බැලුවොත් එක දවසකට ශල්‍යකර්ම 90ක් විතර කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් ලක්ෂ තුන ගණනේ ඒ ගණන වැඩි කරලා බලන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආදි වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් දෙන ඒ සහනාධාරය ගැන කථා කළොත්, ලක්ෂ 19ක් වන සමෘද්ධි ජනතාවට ලබා දෙන සහනාධාරය ගැන කථා කළොත්, ඩීසල් සහනාධාරය ගැන කථා කළොත් මේවා ජනතාවගෙන් අය කරන්න ගියා නම් මේ රට තිබෙන්නේ කොතැනද? ඒ නිසා අද එක්සත් ජාතික පක්ෂය දකින්න ඕනෑ මේ රටේ සැබෑ තත්ත්වයයි. අපේ රජය ක්‍රියාත්මක කරන මේ සහනාධාර ක්‍රම, සමාජ සුභසාධන ක්‍රියාවලීන් ඒ වාගේම ජනතාවගේ සුබවිහරණය සඳහා, සුභ සිද්ධිය සඳහා ඒ ගෙන යන වැඩ පිළිවෙළ කොතරම්ද කියා බලන්න. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ මොකක්ද? ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ ජනතාවගේ නිදහසයි. ඒ නිදහස ලබා දෙන්න නම් අපට ජනතාව බඩ ගින්නේ තියලා ඒ නිදහස ලබා දෙන්න බැහැ. අද "දිවි නැඟුම" වැඩසටහන ක්‍රියාත්මක කරනවා. "දිවි නැඟුම" වැඩසටහන ක්‍රියාත්මක කරලා කරන්නේ මොනවාද? අද මේ රටේ පවුල් දස ලක්ෂයක් සවිබල ගන්වනවා.

අද අපි කථා කරනවා ආසනික් ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "දිවි නැඟුම" යටතේ පවුල් දස ලක්ෂයක් තමන්ගේ ගෙවත්තේ වගා කරන්න පෙළෙඹෙන කොට ඔවුන් හෙට කන මෑකරල් කරලට, හෙට කන බණ්ඩක්කා කරලට, හෙට කන ගොටුකොළවලට බෙත් හේත් ගහයිද? නැහැ. ඔවුන් කාබනික පොහොර යොදලා නැහැ. ඔවුන් කාබනික පොහොර යොදා තමන්ගේ සුරක්ෂිත ආහාර වේලක්, ශරීරයට උචිත පරිදි සමබර ආහාර වේලක් සකස් කර ගන්න තමයි කටයුතු කරන්නේ. එම නිසා ආසනික් කියන එක ගැන මා කල්පනා කරන්නේ මෙයයි. මාර්තු මාසයේ සිට ජූනි මාසය වන තුරු යල් කන්නය. දැන් ආසනික් ගැන කථා කරනවා. යල-මහ කන්නයට අතුරු කන්නයක් වගා කළ අතීත යුගය බලන්නේ නැහැ. වැව් දහස් ගණන් හදා අඩිය-අඟලට සමතලා කරලා හදලා යෝධ ඇළ වාගේ වාරි මාර්ග ක්‍රම හදා තිබෙනවා. ගරු එස්. සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා කියාවි, අනුරාධපුරයේ යෝධ ඇළ ගැන; කලා වැවේ සිට තිසා වැව දක්වා, නුවර වැව දක්වා වතුර ගෙන යන වාරිමාර්ග ක්‍රම ගැන. මේ ක්‍රමවේදයන් ගැන බලන්නට ඕනෑ. අදත් මේ රටේ කෘෂි කාර්මික ක්ෂේත්‍රය සංවර්ධනය කරන්න විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. වැව් ටික අලුතෙන් කපනවා. වාරිමාර්ග ක්‍රම ටික අලුතෙන් හැදෙනවා. මේවා ක්‍රියාත්මක වෙනකොට ජනතාව කාබනික පොහොර යොදාවි. කාබනික පොහොර යොදා ගෙන ඒ සංවර්ධන කටයුතු කරාවි. ඒකයි ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා "දිවි නැඟුම" ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙන්නේ. අද"දිවි නැඟුම" ව්‍යාපෘතියට පවුල් දස ලක්ෂයක් එක්කාසු වී තිබෙනවා.

මේ පාර්ලිමේන්තුවේ අපේ ආණ්ඩු පක්ෂයේ හැම මන්ත්‍රීවරයෙක්ම වාගේ ගොවියෝ. ගරු රොෂාන් රණසිංහ මන්ත්‍රීතුමා, ගරු රුවන් රණතුංග මන්ත්‍රීතුමා, ගරු එස්. සී. මුතුකුමාරණ මන්ත්‍රීතුමා. මේ මන්ත්‍රීතුමන්ලා අද හොඳ ගොවියෝ. ගෙදර ගිහින් ඔවුන් පැළ ටිකක් හදනවා, අද තමන්ගේ ගෙදර ආහාර සුරක්ෂිත කර ගන්න. අද ඒ වාගේ නායකත්වය විසින්

නායකත්වයන් හදා ගෙන තිබෙනවා, ඒ ඒ ප්‍රදේශවල. ආදර්ශයක් ලබා දෙනවා. ඒ විධියේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක වනවා. අවවාදට වඩා ආදර්ශය උතුම් ය කියන බුදුරජාණන් වහන්සේගේ දේශනාව විධියට තමයි අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා කටයුතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා විශේෂයෙන් මේ කාරණය කියන්නට ඕනෑ. අද අපේ දුම්රිය දෙපාර්තමේන්තුවේ බලාපොරොත්තුව වේගවත් ලෙස දුම්රිය ධාවන කටයුතු කරන්නටයි. අපට හෙට අනිද්දා වෙනකොට කොළඹ සිට ගාල්ල, මාතර දක්වා පැය දෙකකදී යන්න පුළුවන්. අධිවේගී මාර්ග ඒ පැත්තෙන් හැදෙනකොට මෙහෙ දුම්රිය මාර්ග හැදෙනවා. දුම්රියේ අපට වේගයෙන්, පහසුකම් සහිතව ගමන් කරන්නට පුළුවන් නම් පාරට එන වාහන තදබදය හුඟක් අඩු වෙනවා. ඒක තමයි රටක දියුණුවය කියන්නේ. ඒක තමයි රටක සංවර්ධනය කියන්නේ. අන්න ඒ දේවල් කරනකොට පුංචි දෙයක් අල්ලා ගෙන කථා කරනවා. අපේ සංවර්ධනය දකින්නේ අර තේ කෝප්පයේ කිඹුලා දකින්නා වාගෙයි. තේ කෝප්පයේ කිඹුලා දකින විධියට තමයි අද එක්සත් ජාතික පක්ෂය කටයුතු කරන්නේ. ඒ ගැන භය වන්නට අවශ්‍ය නැහැ. මේ සංවර්ධනය දකින්න පුළුවන්.

තොරතුරු තාක්ෂණය දියුණු වූ රටේ අද laptop එකක් අරගෙන mouse එක click කර අපට පුළුවන් අන්තර්ජාලයට යන්න; අන්තර්ජාලයට ගිහින් තොරතුරු සොයා ගන්න. තොරතුරුවලින් සංවර්ධනය වූ රටක, තාක්ෂණය දියුණු වූ රටක, විශ්ව ගම්මානයක අපට අලුතෙන් ගෙන එන අණපනත් මොනවා ද කියා අප කල්පනා කරන්නට ඕනෑ. විශේෂයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උපරිම වියදම් සීමාව රුපියල් දස ලක්ෂ එක්දහස් තුන්සියයක්, අවම ලැබීම් සීමාව රුපියල් දස ලක්ෂ අට සියයක්, උපරිම හර ශේෂ සීමාව රුපියල් දස ලක්ෂ හාර දහස් හැට හතක්. උපරිම බැරකම් සීමාව රුපියල් දස ලක්ෂ පන්සියයක්. දැන් මෙය වැඩි කරන්නයි අප ඉල්ලා සිටින්නේ. එම නිසා අද මේ පාර්ලිමේන්තුවේදී අප ඉතාම සතුටු වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි ඔබතුමාගේ, ගරු කථානායකතුමාගේ සහයෝගය ලබා දී අපේ ආර්ථිකයට සෘජුවම බලපෑමක් කරන මේ යෝජනා අනුමත කිරීමට අවස්ථාව ලබා දීම ගැන. ඒ වාගේම හෙට අනිද්දා වනකොට භාණ්ඩ ප්‍රවාහනය -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට නියමිත කාලය අවසාන වෙනවා.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තත්පරයක කාලයක් දෙන්න. මහින්ද චින්තනය ඔස්සේ අතිගරු ජනාධිපතිතුමා සහ මේ රජය ගමනක් යන වෙලාවේ ඒ සඳහා අප සුදුස්සන් බවට පත් වන්නට ඕනෑ බව පැහැදිලිව කියන්නට ඕනෑ. ඒ සඳහා අපි සුදුසුකම් ලද්දවුන් බවට පත් වන්න ඕනෑ. අපේ නුසුදුසුකම් අයින් කර ගන්නට ඕනෑ. අප සුදුස්සන් බවට පත් වෙලා මේ තිබෙන තත්ත්වයන් වඩා හොඳින් තේරුම් අරගෙන ආර්ථිකයේ, මුදල් ලබා දී ආයෝජනය කිරීමට අවස්ථාව ලබා දීමට සහයෝගය ලබා දෙන්නටය කියා ඉල්ලනවා. මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

[අ. භා. 3.39 ]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Mr. Deputy Speaker, I want to speak a few words on the Human Rights Commission because monies are being allocated today to the Human Rights Commission of Sri Lanka . I think from the year 2005 onwards, we have been speaking about the Human Rights Commission of Sri Lanka and the most unfortunate thing is, none of the orders of the Human Rights Commission are being carried out. From the year 2005 up to now, 99 per cent of the orders and recommendations of the Human Rights Commission have not been carried out. I would like to read from a UN Report - the Report of the Secretary-General's Panel of Experts on Accountability in Sri Lanka. On page 106, under 384 it states, I quote:

> "The result is that, in the past, its recommendations have been substantially ignored, not only by the police hierarchy,
>
> but also other Government departments…."

So, why are we allocating monies to this Commission? If there is a Human Rights Commission, the orders given by it have to be carried out. If the orders of the Commission are not carried out, what is the earthly use of having the Commission?

This Commission has no international recognition at all. So much so, that in the year 2006, the Commission was downgraded. It was downgraded and we were put on par with countries like Sudan, Malawi and Congo. We were downgraded. So, the fact of the matter is, why are we having this Commission? I would like the Government to answer because large sums of monies are being allocated to it but the orders of the Commission are not being carried out. I saw a statement made recently by, I think, the new Chairman of the Commission stating that the Commission wants more powers. This is a very lame excuse given by all persons who have to maintain law and order in Sri Lanka. They say, "we do not have powers". If you examine the powers of the Human Rights Commission, they have not used even the powers they have for the betterment of the people. If the Human Rights Commission gives an order, it is up to the Government to carry it out. I do not blame the Commission for that. It is the duty of the Government. But, they have the power to do certain things within the Act. For example, Sir, with regard to detainees, under the Human Rights Act, the Commission has the power to visit all the detainees held by the Government. The parent Act of the Human Rights Commission provides for it with powers to monitor the welfare of the detained persons. They have the right to go and inspect where the detainees are kept and see whether they are being properly looked after. Then, the Commission has to be notified within 48 hours with a list of detainees, so that the Commission will have within itself the names of the detainees. The Human Rights Commission has not been

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

granted a list of detainees up to now under the Human Rights Act. So, these are the powers that are already with the Commission and the Commission is not using these powers for the betterment of the detainees.

Then, Sir, there are international standards set out for the appointment of the Chairman and the Members of the Commission. Under the UN law, when you advertise for the post of Chairman and the Members of the Commission, there must be a transparent process, interviews called and there has to be a discussion among all political parties in Parliament about the persons who will be appointed to the Human Rights Commission. But, in Sri Lanka, unfortunately the Chairman and the Members are appointed by the President. No discussion takes place with anybody. So, because of that, the Human Rights Commission of Sri Lanka does not meet international standards.

Hon. Deputy Speaker, the Human Rights Commission was demoted in 2006, not in 2009. It was downgraded because at that point of time there were 2,000 cases of disappearances, which the Human Rights Commission refused to investigate. They refused. For the first time in the history of the Human Rights Commission of any country, in 2006 they refused to investigate the 2,000 cases of disappearances at that time. So, that was the reason for downgrading the Human Rights Commission in Sri Lanka. At present, the Government is under severe pressure internationally to safeguard human rights. So, I hope the Government will make a new beginning and at least take some concrete steps to restore human rights in Sri Lanka. The dialogue between the international community and the Sri Lankan Government has virtually broken down. There is no dialogue today. ජාත්‍යන්තර ප්‍රජාවත් එක්ක කිසිම සංවාදයක් නැහැ. The dialogue was completely broken down. In 2007, there was a request by the United Nations to open a branch of the UN Human Rights Commission in Sri Lanka. So, I suggest that the Government, at least for a new beginning, to start a dialogue with the international community. The Government should immediately open an office of the UN Human Rights Commission in Sri Lanka so that we could start afresh.

The problem today is that there is no discussion and there is no give-and-take with the international community. Now, with regard to the Ban Ki-moon's Report, the Hon. Minister of External Affairs says, "we are rejecting the Report totally". But, what has actually happened? Hon. Deputy Speaker, if you go through the Report which I have with me, the Government has answered 31 questions. The Government through the Presidential Secretariat has answered 31 questions in writing to the Ban Ki-moon's Panel Report. If the Government does not accept the Panel Report, why did the Government answer 31 questions posed by the UN committee?

Then, with regard to Channel 4, two years ago, certain clips were shown on TV. What did the Government say at that time? They said, "we will file legal action". I remember Mr. Mahinda Samarasinghe at that time, two years ago, said, "we will file action against the Channel 4 clips that were shown all over the world". But, up to now nothing has been done. So, as a responsible Opposition what we would like to tell the Government is: එක්සත් ජාතීන්ගේ එම වාර්තාව තිබෙනවා. ඒක අපට නොසලකා හරින්න බැහැ. එව වාර්තාව නිවැරදි කරන්න රජය යම් යම් පියවරයන් ගත යුතුයි. The Government must take steps to disclaim the charges made by the UN Panel Report. It is the duty of the Government. Up to now, the Government has failed to do so.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව නිවැරදි කිරීමේ වගකීම තිබෙන්නේ රජයට. ඒක ආණ්ඩුවේ වගකීම. ඒකෙන් ඈත් වෙන්න බැහැ. ඒක ප්‍රතික්ෂේප කළ පමණින් අපේ රටට හොඳක් වෙන්නේ නැහැ. මොකද, රටේ කීර්ති නාමය තමයි අද විනාශ වෙලා තිබෙන්නේ. ආණ්ඩුව කියන්නේ එකක්, රට කියන්නේ තවත් එකක්. අපි කවුරුත් අපේ රටට ආදරෙයි. ඒ නිසා රටට අපකීර්තියක් වෙනවා නම්, එම අපකීර්තිය නැති කරන්න ක්‍රියා කරන්න ඕනෑ ආණ්ඩුවයි. Channel-4 සිද්ධිය සම්බන්ධයෙන් වේවා, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්ගේ වාර්තාව සම්බන්ධයෙන් වේවා, එම වාර්තා නිවැරදි කරන්න, ඒවා අසත්‍යයි කියලා ඔප්පු කරන්න ආණ්ඩුව අද වන තෙක් කිසිම පියවරක් අරගෙන නැහැ. මෙය නිවැරදි කරන්න ආණ්ඩුව පියවරක් ගත යුතුයි. That is the duty of the Government. The duty of the Government is to safeguard the reputation of the country. Now, for two years, since the footage was shown on Channel 4, the Government has not taken any steps to disprove the Channel 4 allegations.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

The Government has totally rejected the fake Channel 4. The Government has totally rejected the Darusman Report. Sir, what is he talking? He is misleading the House. He is not even reading a Sri Lankan newspaper. His brain has been pawned to the foreign countries. That is the problem.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, what I said was, it is the duty of the Government to show the world that this Darusman Report is false. For that, you have to appoint a proper committee, you have to gather evidence, you have to accept some charges and reject some charges. That is what Israel did. Sir, Israel was accused of - [*Interruption.*] Please do not disturb me. Sir, three or four years ago, Israel was accused of human rights violations in the Gaza area. There were 400 charges. What did Israel do? They did not reject it. They took the report. They appointed a committee to go into each allegation and what did they do? They accepted some and rejected a vast majority. But what have we done? The UN Panel Report is there. Have we gone through the Report? Have we gathered evidence to reject the Report? Have we gathered evidence to accept the Report? - [*Interruption.*]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Why? Are you ignorant of the Lessons Learnt and Reconciliation Commission?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, why is he acting like this? What is the meaning of this? The Hon. Member is on his feet.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! Hon. Member, you may continue with your speech. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

The Hon. Alhaj A.H.M. Azwer asked a question about the LLRC. I will give him a reply. Sir, the LLRC does not have a mandate. I think the Hon. Sumanthiran three months ago made a very clear speech in Parliament. The LLRC does not have a mandate to investigate human rights violations. Why was the LLRC appointed? The mandate of the LLRC is to find out why the ceasefire agreement was signed and why it broke down? That has nothing to do with what happened during the last stages of the war. In fact, when the Ban Ki-moon Report was out, I suggested to the Government to give the LLRC necessary powers and my comments appeared in the "Divaina". The LLRC has to be given the necessary powers to investigate human rights violations. You go through the mandate. The mandate is: "Why was the ceasefire agreement signed?" - [*Interruption.*] Sir, there is no use in the Government trying to convince us; they have to convince the international community. That is the mistake this Government is making. They are speaking to the public of Sri Lanka. They are not speaking to the international community. The Government is speaking to the people who are already converted. They must speak to the international community. That is not happening today. They are speaking on TV; they are speaking in Parliament; they are speaking in the Provincial Councils. But, have they had a dialogue with the international community? No. The Hon. (Prof.) G.L. Peiris said, "We are not accepting Ban Ki-moon's Report". But, secretly he has answered 31 questions raised by Ban Ki-moon's Panel. Why did he do that? Here, in Sri Lanka, we are opposed to Ban Ki-moon. But, what happened in the UN? You voted for his second term. Why did you vote for his second term? The Hon. Wimal Weerawansa said that there should be an alternate UN - විකල්ප එක්සත් ජාතීන්ගේ සංවිධානයක්-. After opposing Ban Ki-moon for several months, you go and vote for his second term. - [*Interruption.*] This is what I am saying. Hon. Azwer, even the private newspapers that are supporting the Government such as "The Island" and "Divaina", what do they say? The Government has no proper plan to answer the charges made by the international community. There is no point in speaking to the Sri Lankan public. You are wasting your time. You must speak to India; you must speak to the European Union; you must speak to the UN; you must convince them. Sir, when the Hon. (Prof.) G.L Peiris went to India, what did he state in the Joint Communiqué? He stated: "A solution based on the Thirteenth Amendment" So, where is the solution based on the Thirteenth Amendment? Then, he said, "Investigate human rights violations in Sri Lanka". That is what the Joint Communiqué said. So, do not waste your time trying to mislead the public of Sri Lanka and making allegations against the Opposition. What we say is - [*Interruption.*]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Member, do you know that a high-profile delegation came to Sri Lanka including Nirupama Rao and others? What does it mean? We are a working in order to have a dialogue.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! Hon. Member, you may continue with your speech.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I would like to remind the Members of this House that we also love this country. So, we do not want to see the reputation of the country tarnished. It is not the duty of the Opposition to rectify a report. There is the UN Report and it is the duty of the Government to rectify that. They must take steps to rectify that but up to now they have not taken any steps with regard to that. Have you all asked for our support? Have you all asked for the support of the Leader of the Opposition? Nothing. You appear on TV and scold the international community.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

You are conspiring with foreign forces against the Government. That is the problem. You come forward and help us.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

You can say that. But, that is not going to help you internationally. You will fall into a bigger pit in September. So, I would like to - [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please!

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I do not know whether the Members of the Human Rights Commission of Sri Lanka are there. But, all I wish to say is that we have no faith in them. The whole world has no faith in them. Time and again the UN has condemned the Human Rights Commission of Sri Lanka as being worthless and ineffective and I hope the new Chairman will take some steps in this regard. As I said earlier, there is no need to give more powers because there are powers within the Commission to safeguard the human rights in Sri Lanka. What does the Government do when they face allegations of this kind? They assault the Tamil MPs in Jaffna. What is the meaning of this? මුළු ලෝකයම කියනවා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ, මාධ්‍ය නිදහසක් නැහැ කියලා. ආණ්ඩුව මොකක්ද කරන්නේ? ගිහිල්ලා යාපනයේ ඉන්න මන්ත්‍රීවරුන්ට පහර දෙනවා. ඉතින්, මේවාද ආණ්ඩුව දෙන පණිවුඩය? Are these the messages they are conveying to the international community? I just cannot understand the attitude of the Government.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, you have taken 19 minutes.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I will wind up, Sir. I wish to remind this House that we too like a resolution to this conflict with the international community because this is a serious problem. The Government has to realize this. Sir, I will make a prediction. We are going the way Sudan had been going. Three years ago, the situation in Sudan was similar to that of Sri Lanka. There was a very similar situation. There was a very similar civil war in the South of Sudan where thousands of people were killed. But, there was no internal investigation. Then, there was an international investigation and what did they say? The Northern and the Southern Sudanese cannot live together. So, we too are heading that way. You must realize the seriousness of this situation. You must realize that the Government does not wish to see a reality. We are exactly where Sudan was three to four years ago. So, please take note of this at least at this late stage. What we are saying is, initiate a dialogue with the international community. Start talking to them. You have to accept certain mistakes; you have to reject some. Now, what is the defence of the Government? "Zero casualty". Who will believe this, Sir? The Government says that they maintained zero casualty in the last stages of the war. Who will believe this? Nobody is going to believe this. So, this is a fallacy of the Government and I hope the Government, even at this late stage, will start a dialogue with the international community. As I said earlier, if you open a UN Human Rights office in Sri Lanka - not to investigate the past, I am not talking of the past - to prevent any future incidents at least, I think that may be a good starting point to restore human rights in Sri Lanka.

Thank you.

[අ.භා.3.59 ]

**ගරු රොෂාන් රණසිංහ මහතා**
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2010 අංක 7 දරන විසර්ජන පනතේ නියමයන් කිහිපයක් පිළිබඳව කථා කිරීමට මම ඔබතුමාගෙන් අවසර පතනවා. ගරු මහින්ද යාපා අබේවර්ධන අමාත්‍යතුමන් පැවසූ පරිදිම කෘෂි කර්මාන්තය ගොඩනැඟීම වෙනුවෙන්, දේශීය ගොවියා ගොඩනැඟීම වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය එදා ඉඳලාම විශාල කැප කිරීමක් කළා; ඒ වාගේම විශාල උත්සාහයක් ගත්තා. ඒ බව මේ රටේ කෘෂි කර්මාන්තයේ නියැළෙන ගොවි ජනතාව දන්නා නිසාම තමයි එදා ඉඳලාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිටුපස, ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය පිටුපස මේ රටේ බහුතරයක් වූ ගොවි ජනතාව රැඳී සිටියේ. ඒ වාගේම අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපතිතුමා විධියට පත් වුණු දිනයේ ඉඳලාමත් කෘෂි කර්මාන්තය වෙනුවෙන් විශාල සහායක් දක්වපු නායකත්වයක් විධියට අනිවාර්යයෙන්ම ඉතිහාසගත වෙනවා. ඒ වාගේම අද ඒ නාමය කවදාවත් නොමැකෙන නාමයක් විධියට ගොවි ජනතාවගේ මතකයේ රැඳිලා තිබෙනවා. ඒකට හේතුව තමයි වී ගොවියා අසරණ තත්ත්වයක හිටපු වෙලාවේ, එළවලු ගොවියා අසරණ තත්ත්වයක හිටපු වෙලාවේ, ඒ වාගේම පොල් වගා කළ ගොවියා අමාරු තත්ත්වයක හිටපු වෙලාවේ අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීම තුළ පාරිභෝගිකයා වාගේම ගොවි ජනතාව ආරක්ෂා කර ගැනීමේ හොඳ මධ්‍යස්ථභාවයක් අද ඇති කර තිබීම. ඒ වාගේම ගොවි ජනතාවට සහාය දක්වන්න එතුමාට හැකියාව ලැබුණා. පාරිභෝගිකයා භාණ්ඩ අඩු මිලට ගන්න කොට ගොවි ජනතාවටත් ඒවා දරන්න බැරි තරම් අඩු මිලකට විකුණන්න වුණාම ඒ අයගේ ආර්ථිකය ගොඩනඟා ගැනීම බොහොම අපහසු වෙනවා. ඒක තමයි පසු ගිය එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ සම්පූර්ණයෙන්ම සිදු වුණේ. වී ගොවියා ආර්ථිකමය අතින් පහළටම වැටුණා. එළවලු ගොවියා එළවලු වගා කිරීම පවා සම්පූර්ණයෙන් අත් හිටුවා තිබෙන තත්ත්වයක් තමයි තිබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2010 අංක 7 දරන විසර්ජන පනත යටතේ තිබෙන සීමාවන් අද දිනයේ මෙම නියමය මඟින් සංශෝධනය කිරීමට සිදු වුණේ බීජ අවශ්‍යතාව නිසායි. ඔබ සියලු දෙනාම දන්නවා, රටේ මෙච්චර වැදගත් ප්‍රශ්න තිබියදී පසු ගිය කාලයේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මිරිස් කරල එල්ලාගෙන කෑ ගැහුව, එහෙම නැත්නම් තක්කාලි ගෙඩිය ගැන කථා කරපු යුගයක් තිබුණාය කියන එක. අපි දන්නවා, බඩු මිල අඩු කිරීමේ අත්‍යවශ්‍ය තත්ත්වයක් තිබියදීත්, විසඳුම් නැතුව විවේචන පමණක් එල්ල කරමින් යන තත්ත්වයක් තමයි තිබුණේ කියන එක. ප්‍රායෝගිකව එයට විසඳුම් විධියට මේ රටේ ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය යොදා ගනිමින් යම් යම් වැඩ පිළිවෙළ දියත් කළා. භාණ්ඩ මිල ඉහළ දාලා පාරිභෝගිකයා නැති කරන මේ රටේ යම් යම් කොටස්වලට තිත තියන්න, එහෙම නැත්නම් විශේෂයෙන්ම රජය අපහසුතාවට පත් කරන්න හදපු ඒ කලු කඩකාරයන්ට සම්පූර්ණයෙන්ම තිත තියන්න පුළුවන් විධියේ තත්ත්වයක් රජයේ මැදිහත්වීම තුළ, අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීම තුළ ඇති කරන්න පුළුවන් වුණා. ඒ මඟින්

පාරිභෝගිකයාට සාධාරණ මිලට බඩු ගන්න පුළුවන් තත්ත්වයක් ඇති කරනු ලැබුවා.

මේ කටයුතු සාර්ථකව ශක්තිමත් කරමින් ඉදිරියට ගෙන යන්නත්, ගොවි ජනතාව ආරක්ෂා කර ගන්නත් පසු ගිය දවස්වල අතිගරු ජනාධිපතිතුමා වැදගත්, ප්‍රයෝජනවත් තීන්දු කිහිපයක්ම ගත්තා. එයින් එකක් තමයි එළවලු ගොවියාටත් සහන මිලට පොහොර ලබා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති කිරීම. කෘෂි කර්මාන්තයට ප්‍රධාන තැනක් දෙන මේ රටේ එළවලුවලටත් පොහොර සහනාධාරය ලබා දීම පිළිබඳව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව වෙනුවෙන්, පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මා මේ අවස්ථාවේදී අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වනවා.

ඒ විතරක් නොවෙයි. අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා ජගත් පුෂ්පකුමාර අමාත්‍යතුමාගේත්, ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු සියලු දෙනාගේමත් සහයෝගය ලබා ගනිමින් "දිවි නැඟුම" වැඩ පිළිවෙළ ආරම්භ කළා. ඒ "දිවි නැඟුම" වැඩ පිළිවෙළ තුළ මා එක දෙයක් දැක්කා. ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාගේ වැඩ සැලැස්ම කෙසේද කිව්වොත් එක දිගට මාසයකුත් දින ගණනක් තුළ මේ රටේ සියලුම දිස්ත්‍රික්ක නියෝජනය කරමින් ඒ ඒ දිස්ත්‍රික්කවලට ගිහින් සියලුම රාජ්‍ය නිලධාරි මහත්ම මහත්මීන්, විශේෂයෙන් සමෘද්ධි නිලධාරින්, ඒ වාගේම කෘෂි නිලධාරින් හා සියලුම ආයතන එකතු කරලා, සියලු දෙනාම දිරිමත් කරලා, පවුල් දසලක්ෂයක් නඟා සිටුවීමේ "දිවි නැඟුම" වැඩ පිළිවෙළ වෙනුවෙන් උපදෙස් රාශියක් ලබා දීලා ඒ වැඩ කටයුත්ත ආරම්භ කරලා තිබෙනවා. වැඩ පිළිවෙළක් ප්‍රායෝගිකව සිදු කරන්න පුළුවන් විධියට උපදෙස් දීම තුළ අද "දිවි නැඟුම" වැඩ පිළිවෙළ ඉතාම සාර්ථක වෙලා තිබෙනවා. මෙන්න මේ කාරණා නිසා රටේ එළවලු අවශ්‍යතාවට අනුව, මිල සාධාරණ මට්ටමක පවත්වා ගෙන, පාරිභෝගිකයාට පහසු පරිදි මිල දී ගන්න පුළුවන් තත්ත්වයකට ගෙන එන්නට හැකියාව ලැබුණා.

ඊළඟ කාරණය තමයි වී අස්වැන්න වැඩි කර ගැනීම. පසු ගිය කාලයේදී විශේෂයෙන්ම බිත්තර වී වැනි දේ අපට අවශ්‍ය වුණා. එම නිසා එළවලු, පොල්, ඒ වාගේම වී ආශ්‍රිතව බීජ අවශ්‍යතාව ඉතාමත් ඉහළ මට්ටමකට ඇවිත් තිබෙනවා. මේ කටයුතු සඳහා මුදල් අවශ්‍යතාවේ වැඩි වීමක් පැහැදිලිවම අපට දකින්න ලැබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී ගොවි ජනතාවට සහායක් වනවා වෙනුවට විපක්ෂය විසින් මෙවැනි කටයුතුවලට විරුද්ධ වන්නේ ඇයි දැයි කියන එක ඇත්තටම අපි ප්‍රශ්නයක් විධියට දකිනවා.

ඊළඟට, පසු ගිය දිනවල තිබුණු පොල් මිලත් අපි මතක් කරන්න ඕනෑ. පොල් මිල ඉහළ ගිය වෙලාවක් තිබුණා. පොල් මිල ඉහළ ගිය වෙලාවේ කවුරුත් ඒක විවේචනය කළා. පොල් රටින් ගෙනෙනවාය කිව්වා. ඒ විධියට එක් එක් දේවල් කිව්වා මිසක් කවුරුත් ඒකට විසඳුම් ගෙනාවේ නැහැ. පොල් මේ රටේ ජනතාවට අත්‍යවශ්‍යම දෙයක්. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා පොල් කර්මාන්තය සම්බන්ධයෙන් අපේ ගරු ජගත් පුෂ්පකුමාර ඇමතිතුමා පත් කරලා, පොල්වලට පොහොර සහනාධාරය ලබා දීලා පොල් වගා හිමියන්ව ශක්තිමත් කළා. ඒ අනුව අද පොල් ගෙඩියේ මිල ඉතා සීඝ්‍ර ලෙස රුපියල් 25, 30 දක්වා පහළ මට්ටමකට ගෙනැල්ලා ජනතාවට සහනය ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඒ වාගේ විශාල සහයෝගයක් අපේ රජය ජනතාවට ලබා දෙනවා.

අද රසායනික පොහොර ගැන අපේ ගරු අමාත්‍යතුමන් කථා කළා. රසායනික පොහොර භාවිතයේ සිට කාබනික පොහොර භාවිතයට ටික ටික යන්න ඕනෑ යුගයක් අද ඇවිත් තිබෙනවා. ඒකට හේතුව තමයි රසායනික පොහොර භාවිතය නිසා යම් යම් ප්‍රශ්න මතු වෙලා තිබීම. නමුත් අපි කාබනික පොහොර භාවිතය ගැන ජනතාව දිරිමත් කරද්දී, විපක්ෂය ඒකටත් වෙන මොකක් හරි කියනවා. පොහොර සහනාධාරය දෙන එක නවත්වන්න හදනවා කියලා හරි වෙන මොනවා හරි කථාවක් කියනවා.

මේ රට සදාහරිත රටක් විධියට, ජනතාවට ඉතාම හිතකර පරිසරයක් තිබෙන රටක් විධියට ගෙන යන්න නම් අනිවාර්යයෙන්ම අපි කාබනික පොහොර සඳහා යෑමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙන්, රට වෙනුවෙන් විශේෂයෙන්ම අපි ගොවි ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ කාබනික පොහොර සඳහා මීට වඩා අවධානය යොමු කරන්න කියන එකයි. ඒ වාගේම හැම දේටම විරුද්ධව කථා කරනවා වෙනුවට එවැනි කටයුතු වෙනුවෙන් විපක්ෂයේ සහයෝගය දක්වන්න කියලාත් මා ඉල්ලා සිටිනවා.

අතිගරු ජනාධිපතිතුමාගේ, ඒ වාගේම අපේ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ අධීක්ෂණය යටතේ අද පොළොන්නරුව පරාක්‍රම සමුද්‍රයේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තව කුඩා වැව් සංවර්ධනය කරන්න තිබෙනවා. මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ වැව් ප්‍රතිසංස්කරණය වෙනුවෙනුත් ඔබතුමන්ගේ සහයෝගය ලබා දෙන්න කියලා. එසේ ඉල්ලා සිටින්නේ ඒ ජනතාවගේ කෘෂි කාර්මික කටයුතු වෙනුවෙන් කියන එකත් මේ අවස්ථාවේදී මම මතක් කර සිටිනවා.

විශේෂයෙන්ම තවත් දෙයක් මේ අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෑ. දැන් කථා කරන අලුත් දේ තමයි අත්‍යවශ්‍ය භාණ්ඩවල බදු. අද පත්තරවල තිබෙනවා අත්‍යවශ්‍ය භාණ්ඩවල බදු බොහොම ඉහළයි කියලා. නමුත් ඒක සම්පූර්ණ අසත්‍යයක් කියන එක මම වග කීමෙන් කියනවා. අත්‍යවශ්‍ය භාණ්ඩවල බදු වැඩියි කියමින් කරන්නේ ජනතාව නොමඟ යවන්න උත්සාහ කිරීමයි. අද ජනතාව එහෙම නොමඟ යන්නේ නැහැ. ජනතාව බොහොම බුද්ධිමත්. අත්‍යවශ්‍ය භාණ්ඩවල බදු කිසිසේත්ම වැඩි කරලා නැහැ. බොහෝ අත්‍යවශ්‍ය භාණ්ඩවලට බදු නැහැ. ඒ වාගේම සමහර භාණ්ඩවලට බොහොම සුළු බද්දක් තමයි රජය විසින් අය කරනු ලබන්නේ. එසේ කරන්නේ ජනතාව ගැන හිතලා, ජනතාව ගැන හිතන රජයක් විධියටයි.

අද රටේ තිබෙන නිදහස ගැන ඔබතුමන්ලා දන්නවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සුළු ව්‍යාපාරිකයන්ට, ප්‍රධාන ව්‍යාපාරිකයන්ට, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවට අද විශාල ආදායමක් ලැබෙන බව පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු විධියට මා සඳහන් කරන්න ඕනෑ. අද රටේ තිබෙන සාමයත් එක්ක දේශීයව හා විදේශීයව පොළොන්නරුව දිස්ත්‍රික්කයට එන සංචාරකයන් නිසා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරන්න හැකි වෙලා තිබෙනවා. ඒ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා ගැනත්, රජය ගැනත් ඒ ජනතාව බොහොම ප්‍රශංසනීය ලෙස කථා කරන්නේ ඒ අය තුළ තිබෙන කෘතගුණ දැක්වීම විධියටයි.

පසු ගිය දිනවල වෙසක් පෝයත්, පොසොන් පෝයත් තිබුණා. ඒ අවස්ථාවේ මේ රටේ ඉතිහාසයේ අපි කවදාකවත් නොදැක්ක විධියට දැවැන්ත ජනතාවක් පොළොන්නරුව දිස්ත්‍රික්කයට පැමිණියා. ඒ පැමිණීම තුළින් ඒ අයගේ පිබිදීම තුළ අපට පැහැදිලිවම දකින්න පුළුවන් හේතුවක් තිබෙනවා. ඒ තමයි, අද මොකක්ද රටේ තිබෙන තත්ත්වය; අද මොකක්ද රටේ ජනතාවගේ තිබෙන ආර්ථික ශක්තිය කියන එක. ඒ නිසා මොන දේ කිව්වත් අද මේ රටේ ජනතාව අතිගරු ජනාධිපතිතුමා එක්ක ඉන්නේත් මේ නිසාය කියන එක අපි පැහැදිලිව මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

[ගරු රොෂාන් රණසිංහ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මම විශේෂයෙන්ම ප්‍රවාහන අමාත්‍යාංශය ගැන කියන්න ඕනෑ. අද දුම්රිය ක්ෂේත්‍රයේ තිබෙන දියුණුවත් එක්ක, සමස්ත ප්‍රවාහන ක්ෂේත්‍රයේ තිබෙන දියුණුවත් එක්ක මේ රටේ ජනතාවට ප්‍රවාහන අමාත්‍යාංශය තුළින් විශාල සේවයක් කරනු ලබනවා. අද ඒ තුළින් කෙරෙන අධිවේගී දුම්රිය මාර්ග සකස් කිරීම, දුම්රිය මාර්ග දීර්ඝ කිරීම, ඒ වාගේම උතුරු-නැඟෙනහිර දුම්රිය මාර්ග සංවර්ධනය වැනි කටයුතු සඳහා අනිවාර්යයෙන්ම මුදල් අවශ්‍ය වන බව අපි පැහැදිලිවම දන්නවා. ඒ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධියට පැහැදිලිවම මෙම විසර්ජන පනත් කෙටුම්පතට අපේ උපරිම සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමන්ට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා.4.12]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය උල්ලංඝනය වන ආකාරයෙන් වුණත් අද ඉදිරිපත් වෙලා තිබෙන නියමයන් පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී කරුණු කිහිපයක් කථා කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අපි අද මේ විවාදය ආරම්භ කරන වෙලාවේදීම මතු කළේ, මේ පාර්ලිමේන්තුවේ තිබෙන නියමයන්, ස්ථාවර නියෝගයන්, සම්මතයන්, රීතීන් හා ව්‍යවස්ථානුකූල දේවල් හදා ගෙන තිබෙන්නේ රටේ බලය අත්තනෝමතික, ඒකාධිපති විධියකට පාලනය වන එක වළක්වන්න කියන කාරණයයි. පාර්ලිමේන්තුව තුළ මන්ත්‍රීවරුන් හැටියට -මහජන නියෝජිතයෝ හැටියට- අපි ඉන්නේ ඒක නිසා; රටේ තවමත් මහජන නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය තිබෙනවාය කියලා මේ රට ජන සම්මතවාදී ආකාරයට පිළිගන්න නිසා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විසර්ජන පනතේ තිබෙනවා නම් ආණ්ඩුවට ඕනෑ කරන, මහා භාණ්ඩාගාරයට ඕනෑ කරන, රටට ඕනෑ කරන මුදල් හුවමාරු කර ගැනීමේ නියමයන්, ඒ සීමාවන් -උපරිම හා අවම සීමාව- සම්මත කර ගන්න ඕනෑකම තිබෙන්නේ 2011 මැයි මාසයේ 31 වනදාට කලින් කියන එකයි, ඒකට අනුව කටයුතු කරන්න ඕනෑය කියන එකයි අපි කියන්නේ.

මොකද, අපි විශ්වාස කරනවා ජනතාවගේ බදු මුදලින්ම වැටුප් ගන්න නිලධාරීන් මුදල් අමාත්‍යාංශයේ ඉන්නේ, ඒ නිසා ඒ අයට ඒ සිහි බුද්ධිය තිබෙන්න ඕනෑ කියලා; ඒ අයට ඒ සිහි කල්පනාව තිබෙන්න ඕනෑ කියලා; මේ කටයුතු, කරුණු කාරණා කෙරී ගෙන යන කොට උපරිම හා අවම සීමාවන් වෙනස් කර ගන්නවා නම් ඒක වෙනස් කර ගන්න ඕනෑ ඒ නියමිත කාලය තුළදී කියලා ඒ විසර්ජන පනතේ වගන්ති හදා ගත්ත උදවියටම -විපක්ෂය නොවෙයි ඒ වගන්ති හදා දී තිබෙන්නේ.- අඩු තරමේ ඒ හැකියාව, ඒ සිහි බුද්ධිය තිබෙන්න ඕනෑ කියලා. තමුන්නාන්සේලාට මේවා සම්මත කර ගැනීමේ බලය තිබෙනවා. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලය තිබෙනවා. ගරු කථානායකතුමාට අපි ගරු කරනවා, එක අර්ථයකින් එතුමා ඒ තුනෙන් දෙකේ බලය පාවිච්චි කර ගන්න හැකියාව තිබෙන නිසා අද මේක සම්මත කර ගනිමුයි කියලා යෝජනා කරලා එතුමාගේ නියෝගය ලබා දුන්නත් අවසානයේදී හරි එතුමා මෙවැනි කාරණා පිළිබඳව මීට වඩා සැලකිලිමත් වෙන්න ඕනෑය කියලා දක්වපු අදහසට. එතුමාට ඒ අදහස කියන්න සිද්ධ වෙන්නේම, නියෝගයක් හැටියට එතුමා මේක අද සාකච්ඡා කරන්න එකඟ වුණාට මෙතැන වැරැද්දක් තිබෙනවාය කියලා හෘදය සාක්ෂිය අනුව එතුමාට වුණත් පිළිගන්නට සිද්ධ වෙන නිසයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ඒ වැරැද්ද පෙන්වලා දෙන්න ඕනෑකම තිබෙන්නේ අර ඕනෑම දෙයකට විරුද්ධ වන අර්ථයෙන් නොවෙයි,- [බාධා කිරීමක්]

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කථානායකතුමා යම් තීරණයක් දීලා ප්‍රකාශයට පත් කළා. එතුමාගේ අදහස්වලට, එතුමාගේ ප්‍රකාශයට වෙන ආමන්ත්‍රණයක්, වෙන දෙයක් ඇතුළත් කිරීමට දරන උත්සාහයට ඔබතුමා නියෝජ්‍ය කථානායකතුමා හැටියට- [බාධා කිරීමක්]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ, වෙනත් දෙයක් ඇතුළත් කිරීමක් නැහැ. කොහෙත්ම නැහැ. "මම එතුමාට ගරු කරමින්" කියලා කිව්වේ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලසුනේ සිටිද්දී ඉඩ දෙන්නට එපාය කියන එකයි මේ ඉල්ලන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මගේ ඉතාම සීමිත කාලය මේ වාගේ බාල සංවාදයකට ලක් කර ගන්න මම කැමැති නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතාම පැහැදිලිව කිව්වේ, ගරු කථානායකතුමාට ගරු කරමින් කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝගවලට පටහැනිව කරන ලද ප්‍රකාශයක් තිබේ නම් එම ප්‍රකාශ ඉවත් කිරීමට තීරණය කරනවා. [බාධා කිරීමක්]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒ අයිතියත් ඔබතුමාට තිබෙනවා. මා ඉතාම පැහැදිලිව ගරු කථානායකතුමාගේ අදහසට ගරු කරමින්, එතුමා අවසාන වශයෙන් ඉදිරිපත් කරපු මතය නැවතත් මේ ගරු සභාවේ පුනරුච්චාරණය වීමේ වටිනාකම තිබෙන නිසා, ඇමතිවරු මෙවැනි දේවල් සිහි බුද්ධියෙන් කළ යුතු යයි කිව්ව එක -මුදල් කටයුතු භාරව ඉන්න ඇමතිවරු මේවායේ දින වකවානු මතක තියා ගෙන නිලධාරීන් ලවා සිහි බුද්ධියෙන්මේවා කළ යුතු යැයි කථානායකතුමා කිව්ව ඒ වටිනා වචන කීපය- නැවතත් සිහිපත් කිරීමක් මා කළේ. ඊට වැඩිය දෙයක් මා කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ ඉදිරිපත් කර තිබෙන විසර්ජන පනතේ නියමයන් අනුව ආයතන ගණනාවක, දෙපාර්තමේන්තු ගණනාවක, රජයේ මුදල් පරිහරණය කරන ආයතනවල ඒ මුදල් සීමාවන් වෙනස් කරනවා. මෙහිදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල කිහිපයක් පිළිබඳව අවධානය යොමු කරනවා. ඒ යටතේ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තිබෙනවා. මා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා 2000 අවුරුද්දේ ඉඳලා කොළඹ දිස්ත්‍රික්කයෙන් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. ආර්ථික වර්ධන වේගය සියයට 8ක් නැඟලාය කියන ආණ්ඩුව, ආර්ථිකය නියම ආකාරයෙන් පවත්වාගෙන යනවාය කියන ආණ්ඩුව තමයි පළමුවන වතාවට කොළඹ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත මුදල් කපා තිබෙන්නේ. ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
කාටවත් දීලා නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක තමයි ප්‍රශ්නය. කාටවත් දීලා නැත්නම් වඩාත් බරපතළයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට වෙන් වෙන රුපියල් ලක්ෂ 50 වෙන මොකක්වත් නොවෙයි. ඒකෙන් කරන්නේ පන්සලකට මොනවා හෝ හදා දෙන එක; දහම් පාසලකට මොනවා හෝ දෙන එක. සමිතියකට tent එකක්, hut එකක් ලබා දෙන එක; පාසලකට පන්සලකට පුටු ටිකක් ලබා දෙන එක; ප්‍රාදේශීය සභාව පළාත් සභාව හදන්නේ නැති පාරකට තාර ටිකක් දාලා දෙන එක. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට ආත්ම ගෞරවයක් ඇතුව තමන්ගේ ඡන්ද කොට්ඨාසයට ගිහින් මිනිසුන්ට කථා කරන්න තිබෙන අයිතිය ඒ. මහජන දිනයට ආවාට පසු "මන්ත්‍රීතුමා මෙන්න මේ දේ කර දෙන්න" කිව්වාම ඒ දේ කරන්න මන්ත්‍රීවරුන්ට තිබෙන එකම හැකියාව තමයි විමධ්‍යගත ප්‍රතිපාදනවලින් වෙන් වෙන රුපියල් ලක්ෂ පණහ. ඒක වෙන් කර නැහැ. ජුනි මාසයේ 20 වන විටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට වෙන් වන මුදල් ටික වෙන් කර නැත්නම් මොකක්ද ආර්ථික සංවර්ධනය?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)
ඒකෙන් නොවෙයි මනින්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒකත් නැහැ. ඒකෙන් නොවෙයි මනින්නේ. ඒක ඇත්ත. දිසාපතිතුමන්ලාට කථා කළාම -දිස්ත්‍රික් ලේකම්තුමන්ලාට කථා කළාම- ගිය අවුරුද්දේ ලැබුණු ඒවා, පසු ගිය දවස්වල දිගටම ලැබුණු ඒවා කප්පාදු කරනවා නම් ඒක මොකක්ද? ලැබුණු දේවලුත් කප්පාදු කරනවා නම් ඒකට කියන්නේ මොකක්ද? මුදල් සීමාවන් එහාට මෙහාට කර මොකක්ද කරන්නේ? පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාසික සභා රැස්වීම තියලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන කමිටු රැස්වීම තියලා දීපු යෝජනා දෙස බලා, "මන්ත්‍රීතුමා යෝජනා නම් ලැබිලා තිබෙනවා. කරන්න දෙයක් නැහැ. මේ වතාවේ සල්ලි නැහැ" කියලා කියනවා නම්, ඒ වර්ධනයට කියන්නේ මොකක්ද? සියයට 8 ආර්ථික වර්ධනයක් කොහේද? අපි අහන්නේ ඒකයි. කර තිබෙන්නේ ඒක නොවෙයි. මෙතුමා කිව්ව ආකාරයට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ජනසවිය, ජාතික සවිය, මඟ නැඟුම, ගම නැඟුම, දිවි නැඟුම ඔක්කොම නැඟුම් ටිකෙන් වෙන් කර ගන්නවා. ඒ ඔක්කොම නැඟුම් ටිකෙන් වෙන් කරලා විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට අඩු තරමේ තමන්ගේ ඡන්දදායකයාට වැඩක් කර දෙන්න හැකියාව තිබෙන විමධ්‍යගත ප්‍රතිපාදන මුදල් කප්පාදු කර තිබෙනවා. ඔන්න ආර්ථික වර්ධනය. ඔන්න රටේ වර්ධනය. අපි කියන්නේ ඒකයි.

මහා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. අඩු තරමේ මන්ත්‍රීවරයකුට වෙන් කරන ප්‍රතිපාදන ටිකවත් ලබා දෙන්න තරම්වත් ප්‍රජාතන්ත්‍රවාදී නැහැ. ඒකයි කාරණය. තමුන්නාන්සේලා කියන විධියට මේ යුද්ධ කාලයක් නොවෙන්න පුළුවන්. යුද්ධ කාලයේත් මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත මුදල් වෙන් කළා. මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන ලබා දුන්නා. මේ ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් වෙන් කළා. නමුත් යුද්ධය නැතුව ආර්ථික වර්ධනය සියයට 8යි කියන මේ රටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට මහජනතාව වෙනුවෙන් වැඩ කොටසක් කරන්න තිබෙන ප්‍රතිපාදන මුදලත් කප්පාදු කර තිබෙනවා. ඒක නතර කර තිබෙනවා. ජුනි මාසයෙන් පසුව ඒක ලබන අවුරුද්දේ ලැබෙන්නෙත් නැහැ. මේ මාස හයේ දෙන්නෙත් නැහැ. දෙන්න සැලැස්මකුත් නැහැ. දෙන්න වැඩ පිළිවෙළකුත් නැහැ. ඒක තමයි මම මූලික වශයෙන් මතු කරන්නේ.

ඊ ළඟට දුම්රිය දෙපාර්තමේන්තුව ගැන සඳහන්ව තිබෙනවා. මෙකෙන් වියදම්වල උපරිම සීමාව වැඩි කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට එක උදාහරණයක් විතරක් කියනවා. අපි දන්නවා, මේ ආණ්ඩුව මහා ලොකුවට සන්දර්ශන පවත්වලා, කොඩි වනලා තමයි මාතර-ගාල්ල කොටසේ දුම්රිය මාර්ගය අධිවේගී තත්ත්වයට පත් කළේ කියලා. දුම්රිය මාර්ගය අලුත්වැඩියා කළා. ඒ වෙනුවෙන් රුපියල් කෝටි 360ක් වියදම් කළා. රුපියල් කෝටි 360ක් වියදම් කළ දුම්රිය මාර්ගයේ ඊයේ තත්ත්වය මම කියන්නම්.

මාතර සිට කොටුවට දුර තිබෙන්නේ කිලෝමීටර් 159යි. රුහුණු කුමාරි දුම්රිය - අංක 59 දුම්රිය- බලන්න. ගාල්ල සිට මාතරට දුර තිබෙන්නේ කිලෝමීටර් 46යි. ඊයේ ගාල්ල සිට මාතරට එන්න විනාඩි 45ක් ගියා. ගාල්ලේ සිට මාතරට කිලෝමීටර් 46 එන්න විනාඩි 45යි. ගාල්ලේ සිට හික්කඩුවට දුර තිබෙන්නේ කිලෝමීටර් 18යි. කෝච්චියට එන්න යන්නේ විනාඩි 22යි. ඒ කොච්චිය හික්කඩුවේ ඉඳන් අම්බලන්ගොඩට එන්න ගියේ විනාඩි 12යි. අම්බලන්ගොඩ ඉඳන් අලුත්ගමට දුර කිලෝමීටර් 24යි. ගත වන කාලය විනාඩි 23යි. අලුත්ගම ඉඳන් කලුතරට කිලෝමීටර් 18යි. ගත වන කාලය විනාඩි 16යි. මම මේ කියන්නේ මොකක්ද ඇමතිතුමා? ඒ කියන්නේ මාතර ඉඳන් ගාල්ලට යන්න ගිය වෙලාව. ඒ අධිවේගී කළ වෙලාව. හැබැයි ගාල්ලේ ඉඳලා කලුතරට සුනාමියෙන් විනාශ වුණාට පසුව පාර හැදුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ වැඩ කරන මිනිසුන්; දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවෝ; ලංකාවේ දුම්රිය දෙපාර්තමේන්තුව. චීනයෙන්, ඉන්දියාවෙන් ගෙනල්ලා නොවෙයි එය හැදුවේ. ඒ ලංකාවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ වැඩ කරන පුද්ගලයා, ඉංජිනේරුවා හදාපු පාරේ යන වේගයටත් වඩා අඩු වේගයකින් තමයි අද අධිවේගී කරපු මාතර ඉඳන් ගාල්ලට තිබෙන පාරේ කෝච්චිය එන්නේ. රුපියල් කෝටි 360ක් වියදම් කළා. දැන් මේ වියදම් කළ රුපියල් කෝටි 360ට මොකද වෙලා

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

තිබෙන්නේ? අලුතෙන් repair කරලා, හදලා, කොඩි වනලා, විවෘත කරලා, වියදම් කරලා, රුපියල් කෝටි 360ක් වියදම් කරලා හදපු රේල් පාරේ වේගයයි, සුනාමියෙන් විපතට පත් වුණු වෙලාවේ ලංකාවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයෝ, කම්කරුවෝ, ඉංජිනේරුවෝ මහන්සි වෙලා, දුක් මහන්සි වෙලා හදාපු දුම්රිය පාරේ වේගයයි එක සමානයි. ලංකාවේ කම්කරුවා, වැඩ කරපු මනුස්සයා හදාපු පාරේ යන වේගයටත් වඩා අඩුවෙන් තමයි මාතර-ගාල්ල අධිවේගී මාර්ගයේ කෝච්චිය යන්නේ. රුපියල් කෝටි 360යි, high speed කරන්න ගිය වියදම. ඒවායේ ණය තමයි, ඒ වායේ පවු තමයි අද මේ අනුමත කර ගන්නේ. ඒවාට ගෙවන්න ගිහින් තමයි මේ සීමාව වැඩි කර ගන්නේ. ඒවාට ගෙවන කොටස තමයි අද මේ වැඩි කරන්නේ. ඒවා තමයි අපි කියන්නේ නාස්තිකාර වියදම් කියලා. මේ ආණ්ඩුවේ නාස්තිකාර වියදම් නිසා තමයි මේක වැඩි කරන්න වෙලා තිබෙන්නේ. ඒකට හේතුව තමයි මම මේ උදාහරණයකින් කිව්වේ. මම මේ උදාහරණයෙන් කිව්වේ ඒකේ හේතුව තමයි. කල්පනා කරලා බලන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊ ළඟට තමුන්නාන්සේලා කියනවා ආර්ථිකයේ මහා වර්ධනයක් සිදු වෙලා තිබෙනවා කියලා. කිසි ප්‍රශ්නයක් නැහැ. නැඟලා යනවා. දැන් සියයට 8ක ආර්ථික වර්ධන වේගයටයි ගිහින් තිබෙන්නේ. "චීනයේ ආර්ථික වර්ධන වේගය අල්ලන්න තව වැඩි දුර යන්න නැහැ" කියනවා. මම 2011 ජුනි මාසයේ 05 වනදා "සන්ඩේ ටයිම්ස්" පුවත් පතට ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. පෞද්ගලික විශ්‍රාම වැටුප් පනත ගෙනැල්ලා ඒක අකුළා ගත්තාට පසුව ආණ්ඩුව දැන් යෝජනා කරන්කේ මොකක්ද? ආර්ථ සාධක අරමුදල් ආරම්භ කරන්නත් කලින් ලංකාවේ පෞද්ගලික අංශය විසින්ම පවත්වා ගෙන ගිය අර්ථ සාධක අරමුදල් තිබෙනවා. ඒ අර්ථ සාධක අරමුදල් අපේ රටේ අර්ථ සාධක අරමුදල් ආරම්භ කරන්නත් කලින් ඉඳලා පෞද්ගලික අංශයේ අයිතිකරුවන් සහ සේවකයන්ගේ දායකත්වයෙන් හදා ගත්ත අරමුදල්. එහෙම අරමුදල් 172ක් තිබෙනවා. ඒවායේ වටිනාකම රුපියල් බිලියන 210ක් තිබෙනවා. ඒකට ලංකාවේ සේවකයන් 150,000ක් දායක වෙලා තිබෙනවා. මම ඔබතුමාට උදාහරණ කිහිපයක් කියන්නම්. ලංකාවේ තිබෙන හේලීස් සමාගම, රිචඩ් පීරිස් සමාගම, සමහර වාණිජ බැංකු, යුනිලිවර් ආයතනය, ශ්‍රී ලංකා ටෙලිකොම් වාගේ ආයතන එවැනි අර්ථ සාධක අරමුදල් පවත්වාගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එක අර්ථ සාධක අරමුදලක් කියන්නම්. Mercantile Sector Provident Fund Society - MSPFS එක - එවැනි එකක්. මේ අරමුදල්වල තිබෙන මුදල්වලින්, ඒ අය පෞද්ගලික බැංකුවල පවත්වා ගෙන යන අරමුදල්වල තිබෙන මුදල්වලින් සියයට 40ක් රජයේ බැංකුවල අනිවාර්යයෙන් තැන්පත් කරන්න, අනිවාර්යයෙන්ම භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරන්න කියලා නියෝගයක් තමුන්නාන්සේලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් පනවා තිබෙනවා. එහෙම පනවන්න බලපාපු හේතුව වෙන මොකක්වත් නොවෙයි. එහෙම පනවන්න බලපාපු හේතුව මේකයි. පෞද්ගලික අංශයේ අර්ථ සාධක අරමුදලට බැටේ දෙන්න ගිහිල්ලා ඒක ඇන ගත්තාට පස්සේ ඒකෙන් කර ගන්න බැරි වුණාට පස්සේ දැන් ඊ ළඟට අත ගහන්න යන්නේ පෞද්ගලික අංශය මෙච්චර කාලයක් රාජ්‍ය බැංකුවල දාන්නේ නැතිව එහෙම නැත්නම් රජයට අත ගහන්න නොදී තියා ගෙන හිටපු අරමුදල්වලට. ඒ අරමුදල් අස්සට දැන් රිංගන්න හදනවා. ඒ තමයි අද ආණ්ඩුව වැටිලා තිබෙන තැන. අද ආණ්ඩුව වැටිලා තිබෙන ආර්ථික අර්බුදය ඒකයි. ආණ්ඩුව එවැනි බරපතළ ආර්ථික අර්බුදයක් ඇතුළේ ඉඳ ගෙන තමයි අද නැව ගිලුණත් බැන් චූන් සින්දු කියන්නේ. රෝමය ගිනි ගනිද්දී වීණා වාදනය කරනවා වාගේ වැඩ කරන්නේ එහෙම තියෙද්දීයි. එහෙම තියෙද්දී තමයි මේ නාස්තිකාර වියදම් කරමින් අනවශ්‍ය වියදම් කරමින් රටේ මහජන මුදල් කාබාසිනියා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒකට ඔබතුමාට හොඳ උදාහරණයක් කියන්නම්. මම මේ දත්ත ලබා ගත්තේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේම අපට මේ පාර්ලිමේන්තුවේ සභාගත කරපු වාර්තාවේ "රජයට අයත් ව්‍යාපාර" යන මාතෘකාව යටතෙනුයි. ඒ විස්තර 203 පිටුවෙන් ආරම්භ කරන්නේ. ඒ අනුව 2010 ඌන ක්‍රියාකාරීත්ව රාජ්‍ය ආයතන, අකර්මණ්‍ය, පාඩු ලබන තත්ත්වයට පත්වෙච්ච රාජ්‍ය ආයතන 23ක් සම්බන්ධයෙන් තොරතුරු අඩංගු වෙනවා. ඒ තොරතුරුවලට අනුව ලංකා විදුලිබල මණ්ඩලයේ 2009 මෙහෙයුම් අලාභය රුපියල් මිලියන 7,440යි; 2010 රුපියල් මිලියන 4,962යි. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ශුද්ධ අලාභය 2010 වෙනකොට රුපියල් මිලියන 14,662යි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය -මහලොකුවට කයිවාරු ගහනවා, ආසියාවේ ලොකුම වරාය හදනවා කියලා- 2010 ශුද්ධ අලාභය රුපියල් මිලියන 1,190යි. මේ කියන්නේ මම නොවෙයි. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයම කියනවා, මෙන්න මෙය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව -අපේ ඇමතිතුමාත් ඊයේ පෙරේදා කිව්වා.- 2010 මෙහෙයුම් අලාභය රුපියල් මිලියන 12,343යි. ශ්‍රී ලන්කන් ගුවන් සමාගම 2010 බද්දට පෙර ශුද්ධ අලාභය රුපියල් මිලියන 2,674යි. මිහින් ලංකා පුද්ගලික සමාගම 2010 ශුද්ධ අලාභය රුපියල් මිලියන 1,221යි. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය 2010 ශුද්ධ අලාභය රුපියල් මිලියන 830යි. නාගරික සංවර්ධන අධිකාරිය -දැන් තියෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේයි.- 2010 ශුද්ධ අලාභය රුපියල් මිලියන 143.34යි. ලංකා ධීවර සංස්ථාව 2010 ශුද්ධ අලාභය රුපියල් මිලියන 59යි. සීමා සහිත ලංකා නැව් සංස්ථාව 2010 ශුද්ධ අලාභය රුපියල් මිලියන 57.1යි. මා සඳහන් කළේ ඒ පාඩු ලබන රාජ්‍ය ආයතනවලින් කිහිපයක් පමණයි. පාඩු ලබන රාජ්‍ය ආයතන 23ක් තිබෙනවා. මේ පාඩු ලබන රාජ්‍ය ආයතන 23 සඳහා 2010 අවුරුද්දේ රජය විසින් රුපියල් මිලියන 30,661ක මෙහෙයුම් ආධාර - operational donations - දීලා තිබෙනවා. ඒක දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට ගත්තොත් සියයට 0.5යි.

ඒ විතරක් නොවෙයි. රජය විසින් මේ ආයතනවලට ඇපකර ලබා දී තිබෙනවා. ඒ, රුපියල් මිලියන 1,89,412ක. රජය ලබා දුන් ඇපකරවලින් සියයට 90ක් ඒ අතර තිබෙනවා. එතකොට මේ රජය ඇප වෙලා, රජය සල්ලි දීලා, රජය සභාපතිලා පත් කරලා, රජය ක්‍රියාකාරී අධ්‍යක්ෂකලා පත් කරලා, රජය අධ්‍යක්ෂ මණ්ඩල පත් කරලා, රජයේ වාහන, දේපල ලබා දීලා තිබෙනවා. ඒ සියල්ලම ලබා දීපු ආයතන මේ පාඩු ලබන තත්ත්වයට පත් කර තිබෙනවා. කල්පනා කර බලන්න. රජයේ අකාර්යක්ෂමතාවයි මෙයින් පෙන්නුම් කරන්නේ. ආණ්ඩුවේ කළමනාකාරීත්වයක් නැතිකමයි මෙයින් පෙන්නුම් කරන්නේ. එක පැත්තකින් ආණ්ඩුව ඒවාට කට්ටිය පත් කරලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පෙන්නුම් කරන්න යන්නේ මේකයි. අපි මේ පාර්ලිමේන්තුවේ අය වැය සම්මත කරන්න අත උස්සනවා. අණපනත් සම්මත කරන්න අත උස්සනවා. අය වැය විවාදයේදී යෝජනාවලට ඇහුම්කන් දෙනවා. ඒවායේ සුරංගනා කථාවලට ඇහුම්කන් දෙනවා. නමුත් ඇත්ත මොකක්ද? යථාර්ථය මොකක්ද? අපේ රටේ ජනතාවට සහනයක් ලබා නොදෙන ජනතාව ණය බරෙන් පීඩාවට පත් කරන රටේ රාජ්‍ය ආයතන තව තවත් අලාභ තත්ත්වයට පත් කරන ක්‍රියාදාමයක් තමයි මේ ආණ්ඩුව ගෙන යන්නේ. ඒ බව අවධාරණය කරන අතරම රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් ප්‍රගතිය 2010 පිළිබඳ තොරතුරු අඩංගු මේ ලේඛනය -අලාභ ලේඛනය- මා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ඔබතුමාට ස්තුතියි.

***සභාමේසය මත තබන ලද ලේඛනය :***
*சபாபீடத்தில் வைக்கப்பட்ட கூற்று :*
*Statement tabled:*

<u>රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් ප්‍රගතිය 2010</u>

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් 2010 වර්ෂයට අදාලව නිකුත් කරන ලද වාර්ෂික වාර්තාවේ, 2010 වර්ෂයේ රජයට අයත් ව්‍යාපාරයන්හි මූල්‍ය තත්ත්වය පිළිබඳ කරුණු දක්වා ඇත. එම වාර්තාවට අනුව 2010 ඌන ක්‍රියාකාරිත්ව රාජ්‍ය ආයතන, අකර්මන්‍ය රාජ්‍ය ආයතන 23 ක් සම්බන්ධයෙන් තොරතුරු අඩංගු වේ. මෙම පාඩු ලබන රාජ්‍ය ව්‍යාපාර සඳහා 2010 වර්ෂයේ රජය විසින් රු. මිලියන 30,661 ක් එනම් ද.දේ.නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 0.5% ක ලෙසට මෙහෙයුම් ආධාර ලබාදී ඇත.

රජය විසින් රාජ්‍ය ව්‍යාපාරවල මෙහෙයුම් කටයුතු මූල්‍යනය කිරීම සඳහා ඇපකර නිකුත් කිරීම මගින් ද සහාය ලබාදෙන ලදී. ඒ අනුව, 2010 වර්ෂය අවසානයේ නිකුත් කරන ලද ඇපකරවල වටිනාකම රු.මිලියන 189,412 වේ. එය රජය විසින් නිකුත් කරන ලද සමස්ත ඇපකර ප්‍රමාණයෙන් 90% ක් වන අතර වැඩිශයෙන් ඇපකර ලබාදී ඇත්තේ විදුලිය, ඛනිජ තෙල්, පොහොර යන රාජ්‍ය ව්‍යාපාර සබන්ධයෙනි. එම වාර්තාවේ සඳහන් පරිදි, ලංකා විදුලිබල මණ්ඩලයට මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා 2010 දී ලබාදුන් ඇපකර රු.මි. 14,741 ක් විය.

| රාජ්‍ය ව්‍යාපාර | 2009 රු.මිලියන | 2010 රු.මිලියන |
|---|---|---|
| ලංකා විදුලි බල මණ්ඩලය (ලාභය)<br>(මෙහෙයුම් අලාභය) | (11,208)<br>(7,440) | 5,062<br>(4,962) |
| ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය (ශුද්ධ අලාභය) | (1,417) | (14,662) |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය (ශුද්ධ අලාභය) | - | (1,190) |
| ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව (මෙහෙයුම් අලාභය) | (14,735) | (12,343) |
| ශ්‍රී ලන්කන් ගුවන් සමාගම (බද්දට පෙර ශුද්ධ අලාභය) | (9,269) | (2,674) |
| මිහින් ලංකා පුද්ගලික සමාගම (ශුද්ධ අලාභය) | (1,300) | (1,221) |
| ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශුද්ධ අලාභය) | (297) | (830) |
| නාගරික සංවර්ධන අධිකාරිය (ශුද්ධ අලාභය) | | (143.34) |
| ලංකා ධීවර සංස්ථාව (ශුද්ධ අලාභය) | | (59) |
| ලංකා ධීවර වරාය සංස්ථාව (ශුද්ධ අලාභය) | ( 212.7) | (16.5) |
| සීමා සහිත ලංකා නැව් සංස්ථාව (ශුද්ධ අලාභය) | | (57.1) |

*සකස් කිරීම : පර්යේෂණ අංශය - පාර්ලිමේන්තු පුස්තකාලය 2011 ජුනි 21*

[අ. භා. 4.30]

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව සඳහන් කළා. නමුත් එතුමාට අමතක වෙලා. ඒ රාජ්‍ය ව්‍යාපාර මේ රටේ ජනතාවට අභිමි කරපු යුගය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා මහජන සේවාවන්. මේ විධියට බැලුවොත් අපට පාසල්වලිනුත් සල්ලි හම්බ කරන්න වේවි. මේ විධියට බැලුවොත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙනුත් සල්ලි හම්බ කරන්න වේවි. මේවා මහජන සේවාවන්. අද ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා මෙතැන හිටියා නම් කියාවි, අද අපි ඩීසල් ලීටරයක් දෙන්නේ රුපියල් 76කටයි. නමුත් අපට ඩීසල් ලීටරයකට රුපියල් 110ක් වැය වෙනවා. [බාධා කිරීමක්] කීයක් වැය වෙනවාද?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

එච්චර වන්නේ කොහොමද? Landed cost එක එච්චර වන්නේ නැහැ නේ.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

Landed cost එකට බදු දෙන්න පුළුවන්ද? ඔබතුමාගේ ප්‍රවීණ බුද්ධියෙන් කියන්න landed cost එකට බදු දෙන්න පුළුවන්ද කියලා. අසත්‍ය කියන්න එපා. මිනිස්සු නොමග යවන්න එපා. Landed cost එකට දෙන්න පුළුවන් නම් වරායෙන් බඩු බාපු ගමන් එතැන තමයි විකුණන්න වන්නේ. [බාධා කිරීමක්] පෙට්‍රල් ගහන්න වරායට යන්න ඕනෑ. ත්‍රීවීලර් එක අරගෙන පෙට්‍රල් ගහන්න වරායට යන්න ඕනෑ. [බාධා කිරීමක්] බහුබූත කථා කරන්න එපා. තමුන්නාන්සේගේ පණ්ඩිතකම තමුන්නාන්සේට තියා ගන්න. බහුබූත. Landed cost එකට බදු දෙනවා නම් කාර් එක අරගෙන තෙල් ගහන්න වරායට යන්න ඕනෑ. මේ වාගේ ගොන් කථා කියන්න එපා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

බහුබූත නොවෙයි.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

ගොන් කථා කියලා මෝඩකම පෙන්වන්න එපා. [බාධා කිරීමක්] තමුන්නාන්සේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

පෙට්‍රල් ලීටරයක් රුපියල් 110ක් වන්න බැහැ.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද එක්සත් ජාතික පක්ෂයට මේ රට නොමග යවන්න බැරි වෙලා. ඇයි? මීට කලින් අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කථා කළා. එතුමා කිව්වේ මොනවාද? Human Rights Commission of Sri Lanka ගැන කිව්වා. ඉන්දියාවේ හිටපු ශ්‍රීමත් ජවහර්ලාල් නේරු මැතිතුමා හිරේ ඉන්න කොට පොතක් ලිව්වා. ඒක කියවන්න. ඒ පොතේ නම "The Discovery of India" එතුමා ඒ පොතේ ලිව්වේ මොනවාද? ලංකාවේ ත්‍රිකුණාමල වරායත්, ඉන්දියාවේ බොම්බාය වරායත් බටහිර ජාතීන් විසින් අල්ලා ගන්න යනවා කිව්වා රුසියාවට ගහන්න. එතුමා එහෙම ලිව්වා. අද මොකක්ද කරන්නේ? අද අන්තර්ජාතික සම්බන්ධකම් ගැන කථා කරනවා. අන්තර්ජාතික වශයෙන් තිබෙන යුද මාෆියාව ගැන අවබෝධයක් නැතිව වාගේ කථා කරනවා. මේ ආණ්ඩුව, මේ රට වල පල්ලට දමන්න හදන කුමන්ත්‍රණකාරයෝ. මේ රටේ ජනතාවගේ නිදහස අහුරන්න හදන එක තමයි මේ කුමන්ත්‍රණය. අද කරන්න තිබෙන්නේ අපි සියලු දෙනාම එකතු වෙලා මේ ප්‍රශ්නවලට උත්තර දෙන එකයි. Channel 4 ගැන කථා කළා. බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්තුමාට කියන්න බැරිද, ඉසිප්‍රියා පිටුවහල් කරන්නය කියලා. ඇයි, කට

[ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා]

ඇරලා කියන්න බැරි? කොටි ඩෙනුවක් කරන මේ වැඩේ ගැන කථා කරන්න බැරි ඇයි? බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයට කථා කරලා කියන්න ඇයව පිටුවහල් කරන්න කියලා. ලංකාවේ මිනීමරු සංවිධානයක සාමාජිකාවක්, මුහුදු කොටි නායකයකුගේ බිරිඳක් කියලා ඉසිප්‍රියා එංගලන්තයෙන් පිටුවහල් කරන්න කියලා කියන්න කෝ. ඒක නේද, අන්තර්ජාතික සම්බන්ධකම දියුණු කරන විධිය? ඒක නේද, රටවල්වලට ගරු කරන විධිය? ඇයි, මේ රට නොමඟ යවලා බහුබූත කථා කියන්නේ? බලන්න, මහින්ද රාජපක්ෂ මැතිතුමා ඊයේ පෙරේදා අන්තර්ජාතික මට්ටමේ සම්මන්ත්‍රණයකට සහභාගි වන්නට සෝවියට දේශයට ගියා. එතුමාට චීනයෙන් ලැබුණ සහයෝගය කොච්චරද? රුසියාවෙන් ලැබුණ සහයෝගය කොච්චරද? මේ සහයෝගය ලබා ගත යුත්තේ ඇමෙරිකාවෙන් සහ එංගලන්තයෙන් පමණද? තමුන්නාන්සේලාගේ වහල් මෙනියාව. යටත් විජිත යුගයේ තමන්ට ලැබුණු උරුමය. ඔය කලිසම ගලවන්නටත් බැහැ, ඔය ඉංග්‍රීසි අත් හරින්නටත් තමුන්නාන්සේලාට බැහැ. මොකද, ඒ වහල් මානසිකත්වය. The majority of Sri Lankans are not English-oriented people. They are real villagers. We want to protect this majority in Sri Lanka. That is the thinking of the Sri Lanka Freedom Party. Do not forget that.

මේ රටේ ජනතාව වෙනුවෙන් ගොවියාට පොහොර සහනාධාරය දෙන්න කථා කළේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා නොවෙයිද? මැදමුලනෙන් ආපු ගමේ ගැමි සුවඳ දන්නා නායකයා නොවෙයිද ඒ තීන්දුව ගත්තේ? ඒක යූඑන්පී එක කළාද?

අද මේ රටේ සහල්වල ආසනික් තිබෙනවාය කියලා අනියත බියක් ඇති කර තිබෙනවා. එකත් එකටම පාන්පිටිකාරයින්ගෙන් කොමිස් ගහ ගෙන පාන්පිටිකාරයන්ට පන්දම අල්ලා ගෙන, බත් කන ජනතාව පාන්පිටිවලට තල්ලු කරන්න- [බාධා කිරීම්] පණ්ඩිතකම.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු ඇමතිතුමනි, [බාධා කිරීමක්]

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ඔබතුමා කථා කරන වෙලාවට කියන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ, විමල් වීරවංශ ඇමතිතුමා ඒ ගැන නිරතුරුව කථා කළා.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
මේවා කවුරු කිව්වත් එකක් තේරුම් ගන්න ඕනෑ. මේ රටේ බත් කන මිනිස්සු ඒවා පිළිගන්නේ නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
රතන හාමුදුරුවෝ මේවා කියනවා.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
මේ රටේ බත් කන මිනිස්සු මේවා පිළිගන්නේ නැහැ. [බාධා කිරීමක්] අමුවෙන් හාල් කන්නේ නැහැ, හොඳට තම්බලා කන්නේ. සහල් දැඩි උෂ්ණත්වයකට භාජනය කරලා තමයි ආහාරයට ගන්නේ. ඒ නිසා මේ රටේ බහුතර ජනතාවට සහල්වලින් කිසි හානියක් වෙලා නැහැ.

පොඩි තැනක පොඩි දෙයක් අහුලා ගෙන ඒක මහා විශාල කර ගෙන තිබෙනවා. එකත් එකටම පාන් පිටි ආනයනය කරන සමාගම්වලින් කොමිස් අරගෙන, මහජනතාව නොමඟ යවන්න කියන කතා මේවා. ඒක තමයි ඇත්ත. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා විරුද්ධ පක්ෂයේ ඉඳ ගෙන ඕවා කියන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයෙන් කිව්වත්, විරුද්ධ පක්ෂයෙන් කිව්වත් වැරදි දේ වැරදියි කියන්න ඕනෑ. මේ රටේ ජනතාව නොමඟ යවන්න කාටවත් පුළුවන් වන්නේ නැහැ. ඒ නිසා අපි ඇත්ත කතා කරන්න ඕනෑ. බත් කන මිනිස්සුන්ගේ බත් වේලට ගහන්නයි මේ හදන්නේ. ඒකට මේ රටේ ඉඩක් නැහැ කියන එක මම මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ කරු ජයසූරිය මන්ත්‍රීතුමා ගැන මම කනගාටු වෙනවා. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම සඳහා අවසර ඉල්ලා සිටීමේ එතුමාගේ යෝජනාව අද පරාජයට පත් වුණා. තොරතුරු දැන ගැනීමේ අයිතිය, නිදහස තමයි එතුමා ඒ පනත් කෙටුම්පතින් ඉල්ලා සිටියේ. තොරතුරු දෙන්න ඕනෑ. කාටද තොරතුරු හංගන්නේ? තොරතුරු දෙන්න ඕනෑ. තොරතුරු කාටවත් හංගන්න වුවමනාවක් නැහැ. තොරතුරු දැන ගන්න මහජනතාවට අයිතියක් තිබෙනවා. ඒක දෙන්න ඕනෑ. මම එතුමාගෙන් පැහැදිලි කිරීමක් ඉල්ලුවා. නමුත් එතුමා මට ඒ පැහැදිලි කිරීම දුන්නේ නැහැ. මම එතුමාගෙන් අහනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුද හමුදාවේ තිබෙන තුවක්කු ගණනත් දැන ගන්න ඕනෑද කියා. මේ රට පාවා දෙන සතුරාට තොරතුරු දෙන්න කරන කුමන්ත්‍රණයේ තවත් පියවරක් තමයි කරු ජයසූරිය මන්ත්‍රීතුමා අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. ඒකද මේ රටේ තොරතුරු තාක්ෂණය? ඒකද තොරතුරු දැන ගන්න තිබෙන වුවමනාව? ඒකද තොරතුරු දැන ගැනීමේ ආශාව? [බාධා කිරීමක්] තමුන්නාන්සේගේ ප්‍රශ්න ගැන මට තේරුමක් නැහැ. මම අහන්නේ, යුද්ධ හමුදාවේ කාල තුවක්කු කීයක් තිබෙනවාද, යුද්ධ හමුදාවේ රයිෆල් කීයක් තිබෙනවාද, ටී 56 කීයක් තිබෙනවාද, යුද්ධ ටැංකි කීයක් තිබෙනවාද කියා දැන ගන්න තමුන්නාන්සේලාට වුවමනාද කියන එකයි. තමුන්නාන්සේලාට කවදාවත් මේවා දැන ගන්න හම්බ වෙන්නේ නැහැ. අපි දන්නවා තමුන්නානේස්ලා කාටද මේ තොරතුරු ලබා දෙන්න යන්නේ කියා. ඒක මේ ආණ්ඩුව හොඳින් දන්නවාය කියන එක මම මේ වෙලාවේ තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ. ඒ නිසා මේ රටේ ඒ කුමන්ත්‍රණකාරයින්ට ඉඩ දෙන්න පුළුවන් කමක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරපු ජනතාව මේ සියල්ල වරින් වර, නැවත නැවතත් පරාජය කරලා තිබෙනවාය කියන එකත් මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

1931 දී ඩොනමෝර් සාමි ඇවිල්ලා අපට සර්ව ජන ඡන්ද බලය යෝජනා කළා. රාජ්‍ය මන්ත්‍රණ සභාව යෝජනා කළා. මේ වන කොට අවුරුදු 80ක් වරින් වර ඡන්ද බලයෙන් මේ රටේ ආණ්ඩු හදපු, ආණ්ඩු පෙරළපු නිදහස් මිනිස්සු ජීවත් වෙන රටක් මේක. ත්‍රස්තවාදය කිහිප වරක් ඔළුව ඉස්සුවා. ජනතා විමුක්ති පෙරමුණේ නාමයෙන් එළියට ආවා. එල්ටීටීඊ එකේ නාමයෙන් එළියට ආවා. කොයි නාමයෙන් එළියට ආවත් ත්‍රස්තවාදයට මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය මරන්න බැරි වෙච්ච බව පමණක් ඉතිහාස පොතේ ලියැවෙන බව මතක තබා ගන්නය කියන එක මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. මේක ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා

කරපු රටක්; ප්‍රජාතන්ත්‍රවාදීව ආණ්ඩු වෙනස් කරපු රටක්. ඒ දර්ශනය මත පිහිටා වැඩ කරන ආණ්ඩුවක්. ඒ දර්ශනය මත පිහිටා වැඩ කරන කරන නායකයෙක් ඉන්නා රටක් හැටියට අද අපි ඉතාම සතුටු වෙනවා, මේ රටේ ජනතාවට ලැබී තිබෙන නිදහස ගැන. ඒකයි අපට වුවමනා කරන්නේ. ඒකයි අප බලාපොරොත්තු වන දේ. එදා ඩොනමෝර් සාමි ඇවිල්ලා රාජ්‍ය මන්ත්‍රණ සභාව යෝජනා කරපු වෙලාවේ ව්‍යවස්ථාදායක සභාවේ 19 දෙනෙක් සර්ව ජන ඡන්ද බලයට පක්ෂ වුණා, 17 දෙනෙක් විරුද්ධ වුණා. අන්න ඒකයි මේ රටේ ඉතිහාසය. මේ රටේ ඉතිහාසය ඒකයි. සර්ව ජන ඡන්ද බලයටත් විරුද්ධ වෙච්ච මිනිස්සු හිටපු රටක් මේක. මෙතුමන්ලා ප්‍රජාතන්ත්‍රවාදය ගැන අද බුරනවා; අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරනවා. හැබැයි, එදා සුද්දා ගෙනාපු සර්ව ජන ඡන්ද බලයටත් විරුද්ධ වෙච්ච මිනිස්සු හිටියාය කියන එක ඉතිහාස පොතේ ලියැවිලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. බලන්න අර්ථසාධක අරමුදල. අද මෙතැන ඇවිල්ලා කිඹුල් කඳුළු හෙළනවා. දැන් මෙතැන සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා අර්ථසාධක අරමුදලේ ජාතකය කිව්වා. "මේක බණ්ඩාරනායක මැතිතුමා කරපු වැඩක් නොවෙයි; මේක ඒ කාලයේ සිද්ධ වෙච්ච එකක්. ඒකේ සම්මානය යන්නේ ඒ කාලයේ පැවැති පෞද්ගලික අංශයටයි" කියන එක තමයි පෙන්වන්න හදපු පින්තූරය. වෙන මොකක්ද මේකේ තිබෙන රහස? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයෙන් පැවතුණු, 1958 දී බණ්ඩාරනායක මැතිතුමා, ඉලංගරත්න මැතිතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු අර්ථසාධක අරමුදලටත් විරුද්ධ වෙච්ච මිනිස්සු තමයි මේ විරුද්ධ පක්ෂයේ වාඩි වෙලා ඉන්නේ. ඒ නිසා මේවා අමතක කරන්න මේ රටේ ජනතාව ලෑස්ති නැහැ කියන එකත් මම කියන්න ඕනෑ. මේ රටේ දේශපාලනය ගැන වැරදි පින්තූර පෙන්වලා මේ රටේ ජනතාවට වැරදි චිත්‍රයක් මවන්න මේ උදවියට පුළුවන් වන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රට ආරක්ෂා කර ගන්න නම් මේවා තේරුම් ගන්න අවශ්‍යයි. අද මේ රට වැදගත් ගමනක් යන වෙලාවක්.

අද සම්මත කරීම සඳහා ඉදිරිපත් කර තිබෙන්නේ විසර්ජන පනත යටතේ යෝජනායි. අපේ මූල්‍ය බලතල තිබෙන්නේ පාර්ලිමේන්තුවට. විපක්ෂ නායකතුමා උදේ කිව්වා, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අපේ පාර්ලිමේන්තුවට තියෙන බලය ගැන. ඒක තමයි අද මේ ක්‍රියාත්මක වෙන්නේ. ඒකේ වෙන මොකුත් නැහැ. පාර්ලිමේන්තුව විසින් මෙය සම්මත කිරීම අත්‍යවශ්‍යයි. ඒක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් දීලා තිබෙන බලය. ඒක තමයි අද අපි ක්‍රියාත්මක කරන්නේ. මේ රටේ ජනතාවගේ නාමයෙන් මේ මුදල් ජනතාවට හොරෙන් සම්මත කරන්නේ නැහැ. ජනතාව දැනුවත් වන විධියට තමයි මේක සම්මත කරන්නේ. දැන් බලන්න, අද ආර්ථිකයේ වර්ධනය මොන තරම් වේගයකට ගිහිල්ලාද කියලා. 2008 අවුරුද්ද ගත්තොත් උද්ධමනය කොච්චර තිබුණාද? අද උද්ධමනය කීයද? අද උද්ධමනය තනි ඉලක්කමක් - single digit - හැටියටයි තිබෙන්නේ. අද උද්ධමනය කොච්චර පහළට ඇවිල්ලා තිබෙනවාද? ඒක ආර්ථික සංවර්ධනය මනින්න උපාය මාර්ගයක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්න කැමැතියි ආර්ථික විද්‍යාව ශුද්ධ විද්‍යාවක් නොවෙයි කියලා. මේක pure science නොවෙයි. මේක social science. මේක සංකල්ප උඩ තියෙන්නේ. මේකේ විචල්‍යයන් රාශියක් තියෙනවා. මේක වෙනස් වෙන්න පුළුවන්. ආර්ථිකයේ මේ දෙන දත්ත වෙනස් වෙන්න පුළුවන්. මේ දත්ත උඩ දෙන නිගමන වෙනස් වෙන්න පුළුවන්. ඒක අපි පිළිගන්න ඕනෑ කාරණයක්. මහ බැංකු වාර්තාවේ යම් යම් දේවල් ගත්තාම සමහර විට වගාව ගැන වෙන්න පුළුවන්; නිෂ්පාදනය ගැන වෙන්න පුළුවන්; මුළු ලංකාව පුරාම එකතු කරන තොරතුරුවලින් එන නිගමන වෙන්න පුළුවන්; සමහර ඒවායේ යම් අඩු පාඩුකම් තිබෙන්න පුළුවන්. මොකද ආර්ථික විද්‍යාව ශුද්ධ විද්‍යාවක් නොවෙයි. ඒක සමාජ විද්‍යාවක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මානව හිමිකම් ගැන කථා කරපු අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාට මම කියන්නට ඕනෑ, එතුමාට කරන්න තියෙන්නේ මේ රටේ ප්‍රතිරූපය කෙලෙසන මේ දේශ ද්‍රෝහීන්ට විරුද්ධව ක්‍රියා කරන්න ආණ්ඩුවත් එක්ක එකතු වෙන එකයි කියලා. එහෙම එකතු වෙලා මේ රටේ ජනතාවගේ නිදහස ආරක්ෂා කරන්න; මේ රට කුමන්ත්‍රණකාරීන්ගෙන් ආරක්ෂා කරන්න කටයුතු කරන්න. මේ රටේ කැරලිකාර තත්ත්වයක් ඇති කරලා මේ රට තුළ ජනතාවගේ නිදහස අහිමි කරන්න; ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කරන්න එන කුමන්ත්‍රණවලට අහු වෙන්නේ නැතිව තම වගකීම ඉෂ්ට කරන්න විපක්ෂයක් හැටියට කටයුතු කළ යුතුයි කියන කාරණය එතුමාට මතක් කරමින් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන කිහිපය සමාප්ත කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊළඟට ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

[අ. භා. 4.43]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට කලින් කථා කරපු මන්ත්‍රීතුමන්ලාගේ කථාවලට යම් කිසි පිළිතුරක් දෙන්න අවශ්‍ය වෙනවා. ගරු රෝහණ දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන කොට කිව්වා මේ ලෝකයේ මිනිස්සු අභ්‍යවකාශ ලෝකයත් ජය ගත්තාය, ඒ අභ්‍යවකාශ ලෝකය ජය ගත්ත මිනිස්සුන්ට internet කියලා එකක් තියෙනවාය, ඒ internet එක හරහා සියලුම තොරතුරු ලබා ගන්න පුළුවන්ය, හැම මන්ත්‍රී කෙනෙකුටම විමර්ශන නිලධාරීන් ඉන්නවාය, ඒ විමර්ශන නිලධාරීන්ගේ ආධාරයෙන් සියලුම තොරතුරු ලබා ගන්න පුළුවන්ය කියලා. මම හිතන්නේ එතුමා කියවලා නැහැ, මේ තොරතුරු ලබා ගැනීමේ නිදහස කියලා අද කරු ජයසූරිය මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු පනත් කෙටුම්පත. ඒකේ තියෙන්නේ සාමාන්‍යයෙන් ජනතාවට ලබා ගන්න බැරි, internet එකේ නැති තොරතුරු ලබා ගැනීම ගැනයි. එතුමා දුම්රිය ගැන කථා කරපු නිසා ඒ ගැනත් කථා කරන්න ඕනෑ. ඕමන්තේ දක්වා කිලෝමීටර් දහයේ දුම්රිය මාර්ගය - අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා වාගේ- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරු වැඩ කරලා ඔබතුමාගේ පැත්තේ හැදුවා වාගේ කිලෝමීටරයක් ඇමෙරිකන් ඩොලර් දශම හතරයි පහ ගණනේ හදලා තිබෙනවා. මේ පනත තිබුණා නම් අපට අහන්න පුළුවන්, ඕමන්තේ කෝච්චි පාරේ ඉතුරු ටික හදන්න කිලෝමීටරයකට ඇමෙරිකන් ඩොලර් මිලියන දෙක ගණනේ විදේශ ආයතනයකට දෙන්න යනවාය කියලා කියන්නේ ඇත්තද කියලා. ඕවා අන්තර්ජාලයේ නැහැ. මගේ විමර්ශන නිලධාරියාට degree එකක් තිබුණාට එතුමාට ඒක හොයා ගන්න ක්‍රමයක් නැහැ.

මට කලින් කථා කළ මන්ත්‍රීතුමා කරු ජයසූරිය මහත්තයාට ද්‍රෝහියකුට වාගේ කථා කළා; සමච්චල් කළා, එතුමා ඉදිරිපත්

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

කළ මේ පනත් කෙටුම්පත යටතේ, අපේ යුද හමුදාවේ කොච්චර තුවක්කු තිබෙනවාද, කොච්චර යුද්ධ ටැංකි තිබෙනවාද, කොච්චර බෝම්බ තිබෙනවාද කියලා හොයා ගෙන, ඒ තොරතුරු අපිට විරුද්ධ කට්ටියට භාර දෙන්න පුළුවන් කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමාට මම උපුටා දක්වන්න කැමැතියි, අද විවාද කරන "තොරතුරු ලබා ගැනීමේ නිදහස" පනත් කෙටුම්පතේ දෙවන පිටුවේ "... තොරතුරු ලබා ගැනීමේ අවස්ථාව ප්‍රතික්ෂේප කිරීම" කියලා කියන කොටස. ඒ කොටසේ මෙන්න මෙහෙම දෙයක් තිබෙනවා, "රාජ්‍යයේ ආරක්ෂාවට හෝ එහි භෞමික අඛණ්ඩතාවට හෝ ජාතික සුරක්ෂිතතාවට හෝ දරුණු හානියක් වනවා නම් ඉල්ලන ඒ තොරතුරු ප්‍රතික්ෂේප කරන්න ආණ්ඩුවට පුළුවන්" කියලා. ඉතින් " ශ්‍රී ලංකා යුද හමුදාවට තුවක්කු කීයක් තිබෙනවාද කියලා අපිට දැන ගන්න ඕනෑ" කියලා කවුරු හෝ කිව්වොත්, මේ පනත් කෙටුම්පතට අනුව ඒකට උත්තරය දෙන්න ආණ්ඩුව බැඳිලා නැහැ. ඇයි මේ නිකම් බොරුවට මේ පනත් කෙටුම්පතේ නැති දේවල් ගැන කියලා පනත් කෙටුම්පත හෑල්ලුවට ලක් කරන්නේ?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera )
එහෙම නම් අලුත් පනත් කෙටුම්පතක් ගෙනෙන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
දැන් බලන්න, මේ පනත් කෙටුම්පතේ එහෙම දෙයක් නැහැ. රටේ ආරක්ෂාවට හානි වන කිසියම් තොරතුරක් කවුරු හෝ ඉල්ලා තිබෙනවා නම් ඒ ඉල්ලන තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන්න ආණ්ඩුවට පුළුවන්.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
මේ පනත් කෙටුම්පතේ නම් නැහැ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
දැන් බලන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ළඟ තිබෙනවා ඉන්දියාවේ "Right to Information Act" එක. මේ පනතේ එක් කොටසක් විතරක් කියවන්න මම කැමැතියි. මේ පනතේ තිබෙනවා, කාටද, කොහොමද මේ තොරතුරු ඉල්ලන්න පුළුවන් කියලා. ඕනෑම කෙනකුට, ඕනෑම තොරතුරක් ඉල්ලන්න පුළුවන්, ලියුමක් ලියලා හෝ ඊ-මේල් එකකින්. වඩාත්ම වැදගත් දේ මෙන්න මේකයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ පනතේ තිබෙනවා, ඉල්ලා තිබෙන තොරතුරු ලබා දෙන්න කොච්චර කාල වේලාවක් ආණ්ඩුව ගන්න ඕනෑද කියලා. දැන් අපි ප්‍රශ්නයක් අහන සමහර වෙලාවට ඇමතිතුමන්ලා මෙතැන ඇවිල්ලා කියනවා, "මේකට උත්තර දෙන්න අපිට දවස් 30ක් ඕනෑ, දවස් 60ක් ඕනෑ, දවස් 90ක් ඕනෑ" කියලා. නමුත් මොකක්ද මේ පනතේ තිබෙන්නේ? What is the time limit to get the information? It is 30 days from the date of application. ඉන්දියාවේ ඕනෑම තැනක පුද්ගලයෙක් මේ Right to Information Act එක යටතේ ප්‍රශ්නයක් ඇහුවොත් ඒකට උත්තරය දවස් 30ක් ඇතුළත දෙන්න ඕනෑ. පැනලා යන්න බැහැ.

ඊළඟට, "Forty eight hours for information concerning life and liberty of a person" කියලා සඳහන් වනවා. මනුෂ්‍යයින්ගේ ජීවිතයත් එක්ක තිබෙන ප්‍රශ්නයක් නම් දවස් දෙකක් ඇතුළත - පැය 48ක් ඇතුළත- අවශ්‍ය පිළිතුර ලබා දෙන්න ඕනෑ. ඒවා ගැන සෑහෙන්න articles ලියලා තිබෙනවා. මා ළඟ එක් article එකක් තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ, "Impact of Right to Information on Development" කියන ලිපිය. ඒකේ මොකක්ද කියන්නේ? තොරතුරු ලබා ගැනීමේ නිදහස හා රටේ සංවර්ධනය අතර තිබෙන සම්බන්ධතාව මොකක්ද කියන එක. කවුද මේක ලියලා තිබෙන්නේ? මේක ලියලා තිබෙන්නේ එම්.එම්. අන්සාරි. එතුමා තමයි Information Commissioner, Central Information Commission, New Delhi. එතුමා පිටු ගණනක තර්කයක් ඉදිරිපත් කරලා එහි පෙන්වලා තිබෙනවා, ඉන්දියාවේ සංවර්ධන වේගය වැඩි වීමට ප්‍රධාන හේතුවක් තමයි මේ තොරතුරු ලබා ගැනීමේ නිදහස පනත ඉන්දියාවේ 2005 දී ක්‍රියාත්මක වීම කියලා. මම නැවතත් මතක් කර දෙන්න කැමැතියි, මේ පනත ඉස්සෙල්ලාම ඉදිරිපත් කළේ ලංකාවේදී, 2004 දී, රනිල් වික්‍රමසිංහ ආණ්ඩු කාල සීමාවේදීයි කියන එක.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු තිලංග සුමතිපාල මහතා, මොකක්ද රීති ප්‍රශ්නය?

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මන්ත්‍රීතුමා උත්සාහයක් දරන්නේ උදේ පරාජයට පත් කරපු ඒ පනත් කෙටුම්පත ගැන මේ අවස්ථාවේදී මේ විසර්ජන පනත යටතේ වූ යෝජනා යටතේ සාකච්ඡා කරන්න. මම ඒක එහෙම කියන්නේ -

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒකේ point of Order එකක් නැහැ.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
මේ සභාවේ සාකච්ඡාවට අරගෙන, ඡන්දයට ගිය පනත් කෙටුම්පතක් ගැන කථා කරන්නේ. ඒකේ යම් යම් කොටස්වලට පක්ෂයක් හැටියට, රජයක් හැටියට අපේ එකඟතාව තිබෙනවා.මෙතුමා ඔහුගේ කථාවේදී උත්සාහ ගන්නවා, පාර්ලිමේන්තුවේදී ගත්තු ඒ තීන්දුවට පරිබාහිරව ගිහින් එතුමාගේ ප්‍රසිද්ධිය සඳහා මේ අවස්ථාව ගන්න. ඒක වැරදියි. ඒක සම්පූර්ණයෙන් වැරදියි ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒකේ point of Order එකක් නැහැ. මගේ කාලය ගන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝගවලට පටහැනි යමක් ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා නම් එම කොටස් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමට කටයුතු කරනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මම එහෙම කිසිම දෙයක් කථා කළේ නැහැ. මම කථා කළේ, මම පෙන්වලා දුන්නේ ඉන්දියාවේ -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

If there is anything in your speech which is contrary to the Standing Orders, those portions will be expunged.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Hon. Deputy Speaker, I spoke of the Right to Information Act in India. I did not speak about the Freedom of Information Bill that was presented today.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Member, you can continue.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Sir, I spoke about the Right to Information Act in India. My esteemed Colleague perhaps did not hear that.

නමුත් ඒකට ප්‍රශ්නයක් නැහැ. මොකද, තොරතුරු ලබා ගැනීමේ නිදහස - Right to Information -නැතිකම නිසා ලංකාවේ සිද්ධ වෙන නොයෙකුත් ආර්ථික කළමනාකරණය පිළිබඳ කරුණු ගැන අපිට අවබෝධයක් නැහැ. අද අපි මෙතැනට ඇවිල්ලා සිටින්නේ මේ විසර්ජන පනතේ සංශෝධන ලැයිස්තුවක් ගැන කථා කරන්න. ඇත්ත වශයෙන්ම වෙන්නේ මොකක්ද කියලා දන්නේ නැත්නම් අපි කථා කරන්නේ කොහොමද? අපි මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇසුවාම මාස ගණන් කල් ඉල්ලනවා ඒ ප්‍රශ්නවලට උත්තර දෙන්න. අපිට කිසිම ක්‍රමවේදයක් නැහැ තොරතුරු ලබා ගන්න. එහෙම නම් කොහොමද අපි මේ රට සංවර්ධනය කරන්න විපක්ෂයක් හැටියට දායකත්වයක් ලබා දෙන්නේ? විපක්ෂයක් ඕනෑ නැත්නම්, ප්‍රජාතන්ත්‍රවාදයක් ඕනෑ නැත්නම් ඒක වෙනම දෙයක්. නමුත් අපිට කියනවා, ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙනවා, ශක්තිමත් විපක්ෂයක් අවශ්‍යයි කියලා. එහෙම කියනවා නම් මෙතැන ලොකු පරස්පරයක් තිබෙනවා. එතැන තමයි ගැටලුව තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මා ළඟ තිබෙනවා රාජ්‍ය ගිණුම් සම්බන්ධයෙන් ජනවාරි ඉඳලා අප්‍රේල් දක්වා, ඒ කියන්නේ මාස හතරක පූර්ණ වාර්තාව. අපි 2010 ජනවාරි - අප්‍රේල් කාලයේ බදු ආදායම එකතු කරලා තිබෙනවා රුපියල් බිලියන 204ක්. නමුත් 2011 වසරේ ඒ කාල පරිච්ඡේදය තුළම රුපියල් මිලියන 249.8ක් දක්වා, එහෙමත් නැත්නම් සියයට 22ක් දක්වා මේ බදු වැඩි කරලා තිබෙනවා. සාමාන්‍ය ජනතාවගෙන් වැඩිපුර බදු අරගෙන තිබෙනවා. මොනවාගෙන්ද? කිරි පිටිවලින්, ගෑස්වලින්, සීනිවලින්, පරිප්පුවලින්, ලූණුවලින්, අලවලින්, සැමන්වලින්, පෙට්‍රල්වලින්, ඩීසල්වලින්, ජංගම දුරකථනවලින් යන මේ හැම එකකටම බදු ගහලා තව රුපියල් බිලියන 49.8ක් මේ මාස හතරට පමණක් ජනතාවගෙන් අරගෙන තිබෙනවා. හරි. ඒක එහෙම තියමු කෝ. නමුත් ඊට වඩා වැදගත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය අදාළ වෙනවා තොරතුරු ලබා ගැනීමේ නිදහසත් එක්ක. ඒ ප්‍රශ්නය ගෝල්ෆේස් එකේ පාරෙන් එහා පැත්තේ විකුණපු ඉඩම ගැනයි. අක්කර දහයද, දහසයද, විස්සද කියලා අපි දන්නේ නැහැ. Internet එකේ මේ තොරතුරු හරියට නැහැ. අපි ඇහුවාට ප්‍රශ්නවලට උත්තර දෙන්නේ නැහැ. මම මාර්තු මාසයේ 9 වැනිදා ඉඳලා මේ ගරු සභාවේ ඒ ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. කවුරුත් ඒකට උත්තරයක් දෙන්නේ නැහැ. නමුත් පෞද්ගලීකරණය කළාය කියලා අපි දන්නවා. ඒ දන්නේ කොහොමද? මම මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇසුවාම ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මෙන්න මෙහෙම කිව්වා. මම 2011 මාර්තු 9 වැනිදා හැන්සාඩ් වාර්තාවෙන් කියවන්නේ. බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මෙහෙම කියනවා:

> "මේ රජය තීන්දුවක් ගත්තා, සෑම ඉඩමක රජයේ තක්සේරු වටිනාකමට වැඩියෙන් මුදලක් අරගෙන තමයි, සම්පූර්ණ මුදලම රටට ගෙනාවාට පස්සේ තමයි ඉඩමේ අයිතිය දෙන්නේ කියලා."

ඊට පස්සේ මම අහනවා එතුමාගෙන්:

> "ගරු ඇමතිතුමා, සියයට සියයක් බදු ගෙවනවාද?"

එතකොට එතුමා කියනවා:

> "ඔව්. අපි මේ ආයතන දෙකෙන්ම සියයට සියයක් මුදල අරගෙන තමයි දෙන්නේ. අපට මේ වන කොට ඇවිල්ලා තිබෙනවා."

එහෙම නම් මෙතැන මහා ලොකු ගැටලුවක් තිබෙනවා. දැන් මම අහන්නේ මේකයි. මේ ඉදිරිපත් කරලා තිබෙන වාර්තාවල පළමුවැනි මාස හතරේ මේ ආදායම එකතු වෙලා තිබෙනවාද? තිබෙනවා නම් කොහේද තිබෙන්නේ? අපට පෙන්වන්න. මම මේ කියන කරුණු හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. මා ළඟ ඒ හැන්සාඩ් වාර්තාවේ දිනය නැහැ. මම පෙන්වලා දුන්නා perch එකක් විකුණලා තිබෙන්නේ රුපියල් මිලියන 8.25ට කියලා. මම එදා තර්ක කළා Horton Place එකේ, Barnes Place එකේ perch එකක් රුපියල් මිලියන 7 නම්, රුපියල් මිලියන 8.25ට විකුණපු එකේ යම් කිසි සාධාරණත්වයක් තිබෙනවාද කියලා. මම හිතුවා ඊට වඩා ගන්න තිබුණා ටෙන්ඩර් කළා නම් කියලා. ටෙන්ඩර් කළේ නැහැ කියලා මේ පාර්ලිමේන්තුවේදීම අපට උත්තරයක් දුන්නා. නමුත් රුපියල් මිලියන 8.25 කියන්නේ රුපියල් මිලියන 7ට වඩා වැඩි ගණනක්. නමුත් අපි අහන්නේ මේකයි. කෝ මේ සල්ලි? කොහේද මේවා තැන්පත් කළේ? මේ ගිණුම්වලින් අපට පෙන්වන්න පුළුවන්ද මේ සල්ලි ටික? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් මිලියන 8.25 ගණනේ විකුණුවා වාගේම මේකට සියයට සියයක බද්දක් ගන්න තිබෙනවා. ඒ බද්ද කෝ? කොහේද මේ බද්ද පෙන්වලා තිබෙන්නේ? අක්කර 10ක් නම් රුපියල් මිලියන 13,200ක්. බද්දත් එක්ක රුපියල් මිලියන 26,400ක්. එතකොට අක්කර විස්සක ඉඩමේ වටිනාකමත් රුපියල් මිලියන 26,400ක්. බද්දත් එක්ක රුපියල් මිලියන 50,000කට කිට්ටු මුදලක්. රුපියල් බිලියන 50ක්. කොහේද මේ මුදල් වාර්තා කරලා තිබෙන්නේ? ඒකයි අපි අහන්නේ.

ඊයේ පෙරේදා ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයකට ආණ්ඩුවෙන් උත්තරයක් දීලා තිබුණා. එතුමාගේ ප්‍රශ්නය වෙලා තිබුණේ, 2009 දී කැමවලට බදු කොච්චර ගැහුවාද කියන එකයි. ආණ්ඩුව උත්තරය දීලා තිබෙනවා, කෑම සඳහා බදු ගහලා තිබෙනවා රුපියල් මිලියන 22,100ක් කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රභාරක ගුවන් යානා විකුණන "කැටික්" කියන ආයතනය අර බද්ද ගෙව්වා නම් ජනතාවගේ සැමන් එකට, පරිප්පු කිලෝ එකට, අල කිලෝ එකට බදු ගහන්න අවශ්‍ය නැහැ. ඒක තමයි යථාර්ථය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අප කථා කරන්නේ විසර්ජන පනත යටතේ එන නියම සම්බන්ධයෙන්. මේ වාගේ දේවල් ගැන අප මීට වඩා අවබෝධයකින්, මීට වඩා ගැඹුරින් බලන්න ඕනෑ. ඒ එක පැත්තක්. මෙතැන තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, මේවා සම්බන්ධයෙන් අපට කිසිම විධියකට තොරතුරු

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

ලැබෙන්නේ නැති එක. පනතක් නැති නිසා අපට තොරතුරු ගන්නත් බැහැ. ඒ තොරතුරු පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරන්නේත් නැහැ. අප කියන්නේ, "කෝ මේ සල්ලි, මේ සල්ලිවලට මොකද වුණේ කියන එක කරුණාකර මොන විධියකට හරි පාර්ලිමේන්තුවට පෙන්වන්න" කියන එකයි. අපි කියන්නේ නැහැ කවුරු හරි ඒ සල්ලි පර්ස් එකේ දා ගෙන අර ගෙන ගියා කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වැනි ව්‍යවස්ථාවේ මොකක්ද කියන්නේ? මා ළඟ තිබෙනවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. 148වැනි ව්‍යවස්ථාවේ මොකක්ද කියන්නේ? එහි කියන්නේ රාජ්‍ය මූල්‍ය පිළිබඳව සම්පූර්ණ බලතල මේ පාර්ලිමේන්තුවට අයිතියි කියන එකයි. පාර්ලිමේන්තුවට අයිති නම් අපි මේ මුදල් ගැන දැන ගන්න ඕනෑ. පෞද්ගලීකරණයක් කරන කොට ඒ සම්බන්ධයෙන්, යම් දෙයක් විකුණුවාම හම්බ වෙන මුදල සම්බන්ධයෙන්, ඒවාට ගහන බදු සම්බන්ධයෙන් අහන්න අපට අයිතියක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 148වන ව්‍යවස්ථාවේ මෙන්න මෙහෙම සඳහන් වෙනවා: "Parliament shall have full control over public finance". එහෙම සඳහන් වෙලා තියෙද්දී තමයි මේ පාර්ලිමේන්තුවට පිටින් ක්‍රියා කරන්නේ. දැන් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මොකක්ද? වියදම ගැන පොඩ්ඩක් බලමු. රජයේ ගිණුම්වලට බාහිරව ආදායම පෙන්වනවා නම්, රජයේ ගිණුම්වලට බාහිරව -ඒ කියන්නේ පාර්ලිමේන්තුවේ බලතලවලට පිටින් ගිහිල්ලා- වියදමත් කරන්න පුළුවන්. එතැනයි ගැටලුව පැන නඟින්නේ. පාර්ලිමේන්තුවට පිටින් ගිහිල්ලා මේවා -විකිණීම්- කරනවා නම්, ඒ සල්ලි වෙන bank accountsවල දමනවා නම්, ඊට පස්සේ ඒවා වියදම් කරනවා නම් පාර්ලිමේන්තුවක් හැටියට අපට මොකක්ද තිබෙන බලය? කෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාවෙන් අපට දීලා තිබෙන බලය? එතැන ඉතා විශාල ප්‍රශ්නයක් තිබෙනවා කියලා අපට පෙනෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විනාඩියක් පමණක් තිබෙන නිසා මා ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි මේ වියදම් සම්බන්ධයෙන්. ඉස්සර වෙලා ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කරපු කථාවේදී කිව්වා, අපට තවම DCB එක හම්බ වෙලා නැහැ කියලා. සාමාන්‍ය මන්ත්‍රී කෙනකුට රුපියල් මිලියන පහක් හම්බ වෙනවා, නමුත් මේ පාර විමධ්‍යගත අරමුදලින් ඒ රුපියල් මිලියන පහ හම්බ වෙලා නැහැ කියලා එතුමා කිව්වා. එතුමා තවදුරටත් කිව්වා, ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට නම් ප්‍රශ්නයක් නැහැ, "ගම නැඟුම", "මඟ නැඟුම", "දිවි නැඟුම", මේ නැඟුම, ඒ නැඟුම වැනි නැඟුම්වලින් අතිවිශාල මුදල් සම්භාරයක් වියදම් කරන්න හම්බ වෙනවා කියලා. මා ගාව තිබෙනවා fax message එකක් under the title, “Road Construction and Development Project - Nuwara Eliya 2011”. මාර්ග සංවර්ධන අධිකාරිය එය භාර ගෙන තිබෙන්නේ 2011 අප්‍රේල් මාසයේ 26වැනි දා. මොකක්ද මෙහි කියන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි සඳහන්ව තිබෙනවා පාරවල් සංවර්ධනය කිරීම යටතේ වෙන් කිරීම. නමුත් මෙහි කිසිම තැනක කියලා නැහැ මේ පාරවල දිග කීයද, දුර කීයද, පළල කීයද, පාලම් තිබෙනවාද, නැද්ද කියලා. මම උදාහරණ දෙකතුනක් කියන්නම්: Maskeliya to Mocha Estate, Maskeliya to Mittodiyan, Maskeliya to Lanka Estate, Norwood to Venture Estate, Norwood to Newton Estate. ඔය විධියට ස්ථාන 50ක් තිබෙනවා. මොකක්ද මේ ස්ථාන 50ම තිබෙන පොදු සාධකය? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැම පාරකටම වෙන් කරලා තිබෙනවා රුපියල් මිලියන දහය බැගින්. පාරකට රුපියල් මිලියන දහය ගණනේ සියලුම පාරවල් හදන්න රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පාරවල් ටික හදන්නද රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙන්නේ?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔව්. රුපියල් මිලියන 500ක්. මේකට අත්සන් කරලා තිබෙනවා, Hon. P.Thigambaram, MP. මෙන්න මා ගාව තිබෙනවා ඒ fax message එක. මට ගැටලුවක් නැහැ නුවරඑළියේ පාරවල් හදන්න එතුමාට රුපියල් මිලියන 500ක් තිබෙනවා නම්. මගේ ප්‍රශ්නය මේකයි. This is very odd. හැම පාරකටම රුපියල් මිලියන 10ක් වැය වන්නේ කොහොමද? එහෙම වෙන්න බැහැ. සමහර පාරකට රුපියල් මිලියන 3ක් වන්න පුළුවන්. සමහර පාරකට රුපියල් මිලියන 4ක් වන්න පුළුවන්. සමහර පාරකට මිලියන 25ක් වන්න පුළුවන්. හැම පාරකටම කොහොමද මිලියන 10ක් වන්නේ? ඔක්කෝම මිලියන 500ක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම ලේඛනය මේ අවස්ථාවේ දී **සභාගත*** කරනවා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාට නියමිත කාලය අවසානයි ගරු මන්ත්‍රීතුමා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හරි. මා අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මට තව තත්පර 30ක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මෙම විසර්ජන පනත ගැන කථා කරනවා. අපි රටේ ආදායම, වියදම ගැන කථා කරනවා. නමුත් අපිට මේ දූෂණ සම්බන්ධයෙන් ගැටලු ගොඩක් තිබෙනවා. ඒ වාගේ අවස්ථාවක තමයි නිල තොරතුරු ලබා ගැනීමේ නිදහස වෙනුවෙන් අද අපි ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතට විරුද්ධව ආණ්ඩු පක්ෂය ඡන්දය දීලා එම පනත් කෙටුම්පත කාබාසිනියා කරලා දැම්මේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අවසාන වශයෙන් කියන්නේ මේකයි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවට රාජ්‍ය මූල්‍ය පිළිබඳව බලය දීලා තිබෙනවා. නමුත් අපට පෙනෙන්නේ, ක්‍රම ක්‍රමයෙන් ඒ බලය නැති වෙමින් පවතින බවයි. මා ඔබතුමාගෙන් සහ ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සියලු දෙනාගෙන්ම කරුණාවෙන් ඉල්ලන්නේ, අපි එකතු වෙලා පාර්ලිමේන්තුවට අවශ්‍ය, පාර්ලිමේන්තුවට ලැබිය යුතු ඒ බලය නැවත ලබා ගන්න කටයුතු කරමු කියලායි. බොහොම ස්තුතියි.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ. භා. 5.02 ]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Bismillahir Rahmanir Raheem.

Hon. Deputy Speaker, as far as Sri Lanka is concerned, we have reached a focal point in history where the pace of recovery is taking gigantic steps after a prolonged war of 30 years. The whole world is surprised at the way Sri Lanka is managing its affairs, particularly, the economic revival amazed the world. We have heard about Vietnam War, Korean War, wars in Indochina and Burma which is presently known as Myanmar, then Indonesia and in other places. There is no recorded history in those countries to draw a parallel with the massive development and rapid recovery that is being staged in Sri Lanka. Barely after two years, this puzzles even the economic pundits - not the Hon. (Dr.) Harsha De Silva, my good Friend at all - in America, in the International Monetary Fund, in the World Bank and in Geneva as to how this miracle has been achieved. The only answer that one can stand up in the middle of this earth and give is that this miracle is achieved because of one man, His Excellency Mahinda Rajapaksa. That is the story of modern Sri Lanka and that will be a monumental history recorded in the next *Mahawamsa* that would be written soon.

Therefore, Sir, we are not surprised as to why the Opposition is gushing out to attack on us criticizing our achievements. Now, I have regard for my good Friend, the Hon. (Dr.) Harsha De Silva. Before he entered Parliament, he used to talk about economics and I used to patiently listen and sometimes learn. But, after coming to the House, he should have developed his mental capacity; rather it has sunk, I am sorry to say.

Now, he is talking about the roads and how many bridges there are. I think a bridge must be built between his brain and the tongue; there is something missing there. That would be the most-modern bridge that could be built by His Excellency President Mahinda Rajapaksa. I would ask him to do that. Sir, I went the other week to the Eastern Province, from Colombo up to Ratnapura, Pelmadulla, Kahawatta, Udawalawe, then through Bibile, Monaragala to Addalaichenai, Ampara, the other side of Pottuvil. Believe me, Sir, if you come with me, you will travel along that route everyday. There was a time when we shuddered to take our vehicle to the Eastern Province because we would never return home with the four tyres intact. We would have had to repair them at several points. So are the roads through Polonnaruwa,Welikanda, Ottamawadi, Eravur, Batticaloa, Kattankudi. They are all wonderful. These were all built during the time of war in this country. They were accusing us. The Opposition, particularly the UNP and the JVP were conspiring with foreign forces and asking us to lay down arms. Our leaders did it in the past. As a result, 600 policemen were mercilessly butchered in Karaitivu in the Eastern Province. They were ordered not to carry arms and be silent even if they were attacked. What happened to them? ඒක තමයි හොඳ වෙලාව, නරියාට කුකුළා ගෙනෙන්, අපි වැඩේ දෙන්නම් කියලා අමු-අමුවේ මරා දැම්මා. ඒ ගැන අපි Channel 4 එකෙන් අහනවා. Will the Channel 4 show these events to the world, to Barack Obama, Ban Ki-moon, all the leaders of the world and Israeli leaders? Sir, 600 unarmed, innocent policemen were mercilessly killed and it was engineered by Pottu Amman. ඔහුගේ නළලේ තිබුණේ අමු නරකාදියට දමන පොට්ටුවක්. You ask that from our the Deputy Minister, the Hon. Vinayagamoorthi Muralidaran. He will relate to you all these blood-tingling incidents that happened in the Eastern Province. Innocent people from Jaffna were driven away 20 years ago. Now, they have been rehabilitated. I am sure my good Friend, the Hon. Muththali Bawa Farook who has come duly to this House, we welcome him, will vouch for it. They were driven away to Mannar. I was at that time in Puttalam; I was in charge of the Puttalam Electorate. The Hon. J.R.P. Sooriyapperuma, a historian of your calibre must know this. People came from Vanni, Mannar and Jaffna to Kalpitiya in boats and one mother - ஒரு தாய் - was holding her arms trying to hug a baby. There was no baby. அந்தத் தாயினுடைய கை மரத்துப்போயிருக்கின்றது. Her hand was not working. The almost dead baby had fallen into the high seas and the mother had not realized it. Where was this Ban Ki-moon then? I am asking you, where are these Human Rights Commissions and the so-called human rights activists? There are some human rights activists in this country under the garb of red shirts. කත් අදින්නේ ඩොලර් එකටයි, ස්ටර්ලිං පවුම් එකටයි. උපන්නේ මේ භූමියේ. මේ රටේ හාල් කන්නේ. මේ රටේ ජලය බොන්නේ. මේ රටේ හුළං ආශ්වාස, ප්‍රශ්වාස කරලායි ජීවතුන් අතර රැඳෙන්නේ. නමුත් රට පාවා දෙනවා.

අපේ බොහෝ මන්ත්‍රීවරුන් ඉන්දියාව ගැන කථා කළා. ඒක අහන්න ඕනෑ. ඉන්දියාවේ මෙහෙම දෙන්නේ නැහැ. කවුරුන් හෝ සැක සහිත නම් ඔහු තම රටට බැස්සාට පස්සේ පිටි පස්සෙන් යනවා; follow-up කරනවා. ඒවා කිසිම දෙයක් නැහැ. අද මුළු අග්නි දිග ආසියාවේම සමහර සමාජවාදි රටවල්වලට සහ පෙර දිග රටවල්වලට නැති නිදහසක් -මාධ්‍ය නිදහස්- අපේ රටේ තිබෙනවා. ඒවා හංගන්න බැහැ. තවත් තොරතුරු සොයා ගෙන රට පාවා දීම පිණිස තමයි අද කරු ජයසූරිය මන්ත්‍රීතුමා ලජ්ජා නැතුව මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. ඉතාමත්ම බුද්ධිමත්ව අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඒ ගැන රීති ප්‍රශ්නයක් මතු කරලා ඒක "වාස්පාන්" කරලා දැම්මා. Yasin language එකෙන් කියනවා නම් "වාස්පාන්". නැත්තටම නැති කරලා දැම්මා. අන්න එහෙමයි. පිට රට තිබෙන මාධ්‍ය බලන්න කෝ.

Read all the newspapers. This must always be told in English so that the diplomats, our friends, can understand this. Go through all the newspapers. Get the Sinhalese and Tamil newspapers translated. Compare them and you will find that only about 10 to 15 per cent of the news items are pro-Government and the rest 80 per cent or so is against the Government. Where do you find this kind of freedom in the world? Immediately after war the situation in India was different and today they are saying - චැනල් එකට උත්තර දෙන්න ඕනෑ ලු. මොන චැනල් එකක්ද මා

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

දන්නේ නැහැ. අර කොළඹ ජරා වතුර යන එකද? ඒකත් දැන් නතර කරලායි තිබෙන්නේ. රවි කරුණානායක මන්ත්‍රීතුමා නොරිස් කැනැල් චැනල් එක ගැන කථා කරනවාද දන්නේ නැහැ. අර ජරා චැනල් එක ගැන -කැනැල් එක ගැන- එදා ජේ.ආර්.පී. සූරියප්පෙරුම මන්ත්‍රීතුමා අපට ලස්සණ කථාවක් කළා.

It must be printed by the Colombo Municipal Council and distributed among all the people. Then, the people will understand how the Britishers undertook the development schemes, although we were under them at that time. Now, this Channel 4 journalist- එතුමා කියනවා, ඒක හරි ගස්සන්න ලු; පිළිතුරක් දිය යුතු ලු. අපි මොකක්ද පිළිතුරු වශයෙන් දෙන්නේ? අපි කියනවා, අර human rights violate කරපු පොලිස් නිලධාරියාට විරුද්ධව අර කාත්තන්කුඩියේ - See the massacre that was carried out at the Mosque in Kattankudi. The innocent people who were worshipping at Husseiniya Mosque in Kattankudi were massacred. Where were the human rights activists then? Let the Channel 4 people come. We will show them the photographs and video tapes, if they want. They came to Polonnaruwa. Farmers in Eravur in the Eastern Province, successful tobacco cultivators in the region, were tortured and butchered. Come Channel 4, we are inviting you! This Parliament is inviting you. Come and report. We will give you the footage. Channel 4 එක ආරක්ෂා කරන්නට ජාති විරෝධි විදේශික බලවේගයන්ට කත් අදින අපේ මන්ත්‍රීවරු පාමන්කඩ ගැන කිව්වා. අලිමංකඩ කියා පාමන්කඩ ගියාය කියලා අපේ වීරෝදාර රණ විරුවන්ට අපහාස කළා. රණ විරුවෝ ජාතිජාතිත් මේක අමතක කරන්නේ නැහැ. ඒ වාගේම තමයි, කිලිනොච්චියට කියලා මැදවච්චියට යනවාය කියලා කිව්වා. මංගල සමරවීර මන්ත්‍රීතුමා කෝ? මා හිතන හැටියට දැන් ඔය සූරියප්පෙරුම මන්ත්‍රීතුමා ඉඳ ගෙන සිටින seat එකේ ඉඳ ගෙන තමයි එතුමා කිව්වේ, "මේ බොරු ගෙන යන්න එපා. මේ war එක අපට දිනන්න බැහැ"යි කියලා. කවුද අවමංගල වුණේ? එතුමා නේද? අද මේ ප්‍රශ්නය ලංකා වාසි සියලුම ජනතාව අහනවා.

රවි කරුණානායක මැතිතුමා ගගාරින් ගුවනින් බැස්සා වාගේ උදේ පාන්දර පාර්ලිමේන්තුවට එනවා. ඇවිල්ලා, වාචික ප්‍රශ්න අසන ආරම්භයේදී ඉන්නේ නැහැ. දෙවන වටයේ ප්‍රශ්න අහන කොට තමයි එතුමා ඉන්නේ. මොනවාද කථා කරන්නේ? එතුමා සිරිකොතේ කරපු දේවල් ගැන, National Organizer වුණේ කොහොමද කියන ඒවා ගැන කථා කරන්න වුවමනාවක් නැහැ. ඒක අර නොරිස් කැනැල් එකේ චැනල් එකට දාපු ඒ ගොල්ලන්ගේ කැළි කසළ.

I must continue with this story now. Today's "Daily News", states, I quote:

"Channel 4 journalist, an LTTEer - Defence Ministry."

Mr. Gotabaya Rajapaksa and his lieutenants have found it out. She had undergone military training in Vanni. කක්ද නම? "ඉසිප්රියා". ඉස කුඩිච්චියක් දමන්න ඕනෑ, අපේ රවි කරුණානායක මැතිතුමාටයි, ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාටයි. ඒ ගොල්ලන්ට ඉස කුඩිච්චියක් දමන්න ඕනෑ. She is in combat attire in this photograph. මෙන්න ඉන්නවා. ඒ දවස්වල ලස්සණ කෙල්ල; මුහුණත් හොඳයි. ඒ දවස්වල combatant කෙනෙක්. ඒක තමයි කළේ. අහගන්න, තලතා අතුකෝරල මැතිනිය.

Today's "Daily News" further states, I quote:

"The Defence Ministry yesterday said that Issipriya the woman who is alleged to have been a journalist and a news presenter in the Channel 4 documentary, was an LTTE cadre."

You give an explanation to Channel 4 on how you betrayed your own party; how you decimated one National Organizer and usurped power. We stand aright; we stand tall. Why? Because we are pure, our hearts are pure and we have a genuine cause to safeguard the people of this country. That is the correct position of His Excellency President Mahinda Rajapaksa and his entire Cabinet. This story is in the first page of today's "Daily News."

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, you have only one more minute.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
I have got a lot more to say, Sir. From the 4th Channel I have to go to the 5th Channel also. All these have been found out. ඒ කරපු දේවල් අපි දන්නවා. ලංකාවට පැමිණ තිබෙනවා - [බාධා කිරීමක්] ඔව්, ඒ ගැන මේ ගොල්ලන්ට කියලා දෙන්න ඕනෑ. සිරිකොතේ ඒ පහ ගැන. මොකද, කෝට්ටෙ රාජධානියට අයත් ඒ ස්ථානයේ තිබෙනවා ලොකු canal එකක්. ඒකේ තිබුණා historical දේවල්. ඓතිහාසික පුරාවස්තු. කෝ ඒවා? ඇයි අද උදේ ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමිපාණෝ අහපු ප්‍රශ්නයට විරුද්ධ පක්ෂයේ නායකතුමා නැඟිටලා dance කෙරුවේ. හොරු ඉන්නවාද එතැන? අපි එහෙම කියන්නේ නැහැ. ඒවා හාරලා ගත්තේ කවුද? Channel 4 නොවෙයි, කෝට්ටෙ canal එක උඩ ජාතික සේවක සංගමය හැදුවේ කවුද? ඒකට අපට උත්තරයක් ඕනෑ. එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන්ට උත්තරයක් ඕනෑ. ඒ ගොල්ලනුත් අහනවා. දැන් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හසනලි ඇවිල්ලා ඉන්නවා. එයා කවුද?

There is an article published in page 2 of "The Island" dated 16th June, 2011. It states, I quote:

"Congress I member Hasanali speaks out"

I will take two more minutes to read this, Sir. This is a nice article written by my good friend Mr. Shamindra Ferdinando.

It states, I quote:

"Hasanali lashed out those shedding crocodile tears for Sri Lankan Tamils for their personal gain and at the expense of Indo-Lanka relations, which he said would be beneficial to both countries.The vast majority of those targeting Sri Lanka over human rights allegations never showed any concern…"

This is not stated by me or by the Hon. M.T. Hasen Ali who represents the Eastern Province but Hasanali of Madras, Tamil Nadu State Assembly. He furthers states, I quote:

"….LTTE assassinated many prominent Sri Lankan Tamils including A. Amirthalingam and Lakshman Kadirgamar.Had they been genuinely concerned about the situation. They couldn't be selective in their concern, Hasanali said."

“ලංකාදීප” පත්තරයේ දැම්මා වාගේ මේ ලිපියත් මම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මොකද, බොහොම වැදගත් ලිපියක් ලියලා තිබෙන්නේ, අපේ මිත්‍ර ශමීන්ද්‍ර ෆර්ඩිනැන්ඩු මැතිතුමා.

This article further states, I quote:

> “The politician welcomed CM Jayalalithaa’s reported readiness to send an all party delegation from the TN State Assembly to Sri Lanka on a fact-finding mission in spite of recent attacks on the Rajapaksa administration. The TN administration needed to take up issues with the government of Sri Lanka and it would be a mistake on the part of CM Jayalalitha not to deal with Colombo”.

This is what his advice is. Mr. Hasanali further states, I quote:

> “… any move on the part of the international community to punish Sri Lanka for meeting the LTTE challenge would be counterproductive.”

Hasanali of Tamil Nadu says so, not A.H.M Azwer of Colombo, Sri Lanka.

This further states, I quote:

> “Sri Lanka couldn’t be punished on the basis of unsubstantiated war crime allegations, he said...”

මාලයක් දාන්න මේ හසනාලිට. Let us decorate him because he comes from there and speaks bravely in this manner. He said, "We are very thankful to Mr. Shamindra Ferdinando too".

I quote further:

> “... pointing out that no country would be safe if legitimate governments were prevented from tackling the threat of terrorism and violent uprisings. If Sri Lanka could be questioned over its right to quell the LTTE, what would be the position of Indian troopsand police deployed to fight those who had taken up arms,...”

Hurrah! I would say from this Parliament today, Sir.

Then, Sir, there is another fact that I must tell this Parliament before I wind up. The whole country knows that Osama was killed. Now see how human rights work in some people's eyes. How have they watched it? Through dark glasses. Osama was killed and his wife came to his rescue. She was also bulleted down. She was killed and who was watching this? Barack Obama was watching this. Is this not human rights violation? The American Press said, “an unarmed Osama”. Then, who is the terrorist and who is the tourist? They call Osama a terrorist. Then, is Obama a tourist, as our good friend, Mr. Alavi Moulana, the Governor of the Western Province asked the Hon. Dinesh Gunawardena the other day? This is the double tongue; this is the double glass that they are wearing.

Therefore, Sir, from this Parliament I say - [*Interruption.*] He was telling this. Yes, he is a very good friend of ours. There is no problem. Sir, Mr. Moulana has a way of always - [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, your time is over.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Okay, Sir. This is the last thing I wanted to say. I am winding up, Sir. - [*Interruption.*]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Is Bin Laden your relative? - [*Interruption.*]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Bin Laden is my best relative because he is a Muslim. He was fighting against all the atrocities in the world. Because he could not equal the American fire power - [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, your time is over.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
You are selling this country to America and to the imperialists. ඊශ්‍රායලය පිළිගන්නලු. ඊශ්‍රායලයේ, පලස්තීනයේ කරන ඒ torture එක ගැනවත් තකන්නේ නැතිව මේ රටේ මුස්ලිම්වරුන්ගේ ලේ උණු වන අවස්ථාවේදී ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කියනවා, අර imperialist

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියනවා, ඊශ්‍රායලය follow කරන්නය කියලා. හොඳට තියේවි නේද? ඒ නිසා - [*Interruption.*] The cat is out of the bag. අන්තිමට මා මේක කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. Osama was killed. So many others were killed. But, look at the humane angle our President took. When Prabhakaran was killed, his wife was looked after and his children were educated. He was a terrorist who wanted to take over the entire country. This is the humane approach of the Mahinda Rajapaksa Government

---

***** ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

and it is through "Mahinda Chintana" that we will recover this land from the debris that the UNP is putting. We will herald a new Sri Lanka so that from Jaffna to Hambantota, to Dondra, we will be able to live as trustworthy and honest people in this country.

Thank you, Sir, for the patience you have shown.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The next speaker is the Hon. Eran Wickramaratne.
Order, please! මේ අවස්ථාවේ ගරු ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ඒ.එච්.එම්. අස්වර් මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 5.24]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය යටතේ නියමයන් පිළිබඳව සාකච්ඡා කරන වෙලාවේදී, මා මේ විවාදයට රජයේ ආර්ථික ප්‍රතිපත්තිත් එහි ප්‍රමුඛත්වය ගැනත් යම් කිසි දෙයක් එකතු කරන්න කැමැතියි.

පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායකයින්ගේ සමුළුව ලංකාවේ පැවැත්වෙනවා කියලා දැන ගන්න ලැබී තිබෙනවා. මා හිතන විධියට මේක අපේ රටට විශාල ගෞරවයක්. ඒ වාගේම පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලත් ලංකාවට ගෙනෙන්න වැයමක් තිබෙනවා. ඒකටත් අවස්ථාව ලැබෙන්නය කියලා අපි ප්‍රාර්ථනා කරනවා. ඒක රටට තවත් ගෞරවයක් වේවි. ඒ සඳහා වන ආයෝජනය පිළිබඳව මා අද මෙතැනදී සාකච්ඡා කරන්න බලාපොරොත්තු වනවා. රාජ්‍ය නායකයින්ගේ සමුළුව මෙහි පවත්වනවා නම් රාජ්‍ය නායකයෝ 55ක් විතර එනවා. ඔවුන්ගේ කණ්ඩායම් එක්ක පැමිණෙන විට හෝටල් කාමර 1,000ක් විතර අවශ්‍ය වෙනවා මේ සමුළුව සඳහා. මේ හෝටල් කාමර 1,000 කොළඹ අවට ප්‍රදේශයේ තිබෙනවා. ඒ නිසා මේ සමුළුව සාර්ථකව කොළඹ අවට කරන්නට පුළුවන් කියලා සඳහන් කරන්න ඕනෑ. නමුත් හම්බන්තොට වැනි ප්‍රදේශයක අලුත් හෝටල් ගොඩනඟන්න වැයමක් තිබෙනවා නම් අපි විරුද්ධ නැහැ. අපි මෙතැන කථා කරන්නේ ආර්ථික ආයෝජනයක් පිළිබඳවයි. මම හිතනවා ඒ හෝටල් කාමර 1,000 ගොඩනඟනවාට වැඩිය අඩු ආදායම්ලාභී අයට නිවාස 2,000ක් ගොඩනඟලා දෙන එක වටිනවා කියලා. විශේෂයෙන්ම කොළඹ නගරයේ අඩු ආදායම්ලාභීන් අතරේ අසහනයක් තිබෙනවා, ඔවුන්ට තිබෙන පැල්පතත් නැති වේවි කියලා. අපිට ආරංචි වෙලා තිබෙනවා මේ පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල කරන්නට නම් විශාල ආයෝජනයක් අවශ්‍යයි කියලා. සමහර ප්‍රවෘත්ති අනුව ඇමෙරිකන් ඩොලර් බිලියන 4ක් අවශ්‍යයි කියනවා. තවත් ප්‍රවෘත්තියක් අනුව ඇමෙරිකන් ඩොලර් බිලියන 8ක් අවශ්‍යයි කියලා දැන ගන්නට ලැබී තිබෙනවා. ඇමෙරිකන් ඩොලර් බිලියන 8ක් ආයෝජනය කරනවා කියන්නේ මේ රටේ අමාත්‍යාංශ සඳහා අය වැය ලේඛනයෙන් අනුමත කරන ප්‍රමාණයෙන් සියයට අසූවක් පමණ ප්‍රමාණයක්. ඇත්තටම මේක නුවණට සුදුසු වැඩක්ද කියලා අපි අහන්නට අවශ්‍ය වෙනවා. මේ වාගේ ප්‍රමුඛත්වයක් තිබෙන්න පුළුවන්ද? ඇත්තටම අවුරුද්දකට ඇමෙරිකන් ඩොලර් බිලියනයක් විතර රජයට වෙන් කරන්නට වෙනවා මේ ක්‍රීඩා උළෙල සඳහා.

අපි දන්නවා, රජයට පාසල් දහසක අලුත් වැඩ පිළිවෙළක් තිබෙන බව. මේ ඩොලර් බිලියනය ඒ පාසල් දහසේ වැඩ පිළිවෙළ සඳහා යෙදෙව්වොත් එක පාසලකට දශ ලක්ෂ 100ක් ආයෝජනය කරන්නට පුළුවන්. එතකොට අපට හිතලා බලන්නට පුළුවන්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වන්නට යන වෙනස මොකක්ද කියලා. අලුත් ගොඩනැඟිලි, විද්‍යාගාර, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන, ක්‍රීඩාගාර හැදිලා ඒ පාසල්වල විශාල දියුණුවක් ඇති කරන්නට පුළුවන් ඇත්තටම ඒ ආයෝජනය ඒ පාසල් දහසේ වැඩ පිළිවෙළ සඳහා යොදවනවා නම්. ඒ විතරක් නොවෙයි. අපේ උසස් අධ්‍යාපන ඇමතිතුමාත් ගරු සභාවට පැමිණ තිබෙනවා. මේ ඩොලර් බිලියනය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අපේ විශ්වවිද්‍යාල පහළොවට ආයෝජනය කළා නම් එක විශ්වවිද්‍යාලයකට දශ ලක්ෂ 6,000ක් විතර ලැබෙනවා. එහෙම නම් අපට විශ්වවිද්‍යාල සිසුන්ට අවශ්‍ය නේවාසිකාගාර පහසුකම් සලසන්නට පුළුවන්. ඒ ප්‍රශ්න සියල්ලක්ම අපට විසඳන්නට පුළුවන්, පොදු රාජ්‍ය මණ්ඩලයේ ක්‍රීඩා උළෙල වෙනුවට අධ්‍යාපන ක්ෂේත්‍රයට මෙවැනි ආයෝජනයක් කරනවා නම්. එහෙම නම් නවීන විධියට ඉගැන්වීමේ පන්ති කාමර හදන්න පුළුවන්. නොයෙකුත් විධියට අපට විශ්වවිද්‍යාල දියුණු කරන්න පුළුවන්. ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව ප්‍රමුඛත්වයේ ප්‍රශ්නයක් ගැනයි මම මේ අහන්නේ.

අපි දන්නවා, විශ්වවිද්‍යාලවල ආචාර්යවරුන්ගේ දීමනා පිළිබඳව වැටුප් ප්‍රශ්නය පිළිබඳව විශාල සාකච්ඡාවක් ඇති වෙමින යන බව. මහින්ද චින්තනයේ සඳහන් කරනවා, ලංකාව දැනුම් කේන්ද්‍රස්ථානයක් කරන්න යනවාය කියලා. නමුත් අපි දන්නවා, මේ රටේ බුද්ධිමතුන් මේ රට අත් හැරලා විදේශ රටවලට යනවා කියලා. 1948 අපි නිදහස ලබන අවස්ථාවේදී ඒ දශකය තුළ කොළඹ විශ්වවිද්‍යාලය ලන්ඩන් විශ්වවිද්‍යාලය එක්ක සසඳන්න පුළුවන් කාලයක් තිබුණා. නමුත් අද ඇත්තටම අපට ඒක කියන්නට බැහැ. එන්.එම්. පෙරේරා, කොල්වින් ආර්. ද සිල්වා වැනි උගතුන් මේ ගරු සභාවේ කථා කරන කොට මේ රටේ බුද්ධිමතුන් එක හා සමාන මට්ටමෙන් ආඩම්බරයෙන් අපේ විශ්වවිද්‍යාලවලින් පෙනී සිටියා. නමුත් එවැනි තත්ත්වයක් අද නැහැයි කියන එක අපි කනගාටුවෙන් සඳහන් කරන්න අවශ්‍යයි. විශ්වවිද්‍යාලයක් ජාත්‍යන්තර මට්ටමෙන් ඉහළම මට්ටමට එන්නට නම් කරුණු දෙකක් අවශ්‍යයි. එකක් academic freedom. ඉගෙන ගැනීමේ, අධ්‍යාපන පරිපාලනයේ නිදහස තිබෙන්නට ඕනෑ, බුද්ධිමතුන්ට ක්‍රියා කරන්න. දෙවනුව, නිදහස්ව සිතන්නත්, නිදහස්ව අදහස් ප්‍රකාශ කරන්නත් පුළුවන්කම තියෙන්න ඕනෑ. තවත් විධියකට කිව්වොත් පිළිගත්ත මතයට විරුද්ධව මත ඉදිරිපත් කිරීමේ නිදහස තිබෙන්නට ඕනෑ. ඔවුන්ට ආරක්ෂාවක් තියෙන්නට ඕනෑ, විශ්වවිද්‍යාලයක් ඉහළම තත්ත්වයට පැමිණෙන්නට නම්. මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපති

ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මහතා අද පුවත්පතක සඳහන් කර තිබෙන කාරණයක් ගැන මා කියන්නට කැමැතියි. චීනයේ සින්ගුවා විශ්වවිද්‍යාලය අප්‍රියෙල් මාසයේ අවුරුදු 100 සැමරුවා. ඒ උත්සවයට චීනයේ ජනාධිපතිතුමා වන හූ ජින්ටාවෝ පැමිණුනා. ඔහු කරපු කථාවේ සඳහන් කර තිබෙනවා, මේ සින්ගුවා විශ්වවිද්‍යාලය හාවඩ්, ඔක්ස්ෆර්ඩ් වැනි ලෝකයේ ප්‍රමුඛස්ථානයේ තිබෙන විශ්වවිද්‍යාල මට්ටමට ගේන්න අවශ්‍යයි කියලා. ඔහු ඒ අවස්ථාවේදී මතක් කළා ඒක කරන්නට නම් ආචාර්යවරුන්ට ක්‍රියා කිරීමේ නිදහසත්, සිතීමේ නිදහසත්, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසත් අවශ්‍යයි කියලා. ඒ සින්ගුවා විශ්වවිද්‍යාලයේ අධිපතිතුමා වන ගු බිංග්ලින් සඳහන් කර තිබෙනවා, ලෝකයේ අනෙකුත් විශ්වවිද්‍යාල හා සසඳන කොට මෙම විශ්වවිද්‍යාලය උසස්ම ගනයේ විශ්වවිද්‍යාලයක් කරන්නට තව අවුරුදු හතළිහක්වත් අවශ්‍ය වෙයි කියලා.

ඉතින් අපේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප් පිළිබඳව තිබෙන විෂමතාව විසඳන්න ඕනෑ. අපි දන්නවා 2008 ජනවාරි මාසයේ පටන් ගෙන මේ පිළිබඳව ජනාධිපතිතුමා එක්ක සාකච්ඡාවක් තිබුණු බව. පෙබරවාරි මාසයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යම් කිසි කමිටුවක් පත් කළා. ඒ කමිටුවෙන් යම් කිසි අදහස් ප්‍රකාශ කළා. ඔවුන් කිව්වා තාවකාලික කථිකාචාර්ය කෙනෙකුට තිබෙන අවම වැටුප රුපියල් 55,000කුත්, ඒ වාගේම ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කෙනෙකුට 1,77,000ක් පමණ ලැබෙන්න ඕනෑය කියලාත්. ඒ වාගේම මට මතක් වෙනවා 2010 ජුනි මාසයේදී අපේ උසස් අධ්‍යාපන ඇමතිතුමා මේ ඉල්ලීම ඉෂ්ට කරන්නට බලාපොරොත්තු වෙනවා කියලා සඳහන් කළ ආකාරය.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන් බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත් මුණ ගැසුණා. ඊට පස්සේ ජනාධිපති ලේකම්තුමාගෙනුත් ලියමනක් ලැබුණා, "අප ඊළඟ අය වැය ලේඛනය තුළ දී මේක සලකා බලනවා" කියලා. ඉන් පස්සේ 2010 සැප්තැම්බර් මාසයේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාත් මෙලෙසම සඳහන් කළා. නොවැම්බර් මාසයේදී අය වැය ලේඛනයෙන් ඔවුන්ට සියයට පහක වැඩි වීමක් ලැබුණා. ඊට අමතරව 6.25ක තවත් දීමනා වැඩි වීමකුත් දුන්නා. නමුත් ඒ වැඩි වීම දුන්නත් ඔවුන් බලාපොරොත්තු වුණු ප්‍රමාණයටත් වැඩිය ඒක හුඟක් අඩුයි. ඒ විතරක් නොවෙයි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පත් කරපු කමිටුව දුන්න ගණන්වලටත් වැඩිය බොහොම අඩු ප්‍රමාණයක් තමයි ඔවුන්ට ලැබුණේ. මම මේකෙන් කියන්න හදන්නේ මේකයි. මේක දැනුමේ කේන්ද්‍රස්ථානයක් කරන්න අපි වෑයම් කරනවා නම් මේ රට තුළ මේ ආචාර්යවරු, මේ බුද්ධිමතුන් අපි රඳවා ගන්න අත්‍යවශ්‍යයි. රජය හුඟක් වෙලාවට කරුණු දක්වනවා, මේ ක්ෂේත්‍රයේ පඩි වැඩි කළොත් අනික් ක්ෂේත්‍රවලත් මේ වාගේ පඩි වැඩි කරන්න සිදු වෙයි කියලා. ඒක කොහොම වෙතත්, මේ ක්ෂේත්‍රයේ අය දැන් සෑහෙන කලක සිට මේ ඉල්ලීම කරමින් සිටිනවා. සුදුස්සන්ට සුදුසු වැටුප දෙන්න අවශ්‍යයි. බුද්ධිමතුන්ටයි, ආචාර්යවරුන්ටයි සුදුසු වැටුප දෙන්න අවශ්‍යයි. නැත්නම් රට පිරිහෙනවා. ඒවායේ විතරක් නොවෙයි, අනික් ක්ෂේත්‍රවල ඉන්න අයත් -රාජ්‍ය සේවයේ ඉන්න අය- වැටුප් වැඩි කරන්න කියලා ඉල්ලීම් කළා. රජය පොරොන්දු වුණා අඩුම වශයෙන් රුපියල් 2,500ක්වත් දීලා ඒ ඉල්ලීම ඉෂ්ට කරලා දෙන්න. නමුත් ඒක ඉෂ්ට කරලා දෙන්න වුණේ නැහැ.

රජයේ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව, ඒවායේ ප්‍රමුඛත්වය ගැනයි මම අහන්නේ. ආයෝජනය කිරීමට, ඒ තීරණය ගන්නට පුළුවන්. කැබිනට් මණ්ඩලයට බලය තිබෙනවා එවැනි ඕනෑම තීරණයක් ගන්න. නමුත් වියදම් අනුමත කරන්නටත්, ඒ වියදම් සාධාරණද, අසාධාරණද කියන ප්‍රශ්නය අහන්නටත් පාර්ලිමේන්තුවට අයිතිවාසිකමක් තිබෙනවා. ආයෝජනය කිරීමට ප්‍රථමයෙන් -වරාය වෙන්න පුළුවන්, ගුවන් තොටු පොළ වෙන්න පුළුවන්, ක්‍රීඩාංගණ වෙන්න පුළුවන්, මහා මාර්ග වෙන්න පුළුවන්, යටිතල පහසුකම් වෙන්න පුළුවන්- අපි දැන ගන්න අවශ්‍යයි ඒවායේ මූලික සිද්ධාන්ත මොනවාද කියලා. What are the assumptions? බලාපොරොත්තු වෙන ආදායම මොකක්ද, ඉන් ලැබෙන ප්‍රතිඵල මොනවාද? What is the Return On Investment? What is the Internal Rate of Return? මේවා පිළිබඳව කිසිම විස්තරයක් මේ පාර්ලිමේන්තුවට ලැබිලා නැහැ.

අපි දන්නවා මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාංගණ ගොඩ නඟලා තිබෙන බව. නමුත් මේවා සුදුසු ආයෝජන නොවෙයි කියලා සඳහන් කරන්න අවශ්‍යයි. ඒ නිසා දැනටම වෙලා තිබෙන වැරැදි නිසා ආයෙත් අපි අලුත් ක්‍රීඩාංගණ ගොඩ නඟලා, අලුත් ක්‍රීඩා උළෙලවල් ගෙන එන්න -මේවාට- රටේ ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රමුඛත්වය දෙන එක විශාල ප්‍රශ්නයක් වෙනවා. රජයේත්, විපක්ෂයේත් සිටින මන්ත්‍රීවරුන් බහුතරයක් මෙවැනි නාස්තිය ප්‍රතික්ෂේප කරනවා ඇති කියලා මම විශ්වාස කරනවා. ස්වල්ප දෙනෙකුගේ අභිමතය අනුව තීරණය කරලා කරන මෙවැනි නිෂ්ඵල, විනාශකාරී ආයෝජන අප නතර කරන්න අවශ්‍යයි. නැත්නම් අපේ දරුවන්ට විතරක් නොවෙයි, අපේ දරුවන්ගේ දරුවන්ටත් මේ ණය මුදල් ගෙවන්න සිදු වෙනවා කියලා කියන්න ඕනෑ.

මට ප්‍රථමයෙන් කථා කරපු ගරු මන්ත්‍රීතුමා ඉංග්‍රීසි භාෂාවෙන් කථා කළා, අද උදේ විපක්ෂයේ මන්ත්‍රීවරයකු කළ යම් කිසි ප්‍රකාශයක් ගැන. ඒ නිසා මමත් ඒ ගැන ඉංග්‍රීසි භාෂාවෙන්ම කථා කරන්නම්.

While we speak on the Resolutions under the Appropriation Act, there are many misappropriations also that we need to refer to. I am referring particularly to Section 8 of the Human Rights Commission of Sri Lanka Act. I am doing so because the speakers before me referred to that. The question I am asking is, "Has there been enough of allocation made to the Human Rights Commission when the country is facing such a problem?" There is a backlog of cases in the Commission. The Commission has not been functional for a while. But, what is the remedy? How will we overcome this problem of backlog ?

There are about 1,000 cases pending according to the Chairman of the Human Rights Commission. But, how many cases have been reported in 2010 and how many have been investigated? I also have a question to ask about the appointment of the Commission itself. As we know, with the passage of the Eighteenth Amendment to the Constitution, the President became the appointing authority. Therefore, to some extent, the independence of the Commission is under question. But, it would be better if the Human Rights Commission itself could forward its budget to Parliament rather than forwarding it to the Government so that its independence could be strengthened through that process even if the President is the appointing authority.

Section 3(1) of the Human Rights Commission of Sri Lanka Act states that those who are appointed to this Commission as members should be people who have a background of human rights; practical experience on working on human rights issues and knowledge of human rights standards. Maybe, the Presidential Secretariat has

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

the criteria of the people who should be appointed for this. I am requesting the Presidential Secretariat to inform Parliament about the criteria that have been used in appointing Members to the Human Rights Commission.

Sir, the Paris Principles have to be followed by this Commission. As you know, in 2007, the Sri Lankan Human Rights Commission was downgraded from "A" to "B". The Paris Principles states that the national commission of a country should monitor any situation of violation of human rights and have access to any group or individual possessing knowledge about violations or threat. It also states that it should be able to advise the government or Parliament on any violation on issues related to legislation and comply with international human rights standards. But, the Parliament has not received any such advice as far as I can remember. It also states that it should advise the government to ratify human rights instruments and contribute to the reports which governments are obliged to submit to regional and international institutions. It should educate and inform the public; it should publicize reports on any human rights matter and have access to the media.

Now, the issue is that Sri Lanka has been downgraded by the international co-ordinating committee and the question I have is, while the country is going through such a bad period in terms of the international arena, what plans has the Government got to move the Human Rights Commission's ranking from "B" to "A". It was an unequivocal message from the international community that Sri Lanka is not in compliance with international standards on human rights. What does this mean? The downgrading means that Sri Lanka has no right to vote at international meetings and it is not eligible to stand for election in international fora on human rights. This is an expression that human rights are being violated with impunity and the Human Rights Commission of Sri Lanka cannot provide protection. This is an indictment on the country and we together must strengthen the Human Rights Commission and see that we have local mechanisms that are going to put this situation right.

We must not forget that in September this year, India will become a member of the United Nations Human Rights Council in Geneva and together with its seat on the Security Council, India will determine the agenda for the whole of South Asia. We have to work together to make sure that this situation is rectified. The attack on Sri Lanka is not just an attack on the Sri Lankan Government or on the Head of the Government. It is an attack on the country and on every citizen of this country and therefore, we have to work intelligently and have a strategy that will counter it so that the country could be restored to its former glory. Let us not leave in denial that we have a problem because we have a problem as Sri Lankans, not just as a Government. Attempts on disrupting meetings of the Members of Parliament, whether it is in Allaveddi or whether it is in some other place in the country, does not really help.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, now you have to wind up please.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
I will conclude. We must protect the rights of the Members of Parliament. Blocking websites of citizen journalism as what has happened today to the citizen journalism websites like "Grownviews" or "Vikalpa" will not help. Remember, we are just coming after the Arab Spring Revolution and this is not the path to take. We should allow for free expression and counter those who have different views to ours. That is the way to set right the human rights record of this country. Just a hardline, non-engagement with the international community is going to take this country down the wrong road and we must, as a Parliament, look into this and work together.

Thank you.

[අ. භා. 5.45]

**ගරු එස්.බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දීර්ඝ කථාවක් කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මට විනාඩි පහක් දෙන්න. අපේ ඒ ගරු මන්ත්‍රීතුමා පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා තරගය පිළිබඳව, ඒ වියදම ගැන කථා කළා. මා එතුමාගේ අවධානයට යොමු කරවන්න කැමැතියි, ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ යුගයේ එතුමා ලංකාවට සාෆ් ක්‍රීඩා තරගාවලිය ගෙනාපු බව. ඒ ගෙනෙන්න තමයි සුගතදාස ක්‍රීඩා පිටිය හැදුවේ. ඒක කරන්න තමයි Sugathadasa Swimming Pool එක හැදුවේ. ඒ සාෆ් තරගාවලිය සඳහා තමයි -මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ කාලයේ ඒ ආණ්ඩුවේ සිටියා - Sugathadasa Indoor Stadium එක හැදුවේ. මේ විධියටම එදාත් චෝදනා කළා. මතක තියා ගන්න, එදා ලංකාවේ ඒක පුද්ගල ආදායම ඩොලර් 600යි. හැබැයි, අපි සාෆ් තරගය ගෙනෙන්න සුගතදාස ක්‍රීඩාංගනය - Sugathadasa Indoor Stadium- එක, swimming pool එක හැදුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැලේසියාව 1987 දී තමයි පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා තරගයට ඉල්ලුම් කරන්නට පටන් ගත්තේ. ඒ වෙලාවේ මැලේසියාවේ ඒක පුද්ගල ආදායම - මා ළඟ හරියටම සංඛ්‍යා ලේඛන නැහැ. මා මේ හදිසියෙන් ඔබතුමාට කියන්නේ- ඩොලර් 2200, 2300 ගණන්වල තමයි තිබුණේ. හැබැයි, එදා ඒකට bid කළා විතරක් නොවෙයි, ඒක අරගෙන ඉවර වෙලා 1997 දී නැත්නම්, 1998 දී මහතිර් මොහොමඩ් කිව්වේ මොකක්ද? මැලේසියාවේ සංචාරක ව්‍යාපාරය, මැලේසියාවට ආයෝජකයන් පැමිණීම යන මේ සියල්ල පොදු රාජ්‍ය මණ්ඩලයීය

ක්‍රීඩා උළෙල නිසා පිම්මකින් නැඟිට්ටා කිව්වා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා මේ වාගේ චෝදනා කරනකොට පොඩ්ඩක් හිතන්න. අද ශ්‍රී ලංකාව තිස් අවුරුදු යුද්ධය නවත්වලා, ඩොලර් 2600ක විතර ඒක පුද්ගල ආදායමක් තියා ගෙන, අද සියයට 8ක සංවර්ධන වේගයක් තියා ගෙන නැඟිටින්න උත්සාහ කරන අවස්ථාවක්. ඒ නිසා මේ වාගේ වේලාවක ලෝකය අප රට දිහා බලවන, රටට ආයෝජකයන් ගෙන්වා ගන්න, රටට සංචාරකයන් ගෙන්වා ගන්න පුළුවන් විශාල ආයෝජනයක් හැටියට තමයි පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා තරගය අපි දකින්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දෙවන කාරණය හැටියට එතුමා මතු කළා, විශ්වවිද්‍යාල නිදහස හා ස්වාධීනත්වය ගැන. මම කියන්නේත් ඔය කාරණයම තමයි. 1988න් පස්සේ මේ විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයෙකුට බෞද්ධ සංගමයක, ක්‍රිස්තියානි සංගමයක, ක්‍රීඩා සංගමයක නිලයක් ගන්න ඉඩ දෙන්නේ නැහැ, ඉතාම සුළු පිරිසක්. මේ විශ්වවිද්‍යාල තුළ ශිෂ්‍යයන්ට නිදහසේ හිතන්න, නිදහසේ සමිති සමාගම් හදන්න, නිදහසේ සංවාද කරන්න අවශ්‍ය පරිසරයක් තිබෙන්න ඕනෑ. 1988න් පස්සේ විශ්වවිද්‍යාලවල අන්තගාමී ශිෂ්‍ය කණ්ඩායමක් - සියයට එකක් දෙකක්- ඉන්නවා. මේ පිරිසට විරුද්ධ කිසි කෙනෙකුට විශ්වවිද්‍යාලය තුළ කථාවක් පවත්වන්න දෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සර අපි විශ්වවිද්‍යාලවල සිටිද්දී විවිධ දේශපාලන මත දරන අය විශ්වවිද්‍යාලවල කථා කරනවා. ශිෂ්‍යයෝ ගිහිල්ලා ඒවා අහනවා. ශිෂ්‍යයෝ ඒවා ගැන ප්‍රශ්න කරනවා. ඒ නිදහස් වාතාවරණය දැන් විශ්වවිද්‍යාලයේ නැහැ.

අපි ඒක හදා ගෙන යනවා. අද විශාල වශයෙන් ඒ විශ්වවිද්‍යාල තුළ මේ තත්ත්වය දියුණු කර ගෙන යනවා.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ප්‍රශ්නය ගැන ගරු මන්ත්‍රීතුමා කථා කළා. අතිගරු ජනාධිපතිතුමාත්, අපේ ආණ්ඩුවත් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට වැටුප් ප්‍රශ්නයක් තිබෙනවාය කියන එක පිළිගත්ත නිසා තමයි සියලු රජයේ සේවකයන්ට සියයට පහක් වැටුප් වැඩි කරලා, ආපසු සියයට 6.25ක් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට වැඩි කරලා, ඊට පස්සේ පරීක්ෂණ දීමනාව හැටියට තවත් සියයට 25ක් වැඩි කළේ. නමුත් අපි දන්නවා ඒකේත් ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මේ ප්‍රශ්නය පිළිබඳව අදත් ආචාර්යවරුන් එක්ක මුදල් අමාත්‍යාංශය හා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම සාකච්ඡා කරනවා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය ඉතා ඉක්මනින් විසඳා ගන්න බලාපොරොත්තු වෙනවා, ආචාර්යවරුන් එක්ක ඉතා සුහදශීලිව සාකච්ඡා කරමින්. සටනකට ආවාම දෙගොල්ලන් වචන හුවමාරු කර ගන්නවා; කථා කර ගන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා සේම ඒ ආචාර්යවරුන්ගේ වැදගත්කම අපි පිළිගන්නවා. අපි කිසි සේත්ම ඒක හෑල්ලු නොකර, එයට බාධා නොකර මේ ප්‍රශ්නය විසඳා ගන්නවාය කියන කාරණය ඔබතුමාට කියන්න කැමැතියි.

ඊ ළඟ කාරණය තමයි ගරු මන්ත්‍රීතුමා කථා කරපු මානව හිමිකම් පිළිබඳ කාරණය. මම එක කාරණයක් කියන්න කැමැතියි. ලෝකයේ සමහර අයට ඕනෑකම තිබෙනවා මේ වෙලාවේ මේ රටට ඇඟිලි ගහන්න. ඒක ඉරාකයේ සිදු වෙච්ච සිදුවීම් වලින්, ඒක ලිබියාවේ සිදු වෙච්ච සිදුවීම්වලින්, ඒක සිරියාවේ සිදු වෙච්ච සිදුවීම්වලින් අපට පෙනෙනවා. ඉතින් ඔබතුමා කිව්ව විධියටම මේ වෙලාවේ කළ යුතු වන්නේ අපේ රටේ නීතිය, අපේ අධිකරණය පිළිබඳව විශ්වාසය ඇති වන විධියට අපේ රටේ සියලු දේශපාලන පක්ෂ කටයුතු කිරීමයි. මේ රටේ සියලු දෙනාගේම යුතුකම වන්නේ ඒකයි. මේ ලබා ගත්තා වූ නිදහස, එක් සේසත් කරපු රට ආරක්ෂා කර ගැනීම සඳහා මීට වඩා වග කීමෙන් යුතුව, -කේලාම් නොකියා, යටින් කථා නොකියා, එහාට මෙහාට එක එක දේවල් නොකියා- මේ රටට ජාත්‍යන්තර අතපෙවීම්වලට ඉඩ කඩ නොසලසන විධියට අපි සියලු දෙනාම හැසිරීමේ වැදගත්කම මේ වෙලාවේ අවධාරණය කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

[අ. භා.5.50]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2010 අංක 07 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය යටතේ දක්වා ඇති නියමයන්වලින් විශේෂයෙන් මගේ අවධානය යොමු වන්නේ 17 වන නියමය පිළිබඳවයි. "අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" කියන කරුණ යටතේ වැඩිමනත් වශයෙන් ලබා දෙන ප්‍රදාන ගැනයි එහි සඳහන් වන්නේ.

මේ රටේ ජනතාව "මහින්ද චින්තන ඉදිරි දැක්ම" අනුමත කරමින් මේ ආණ්ඩුවට විශාල බලයක් ලබා දුන්නා. 2005 වසරේ වර්තමාන ජනාධිපතිතුමා බලයට පත් වුණා. මේ ආණ්ඩුව බලයේ හිටියා. මහින්ද චින්තන ඉදිරි දැක්ම ඉදිරිපත් කරමින් නැවත වරක් බලය ඉල්ලන කොට සඳහන් කළා මේ ආකාරයට.

"මේ රටේ තිබෙන විසඳිය යුතු, ප්‍රමුඛතාව දිය යුතු බරපතළම ප්‍රශ්නවලින් එකක් හැටියට සලකන්නේ අල්ලස හා දූෂණය මැඩලීමයි."

ඒ වෙනුවෙන් මහින්ද චින්තන ඉදිරි දැක්ම පොතේ බොහොම පැහැදිලිව නිශ්චිත ක්‍රියාමාර්ග යෝජනා කරලා තිබෙනවා. මොනවාද මේ ක්‍රියාමාර්ග?

"සියලුම ආකාරයේ වංචා දූෂණ වැළැක්වීම සඳහා නව ව්‍යවස්ථා සංශෝධනය යටතේ දේශපාලන පක්ෂපාතිත්වයෙන් තොර ස්වාධීන

බුද්ධිමතුන්ගෙන් යුත් මණ්ඩලයක් පත් කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස, දූෂණය වැළැක්වීම සඳහා වූ මේ විධියේ ස්වාධීන බුද්ධිමතුන්ගේ මණ්ඩලයක් දැන් තිබෙනවාද? උත්තරය මොකක්ද? නිශ්චිතවම නැත. මහින්ද චින්තන ඉදිරි දැක්ම පොතේ කියන විධියට අල්ලස, දූෂණය වැළැක්වීම සඳහා වූ වැඩ පිළිවෙළ සඳහා "නව පාර්ලිමේන්තුවේ පළමු පනත" වශයෙන්, මම නැවත නැවත කියනවා, "නව පාර්ලිමේන්තුවේ පළමු පනත" වශයෙන් සඳහන් කරමින් මෙහෙම කියනවා:

"නව පාර්ලිමේන්තුවේ පළමු පනත වශයෙන් රජයේ සංස්ථා, මණ්ඩල සහ මූල්‍ය ආයතනවල දූෂණ, වංචා සහ අක්‍රමිකතා වැළැක්වීම සඳහා මෙන්ම

ටෙන්ඩර් පරිපාටි උල්ලංඝනය කිරීම් නතර කිරීම සඳහා සහ ඒ පිළිබඳ තොරතුරු ජනතාවට ලබා ගැනීමට පහසුවන විශේෂ විධිවිධාන පනතක්

ඉදිරිපත් කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වැනි නිරතුරුවම මේ පාර්ලිමේන්තුවට පැමිණෙන, මේ පාර්ලිමේන්තුව ගැන හොඳට දැනුම තිබෙන, මන්ත්‍රීවරයකු මූලසුනේ සිටින අවස්ථාවක මම මේ ප්‍රශ්නය අසන්නට කැමතියි. නව පාර්ලිමේන්තුවේ පළමු පනත ලෙස අල්ලස හා දූෂණය මැඩලීමට ආණ්ඩුවට ශක්තියක් ලබා දෙන අලුත්ම පනත් කෙටුම්පතක් මේ පාර්ලිමේන්තුවට අරගෙන එනවාය කිව්ව මේ ආණ්ඩුව දැනට අවුරුද්දක් ගත වී තවත් ඉස්සරහට යද්දී, අඩු ගණනේ මේ විධියේ නව පනතක අවශ්‍යතාවය ගැන එක වචනයක්වත් කථා කරන්නේ නැහැ. ඒ විතරක් නොව, අල්ලස, දූෂණය වැළැක්වීම සඳහා දැනට තිබෙන ප්‍රතිපාදනයන් පවා ක්‍රියාත්මක කිරීම අනෙක් අතට හරවනවා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නව පාර්ලිමේන්තුවේ අලුත්ම පනත ලෙස මේ පනත් කෙටුම්පත ගෙන ඒමෙන් පසුව ඊළඟට සිදු කරන කාරණය ලෙස මහින්ද චින්තන ඉදිරි දැක්මේ මෙසේ සඳහන් වනවා:

"එතැන් සිට මාස 3ක් තුළ මේ සම්බන්ධයෙන් පවතින ආයතනික සහ නීතිමය රාමුව ශක්තිමත් කර ක්‍රියාවට නැංවීම ආරම්භ කරමි ."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ කියවූයේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය නොවෙයි. මේ ගරු පාර්ලිමේන්තුවේ මහත් වූ බහුතරයක් සහිත විධායක බලය ඇති; අසීමිත බලයක් සහිත වර්තමාන ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයනයයි. මම මේ කාරණය වග කීමෙන් කියනවා. මේ රටේ මූල්‍ය පාලනය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාව අනුව මේ ගෞරවණීය පාර්ලිමේන්තුවට සුවිශේෂ බලයක් පවරා තිබෙනවා. රාජ්‍ය මුදල් නිසි ලෙස යෙදවීම තහවුරු කරන්නට, රාජ්‍ය මුදල් දූෂණය නතර කරන්නට, රාජ්‍ය මුදල් අයථා ලෙස පරිහරණය කිරීම නතර කරන්නට, රාජ්‍ය මුදල් නාස්තිය නතර කරන්නට හැකි සුවිශේෂ එකම බලය පවරා තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ උත්තරීතර පාර්ලිමේන්තුවටයි. නමුත් මේ ආණ්ඩුව මහින්ද චින්තන ඉදිරි දැක්මේ දක්වා තිබෙන, ප්‍රමුඛතාවක් දිය යුතු කරුණක් ලෙස පිළිගෙන තිබෙන අල්ලස, දූෂණය මැඩලන නව නීති රෙගුලාසි ගෙන එනවාය කියන නිශ්චිත කාල වකවානු සහිත පොරොන්දුව ඉටු කිරීම පැහැර හැර තිබෙනවා. මේක මේ ආණ්ඩුවට ජනතාව දුන් වරමට පයින් ගැසීමක් විතරක් නොවෙයි, මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ තිබෙන මූල්‍ය පාලනය පිළිබඳ බලය අකුලා ගැනීමක්; ඒ පිළිබඳ පසුගාමී තත්ත්වයක්.

මේ රටේ අල්ලස හා දූෂණය පිළිබඳව තිබෙන නීති නිසි ලෙස ක්‍රියාත්මක කරන්නට අවශ්‍යයි. එක අතකින් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් කර, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය ස්වාධීන කර, තරාතිරම නොබලා ඉහළ සිට පහළට වැරදි කරන සියලු දෙනා නීතියේ ක්‍රියාකාරීත්වය තුළට ගෙන එන්නට අවංක උත්සාහයක් ආණ්ඩුවට තිබෙන්නට ඕනෑ. අවාසනාවකට එහෙම උනන්දුවක්, එහෙම වැඩ පිළිවෙළක් වර්තමාන රජයට තිබෙනවාය කියා පෙනෙන්නටවත් නැහැ. අල්ලස, දූෂණය ගැන කථා කරන අය ද්‍රෝහීන් වශයෙන් නම් කරන්නටත්, නාස්තිය ගැන කථා කරන අය ද්‍රෝහීන් වශයෙන් නම් කරන්නටත් කටයුතු කරනවා විනා ආණ්ඩුවේ ඉදිරි ගමනට ඉවහල් වන්නාවූ, අපේ ආදරණීය මාතෘ භූමියේ ඉදිරි ගමනට ඉවහල් වන්නා වූ නිවැරදි මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නට ආණ්ඩුව අසමත් වී තිබෙනවා. මෙහිදී මේ රටේ මූල්‍ය පාලනය පිළිබඳ ප්‍රශ්න, පොදුවේ යහ පාලනය පිළිබඳ පියවර ගැනීමට අවශ්‍ය කරන තොරතුරු ජනතාව දැනගත යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාවේ තොරතුරු අයිතිය පිළිබඳ පනත මඟින් ඉතාම සාර්ථකව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට පමණක් නොවෙයි සාමාන්‍ය පුරවැසියන්ටත් රාජ්‍ය ව්‍යුහයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව තොරතුරු දැන ගැනීමට අවස්ථාව ලබා දී තිබෙනවා. එහි ප්‍රතිඵලයක් විධියට ඉන්දියාවේ දූරකථන සංඛ්‍යාත අඩු මිලට හොර රහසින් විකිණීමෙන් සිදු වුණු ඩොලර් බිලියන තිහකට වඩා වැඩි දූෂණයක් පිළිබඳව හෙළිදරව් කර ගැනීමට හැකියාව ලැබුණා. සෑම දිනකම විවිධාකාර වංචා, දූෂණ පිළිබඳ කරුණු හෙළිදරව් වෙනවා. එය රාජ්‍ය පරිපාලනයට බාධාවක් නොවෙයි. එවැනි කරුණු හෙළිදරව් වන නිසා, ඒ පිළිබඳව රටේ ජනතාව දැනුවත් වන නිසා, අදට වඩා පාර්ලිමේන්තුවට තොරතුරු ලබා ගැනීමට හැකි වන නිසා රාජ්‍ය තන්ත්‍රයේ නිලධාරින් නිවැරදිව වැඩ කරන්නට, නිවැරදිව මූල්‍යමය කාරණා පිළිබඳව වාර්තා තබා ගන්නට, නිවැරදි කාර්ය පටිපාටි අනුගමනය කරන්නට පෙලඹෙනවා. එය රටේ ඉදිරි ගමනට යහපත් ලෙස බලපාන වැදගත්ම දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ඉදිරි ගමනට ඉවහල් වන්නා වූ ඉතාම වටිනා පනත් කෙටුම්පතක් පිළිබඳව අද මේ පාර්ලිමේන්තුව තුළ සිටින මේ ආණ්ඩුවේ ගෞරවණීය මන්ත්‍රීතුමන්ලා විරුද්ධත්වය පළ කළා. පළමුවර කියැවීමේදී විරුද්ධත්වය පළ කළා. මොකක්ද ඒකෙන් කියන්නේ? මේ රටේ ජනතාවට තොරතුරු දැන ගන්නට ඇති නිදහස වෙනුවෙන් අඩු ගණනේ පාර්ලිමේන්තුවේ දෙවන වර කියැවීම දක්වා විවාදයකටවත් යන්න මේ ගෞරවණීය පාර්ලිමේන්තුවේ සිටින ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කැමැත්තක් නැහැයි කියන එකයි. එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත්, ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමන්ලාත්, ද්‍රවිඩ සන්ධානයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් මේ පනත් කෙටුම්පත පළමුවර කියැවීම අනුමත කරමින් තමන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීම පිළිබඳව එක අතකින් සතුටු වෙන්නට ඕනෑ. අනෙක් අතට මම අහනවා, අඩු ගණනේ මේ පනත් කෙටුම්පතේ තිබෙන කරුණු කියවලා බලාද විරුද්ධයි කියලා කිව්වේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු මිත්‍රපාල ඇමතිතුමා බොහොම වැදගත් විධියට, බරපතල විධියට ප්‍රශ්නයක් මතු කළා, මේ තොරතුරු දැන ගන්නේ හමුදාවේ තිබෙන තුවක්කු ගණන, යුද ටැංකි ගණන, මිසයිල ගණන දැන ගන්නද කියලා. එතුමා මේ පනත් කෙටුම්පත කියෙව්වා නම්, මේ පනත් කෙටුම්පතේ 4. (1) (ඇ) උපවගන්තිය කියෙව්වා නම් ඒ ප්‍රශ්නය අහන්නේ නැහැ. එහි මෙහෙම තියෙනවා, "රාජ්‍යයේ ආරක්ෂාවට හෝ එහි භෞමික අඛණ්ඩතාවට හෝ ජාතික සුරක්ෂිතතාවට හෝ දරුණු හානියක් වීම; ඕනෑම පුද්ගලයකුගේ ජීවිතයට හෝ ආරක්ෂාවට හෝ අනතුරක් සිදුවීමට ඉඩකඩ සැලසීම" යන හේතු සහ තවත් හේතු මත තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන්න පුළුවන් කියලා. ඒ නිසා ජාතික ආරක්ෂාවට, රාජ්‍ය ආරක්ෂාවට, පෞද්ගලිකත්වයට කිසිම ආකාරයක හානියක් මේ යෝජිත පනත් කෙටුම්පත තුළින් සිද්ධ වෙන්නේ නැහැ. නමුත් අද මොකක්ද වෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව කියන ආයතන තුනේම සිදු වුණු වංචා පිළිබඳව, යුද්ධය ආපස්සට අරගෙන ගිය, රටට ද්‍රෝහිකම් කළ, ආයුධ වෙළෙඳාමේදී වංචා කරපු, දූෂණ කරපු අය පිළිබඳව ශිරානි තිලකවර්ධන මැතිනියගේ සභාපතිත්වයෙන් සහ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත, මේ රජය විසින්ම පත් කළ ඉහළ පෙළේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් කළ පරීක්ෂණ සම්බන්ධ එම කොමිෂන් සභාවේ වාර්තාව මම 2011 ජූනි මාසයේ 07වැනි දින ඉල්ලුවාම රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් කියලා දෙන්න බැහැ කිව්වා. මම කිව්වා, "අඩු ගණනේ කියන්න කාට විරුද්ධවද පියවර අරගෙන තිබෙන්නේ?" කියලා. "දෙන්න බැහැ" කිව්වා. අඩු ගණනේ නම් නොකියා කියන්න කිව්වා, හොරකම් කරලා තිබෙන ප්‍රමාණය; තොරතුරු ප්‍රමාණය. "දෙන්න බැහැ"යි කිව්වා. මේ වැදගත් තොරතුරු සඟවන්නේ, රටට ද්‍රෝහිකම් කළ මිනිස්සුන් පිළිබඳව සඟවන්නේ, මේ රටේ ශ්‍රේෂ්ඨ යුද ජයග්‍රහණය පසුපසට ඇදපු, අද මේ සමාජය තුළ මහා ලොකු ප්‍රතිරූප හදා ගෙන මේ ආණ්ඩුවේම නිල තල දරමින් ඉන්න මිනිස්සු ගැන තොරතුරු සඟවන්නේ මේ රටට තිබෙන ආදරයට

නොවෙයි, මේ රට ආපසු අරගෙන යන්නයි. මේ රට පසුපසට අරගෙන යන්නේ මේ ආණ්ඩුවේ තිබෙන අදූරදර්ශී ප්‍රතිපත්තිය කියන කාරණයත් මම කියන්න කැමැතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ස්තුතියි.

ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමා.

[අ. භා. 6.02]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ පාර්ලිමේන්තුවේ විසර්ජන පනත යටතේ වූ යෝජනා කීපයක් පිළිබඳව විවාදයට ගැනෙන අවස්ථාවේදී ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා අද මේ පාර්ලිමේන්තුවට ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පතට ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවක් තිබූ බවට කරුණු සඳහන් කළා. එය සත්‍යයක්. ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ගේ විරුද්ධත්වයට පෙර විපක්ෂයේ මන්ත්‍රීවරුන් 64 දෙනාගෙන් මේකට ඡන්දය ලබා දුන්නේ 32 දෙනෙක් පමණයි. විපක්ෂයේ මන්ත්‍රීවරු 32ක් මේකට සහයෝගය ලබා දුන්නේ නැහැ. එම නිසා ආණ්ඩුවේ විරෝධතාව පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න පෙර විපක්ෂයේ විරෝධතාව පිළිබඳවත් කරුණු සොයා බලන්න කියලා මම මේ අවස්ථාවේදී ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගෙන් මුලින්ම ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්]

එම නිසා විශේෂයෙන්ම අද මෙම විසර්ජන පනත යටතේ වූ යෝජනාවල අපේ අමාත්‍යාංශය යටතේ ඇති රජයේ කර්මාන්තශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුමේ රුපියල් මිලියන 260ක්වූ වියදම රුපියල් මිලියන 280 දක්වා සංශෝධනය කිරීමටත්, ඒ වාගේම ලැබිය යුතු ආදායම රුපියල් මිලියන 280, මිලියන 268ක් ලෙස සංශෝධනය කිරීමටත් යෝජනා ඇතුළත් කරලා තිබෙනවා.

විශේෂයෙන්ම රජයේ කර්මාන්තශාලාව 1928 දී ආරම්භ කළේ රජයේ අත්‍යවශ්‍යම කරුණු ඉටු කරවා ගැනීමේ අරමුණ ඇතිවයි. අද එම ආයතනය -එම කර්මාන්තශාලාව- සේවකයන් 500 දෙනකුගෙන් සමන්විතව රජයේ ඉතාමත් රහස්‍ය අත්‍යවශ්‍ය සේවාවන් රැසක නියැළී සිටින ආයතනයක්. සෑම මැතිවරණයකදීම ඡන්ද පෙට්ටි සකස් කිරීම යනාදී, රජයක් විසින් ඉටු කළ යුතු පෞද්ගලික අංශයකට ලබා නොදිය යුතු ඒ කාර්ය භාරයන් සියල්ලක්ම ඉටු කිරීමේ වගකීම පැවරෙන්නේ මේ රජයේ කර්මාන්තශාලාවටයි. එම නිසා පසු ගිය 2009 - 2010 වර්ෂවල මේකේ ආදායම -ලාභය- ශීඝ්‍ර ලෙස වැඩි වෙලා තිබෙනවා. ඒ ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් විධියට තමයි මේ අත්තිකාරම් ගිණුම සංශෝධනය කරන්න පාර්ලිමේන්තුවට අද මෙම යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශය අද මේ රටේ ජාතික නිෂ්පාදනයෙන් සියයට 9කට ආසන්න ප්‍රමාණයක් ඉදි කිරීම් ක්ෂේත්‍රය තුළින් දායකත්වය ලබා දෙනවා. සියයට පහක්ව තිබුණු මේ දායකත්වය සියයට නවය දක්වා මේ වන විට වර්ධනය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ 2015 වන විට අපේ අමාත්‍යාංශයට ලබා දී තිබෙන ඉලක්කය මේ රටේ ජාතික නිෂ්පාදනයෙන් සියයට 15ක් දක්වා මේ දායකත්වය වැඩි කර ගැනීමයි. එම නිසා විශේෂයෙන්ම ගරු විමල් වීරවංශ අමාත්‍යතුමාගේ නායකත්වයෙන් අපේ අමාත්‍යාංශය අද ආයතන 12කින් සමන්විතව ඒ ඉලක්කයන් ඉතාමත් සාර්ථකව සපුරාගෙන යන බව අපි මේ අවස්ථාවේදී මෙම ගරු සභාවට කිව යුතුව තිබෙනවා.

මෙම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වර්ධනය හුදෙක්ම සෑම ගමකටම ගිය වර්ධනයක්. අද ජාතික ආදායම දිහා බැලුවාම මොකක්ද පෙනෙන්නේ? විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය තමයි මේ වන විට අපේ රටේ වැඩිම වර්ධනයක් සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ වාගේම දෙවැනි වැඩිම වර්ධනය සිද්ධ වෙලා තිබෙන්නේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේයි. මේ වර්ධනයේ අනෙක් විශේෂත්වය වන්නේ සෑම ගමකම ඉදිකිරීම් ක්ෂේත්‍රය අද දියුණු වෙලා තිබීමයි. මං මාවත් ඉදිකිරීම් වැනි ගමේ වාරි මාර්ග ව්‍යාපෘති, වරායවල්, ගුවන් තොටුපොළවල් දක්වා වූ දැවැන්ත ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් මේ රටේ නිදහස ස්ථාපිතවීමත් සමඟම අද මේ රට තුළ සිදු වන බව අමුතුවෙන් සඳහන් කළ යුතු වන්නේ නැහැ.

නිවාස දස ලක්ෂයක් ඉදි කිරීම සඳහා අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන "ජන සෙවණ" නිවාස වැඩ පිළිවෙළ අද ඉතාමත් සාර්ථකව මේ රට තුළ ක්‍රියාත්මක වෙමින් පවතිනවා. විවිධ අංශ පදනම් කර ගෙන මේ අවුරුද්දේ ඉලක්කය අපි මේ කාර්තුව වන විට සපුරා ගෙන තිබෙන බවත් ඉතාමත් සතුටින් මේ ගරු සභාවට අපි සඳහන් කළ යුතුව තිබෙනවා. ඒ නියමිත ඉලක්කයන්වලදී මේ රටේ සමස්ත ජාතික ආදායම එක් පුද්ගලයෙක් සඳහා ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4000 වන විට මේ රටේ ජාතික නිෂ්පාදනයට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දායකත්වය අනිවාර්යයෙන්ම සියයට පහළොවේ ඉලක්කය ලබා දීමේ කාර්ය භාරය ක්‍රියාත්මක කරන්න පුළුවන්කමක් තිබෙන බව අපි ඉතාමත් සතුටින් සඳහන් කළ යුතුයි.

විසර්ජන පනත යටතේ යෝජනා විවාදයට ගැනෙන මේ අවස්ථාවේදී විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා විවිධ ආකාරයේ කරුණු ඉදිරිපත් කළා. අද මේ රටේ පාර්ලිමේන්තු ක්‍රමය තුළ මේ රටේ තිබෙන සීමිත සම්පත් ප්‍රමාණයෙන් මොකක්ද කරන්නේ කියන තීන්දු තීරණය ගැනීමේ වගකීම පැවරෙන්නේ ආණ්ඩුවක් විධියට රජයට.

පොදු රාජ්‍ය මණ්ඩලය ක්‍රීඩා උළෙල සඳහා වියදම් කරන මුදල පාසල් සඳහා වියදම් කළොත් කොහොමද, විශ්වවිද්‍යාල සඳහා වියදම් කළොත් කොහොමද, කොළඹ නගරයේ හෝටල් ඉදිකිරීම කාමර සංඛ්‍යාව වැඩි කිරීම කොහොමද යනාදිය පිළිබඳව මා මිත්‍ර ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කරුණු ඉදිරිපත් කළා. මේ තීන්දුව ගන්න ජනතාව බලය දීලා තිබෙන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානය විධියට මේ රජයට. ඒක තමයි අද මේ රජය කරන්නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නියෝජ්‍ය ඇමතිතුමනි, ලංකාවේ ක්‍රීඩා උළෙල පවත්වනවාට අපි විරුද්ධ නැහැ. අනවශ්‍ය වියදම් දරන්නේ නැතුව ඒක කොළඹ වාගේ ස්ථානයක පවත්වනවා නම් යෝග්‍යයි කියායි අප කියන්නේ. අලුතෙන්ම ගම්මානයක් නිර්මාණය කරලා ක්‍රීඩාංගණයක් නිර්මාණය කරලා වියදමක් දරලා කරන්නේ නැතුව දැනට අපේ තිබෙන සම්පත් පාවිච්චි කරලා කරන්න. ක්‍රීඩා උළෙල මෙහෙ පවත්වනවාට අපි විරුද්ධ නැහැ. ඒ පිළිබඳව අපේ නායකතුමා ප්‍රකාශයකුත් කර තිබුණා. කොයි කාලයේ ආවත් කමක් නැහැ. අපි සහයෝගය දෙනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
මා හිතන විධියට ඔබතුමා ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන හිටියේ නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගමට ගෙන ගියාට කමක් නැහැ. ඒක ප්‍රායෝගිකව විය යුතුයි.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු මන්ත්‍රීතුමා මා කියන්නේ ඔබතුමා කියන එක. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය බොරු වියදම් කරන්න එපා, මේක කොළඹ තියන්න කියන එකයි. අප කියන්නේ මේක ගමට ගෙන යන්න ඕනෑ කියායි. ඔබතුමා කියන එක හරි. අපේ ප්‍රතිපත්තිය ගැනයි මම මේ කියන්නේ. අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ නගරයට සීමා වෙලා තිබෙන සංවර්ධනය ගමට ගෙන යෑම තමයි අද ඉටු කළ යුතු කාර්ය භාරය වන්නේ. ඒක අද සමස්ත රට තුළම සිද්ධ වෙනවා. කලින් අපේ රටේ ජාතික නිෂ්පාදනයට සියයට 53ක් දායක වුණේ බස්නාහිර පළාතෙන්. අද ඒක සියයට 47 දක්වා අඩු වෙලා තිබෙනවා. අඩු වුණු සියයට 5 කොහාටද ගියේ? අඩු වුණු සියයට 5 ගියේ මේ රටේ ගමට. මෙන්න මේකයි මහින්ද චින්තන ප්‍රතිපත්තිය කියලා කියන්නේ. මේකට ඔබතුමන්ලා විරුද්ධ වීම සාධාරණයි. මේකට ජනතාව කැමැතියි. ජනතාව මේකයි ඉල්ලන්නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
කාමර 1000ක් තිබෙනවාද -

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
සංචාරක ව්‍යාපාරය කියන එක තිබෙනවා. [බාධා කිරීමක්] ඒ පිළිබඳ වගකීම අපි භාර ගන්නවා. මේ රටේ කරන්න බැහැයි කිව්ව බොහෝ දේවල් -

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர )
(The Hon. Chandrasiri Gajadeera )
ඒ ප්‍රතිපත්තිය මත ගොඩ නඟා ගන්න එක අපිට අමාරු නැහැ.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
විශේෂයෙන්ම මා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියන්නේ ඔබතුමන්ලා විවේචන කරන්න, ඔබතුමන්ලාගේ අදහස් ඉදිරිපත් කරන්න කියලායි. නමුත් මේකේ ප්‍රතිපත්තිමය තීන්දුව ගන්නේ රජයක් විධියට අනිවාර්යයෙන්ම අපි. මෙතෙක් අරගෙන තිබෙන සෑම තීන්දුවක්ම ප්‍රතිපත්තියක්ම මේ රටේ ජනතාව අනුමත කර තිබෙනවා. ජනතාව මේ ප්‍රතිපත්තිවලට කැමැතියි. ජනතාවගේ කැමැත්ත මොකක්ද කියන එක පිළිබඳව ඉතාමත් හොඳ අවබෝධයක් අපේ රජයේ සියලුම දෙනාට තිබෙන බව මේ අවස්ථාවේදී විපක්ෂයට සඳහන් කළ යුතුව තිබෙනවා.

අජිත් පෙරේරා මන්ත්‍රීතුමා සෑම අවස්ථාවකම මහින්ද චින්තන වැඩසටහනේ සිදු නොවුණු දේවල් පිළිබඳව කරුණු ඉදිරිපත් කරනවා. සිදු වුණු වැඩ විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම මේ වැඩසටහන, මේ ප්‍රතිපත්තිය මාසයක්, දෙකක්, අවුරුද්දක් ඇතුළත පමණක් ක්‍රියාත්මක කරනවා කියලා නැහැ. මේකේ විශාල ප්‍රමාණයක් තිබෙන්නේ මේ අවුරුදු හය තුළ ක්‍රියාත්මක කරන ප්‍රතිපත්තීන්, වැඩසටහන්. උදාහරණයක් විධියට මේ කාල සීමාවේ -අවුරුදු දෙකක් තුළ- මේ රටේ ත්‍රස්තවාදය සඳහටම නැති කරනවා කියලා නැහැ. නමුත් ඒක නැති කළා. කාල සීමාවන් නැතිව මේ රටට ලබා දීපු ජයග්‍රහණයන් පිළිබඳව මම හිතන්නේ විපක්ෂය මොනම ආකාරයකින්වත් කථා කරන්නේ නැහැ. මේක කනගාටුදායක කරුණක් විධියට අපි සඳහන් කළ යුතුව තිබෙනවා.

විශේෂයෙන්ම අද මේ රට සෑම අංශයකම ශීඝ්‍ර දියුණුවක් ලබා ගෙන තිබෙනවා. අධ්‍යාපන අංශය වෙන්න පුළුවන්, උසස් අධ්‍යාපන අංශය වෙන්න පුළුවන්, ඒ වාගේම ආර්ථිකය වෙන්න පුළුවන්, සෞඛ්‍ය අංශය වෙන්න පුළුවන්, ඒ සෑම අංශයකම අද විශාල දියුණුවක් මේ රට තුළ ඇති වන බව අපි සියලු දෙනාම තේරුම් ගත යුතුයි, අවබෝධ කර ගත යුතුයි. අද කොළඹ නගරය ලස්සන වෙනවා. මේක පක්ෂ භේදයකින් තොරව ජනතාව කියනවා. මේක පේන්න තිබෙන දෙයක්. මේවා පිළිබඳව කථා කළ යුතුයි. එම නිසා ඔබතුමන්ලා මේවා ගැන අසුබවාදී විධියට දකින්න එපා කියන ඉල්ලීම මම කරනවා.

විශේෂයෙන්ම අද අපේ අමාත්‍යාංශය යටතේ ඇති රජයේ කර්මාන්තශාලාව සම්බන්ධව මේ විසර්ජන පනත් කෙටුම්පතට අදාළව කරුණු ඉදිරිපත් කරන්න සිද්ධ වුණේ ඇත්ත වශයෙන්ම ඒ ආයතනයේ කාර්ය භාරය වැඩි වුණු නිසායි. ගිය වර අය වැයට ඉදිරිපත් වුණ ප්‍රමාණයට වඩා වැඩියෙන් වැඩ කරන්න සිද්ධ වුණා. එම නිසා තමයි මෙම විසර්ජන පනත් කෙටුම්පත යටතේ පාර්ලිමේන්තුවෙන් අද නැවත අනුමැතියක් ලබා ගන්න සිද්ධ වුණේ. අපි ඉදිරි කාල සීමාව තුළදී මේ රට පොදු අරමුණක් කරා, ආසියාවේ ආශ්චර්ය කරා ගෙන යන ගමනේදී අමාත්‍යාංශයක් විධියට අපේ යුතුකම, වගකීම අපි ඉටු කරනවා කියන ඒ පණිවුඩය සඳහන් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 6.14 ]

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 16 දරන නියමය පිළිබඳව මාගේ අවධානය යොමු කරනවා. අතිගරු ජනාධිපතිතුමා විසර්ජන පනතක් ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුවෙන් ඉල්ලීමක් කරලා තිබුණා. අය වැය ලේඛනයෙන් වෙන් කළ මුදල් ප්‍රමාණය වැඩි කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා අවශ්‍ය කරන ප්‍රතිපාදන වෙන් කර ගැනීම සඳහා අනුමැතිය තමයි මේ අවස්ථාවේ ඉල්ලා සිටින්නේ. එකී පනත අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ කෘෂි කාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුමේ තිබුණ රුපියල් මිලියන 260ක මුදල රුපියල් මිලියන 300 දක්වා වැඩි කර ගැනීම සඳහා තමයි අවසරය ඉල්ලා තිබෙන්නේ.

විශේෂයෙන් අපි කෘෂිකර්ම ක්ෂේත්‍රය දිහා බැලුවාම, මේ ආණ්ඩුව සහ අතිගරු ජනාධිපතිතුමා බලයට පැමිණියේ ගොවීන් කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් අයින් වෙන්න ලැහැස්ති වෙලා සිටි අවස්ථාවකයි. ඒ දවස්වල කථාවක් තිබුණා තමන්ගේ අස්වැන්න - වී ටික, බැත- පොහොරවලට, කම්කරු කුලියට සහ කෘෂි රසායනික තෙල් සඳහා වෙන් කළාට පසුව ගොවියාට ඉතිරි වෙන්නේ බෝලත්තයි, උකුනු ගහයි විතරයි කියලා. ඒ කාලයේ තමයි අපේ අතිගරු ජනාධිපතිතුමා 2005 දී මේ රටේ බලය ලබා ගත්තේ. එතුමා මැතිවරණ කාලයේදී පොරොන්දු වූ ආකාරයටම පොහොර සහනාධාරය දීලා නැවත අපේ ගොවීන්ගේ දරුවෝ

ගොවිජන ක්ෂේත්‍රයට යොමු කරලා මේ රට දියුණු කිරීම සඳහා, ඇත්ත වශයෙන්ම මේ රට කෘෂි කර්මාන්තයෙන් දියුණු කිරීම සඳහා ගත්ත පියවර නිසා තමයි අද අපට කෘෂිකර්ම ක්ෂේත්‍රයේ යම් කිසි ස්ථානයකට එන්න පුළුවන් වෙලා තිබෙන්නේ. එතුමා යුද්ධය ජයග්‍රහණය කළේ මොන ආකාරයෙන්ද? මේ රටේ සියලුම ජනතාවගේ මානසිකත්වය යුද්ධය කෙරෙහි මෙහෙය වූ නිසා අපි කරන්න පුළුවන් හැම දේම කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දේවස්ථානයේ කන්නලව් කළා මේ රටෙන් මේ ශාපය තුරන් වේවා කියලා. පන්සල්වල බෝධි පූජා පැවැත් වුවා. ඒ ආශීර්වාදය තුළින් තමයි අපට, ත්‍රිවිධ හමුදාවට මේ රටේ අවුරුදු තිහක යුද්ධය ජයග්‍රහණය කරන්නට පුළුවන් වුණේ.

යුද්ධය අවසන් කළාට පස්සේ එතුමාට තිබුණු ඊ ළඟ අභියෝගය තමයි මේ රටේ ආර්ථික සටන ජයග්‍රහණය කිරීම. ඒ සඳහා ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ආර්ථික සංවර්ධන ඇමතිතුමා වශයෙන් "දිවි නැඟුම" වැඩසටහන යටතේ මේ රටේ සෑම ගමක් ගානේම ගිහිල්ලා පවුල් 10,00,000ක ප්‍රමාණයක් "දිවි නැඟුම" වැඩසටහනට දායක කර ගෙන, මේ රට ආර්ථිකයෙන් දියුණු කිරීම සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් දියුණු කරමින් අද මේ කර ගෙන යන වැඩ පිළිවෙළ විපක්ෂයේ පැසසුමට ලක් විය යුතු කරුණක්.

කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ගොවි පොළවල්, කෘෂිකර්ම ක්ෂේත්‍රය නැංවීමේදී විශේෂිත ස්ථානයක් ගන්නවා. විශේෂයෙන් බීජ සඳහා, නිවැරදි ඒ වාගේම නිරෝගී බීජ ලබා ගැනීම සඳහා මූලික වියදමක් දරන්න සිද්ධ වනවා. ඒ ධනය හරියාකාරව වැය කළොත් තමයි ගොවීන්ට නිවැරදි බීජ ලබා දීමට, ශක්ති සම්පන්න ප්‍රජනන ශක්තියක් තිබෙන බීජ ලබා දීමට හැකියාවක් ලැබෙන්නේ.

අද අපේ ප්‍රදේශයේ ඉලුප්පල්ලමේ ගොවි පොළ ලංකාවේ බීජ නිෂ්පාදන ගොවි පොළවල් අතරින් ඉතාම වැදගත් ස්ථානයක් ගන්නා ගොවි පොළක්. මේ ආණ්ඩුව මේ අවුරුද්දේ රුපියල් ලක්ෂ 500ක් වියදම් කරලා අවශ්‍ය කරන බීජ නිෂ්පාදනය එදාට වඩා ඉහළ මට්ටමකින් කර ගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ඔබතුමා දන්නවා ඇති, පසු ගිය ගංවතුර සමයේ අපේ ප්‍රදේශයේ විශේෂයෙන් උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ විශාල වශයෙන් ගොවි බිම් හානියට පත් වෙලා, බිත්තර වී පවා හොයා ගන්න බැරි වූ අවස්ථාවක ඉලුප්පල්ලමේ බීජ නිෂ්පාදනවලින් උතුරු නැඟෙනහිර ප්‍රදේශවලට බිත්තර වී කිලෝ 50,000කට වැඩි ප්‍රමාණයක් ලබා දී තිබෙන බව. ඒ කිලෝ 50,000 ලක්ෂය දක්වා වැඩි කිරීම සඳහා අවශ්‍ය කරන ප්‍රතිපාදන ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ අවධානය යටතේ මේ අවුරුද්දේ ලබා දී තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපි ඒ ගැන සන්තෝෂ වන්නට ඕනෑ.

විපක්ෂය මානව හිමිකම් ගැන කථා කළා; එහෙමත් නැත්නම් ආර්ථික නිදහස, තමන්ගේ නිදහස ගැන කථා කළා. ඒ හැරෙන්න මේ රටේ ගොවියා පිළිබඳව එක වචනයක්වත් ඔවුන් අද මෙතැනදී මේ වන කොට කථා කළේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කළ යුතුයි. ඇමතිතුමාට පිළිතුරු දෙන්න තිබෙනවා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)
මම වැඩි වේලාවක් ගන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව එක විනාඩියක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා මෙතැනදී කිව්වා, සැප්තැම්බර් මාසය වන කොට මේ ආණ්ඩුවට මීට වඩා ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙයි කියලා. අපිට සැකයක් ඇති වනවා, එහෙම නම් මේ විපක්ෂය ජාත්‍යන්තර කණ්ඩායමක් එක්ක එකතු වෙලා සැප්තැම්බර් මාසයේ මේ ආණ්ඩුව අසීරු තත්ත්වයකට පත් වන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගන්නවාද කියලා. අද ඒක එතුමාගේ කටින් පිට වුණේ හරියට "බළලා මල්ලෙන් එළියට පැන්නා" හා සමානවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රජය ගෙන යන වැඩ පිළිවෙළට ගොවීන් වශයෙන් ගොවීන්ගේ සහයෝගය උපරිම වශයෙන් ලබා දෙන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි. ගරු චන්ද්‍රසිරි ගජදීර ඇමතිතුමා.

[අ. භා. 6.20 ]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අත්තිකාරම් ගිණුම් සීමාවන් වෙනස් කිරීමේ පදනම මත අද මේ පාර්ලිමේන්තුවට ගිණුම් 10ක් ඉදිරිපත් කළ අවස්ථාවේ ඒ සම්බන්ධයෙන් විවිධ අදහස් ඉදිරිපත් වුණා.

මම ඔබතුමාට කියන්න ඕනෑ, මේ ගිණුම් පිළිබඳ සංශෝධන සමහරු දැක්කේ හරියට පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළා වාගේය කියන එක. ඇත්ත වශයෙන්ම මෙය සම්ප්‍රදායක් හැටියට, අමාත්‍යාංශයට වෙන් කරන ලද ගිණුම් තුළ ඇති කර ගන්නා වූ වෙනස්කම්, උපරිම වියදම් සහ අවම ලැබීම් සම්බන්ධව වෙනස්කම් පිළිබඳව ගෙනෙන ලද සංශෝධන.

මේ කාරණා පිළිබඳව සාකච්ඡා කරද්දී මම කියන්න ඕනෑ, බන්ධනාගාර දෙපාර්තමේන්තුවත් ඒ වාගේම ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවත් කියන දෙපාර්තමේන්තු දෙකේ ගිණුම් සම්බන්ධයෙන් තමයි මම මූලික අවධානය යොමු කරලා තිබෙන්නේ කියන එක. ඒ ගැන කථා කරන කොට මම මතක් කරන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කථාවල වැඩි අවධානය යොමු කරවන්න උත්සාහ කෙරුවේ, මේ රටේ ප්‍රජාවගේ පැත්තට වඩා විදේශීය ප්‍රජාවගේ පැත්තට බව.

සමහර ප්‍රශ්න සිංහලෙන් කථා කරලා මානව හිමිකම් පිළිබඳ ප්‍රශ්නය ඉංග්‍රීසියෙන් කථා කළා. දැන් මම කියන්න ඕනෑ, මේ මානව හිමිකම් පිළිබඳව කථා කරන අයගේ ඉතිහාසය අරගෙන බැලුවොත් ඒ අය ලේ තැවරුණු අතීතයකට හිමිකම් කියන අය බව. කමක් නැහැ. එහෙම ඉතිහාසයක් තිබුණත් මිනිසුන්ගේ හිමිකම් වෙනුවෙන් පෙනී සිටින්න ඕනෑ. ඒකේ කිසිම වරදක්

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

නැහැ. නමුත් මම කියන්න ඕනෑ, අපි තිස් අවුරුදු යුද්ධයකට මුහුණ දීලා බරපතළ අසීරුකම්වලට ලක් වුණත් තවමත් අපි මේ යුද්ධයට මුහුණ දීපු උතුරේ තරුණයන් වෙනුවෙන් ඒ අය සමාජගත කිරීමේ ක්‍රියාවලිය; ඒ අය පුනරුත්ථාපනය කිරීමේ ක්‍රියාවලිය; ඒ අය සමාජයේ යහපත් පුරවැසියන් කිරීමේ ක්‍රියාවලිය විශේෂ වැදගත්කමක් හැටියට සලකලා කරගෙන යනවාය කියලා. පසු ගිය කාල පරිච්ඡේදය තුළ අපේ පුනරුත්ථාපන මධ්‍යස්ථානවල රඳවා සිටි තරුණයන් එකොළොස් දහසක ප්‍රමාණයෙන් ඉතාම කෙටි කාලයක් තුළ පන්දහස් ගණනක් පමණ පුනරුත්ථාපනය කර සමාජගත කරලා දෙමව්පියන්ට භාර දීලා තිබෙනවා. ඒ වාගේම ඒ ඉන්න තරුණයන්ට ඉතා හොඳින් ඔවුන්ගේ අවශ්‍යතා සම්පූර්ණ කර ගත හැකි නිපුණ තැනැත්තන් විධියට පුහුණුවීම් ලබා දීලා ඒ අය මේ මධ්‍යස්ථානයෙන් පිට වුවත් තමන්ගේ ජීවන වෘත්තිය සපයා ගත හැකි ණය ක්‍රමවලට සම්බන්ධ කරලා ඔවුන්ට මේ සමාජයේ යහපත් පුරවැසියන් හැටියට ජීවත් වන්න පුළුවන් අවස්ථාව සලසා දෙන්න පසු ගිය දවස් කීපය ඇතුළත අපට පුළුවන්කම ලැබුණා. මම අහන්න කැමැතියි, මෙවැනි අරගලයකට මුහුණ දීපු මොන රටේද තමන්ට එරෙහිව අවි ඔසවා ගත් අය මේ වාගේ කෙටි කාලයක් තුළ පුනරුත්ථාපනය කරලා පමණක් නොවෙයි, ආර්ථික සහන ලබා දීලා සමාජගත කරලා තියෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක පැත්තකින් අපේ රජය පසු ගිය කාලය තුළ ඇති වුණු ඒ දේවල්වල විෂයමූල හා මනෝමූල කාරණා ගැන අධ්‍යයනයකින් යුක්තව ඒ හේතු වෙනස් කරන්න දැවැන්ත සංවර්ධන කාර්ය භාරයක් අනුගමනය කරනවාය කියලා මම මතක් කරන්න ඕනෑ. ඒක නිසා අද උතුරුකරයේ වේගවත් සංවර්ධනයක් ඇති වෙලා තිබෙනවා. ජාතික ආර්ථිකයට, දළ ජාතික නිෂ්පාදනයට විශාල දායකත්වයක් ලබා දෙන්න පුළුවන් මට්ටමකට නැගෙනහිර හා උතුරු පළාත් අද දියුණු වෙලා තිබෙනවා. මානව හිමිකම් ගැන කථා කරන අය ඒ ප්‍රදේශවලට ගිහිල්ලා අද ඇති වී තිබෙන වෙනස්කම් බලන්න ඕනෑ. ඒ මිනිස්සුන්ට නිදහසේ හිතලා වැඩ කරන්න පුළුවන් සමාජ පරිසරය ගොඩ නඟලා තිබෙනවා. ඔවුන්ගේ අතට ආර්ථික ප්‍රතිලාභ ලබා දීලා තිබෙනවා.

එක පැත්තකින් යුද්ධයේ කටුක ඉතිහාසය අමතක වන විධියට ඒ අරගලයට මුහුණ දීපු තරුණයන් සංවර්ධනය කරනවා වාගේම ඉදිරි කාලයේ එවැනි තත්ත්වයක් ඇති නොවන්න අවශ්‍ය වූ සමාජ පරිසරය ඇති කරන්න ගොඩ නඟන වැඩ පිළිවෙළේ තියෙන ප්‍රධාන ඉලක්කය තමයි ඔවුන් සියලු දෙනාගේම මානව හිමිකම් සුරක්ෂිත කිරීම සහ මුළු මහත් සමාජ දේහයේ තිබුණු එවැනි ප්‍රතිවිපාක දෙන ක්‍රියාවන් වළක්වාලීමට පියවර ගැනීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බන්ධනාගාර දෙපාර්තමේන්තුව අරගෙන බැලුවොත් ඔබතුමාත් දන්නවා දැන් බන්ධනාගාරවලට ඇතුළු වන සංඛ්‍යාව අඩු වෙමින් තිබෙනවාය කියලා. මම මේ වගකීම් භාර ගන්න කොට බන්ධනාගාරය තුළ හිටියේ විසිහය දහසක් පමණ සංඛ්‍යාවක්. මේක රැජිනගේ බෝඩිම වාගේ එනවා යනවා. දැන් විසිදාහක ප්‍රමාණයකට අඩු වෙලා තිබෙනවා. මේකට හේතුව තමයි එක පැත්තකින් රජය ගෙන යන සමාජ සංවර්ධන ක්‍රියාවලිය; "මතට තිත" වැඩ සටහන; ගම ගොඩ නඟන ආර්ථික ක්‍රියාවලිය. මේ නිසා අපරාධවලට සම්බන්ධ වන ප්‍රමාණයන් අද ප්‍රතිශතයක් වශයෙන් අඩු වෙලා තිබෙනවා. ඒක ලෝකයේ අනිකුත් රටවල් එක්ක සංසන්දනය කළොත් අපි ගෙන යන පුනරුත්ථාපන ක්‍රියාවලිය, සමාජ හා ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රතිඵල ඒකට බලපාලා තිබෙනවා. පසු ගිය කාලය ඇතුළත සමහරු කිව්වා, බන්ධනාගාරගත වෙලා ඉන්න අයට නිසි විධියට සලකන්නේ නැහැ කියලා. ඊයේ පෙරේදාත් පුවත් පතක මේ ගැන සටහන් වෙලා තිබුණා මම දැක්කා. ඔබතුමා දන්නවා. මේ මෑතකදී සුදු කොඩි නඩුව විමර්ශනය කරන්න මාර්ක් ට්‍රවල් මහත්තයා ලංකාවට ආපු වෙලාවේ ෆොන්සේකා මහත්මයා ඉන්න ස්ථානය බලන්න අපි එතුමාට අවස්ථාවක් ලබා දුන්න බව. ඔහු ගිහිල්ලා විනාඩි 20ක් විතර එතුමා හමු වෙලා කථා කළා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, දැන් අවසන් කරන්න.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
පර්චස් 15ක විතර බිම් කොටසක් -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා දැන් ඡන්දය ගන්නත් තිබෙනවා. දැන් අවසන් කිරීමේ වෙලාව.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
තව වචන දෙකකින් අවසන් කරනවා.

ෆොන්සේකා මහත්මයාව විශේෂ පහසුකම් සහිත ස්ථානයක රඳවා තිබෙන බව එතුමා තේරුම් ගත්තා. ඊට පස්සේ ඒ සම්බන්ධයෙන් වචනයක්වත් එතුමා කථා කළේ නැහැ. ඒ නිසා මම කියන්න කැමැතියි, අපි මේ රටේ මානව හිමිකම් ඉතා උසස් මට්ටමකින් රකිනවා වාගේම, සියලු ක්ෂේත්‍ර තුළින් කර ගෙන යන ආර්ථික සංවර්ධන ක්‍රියාදාමය වැඩිදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් තමයි මේ සංශෝධන ගෙනැවිත් තිබෙන්නේ කියන එක. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

Sir, on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance and Planning with the approval of the Government,

by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 7 of 2010 and specified in the Order No. 17 hereto,

be approved.

**Appropriation Act, No. 7 of 2010**

**Order No. 17 under Section 8**

By virtue of the powers vested in me by Section 8 of the Appropriation Act, No.7 of 2010, I, Mahinda Rajapaksa, Minister of Finance and Planning with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 01602 "Advancing monies to be used in Bribery detection as Bribes Advance Account - Commission to Investigate Allegations of Bribery or Corruption" of the third Schedule to that Act.

| | | | | |
|---|---|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the third Schedule to that Act. | | | Not Revised |
| (ii) | Minimum limit of receipts specified in Column III of the third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 1,500,000<br>400,000 |
| (iii) | Maximum limit of debit balance specified in Column IV of the third Schedule to that Act. | | | Not Revised |
| (iv) | Maximum limit of liabilities specified in Column V of the third Schedule to that Act. | | | Not Revised |

(This Order is valid up to 31.12.2010 only.)

Sgd. MAHINDA RAJAPAKSA,
Minister of Finance and Planning.

21.04.2011
Colombo 01.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

Sir, on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance and Planning with the approval of the Government,

by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 7 of 2010 and specified in the Order No. 18 hereto,

be approved.

**Appropriation Act, No. 7 of 2010**

**Order No. 18 under Section 8**

By virtue of the powers vested in me by Section 8 of the Appropriation Act, No.7 of 2010, I, Mahinda Rajapaksa, Minister of Finance and Planning with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 31002 "Government Factory Stores Advance Account - Government Factory" of the third Schedule to that Act.

| | | | | |
|---|---|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the third Schedule to that Act. | | | Not Revised |
| (ii) | Minimum limit of receipts specified in Column III of the third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 120,000,000<br>105,000,000 |
| (iii) | Maximum limit of debit balance specified in Column IV of the third Schedule to that Act. | | | Not Revised |
| (iv) | Maximum limit of liabilities specified in Column V of the third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 0<br>20,000,000 |

(This Order is valid up to 31.12.2010 only.)

Sgd. MAHINDA RAJAPAKSA,
Minister of Finance and Planning.

21.04.2011
Colombo 01.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## IV

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

Sir, on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance and Planning with the approval of the Government,

by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 7 of 2010 and specified in the Order No. 19 hereto,

be approved.

**Appropriation Act, No. 7 of 2010**

**Order No. 19 under Section 8**

By virtue of the powers vested in me by Section 8 of the Appropriation Act, No.7 of 2010, I, Mahinda Rajapaksa, Minister of Finance and Planning with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 30602 "Railway Stores Advance Account - Department of Sri Lanka Railways" of the third Schedule to that Act.

| | | | | |
|---|---|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 1,300,000,000<br>1,800,000,000 |
| (ii) | Minimum limit of receipts specified in Column III of the third Schedule to that Act. | | | Not Revised |
| (iii) | Maximum limit of debit balance specified in Column IV of the third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 4,067,000,000<br>4,750,000,000 |
| (iv) | Maximum limit of liabilities specified in Column V of the third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 500,000,000<br>800,000,000 |

(This Order is valid up to 31.12.2010 only.)

Sgd. MAHINDA RAJAPAKSA,
Minister of Finance and Planning.

21.04.2011

Colombo 01.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## V

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

Sir, on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance and Planning with the approval of the Government,

by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 7 of 2010 and specified in the Order No. 20 hereto,

be approved.

**Appropriation Act, No. 7 of 2010**

**Order No. 20 under Section 8**

By virtue of the powers vested in me by Section 8 of the Appropriation Act, No.7 of 2010, I, Mahinda Rajapaksa, Minister of Finance and Planning with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 23202 "Prisons Industrial and Agricultural undertakings Advance Account - Department of Prisons" of the third Schedule to that Act.

| | | | | |
|---|---|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 153,000,000<br>89,000,000 |
| (ii) | Minimum limit of receipts specified in Column III of the third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 175,000,000<br>98,000,000 |
| (iii) | Maximum limit of debit balance specified in Column IV of the third Schedule to that Act. | | | Not Revised |
| (iv) | Maximum limit of liabilities specified in Column V of the third Schedule to that Act. | | | Not Revised |

(This Order is valid up to 31.12.2010 only.)

Sgd. MAHINDA RAJAPAKSA,
Minister of Finance and Planning.

21.04.2011
Colombo 01.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## VI

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

Sir, on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance and Planning with the approval of the Government, by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 7 of 2010 and specified in the Order No. 24 hereto, be approved.

**Appropriation Act, No. 7 of 2010**

**Order No. 24 under Section 8**

By virtue of the powers vested in me by Section 8 of the Appropriation Act, No.7 of 2010, I, Mahinda Rajapaksa, Minister of Finance and Planning with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 25002 "Advances for Payments on behalf of other Governments Advance Account - Department of State Accounts" of the third Schedule to that Act.

| | | | | |
|---|---|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the third Schedule to that Act. | | | Not Revised |
| (ii) | Minimum limit of receipts specified in Column III of the third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 5,550,000<br>4,700,000 |
| (iii) | Maximum limit of debit balance specified in Column IV of the third Schedule to that Act. | | | Not Revised |
| (iv) | Maximum limit of liabilities specified in Column V of the third Schedule to that Act. | | | Not Revised |

(This Order is valid up to 31.12.2010 only.)

Sgd. MAHINDA RAJAPAKSA,
Minister of Finance and Planning.

21.04.2011
Colombo 01.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## VII

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

Sir, on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance and Planning with the approval of the Government,

by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 7 of 2010 and specified in the Order No. 25 hereto,

be approved.

**Appropriation Act, No. 7 of 2010**

**Order No. 25 under Section 8**

By virtue of the powers vested in me by Section 8 of the Appropriation Act, No.7 of 2010, I, Mahinda Rajapaksa, Minister of Finance and Planning with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 25003 "Miscellaneous Advances Account - Department of State Accounts" of the third Schedule to that Act.

| | | | | |
|---|---|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 50,000,000<br>30,000,000 |
| (ii) | Minimum limit of receipts specified in Column III of the third Schedule to that Act. | From<br>To | Rs.<br>Rs. | 250,000,000<br>37,200,000 |

| | | | |
|---|---|---|---|
| (iii) | Maximum limit of debit balance specified in Column IV of the third Schedule to that Act. | From<br>To | Rs. 200,000,000<br>Rs. 560,000,000 |
| (iv) | Maximum limit of liabilities specified in Column V of the third Schedule to that Act. | | Not Revised |

(This Order is valid up to 31.12.2010 only.)

Sgd. MAHINDA RAJAPAKSA,
Minister of Finance and Planning.

21.04.2011
Colombo 01.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## VIII

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

Sir, on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance and Planning with the approval of the Government,

by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 7 of 2010 and specified in the Order No. 27 hereto,

be approved.

**Appropriation Act, No. 7 of 2010**

**Order No. 27 under Section 8**

By virtue of the powers vested in me by Section 8 of the Appropriation Act, No.7 of 2010, I, Mahinda Rajapaksa, Minister of Finance and Planning with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 21302 "Printing Publicity and Sales of Publications (public Notification of Publication rights, Acquiring Translation fees and staff wages inclusive of all allowances) Advance Account - Department of Educational Publications" of the third Schedule to that Act.

| | | | |
|---|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the third Schedule to that Act. | | Not Revised |
| (ii) | Minimum limit of receipts specified in Column III of the third Schedule to that Act. | From<br>To | Rs. 3,800,000,000<br>Rs. 1,900,000,000 |
| (iii) | Maximum limit of debit balance specified in Column IV of the third Schedule to that Act. | | Not Revised |
| (iv) | Maximum limit of liabilities specified in Column V of the third Schedule to that Act. | From<br>To | Rs. 100,000,000<br>Rs. 1,000,000,000 |

(This Order is valid up to 31.12.2010 only.)

Sgd. MAHINDA RAJAPAKSA,
Minister of Finance and Planning.

29.04.2011
Colombo 01.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## IX

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

Sir, on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That this Parliament resolves that the Order made by the Minister of Finance and Planning with the approval of the Government,

by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 7 of 2010 and specified in the Order No. 26 hereto,

be approved.

**Appropriation Act, No. 7 of 2010**

**Order No. 26 under Section 8**

By virtue of the powers vested in me by Section 8 of the Appropriation Act, No.7 of 2010, I, Mahinda Rajapaksa, Minister of Finance and Planning with the approval of the Government, do by this Order, vary the limits specified against the activity Item No. 31003 "Work Done Advance Account - Government Factory" of the third Schedule to that Act.

| | | | |
|---|---|---|---|
| (i) | Maximum limit of expenditure specified in Column II of the third Schedule to that Act. | From<br>To | Rs. 260,000,000<br>Rs. 280,000,000 |
| (ii) | Minimum limit of receipts specified in Column III of the third Schedule to that Act. | From<br>To | Rs. 280,000,000<br>Rs. 268,000,000 |
| (iii) | Maximum limit of debit balance specified in Column IV of the third Schedule to that Act. | | Not Revised |
| (iv) | Maximum limit of liabilities specified in Column V of the third Schedule to that Act. | From<br>To | Rs. 0<br>Rs. 2,000,000 |

(This Order is valid up to 31.12.2010 only.)

Sgd.MAHINDA RAJAPAKSA,
Minister of Finance and Planning.

29.04.2011
Colombo 01.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## X

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

Sir, on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That this Parliament resolves that the Orders made by the Minister of Finance and Planning with the approval of the Government,

by virtue of powers vested in him by Section 8 of the Appropriation Act, No. 7 of 2010 and specified in the schedule hereto,

be approved.

(These Orders are valid only up to 31.12.2010)

## SCHDEDULE

**Appropriation Act No. 7 of 2010 Order under Section 8**

Schedule of variation of limits of Advance Accounts pertaining to Advances to public officers Authorized by the Minister of Finance and Planning under Section 8 of the Appropriation Act No. 7 of 2010 in Respect of Finance year 2010.

| Srl No. | Ministry/Department | Item No. | Maximum Limit of Expenditure in Column II | | Minimum Limit of Receipts in Column III | | Maximum Limit of Debit Balance in Column IV | | Order No. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | From | To | From | To | From | To | |
| 1 | Minister of Rehabilitation and Prison Reforms | 17401 | - | - | 100,000 | 350,000 | 3,000,000 | 10,000,000 | 1 |
| 2 | Minister of Construction, Engineering Services, Housing and Common Amenities | 12301 | - | - | 7,400,000 | 4,000,000 | - | - | 2 |
| 3 | Minister of Livestock and Rural Community Development | 14001 | - | - | 5,800,000 | 4,600,000 | - | - | 3 |
| 4 | Minister of Transport | 11401 | - | - | 8,200,000 | 4,500,000 | | | 4 |
| 5 | Minister of Disaster Management | 10601 | - | - | - | - | 8,000,000 | 11,500,000 | 5 |
| 6 | District Secretariat, Colombo | 25501 | - | - | 35,000,000 | 29,000,000 | 170,000,000 | 175,000,000 | 6 |
| 7 | District Secretariat, Matale | 25901 | - | - | 32,000,000 | 26,000,000 | - | - | 7 |
| 8 | District Secretariat / Kachcheri - Batticaloa | 26901 | - | - | - | - | 50,000,000 | 82,000,000 | 8 |
| 9 | District Secretariat / Kachcheri - Trincomalee | 27101 | - | - | 15,000,000 | 13,500,000 | - | - | 9 |
| 10 | District Secretariat, Anuradhapura | 27401 | - | - | 40,000,000 | 30,000,000 | | | 10 |
| 11 | District Secretariat, Monaragala | 27701 | - | - | 21,000,000 | 19,000,000 | | | 11 |
| 12 | District Secretariat, Rathnapura | 27801 | - | - | - | - | 146,000,000 | 148,000,000 | 12 |
| 13 | Minister of Ports and Aviation | 11301 | - | - | 5,600,000 | 5,159,000 | - | - | 13 |
| 14 | Department of Motor Traffic | 30701 | - | - | - | - | 65,000,000 | 95,000,000 | 14 |
| 15 | Department of Community Based Correction | 32601 | - | - | - | - | 13,000,000 | 20,000,000 | 15 |
| 16 | Human Right Commission of Sri Lanka | 02201 | - | - | 292,000 | 0 | - | - | 21 |
| 17 | Department of Trade Tariffs and Investment Policy | 24401 | - | - | 2,000,000 | 1,980,000 | - | - | 22 |
| 18 | Department of Legal Affairs | 32301 | - | - | - | - | 1,000,000 | 1,102,769 | 23 |

*Sgd.* Mahinda Rajapaksa
Minister of Finance and Planning

29 April 2011
Colombo 01.

( Cabinet approval signified)

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The Adjournment Motion is to be moved by the Hon. John Amaratunga.

# විමධ්‍යගත අරමුදල් වැඩි කිරීම
## பன்முகப்படுத்தப்பட்ட நிதியினை அதிகரித்தல்
## INCREASE OF DECENTRALIZED FUNDS

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත වසරක් ආරම්භයේදීම විමධ්‍යගත අරමුදල් සංවර්ධන කටයුතු සඳහා ඔවුන්ට වෙන් කර දීම සාමාන්‍ය පිළිවෙතයි.

ශ්‍රී ලංකා මහ බැංකුව පවසන පරිදි ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ඉහළ මට්ටමක පැවතීමත්, මේ වන විට යුද්ධය අවසන් වී රටේ සාමකාමී වාතාවරණයක් පැවතීමත් හේතු කොට ගෙන මන්ත්‍රීවරයකු සඳහා ලබා දෙන රුපියල් ලක්ෂ 50ක්වූ විමධ්‍යගත අරමුදල් ප්‍රමාණය වසරකට රුපියල් ලක්ෂ 100 දක්වා වැඩි කරන ලෙසත්, මේ වසරේ මේ දක්වා ලබා දී නොමැති විමධ්‍යගත අරමුදල් සංවර්ධන කටයුතු වෙනුවෙන් යෙදවීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනට වහාම ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරයකු විධියට තමුන්නාන්සේත් දන්නවා මේ විමධ්‍යගත අරමුදල් දීමේ වැඩ පිළිවෙළ ආරම්භ කළේ 1972 දී බව. පළමුවෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මුදල් වෙන් කරන්නට පටන් ගත්තේ 1973 දීයි. ඒ වෙලාවේ මන්ත්‍රීවරයකුට දුන්නේ රුපියල් ලක්ෂ 5යි. යුගයේ හැටියට, කාලයේ හැටියට, වියදමේ හැටියට ඒ රුපියල් ලක්ෂ 5න් විශාල සංවර්ධන වැඩ කොටසක්, වැඩ පිළිවෙළක් මන්ත්‍රීවරයකුට කරන්න පුළුවන්කම තිබුණා. ඊට පසුව 1979 වර්ෂයේ දිස්ත්‍රික් සංවර්ධන වැඩ පිළිවෙළ ආරම්භ වුණු වෙලාවේ විමධ්‍යගත අරමුදල රුපියල් ලක්ෂ 25ක් බවට පරිවර්තනය වුණා. මොකද, වියදම වැඩි වන විට විමධ්‍යගත අරමුදල් වැඩි කරලා දුන්නා. ඊට පස්සේ 2000 වසරේ දී එය රුපියල් ලක්ෂ 35 දක්වා වැඩි වෙලා, 2003 රුපියල් ලක්ෂ 50 දක්වා වැඩි කරන්නට යෙදුණා. ඒ වන විට මන්ත්‍රීවරු සංඛ්‍යාවත් 196 දක්වා වැඩි වුණා. ඒ වාගේම පත් කළ මන්ත්‍රීවරු 29ක් සිටියා.

මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. අපි දැන් ඉන්නේ 2011 අවුරුද්දේ ජුනි මාසයේ. මන්ත්‍රීවරුන්ට අවුරුදු 40ක කාලසීමාවක් තුළ සම්ප්‍රදායානුකූලව ලැබුණු ඒ විමධ්‍යගත අරමුදල මේ වන තෙක් ලැබිලා නැහැ. "දෙනවා" කියන වචනයවත් මට තවම අහන්න ලැබුණේ නැහැ. පක්ෂ නායක රැස්වීමේදීත් අපි මේ ප්‍රශ්නය ගැන කථා කළා. නමුත් අපට සෑහීමට පත් වන්න පුළුවන් පිළිතුරක් ලැබුණේ නැහැ. ඒ නිසායි අපි මේක මේ ගරු සභාවට ගෙනාවේ. ගරු කථානායකතුමා තමයි, අපේ මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන පුද්ගලයා හැටියට අපි සලකන්නේ. ඒ නිසා අපි මේ ගරු සභාවට මේ යෝජනාව ගෙනැල්ලා ඉල්ලීමක් කරන්නේ කරුණාකරලා සම්ප්‍රදායානුකූලව මන්ත්‍රීවරුන්ට ලැබුණ මේ දීමනාව - මේ විමධ්‍යගත අරමුදල-දේශපාලන භේදයෙන් තොරව වහාම ලබා දෙන්නට පියවර ගන්නා ලෙසයි.

මේ වනකොට අවුරුද්දේ මාස හයක් අවසාන වෙලා තිබෙනවා. දැන් සල්ලි වෙන් කළත් බොහොම අමාරුවෙන් තමයි ඉතුරු මාස හය තුළ ඒ යෝජනා ක්‍රියාත්මක කරන්න පුළුවන් වන්නේ. මේක හරිම කනගාටුදායක තත්ත්වයක්. එක්සත් ජාතික පක්ෂය හෝ වේවා, සන්ධානය හෝ වේවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හෝ වේවා කවුරු ආණ්ඩු කළත් එදා ඉඳලා දේශපාලන බේදයෙන් තොරව මන්ත්‍රීවරුන්ට ඒ මුදල් ලබා දුන්නා. අද මේ රජයට ප්‍රශ්නයක් නැහැ. රට පුරා විවිධාකාර වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. ගම නැඟුම, මඟ නැඟුම, දිවි නැඟුම ඒ ආදී වශයෙන් ඒ කටයුතු කෙරෙනවා. නමුත් විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට ඒ අයගේ ඡන්ද දායකයන් වෙනුවෙන්, ඒ අයට සහයෝගය දීපු කණ්ඩායම් වෙනුවෙන් සේවය කරන්න කිසිම අවස්ථාවක් නැහැ. අපි දකින විධියට අද මේ හැම දෙයක්ම දේශපාලනීකරණය වෙලා තිබෙනවා. ඒකයි අද තිබෙන කනගාටුදායක තත්ත්වය. අද ඒ මුදල් ලැබෙන්නේ එක්තරා පාර්ශ්වයකට පමණයි. ඒ නිසා මේ රටේ ජනතාවට ඔවුන්ගේ අවශ්‍යතාවන් ඉටු කර දෙන්න, ඔවුන්ගේ වගකීම් ඉටු කර දෙන්න, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් අවස්ථාව ලබා දෙන්න, අපේ ඒ අයිතිවාසිකම ආරක්ෂා කර දෙන්න කියලා අපි ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේක වැදගත්ම කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට ලබා දෙන රුපියල් ලක්ෂ 50, ලක්ෂ 100 දක්වා වැඩි කරන්න කියලා ඉල්ලීමක් කරන්නේ අද වෙළෙඳ පොළේ පවතින අමුද්‍රව්‍යවල මිල අනුවයි. අද සිමෙන්ති කොට්ටයක මිල කීයද? වැලිවල මිල කීයද? යකඩවල මිල කීයද? ඔය ආදී වශයෙන් හැම දෙයකම මිල බැලුවාම ගොඩනැගිල්ලක් හදන්න කොතරම් මුදලක් වැය වෙනවාද? දැනට අවුරුදු දෙක තුනකට කලින් ලක්ෂ 50කින් කරපු වැඩක් අද ලක්ෂ 100ක්වත් නැතුව කරන්න බැහැ. මේ මුදල් ලබා ගත්තාම අපේ මන්ත්‍රීවරු එක්කෝ ගම් මට්ටමින් පාරක් හදයි, විදුලි බුබුලක් සවි කරයි, විදුලි කණුවක් හිටුවයි, ප්‍රජා ශාලාවකට මුදල් දෙයි, එහෙම නැත්නම් සිද්ධස්ථානයකට මුදල් දෙයි, එහෙමත් නැත්නම් වැඩිහිටි සමිතියකට උදව් කරයි. ඔය ආදී වශයෙන් අපේ මන්ත්‍රීතුමන්ලා ප්‍රජා වැඩ කොටසක් තමයි යුගයෙන් යුගයට ඉටු කළේ. විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට දැන් මේ කිසි දෙයක් කරන්න අවස්ථාව අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා අපේ යුතුකමක් තිබෙනවා, මේ පිළිබඳව මැදිහත් වෙන්න කියලා ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරන්න. මේ අසාධාරණය වෙන්න ඉඩ දෙන්න එපා.

විමධ්‍යගත මුදල් ලබා ගෙන සංවර්ධන කටයුත්තක් කරන්නවත් දැන් කාල සීමාවක් ඇති නැති තරම්. මේ ගැන අපි කනගාටු වෙනවා. මේක චුවමනාවෙන්ම ප්‍රමාද කළාද එහෙම නැත්නම් මේක ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අයිතිවාසිකම් විනාශ කර දැමීමේ අරමුණක් ඇතිව කළාද කියන එක ගැන අපට සැකයක් තිබෙනවා. හැම අවස්ථාවකදීම අපි බලාපොරොත්තු වුණා මැතිවරණය ඉවර වුණාම විමධ්‍යගත මුදල් ලබා දෙයි කියලා. අද ආර්ථික වර්ධනය මෙච්චරයි, ඒක පුද්ගල ආදායම මේ විධියට වැඩි වෙලා තිබෙනවා, හැම අතින්ම ආර්ථිකයේ විශාල දියුණුවක් ලබා තිබෙනවා කියන එක රජය වෙනුවෙන් කතා කළ හැම

[ගරු ජෝන් අමරතුංග මහතා]

මන්ත්‍රීවරයෙක්ම, ඇමතිවරයෙක්ම කිව්වා. ඒවා කරන්න ඒ හැටි විශාල මුදලක් තිබෙනවා නම් ඇයි මේ මන්ත්‍රීවරුන්ට දෙන්න තිබෙන විමධ්‍යගත මුදල් දෙන්නේ නැත්තේ කියලා අපි අහනවා.

සෑම වර්ෂයකදීම අය වැයෙන් මේ සඳහා මුදල් වෙන් කරනවා. ඒ නිසා ඒ මුදල් තිබෙනවා. ඒ මුදල් ලබා ගැනීම සඳහා මන්ත්‍රීවරුන්ට යෝජනා ඉදිරිපත් කරන්න අවස්ථාවක් නොදෙන එක තමයි අපට තිබෙන කනගාටුව. මම මීට වැඩිය මේ පිළිබඳව කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අවුරුදු 40ක පමණ කාල සීමාවක් තුළ යුගයෙන් යුගයේ හිටපු ඒ රාජ්‍ය නායකයන් එහෙම නැත්නම් ඒ මුදල් ඇමතිවරු අවශ්‍ය මුදල් ප්‍රමාණය ලක්ෂ 5 සිට ලක්ෂ 50 දක්වා වැඩි කරලා මන්ත්‍රීවරුන්ට දුන්නත් මේ අවස්ථාවේදී ඒ මන්ත්‍රීවරුන්ට ඒ මුදල් නොදී යටපත් කර ගෙන ඉන්නේ ඇයි කියලා මම අහනවා.

විශේෂයෙන්ම මෙතැන ඇමතිවරු කිහිප දෙනෙක් ඉන්නවා. තමුන්නාන්සේලා කැබිනට් මණ්ඩලයේ තීරණයක් අරගෙන හැකි ඉක්මනින් මේ විමධ්‍යගත මුදල් මන්ත්‍රීවරුන්ට ලැබෙන්න ඉඩ සලස්වන්න කියලා මම කියනවා. [බාධා කිරීමක්] මෙක අපට විතරක් බලපාන දෙයක් නොවෙයි. මම දන්නේ නැහැ ඇමති නොවන මන්ත්‍රීවරු මෙතැන ඉන්නවාද කියලා. [බාධා කිරීමක්] ඇමතිකම් නැති අයත් ඉන්නවාද? එහෙම නම් මම කනගාටු වෙනවා, එහෙම කියපු එක ගැන. ඇමතිකම තිබුණත් සමහරුන්ට බලය නැහැ. නමට තමයි එතුමන්ලා ඇමතිකමේ ඉන්නේ. එහෙම චෝදනාත් තිබෙනවා. එක පැත්තකින් ජ්‍යෙෂ්ඨ ඇමතිවරු ඉන්නවා. නාම පුවරුවට පමණක් සීමා වෙච්ච ඇමතිවරුත් ඉන්නවා. ඒ අය දැන් කථා කරන්නේ නැහැ බය නිසා. ඒ අයටත් මේ යෝජනාව ප්‍රයෝජනයක් වෙනවා, අඩු තරමින් තමුන්ගේ මන්ත්‍රීකම ආරක්ෂා කර ගන්න, ඇමතිකම ආරක්ෂා කර ගන්න ගමට ගිහිල්ලා යම් කිසි වැඩක් කරලා තමුන්ගේ අනන්‍යතාව තහවුරු කර ගෙන ඉදිරි මැතිවරණවලදීත් ජනතාවට මුහුණ දෙන්න පුළුවන් තත්ත්වයක් ඇති කර ගන්න. මම මේ කථා කරන්නේ විශේෂයෙන්ම විරුද්ධ පක්ෂය වෙනුවෙන්. නමුත් මේකෙන් විරුද්ධ පක්ෂයේ අයට පමණක් නොවෙයි, රජයේ ඉන්න මැති ඇමතිවරුන්ටත් ප්‍රතිලාභයක් -ප්‍රයෝජනයක්- අත් වෙනවා කියන එක මම මතක් කරන්න ඕනෑ.

දැන් ලබා දෙන රුපියල් ලක්ෂ 50 ප්‍රමාණවත් නැහැ. ඒ ලක්ෂ 50 වෙනුවට ලක්ෂ 100ක්වත් අඩු තරමින් මේ කෙටි කාල සීමාවට හරි ලබා දෙන්නේ නම්, මහජන ඡන්දයෙන් පත් වෙච්ච මන්ත්‍රීවරු හැටියට අපේ වගකීම් කොටස ජනතාවට ඉටු කරන්න අපට පුළුවන් වෙයි කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවන් යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ජෝන් අමරතුංග මැතිතුමාට මා විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. එම යෝජනාව ස්ථිර කරන ගමන් ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න මා බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් මේ යෝජනාව අවුරුදු ගණනාවක් තිස්සේ අපි සියලු දෙනා කථා කරපු යෝජනාවක්. මේ මුදල පිළිබඳව තිබෙන ප්‍රධාන ප්‍රශ්නය අපි කථා කරලා තිබෙනවා. 1977 දක්වා තිබිච්ච හැම ආණ්ඩුවක්ම කේවල ඡන්ද කොට්ඨාස ක්‍රමය යටතේ තමයි පත් වුණේ. එහෙම නැත්නම් ආසනයකට මන්ත්‍රීවරයකු පත් වීමේ ක්‍රමය. එතකොට ආසනයකට ලක්ෂ 25ක් ලැබෙනවා කියන්නේ දැවැන්ත මුදලක්. ඉස්සර හිටපු මන්ත්‍රීවරු ගැන කියන කොට අදත් කියනවා, "ඒ මන්ත්‍රීතුමා ඉන්න කොට නම් පුදුම විධියේ වැඩ කොටසක් කෙරුවා" කියලා. ඒ කෙරුවේ ඒ ලක්ෂ 25න් තමයි. දැන් සිද්ධ වෙලා තිබෙන්නේ වෙන දෙයක්. එදා ලක්ෂ 25ක් ගත්තාම සමහර වෙලාවට ලක්ෂ දෙකෙන්, ලක්ෂ දෙකහමාරෙන් එක ගොඩනැඟිල්ලක් හදලා ඉවර කරන්න පුළුවන්. එහෙම හදපු ඉතිහාසයක් තමයි අපි දැක්කේ. නමුත් අද ඔබතුමාත් දන්නවා ඇති, දිස්ත්‍රික්කයක් හැටියට වැඩ කරන විට අපේ දිස්ත්‍රික්කයකට ආසන ගණනාවක් තිබෙන බව. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආසන 14ක් තිබෙනවා. ඉස්සර එක ආසනයකට ලක්ෂ 25ක් ලැබුණා. දැන් ආසන 14කට ලැබෙන්නේ ලක්ෂ 50යි. ඉතින් මේකෙන්ම බොහොම පැහැදිලි වෙනවා, අපි කොහොමද මේ ලක්ෂ පනහ දිස්ත්‍රික්කයේ ආසන 14කට බෙදන්නේ කියලා. එහෙම බෙදන කොටත් නොයෙක් ප්‍රශ්න තිබෙනවා.

අපි දන්නවා අද වෙන කොට මේ පිළිබඳව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් විවිධ නිර්ණායක දමලා තිබෙන බව. ඒ නිසා කිසිම දෙයක් දීගන්න බැරි තත්ත්වයකට දැන් පත් වෙලා තිබෙන්නේ. වෙනදා අපි මේ ලක්ෂ පනහ අරගෙන අඩුම තරමින් ආසන 14ට සොච්චම් මුදලක් -පොඩ්ඩ පොඩ්ඩ- දුන්නා. සමහර වෙලාවට ඒකෙන් මරණාධාර සමිතිවලට පුටු ටිකක් දුන්නා. මරණාධාර සමිතිවලට hut එකක් දුන්නා. මරණාධාර සමිතියකට, පන්සලකට අපි ශබ්දවාහිනී යන්ත්‍රයක් - loudspeaker set එකක්- දුන්නා. අඩුම තරමින් මේ වාගේ පරිත්‍යාගයක්, නැත්නම් ඒ ගන්න තිබුණු දේවල්වලින් එක දෙයක් හරි ගන්න මුදල් දුන්නා. ඇත්තටම අත්‍යවශ්‍ය පන්සලකට, නැත්නම් වැඩි පිරිසක් ඉන්න මරණාධාර සමිතියකට තමයි අප මේවා දුන්නේ. නමුත් අද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මේ සියලු දේවල් අහෝසි කර තිබෙනවා. අද මරණාධාර සමිතියකට පුටුවක් දීගන්න බැහැ; අද මරණාධාර සමිතියකට hut එකක් දීගන්න බැහැ; පන්සලකට ශබ්දවාහිනී යන්ත්‍රයක් දෙන්න විධියක් නැහැ. පන්සලක බෝධි සරයක් හදන්න, නැත්නම් විහාර ගෙයක් හදන්න, ආවාසය හදා ගන්න අපෙන් රුපියල් 25,000ක් ඉල්ලුවොත් අපි කොහොමද දෙන්නේ? හාමුදුරුවෝ අපිව ගෙන්වලා ඉන්දවලා ඉස්සරවෙලාම අහන්නේ, "මහත්තයෝ, මොනවාද දෙන්න පුළුවන්?" කියලායි. ඉතින් අපට දීගන්න දෙයක් නැහැ. පන්සලට ගිහිල්ලා අපිත් හැරිලා එන්න ඕනෑ. ඇයි අපට මොකුත් දීගන්න විධියක් නැහැ නේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවාත් ඇති බුද්ධශාසන අමාත්‍යාංශයෙන් රුපියල් 15,000යි පන්සලකට දෙන්නේ. ඊළඟට තව රුපියල් 25,000ක් බුද්ධ ශාසන අමාත්‍යාංශය විධියට සමහර ප්‍රදේශවලට දීලා තිබෙන බව අප දන්නවා. හැබැයි, අද විමධ්‍යගත අරමුදලක් අරගෙන මන්ත්‍රීවරයකුට අඩුම තරමින් ආසනයක පන්සලකටවත් රුපියල් 25,000ක් දීගන්න බැරි තැනකට අද පත් වෙලා තිබෙනවා. මම විශේෂයෙන් මේවා කියන්නේ අපේ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් මේ ගරු සභාවේ දැන් ඉන්න නිසායි. මම මේක බැසිල් රාජපක්ෂ ඇමතිතුමාටත් කිව්වා. Consultative Committee එකේදීත් කිව්වා, කරුණාකරලා මේක කරන්න එපා කියලා.

එතුමන්ලාගේ තර්කය තමයි පුටු ඕනෑවට වැඩිය තිබෙනවාය කියන එක. ඔව්. මරණාධාර සමිතියක ඉන්නේ සාමාජිකයන් 50ක් වෙන්න පුළුවන්. හැබැයි සාමාජිකයන්ගෙන් එක්කෙනෙක් මැරුණාම ඒ මළ ගෙදරට 500ක 1000ක විතර පිරිසක් එනවා. ඉතින් මරණාධාර සමිතියේ සාමාජිකයන්ට වැඩිය සමිතියේ පුටු තිබීම හොඳ නැහැ කියලා කවුරු හරි තීරණය කරනවා නම්, එතැනම ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. දැන් ඒක තමයි නිර්ණායකය විධියට දමලා තිබෙන්නේ. ඇහුවාම කියනවා, මරණාධාර සමිතියේ සාමාජිකයන්ට වැඩිය ඒ සමිතියේ පුටු තිබෙනවා ලු. ඉතින් මම කිව්වා, "ඒක හරි නේ" කියලා. පුටු වැඩියෙන් තියෙන්න එපා යැ. මරණාධාර සමිතියේ සාමාජිකයෝ ටික විතරද මළ ගෙදරට ඇවිල්ලා ඉඳ ගෙන ඉන්න ඕනෑ?

මරණයක් වුණාම 500ක් 600ක් ඇවිල්ලා ඒ මළ ගෙදර ඉඳ ගන්න එපාද? මම හිතන හැටියට මේවා අපි මේ පාර්ලිමේන්තුවේ කථා කළ යුතු කාරණා නොවෙයි. මෙය පාර්ලිමේන්තුවේ වෙලාව පාවිච්චි කළ යුතු කාරණයක් නොවෙයි. මේවා ඉතාම සුළු, සරල සිද්ධීන්. මේක අවබෝධ කර ගන්නේ නැතුව කොහොමද? මම දන්නේ නැහැ මේවා නිලධාරීන්ගේ කථාද, වෙන වෙන කථාද කියලා. යම් යම් අකටයුතුකම් සිද්ධ වෙනවා නම් ඒවා ගැන සොයා බලලා අවශ්‍ය කටයුතු ටික අපි කරමු. නමුත් මම විශේෂයෙන් ඉල්ලන එක කාරණයක් තමයි, මේ ලිහිල් කිරීම කරන්න කියන එක. අනෙක් එක රුපියල් ලක්ෂ 50කින් අපට ආසන 14ක වැඩ කරන්න බැහැ. අපි කියන්නේ නැහැ විශ්වකර්ම වැඩ කරන්න කියලා.

දැන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට -ඇමතිවරුන් නොවුණත්- සමහර වෙලාවට රුපියල් ලක්ෂ තුන්, හාරසියය ආණ්ඩුවෙන් ලැබෙනවා. මම අපෙන් එහා පැත්තට ගිහින් දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත ඔසවපු මන්ත්‍රීවරුන්ගෙන් ඇහුවා, "කීයක් විතර ලැබෙනවාද?" කියලා. ඒ අයත් කිව්වා, "රුපියල් ලක්ෂ තුන්, හාරසියයක් විතර ලැබෙනවා. අපිත් ඒවායින් මොනව මොනවා හෝ කරනවා" කියලා. එතකොට මම ඇහුවා, "අපිටත් එහාට එන්න කියලාද කියන්නේ" කියලා. අපිට මොකවත් දෙන්නේ නැහැ. අපට රුපියල් ලක්ෂ 50ක් දුන්නා. ඒ රුපියල් ලක්ෂ 50ත් දැන් ලැබෙන්නේ නැහැ. දැන් අගෝස්තු මාසයත් එනවා. ජුනි මාසයත් ඉවරයි. නමුත් තවම සල්ලි ඇවිල්ලා නැහැ. අද මට ඇමතිවරු කිහිප දෙනෙක්ම කිව්වා, "අපේ සල්ලිත් ඇවිල්ලා නැහැ මන්ත්‍රීතුමා" කියලා. එතකොට මොකක්ද ඒකෙන් අදහස් වෙන්නේ? දැන් මේ අවුරුද්ද අවසාන වන වෙලාවේ සල්ලි ටික ලැබුණාම මොකද වෙන්නේ? අපි වැඩක් සැලසුම්ගත කරලා තිබුණොත් ඒ ඇස්තමේන්තුවලට අවශ්‍ය කරන මුදල් ටික ලැබුණාම සමහර වෙලාවට ඒවා හදා ගන්න, හොයා ගන්න බැරිව යනවා. ඒ සල්ලි ටික අපිට පාවිච්චි කරන්න බැහැ. සල්ලි ටික ආපසු යනවා. නැත්නම් අපි විවිධ මිලදී ගැනීම් කරන්න ඕනෑ. විවිධ මිලදී ගැනීම් කරන කොට මොකද වෙන්නේ? අපේ ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා දන්නවා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අයත් කැමැතියි අවසාන වශයෙන් කරන මිලදී ගැනීම්වලට කියලා. ඇයි? ඒ ගොල්ලන්ට පහසුවෙන් වැඩේ කර ගන්න පුළුවන්. "දම්රෝ" පුටු කියලා පුටු මිලදී ගත්තාම "දම්රෝ" කියලා නම ගහලා තිබෙන වෙනත් ආයතනයක පුටු තමයි "දම්රෝ" පුටු කියලා දීලා තිබෙන්නේ. මම මේ පසු ගිය අවුරුද්දේ සිදු වූ වංචාවක් ගැන අවංකවමයි කියන්නේ. "දම්රෝ" කියලා ආයතනයකින් පුටු දෙනවා කියලා කිව්වා. නමුත් දෙන්නේ වෙන ස්ථානයකින්. මම ගිහිල්ලා බැලුවාම ඒවා "දම්රෝ" නොවෙයි. "දම්රෝ" පුටු එතැන නැහැ. ඒ කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වෙලාවේ මිලදී ගැනීම්වලට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අයත් කැමැතියි. මොකද, ඒවා ඇතුළේ යම් යම් ගනුදෙනු, හුවමාරුවීම් සිද්ධ වෙනවා. අපට යෝජනාව එවන්න කියනවා දෙසැම්බර් මාසයේදී. අපි දෙසැම්බර් මාසයේ යෝජනා යවනවා. හැබැයි ජනවාරි පටන් ගන්නෙත් නැහැ, පෙබරවාරිත් නැහැ, මාර්තුත් නැහැ, අප්‍රේලුත් නැහැ. මැයිත් නැහැ. දැන් හෙට අනිද්දා වන කොට ජුනි මාසයත් ඉවර වෙනවා. එතකොට ඒකත් නැහැ. ඉතින් ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලනවා කරුණාකරලා මේ ලැබෙන්න තිබෙන සල්ලි ටික මේ අවුරුද්දේවත් දෙන්න කියලා.

දෙවැනි එක තමයි අපේ ජෝන් අමරතුංග මැතිතුමා කළ යෝජනාව; මේක රුපියල් ලක්ෂ 100ක් දක්වා වර්ධනය කරන්න කියපු කාරණය. ඇත්තටම අපි ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ 2004 වර්ෂයේ ලැබුණාට පස්සේ අපිට එක අවුරුද්දක් දුන්නා පාරවල් සඳහා රුපියල් ලක්ෂ 50ක්. ඇත්තටම ආණ්ඩුවෙන් අරගෙන කරන එකටත් වැඩිය මේකේ වැදගත්කම තිබෙන්නේ ඇමතිවරයෙකුට වුණත්, නියෝජ්‍ය ඇමතිවරයෙකුට වුණත්, මන්ත්‍රීවරයෙකුට වුණත් පෞද්ගලිකව රුපියල් ලක්ෂ 100ක් විතර ලැබෙනවා නම් තමන්ට රිසි සේ ව්‍යාපෘතිවලට යොදවන්න පුළුවන් වීමයි. ඒකේ ලොකු වටිනාකමක් තිබෙනවා. ඔබතුමන්ලාටත් "දිවි නැගුම" ව්‍යාපෘතියෙන් පොඩ්ඩක් ලැබෙනවා. "මහ නැගුම" ව්‍යාපෘතියෙන් පොඩි කෑල්ලක් ලැබෙනවා. ඉතින් ඔය ටික තමයි ලැබෙන්නේ. මම කියන්නේ හරියට ලක්ෂ 100ක් අපේ අතට ලැබෙනවා නම් අපට පුළුවන් ස්ථාවර වැඩකට අත ගහන්න. රුපියල් ලක්ෂ 50ක් අරගෙන අපි මොනවාද කරන්නේ කියලා කියන්න? අපි සංවර්ධන වැඩ සටහන් මොනවාද කරන්නේ? අපිට ආසනයකට දෙන්න පුළුවන් ප්‍රමාණය කල්පනා කරන්න? දැන් මගේ දිස්ත්‍රික්කයේ පුදුම අපහසුතාවක් අපට තිබෙන්නේ. ආසන 14කට අපි දෙන්න ඕනෑ. සමහර ආසනයකට රුපියල් ලක්ෂයක්වත් දී ගන්න බැහැ. නමුත් අපි ඒ ආසනවලින් ඡන්ද ගත්තාම ඒ මිනිස්සු අපෙන් ඇවිල්ලා එක එක දේවල් ඉල්ලනවා. ඉතින් අපිට කරන්න විධියක් නැහැ. ඒ කියන්නේ විවිධ ව්‍යාපෘතිවලින් ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට විවිධ වැඩ කටයුතු තමන්ගේ දිස්ත්‍රික්කයේ ආසනවල කරන්න පුළුවන්. ඒක වෙනම කථාවක්. මම කියන්නේ මේකට විපක්ෂයද, ආණ්ඩු පක්ෂයද කියලා කල්පනා කරන්නේ නැතුව මන්ත්‍රීවරයෙකුට තිබෙන ගෞරවයෙන් ඔහුට ලක්ෂ 100ක විතර ප්‍රමාණයක් ලැබුණොත් ඔහුට පුළුවන් ඔහුගේ යෝජනා, අදහස් ක්‍රියාත්මක කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයකට අපි ජල ව්‍යාපෘතියක් ගත්තොත් ජල ව්‍යාපෘතියක් අපිට ක්‍රියාත්මක කරන්න බැහැ. ඇයි? ඒකට අපට එකපාර මුදල් යොදවන්න බැහැ. අපිට රුපියල් ලක්ෂ 100ක් තිබුණොත් රුපියල් ලක්ෂ 5ක්, 10ක් එකපාර යොදවන්න පුළුවන්. දැන් බලන්න අද අපෙන් ඉල්ලන්නේ මොනවාද? අද අපෙන් ඉල්ලන්නේ විදුලි කණු. විදුලි කණුවක් රුපියල් 45,000යි, 50,000යි. කලින් රුපියල් 36,000ට තිබුණු ඒක දැන් වැඩි වෙලා රුපියල් 45,000ක්, 50,000ක් විතර වෙනවා. අපේ ගම්වල ඉන්න මිනිස්සු පෞද්ගලිකව ගන්න කැමැතිත් නැහැ. තමන්ගේ ගෙය පෙනි පෙනී විදුලි කණුව තිබෙනවා, විදුලි කණුව ගන්නේ නැහැ. සල්ලි නැහැ කියලා නිකම් ඉන්නවා. එක්කෝ මොකක් හෝ ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. ඉස්සර ක්‍රමවේදයක් හදලා තිබුණා, රුපියල් 1000 ගණනේ යම් කිසි විධියකට ගෙවන්න ගන්න පුළුවන් ක්‍රමයක්. අපිට සල්ලි ටිකක් දමන්න පුළුවන් විධියට දාහේ ක්‍රමය කියලා එකක් හදලා තිබුණා. මම හිතන්නේ සාලින්ද දිසානායක ඇමතිතුමාට මතක ඇති. මට හොඳට මතකයි 1994 දී රුපියල් දාහේ ක්‍රමය තිබුණා. ගරු එස්.බී. දිසානායක මැතිතුමාටත් මතක ඇති. මම හිතන්නේ ඒ කාලයේ විදුලිය ගන්න රුපියල් දාහේ ක්‍රමයක් තිබුණා. ඒ වාගේ අලුත් ක්‍රම හදලා තිබුණොත් හොඳ බවයි මා කියන්නේ.

විදුලි කණුවලටමයි අපි ගොඩක් වියදම් කරන්නේ. ඇත්තටම විශාල වියදමක්. අපි රුපියල් ලක්ෂ දෙක තුනක් වියදම් කරනවා විදුලි කණු හතරකට. සමහර විට ගෙවල් තිබෙන්නේ හතරයි. එය ගමක වෙනත් වැඩක් කරන්න පුළුවන් මුදලක්. රුපියල් ලක්ෂ දෙකතුනක් දැම්මොත් සමහර වෙලාවට අඩුම තරමේ වතුර බට ටිකක් ඇදලා මුළු ගමටම වතුර දෙන්න පුළුවන්. අපට මේ ලැබෙන ප්‍රමාණය මදි. ඒකයි මා විශේෂයෙන්ම මෙතැනදී සඳහන් කළේ. ඉතාම වටිනාකමකින් යුක්ත කාරණයක් ගැනයි අප මේ කථා කරන්නේ. එක්කෝ ලංකා විදුලිබල මණ්ඩලය අපට යම්කිසි විධියේ සාධාරණ වැඩ පිළිවෙළක්, විදුලි කණු දෙකක් තුනක් අවශ්‍ය තැන්වලට අඩු මුදලකට ඒවා ලබා දීමේ කුමක් හෝ හොඳ වැඩ පිළිවෙළක් හදලා දෙන්න ඕනෑ. අපෙන් තමයි වැඩියෙන්ම මුදල් ගන්නේ. රුපියල් 48,000ක් 50,000ක් විතර ගන්නවා විදුලි කණුවකට. සාමාන්‍ය පුද්ගලයන්ගෙන් ගන්නේ රුපියල් 10,000යි. දැන් ඒක රුපියල් 12,000ක්, 13,000ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ කාරණාත් එක්ක බලන කොට අපේ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවේ බොහෝ වටිනාකමක් තිබෙනවා.

[ගරු ජෝන් අමරතුංග මහතා]

විමධ්‍යගත අරමුදල්වලින් අප කරන්න හදන වැඩ කටයුතු ටික ඇත්ත වශයෙන්ම ප්‍රයෝජනවත් වැඩද? ඒකයි මා කලින් කිව්වේ. අපි රුපියල් ලක්ෂ දෙකක් දෙනවාය කියලා හිතමු විදුලි කණු ගන්න. විදුලි කණු තුනකට දුන්නාම ඒ ගණන ඉවරයි. හැබැයි ඒ රුපියල් ලක්ෂ දෙක පාවිච්චි කරලා වෙනත් ගොඩක් දේවල් කරන්න පුළුවන්. ඒ නිසා මා විශේෂයෙන්ම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. එක පැත්තකින්, මේ විදුලිබල ප්‍රශ්නය සම්බන්ධව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය මැදිහත් වෙලා විදුලි කණුව දෙකතුන අවශ්‍ය වෙලා තිබෙන තැන්වලට විදුලිය ලබා දීමේ වැඩ පිළිවෙළක් ඇති කරලා ඒ කටයුතු අවසන් කරන්න ඕනෑ. එහෙම නැත්නම් විදුලිය ලබා දීම සම්බන්ධව අපට යන ගණන් ටික බේරා ගන්න යම්කිසි අඩු මුදලක් නියම කරන්න ඕනෑ. ඒ වාගේම යම්කිසි විධියකට වැඩි මුදලක් මන්ත්‍රීවරයකුට දෙන්න ඕනෑ. ඒකයි මා කිව්වේ මෙය පෞද්ගලිකව මන්ත්‍රීවරයකුට ලැබෙන විමධ්‍යගත අරමුදලක්ය කියා. එක ඇමතිවරයකුට, නියෝජ්‍ය ඇමතිවරයකුට ආණ්ඩුවේ විවිධ ව්‍යාපෘතිවලින් තමන්ගේ ආසනයට, දිස්ත්‍රික්කයට විවිධ වැඩ කරන්න පුළුවන්. නමුත් ආණ්ඩුවේද විපක්ෂයේද කියලා නැතිව මන්ත්‍රීවරුන් විධියට තමන්ට පෞද්ගලිකව මුදල් ලැබෙනවා නම් ඔවුන්ට පුළුවන් ඔවුන්ගේ ප්‍රදේශවල යම්කිසි ස්ථාවර වැඩ පිළිවෙළ පටන් ගන්න. මේ අවුරුද්දේ රුපියල් ලක්ෂ හතරක් දමනවා; ලබන අවුරුද්දේ රුපියල් ලක්ෂ පහක් දමනවා. එහෙම දැම්මාම ව්‍යාපෘතිය අවුරුදු එකහමාරෙන් දෙකෙන් ඉවරයි. එතකොට තමන්ටම කියන්න පුළුවන්, "මේක මගේ විමධ්‍යගත අරමුදල්වලින් හදපු ගොඩනැඟිල්ලක්, නැත්නම් විදුලි ව්‍යාපෘතියක්, නැත්නම් ජල ව්‍යාපෘතියක්" කියලා. අපට ඒ විධියට කටයුතු කරන්න පුළුවන්. දැන් අපට කියනවා පාරවල් හදන්න සල්ලි දමන්න කියලා. අප කොහොමද පාරවල් හදන්න සල්ලි දමන්නේ? සල්ලි දමන්න කිව්වාට සල්ලි නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයකු විධියට ඔබතුමාටත් ලංකාව පුරාම විවිධ කටයුතුවලට මුදල් බෙදලා දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. අහන්න කෝ රුපියල් ලක්ෂ 50න් බෙදලා දෙන්න පුළුවන් කොහේටද කියලා. ඉතින් ඔබතුමාත් අසරණ වෙනවා. අපේ ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමාත් මෙතැන ඉන්නවා. ඒ වාගේම අපේ නියෝජ්‍ය මුදල් ඇමති ගීතාංජන ගුණවර්ධන මැතිතුමාත් මෙතැන ඉන්නවා. ඔබතුමන්ලා දෙදෙනාටම මේ කාරණය අදාළයි. විශේෂයෙන්ම ඔබතුමන්ලා දෙදෙනාගෙන්ම මම බොහොම ගෞරවයෙන් ඉල්ලනවා, කරුණාකර අපට ස්ථිරසාර වචනයක් දෙන්න කියලා. ඊළඟ Consultative Committee එකට ගිහිල්ලා ජනාධිපතිතුමාගෙන් ඉල්ලන්නම් කියලා ඉන්න එපා. යම්කිසි ස්ථාවර විධියේ විසඳුමක් අපට ලබා දෙන්න කියලා ගෞරවයෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ස්තුතියි! මීළඟට ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කාලය මිනිත්තු 20යි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් කථා කරන මේ වෙලාවේ මම විශේෂයෙන්ම එතුමාට ස්තුතිවන්ත වෙනවා ආර්ථිකය දියුණු වීම සම්බන්ධව කථා කිරීම පිළිබඳවත්, ඒ වාගේම "දිවි නැඟුම" වැඩ සටහන, "ගම නැඟුම" වැඩසටහන, "මඟ නැඟුම" වැඩසටහන, ප්‍රාදේශීය සංවර්ධනය වැනි අපේ රජයේ වැඩ සටහන් කීපයක් මතක් කර දීම පිළිබඳවත්. රජය ඒ වැඩ කටයුතු කර ගෙන යන බව එතුමා කිව්වා. විශේෂයෙන්ම මන්ත්‍රීවරුන්ට දෙන මුදල් ප්‍රමාණය මොන හේතුවක් නිසාවත් අඩු කිරීමේ හෝ මන්ත්‍රීවරයකුට මුදල් නොදීමේ හෝ පරමාර්ථයක් අපේ රජයට නැහැ. ඒක පළමුවෙන්ම සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ අලුත් වැඩ පිළිවෙළ යටතේ පසු ගිය අවුරුදු කීපය තුළ ශ්‍රී ලංකාවේ සිදු වූ සංවර්ධනය පිළිබඳ සමීක්ෂණයක් අපේ අමාත්‍යාංශය විසින් කරනු ලැබුවා. ඒ වාගේම තොරතුරු ඒකරාශී කර ගත්තා, මෙතෙක් මුදල් වියදම් වූ ආකාරය සහ පසු ගිය වකවානුව ඇතුළත මුදල් වියදම් කිරීම නිසා ඇති වූ ප්‍රගතිය පිළිබඳව. පාර්ලිමේන්තුවට වග කියන්න ඕනෑ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා. අප වියදම් කරන මුදල් සම්බන්ධයෙන්මේ පාර්ලිමේන්තුවේදී ඇසීමේ වග කීමක් ඔබතුමන්ලාට තිබෙනවා. අප මුදල් ප්‍රමාණයක් වියදම් කළාම ඔබතුමන්ලාට ප්‍රශ්න කරන්න පුළුවන් ඒ මුදල් මොන ආකාරයටද වැය කරලා තිබෙන්නේ කියලා. අපි ප්‍රතිපත්තිමය තීන්දුවක් අර ගෙන තිබෙනවා, මේ රටේ මුදල් වැය කිරීමේදී පොදු මහ ජනතාවගේ මූලික අවශ්‍යතා මොනවාද කියලා ප්‍රමුඛතාව තීන්දු කිරීමේ ක්‍රමවේදයක් ඒ ජනතාවට සහ මහ ජන නියෝජිතයන්ට ලබා දීම සඳහා. ඒ අනුව සියලුම මන්ත්‍රීවරුන්ගෙන් යෝජනා ගන්නවා. ඒක ප්‍රාදේශීය සභාවේ වන්නට පුළුවන්; පාර්ලිමේන්තුවේ වන්නට පුළුවන්; පළාත් සභාවේ වන්නට පුළුවන්. ඒ වාගේම අපි ඊට පහළ මට්ටමක් පිහිටුවා තිබෙනවා. ඒ, මේ රටේ "ජන සභා" කියලා එකක් පිහිටුවා තිබෙනවා, ගම් මට්ටමෙන්. එතකොට මේ "ජන සභා" යෝජනාත් තිබෙනවා. ඒ වාගේම "ප්‍රාදේශීය සංවර්ධන කමිටුවක්" කියලා එකක් ස්ථාපිත කරලා තිබෙනවා. අපි උදාහරණයක් හැටියට හිතුවොත්, පඩුවස්නුවර ආසනය නියෝජනය කරමින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු හැටියට සිටින දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට කුරුණෑගල දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය සංවර්ධන කමිටුවකම සාමාජිකයකු හැටියට ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට සහභාගි වන්නට පුළුවන්. ඒ වාගේම ඒ සඳහා ලිපියකුත් එතුමාට යවනවා. හැම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවටත්, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපති කෙනෙක් සිටිනවා. මන්ත්‍රීවරුන් සිටිනවා. ඒ සියලු දෙනාම නියෝජනය වන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවක් ස්ථාපිත කර තිබෙනවා. ඒක ශක්තිමත් කර තිබෙනවා.

මේ මුදල් වියදම් කිරීමේ දී අපට අවශ්‍ය වන්නේ මොකක්ද? ඔබතුමා මෙතැන සිටින්නේත්, මම මෙතැන සිටින්නේත්, - ආණ්ඩුවේ වුණත්, විරුද්ධ පක්ෂයේ වුණත් අපි ඡන්දය අරගෙන ඇවිල්ලා තිබෙන්නේ- ජනතාවගේ මූලික අවශ්‍යතාවන් ඉෂ්ට කරන්නයි. මෙතෙක් අපට වුවමනා දේවල්වලට විමධ්‍යගත මුදල් ලබා දුන්නේ. දැන් මෙතුමාගේ අදහසක් ඇතිව කියවුණා, මරණ ගෙදරකට එතුමාට පුටුවක් දෙන්න බැහැ; tent එකක් දෙන්න බැහැ කියලා. එතකොට මරණයක් සිදු වුණු වෙලාවකට මරණාධාර සමිතියෙන් කියලා ඒ ගෙදරට tent එකක් දෙන්න බැහැ කියලා කිව්වා. මේකමද මහජන නියෝජිතයකුගේ කාර්ය භාරය? මහජන නියෝජිතයකු වියදම් කරන හැම මුදලක්ම මේ රටේ මුදල්. ඒ මුදල් අපි අවශ්‍ය අවශ්‍ය තැන්වලට, අවශ්‍ය අවශ්‍ය විධියට අපේ හිතුමතේට බෙදා හැරීම හෝ දීමද කළ යුත්තේ? ප්‍රමුඛ අවශ්‍යතාවන් පෙළ ගැස්වෙන ආකාරයට මේ සංවර්ධන යෝජනා ක්‍රම සහ ගම්වල මූලික අවශ්‍යතාවන් මොනවාද කියලා තීන්දු කරන්න ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට අපි බලය දීලා තිබෙනවා. පහළම නියෝජිතයාගේ ඉඳලා, ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීගේ, ජන සභාවේ අදහස්, මේ සියල්ලම අරගෙන ප්‍රාදේශීය

සම්බන්ධීකරණ කමිටුවෙන් ප්‍රමුඛතාව අනුව ලේඛනයක් හදන්නවා. ඒ ලේඛනයට මේ සියලුම මන්ත්‍රීවරුන්ගේ මුදල් යනවා. අපි දැන් මුදල් වෙන් කරනවා. උදාහරණයක් හැටියට ගත්තොත් දිස්ත්‍රික්කයකට අවම වශයෙන් රුපියල් මිලියන 3,000ක මුදලක් පසු ගිය අවුරුද්දේ අපි වෙන් කරලා තිබෙනවා. මේ රුපියල් ලක්ෂ 100ක්, ලක්ෂ 50ක් නොවෙයි. අඩුම වශයෙන් රුපියල් මිලියන 3,000ක් වෙන්න හැම සම්බන්ධීකරණ කමිටුවක් මඟින් සෑම දිස්ත්‍රික්කයකටම අපි වෙන් කරලා තිබෙනවා.

ඊට අමතරව මේ රටේ ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළවල් රාශියක් තිබෙනවා. උතුර ගත්තොත්, "උතුරු වසන්තය", "නැඟෙනහිර නවෝදය", "වයඹ පුබුදුව", මේ විධියට හැම project එකක්ම ආවොත්, ඒ හැම ව්‍යාපෘතියක් - project - එකක් ගැනම සාකච්ඡා කරන්නට පුළුවන්, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට. මෙතැන වැරැද්ද වෙලා තිබෙන්නේ ඒක නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමහර විපක්ෂයේ මන්ත්‍රීවරුන් ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීමට යන්නේ නැහැ. ආරාධනා කරනවා, යන්නේ නැහැ. එතකොට තමන්ගේ යෝජනා ඉදිරිපත් කරන්න ඕනෑ. අපි පැහැදිලිව කියා තිබෙනවා, "ඔබතුමන්ලා දෙන යෝජනාවලින් ප්‍රමුඛත්වය අනුව ජනතාවට ගැළපෙන ඉහළම යෝජනාව ක්‍රියාත්මක කිරීමේ බලය මේ ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට තිබෙනවා" කියලා. එතුමා කියපු එක සම්පූර්ණයෙන් ඇත්ත. අපි කියලා තිබෙනවා, "මේ අනවශ්‍ය දේවල්වලට මුදල් දෙන්න එපා" කියලා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ලංකාවේ ජනගහනයට වැඩියෙන් පුටු බෙදලා තිබෙනවා.

ලංකාවේ ගොවීන්ට වැඩියෙන් උදැලු බෙදලා තිබෙනවා. මුදල් පරිපාලනයක් නැතිව සමහර අවස්ථාවලදී එක පන්සලක ඩෙස්ක් බංකුවලට රුපියල් 7,500යි, 12,000යි, 15,000යි දීලා තිබෙනවා. මන්ත්‍රීවරුන් දහ දෙනෙක් සිටියා නම්, දහ දෙනාම දීලා තිබෙනවා. එහෙම නොවෙයි විය යුත්තේ. අපි එතැනදීත් කියලා තිබෙනවා, මේ දිස්ත්‍රික්කයේ අඩුම ආදායම් ලබන පන්සල් මොනවාද, දහම් පාසල්වලට අවශ්‍ය බඩු නොලැබෙන පන්සල් මොනවාද කියලා ලැයිස්තුවක් ගන්න කියලා. දිස්ත්‍රික්කයට ලේඛාධිකාරිවරයෙක් ඉන්නවා. ස්වාමීන් වහන්සේලා විසින් පත් කර ගත් දිස්ත්‍රික් ලේඛාධිකාරිවරයෙක් ඉන්නවා. ඒ ස්වාමීන් වහන්සේ ඇතුළු දිස්ත්‍රික් ලේඛාධිකාරි ස්වාමීන් වහන්සේලාගෙන් ලැයිස්තුවක් ගන්නට ඕනෑ, මෙන්න මේ දහම් පාසල්වලට මෙන්න මේ පන්සල්වලට මුදල් වෙන් කිරීමේ දී ප්‍රමුඛතාව දෙන්න. අපට බැරි ඒවා කොටසක් අපේ බුද්ධ ශාසන අමාත්‍යාංශයට දෙනවා. ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට මේ මුදල් වෙන් කරන්න එපාය කියලා නැහැ. ඒවා වෙන් කරන්න ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට බලය තිබෙනවා. අද ඉතාමත්ම ශක්තිමත් කරලා තිබෙනවා, ප්‍රාදේශීය සංවර්ධන කමිටු. මෙහි සභාපතිවරයා සිටියාට ඒකේ පළාත් සභා මන්ත්‍රීවරයාට ඉන්න පුළුවන්; පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට ඉන්න පුළුවන්; ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාට ඉන්න පුළුවන්.

ඊ ළඟට අපි කියා තිබෙනවා, වාරි මාර්ග සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙන් දෙන මුදල් අපි පෙළ ගස්සනවා, සුළු වාරි මාර්ග යෝජනාවලට පමණයි කියලා. මොනම හේතුවකටවත් අනුමැතිය නැතුව අපේ අමාත්‍යාංශයෙන් අපි මුදල් යවන්නේ නැහැ, මේ මේ කටයුතුවලට යවන්න කියලා. මේ රටේ පසු ගිය දශක කිහිපය ඇතුළත සංවර්ධනයට යවපු මුදල් නිසියාකාරව පරිහරණය වුණා නම්, මේ සංවර්ධනය මීට වඩා වේගවත්ව යනවා. එම නිසා අද මේ අමාත්‍යාංශයේ කාර්ය භාරය වෙලා තිබෙනවා, මේක හරියාකාරව නිර්ණය කරන එක.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ මුදල් පරිහරණය කිරීමේදී මුදල් වැය කරන්න එක්තරා සීමාවක් දීලා තිබෙනවා, දහම් පාසලට දෙනවා නම් මෙන්න මේ ප්‍රමාණයට වඩා දෙන්න බැහැ; අනික් අවශ්‍යතාවන්වලට දෙනවා නම් අනවශ්‍ය දේවල්වලට මේ ප්‍රමාණයට වඩා දෙන්න බැහැයි කියලා. ඉස්සර ලැයිස්තු අරගෙන බැලුවොත්, මන්ත්‍රීවරයෙක් පන්සලට loudspeaker එකක් දෙනවා; මෙතැනට පුටු 100ක් දෙනවා; මෙතැනට දැකැති 1,000ක් දෙනවා. මේ විධියට විශාල ප්‍රමාණයක් බෙදා තිබෙනවා. මේවායින් ප්‍රයෝජනයක් වුණාද කියන එකයි ප්‍රශ්නය. එම නිසා මේ මන්ත්‍රීවරයකුට රුපියල් ලක්ෂ 100ක් නොවෙයි, අපි හරියට බැලුවොත් එක ආසනයක ප්‍රාදේශීය සංවර්ධන කමිටු 3ක් තිබෙනවා නම්, එම ආසනය නියෝජනය කරන්නේ මන්ත්‍රීවරුන් දෙදෙනෙක් වුණත් ඊට වඩා වැඩි මුදලක් වුණත් වෙන් කෙරෙනවා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කය කුරුණෑගල වුණත්, ඔබතුමාගේ මූලික ආසනය පඩුවස්නුවර ආසනයයි. ඒ ආසනයේ මන්ත්‍රීවරයා හැටියට ඉන්නේ ඔබතුමා නම්, ඔබතුමා ගණන් හදා බලන්න, ඒ කොට්ඨාසයට රුපියල් ලක්ෂ කීයක් ගිහින් තිබෙනවාද කියලා. මේක දයාසිරි ජයසේකරගේ නමට ගිහිපු එක නොවෙයි ප්‍රශ්නය. මේක වෙන මන්ත්‍රීවරයකුගේ නමට ගිහිපු එක නොවෙයි ප්‍රශ්නය. ඒ මන්ත්‍රීවරයාට වෙන් කරන මුදල ඔබතුමා කිව්වා, වාගේ ලයිට් කණු දෙකකට, තුනකට දුන්නා නම් ඔබතුමන්ලාට ඒක කරන්න බැහැ. එක ලයිට් කණුවක් රුපියල් 50,000ක් වනවා. අන්න ඒක නිසා අපි කියන්නේ විදුලි බල මණ්ඩලය කළ යුතු කාර්යය විදුලි බල මණ්ඩලයට කරන්න දෙන්න කියලායි. දැන් අපි ඒ ටික කර ගෙන යනවා.

අනික් පැත්තෙන්, මහජන මන්ත්‍රීවරුන්ගේ යෝජනා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ප්‍රතික්ෂේප කරන්න බැහැ. ඔබතුමන්ලා කරන්නේ ගම් මට්ටමේ ඉහළම යෝජනාවක් නම්, ඒ ඉහළම යෝජනාව ජන සභාවෙනුත් ඇවිත් තිබෙනවා නම්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී ඒක අනුමත විය යුතුයි. ඒක ඔබතුමන්ලා ගිහින් සටන් කරලා ගන්නවා. මේ නිර්ණායකයන් හදා තිබෙන්නේ රටේ ජනතාවගේ යහපතටයි. මේ මුදල් නිසියාකාරව පරිහරණය කරන්න ඕනෑ නිසා තමයි අපි මේ ක්‍රියාදාමය අරගෙන තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ඔබතුමාගෙන් අහන්නේ මේකයි. ඔබතුමා අපට කෙළින්ම කියන්න, මේ අවුරුද්දේ මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අරමුදල් නැද්ද කියලා. විමධ්‍යගත අරමුදල් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
විමධ්‍යගත අරමුදල් කියන්නේ, මේ සියලුම මුදල් යන්නේ එක තැනකටයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම නොවෙයි. අපි අහන්නේ, අපි යවපු යෝජනා ටිකට මොකද වුණේ කියලායි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
කරුණාකර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට දමන්න. දිස්ත්‍රික්කයේ 14ක් -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපට ඒක කියලා නැහැ. අපි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අපේ යෝජනා යවලා තිබෙනවා. මා ඔබතුමාගෙන් අහන්නේ -

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අපි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට උපදෙස් දෙන්නම්, ඔබතුමන්ලාගේ යෝජනා ප්‍රාදේශීය සම්න්ධීකරණ කමිටුවට යවන්න කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතකොට මොකුත් වෙන් කරන්න විධියක් නැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ප්‍රමුඛත්වය අනුව ජන සභාවෙන් අනුමත කරනවා නම්, ප්‍රාදේශීය වශයෙන් ඒවාට වෙන් කරන්න කියලා අපි කියන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා අහන්නේ, මේ අවුරුද්දේ මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අරමුදල් නැද්ද කියලායි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අරමුදල් ආදී සියලුම දේවල් සඳහා මේ මුදල් යන්නේ ප්‍රාදේශීය සංවර්ධන කමිටු ඔස්සේයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අරමුදල් නැද්ද කියලායි අහන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මන්ත්‍රීවරු ඉන්නවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වෙන දා ඔහොම කමිටුවලට -

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ලක්ෂ්මන් යාපාට රුපියල් ලක්ෂ 50ක්, ලක්ෂ 100ක් වෙන් කරන්නේ නැහැ. ලක්ෂ්මන් යාපාට නොවෙයි මුදල් වෙන් කරන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි ඔබතුමාගෙන් අහන්නේ එතකොට එහෙම එකක් නැද්ද කියලායි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ නමට මුදල් වෙන් කරන්නේ නැහැ. ඒක අපි ඉතාමත් පැහැදිලිව කියනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතකොට මේ අවුරුද්දේ විමධ්‍යගත අරමුදල් නැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
විමධ්‍යගත අරමුදල් තිබෙනවා. පටලවන්න එපා. අපේ විමධ්‍යගත අරමුදල් තිබෙනවා. ඔක්කොම යවන්නේ ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පසු ගිය කාලයේ අඩුම තරමේ අපව දැනුවත් කිරීමක් කරලා ඔබතුමා ඒ කටයුත්ත කළා නම් හොඳයි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මේක කලිනුත් කළා. දැනුවත් කරන්න දෙයක් නැහැ. ඔබතුමා මේ ගැන හොඳට දන්නවා. ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ 1989 ඉඳලා කොට්ඨාසවලට තමයි සල්ලි දුන්නේ. මේක කවුරුත් කළේ නැහැ. එතුමා ඒක කළා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ. ඒක නොවෙයි අපි අහන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා, අපි දන්නවා, -

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ මේ කටයුත්ත කළාය කියා ඔබතුමා පිළිගන්නවාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ මන්ත්‍රීවරු ඒක නැති කළා නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැති කළ එක නොවෙයි. එතුමා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට නේ මුදල් දුන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම දන්නවා. ඔබතුමා මට කියනවා ප්‍රාදේශීය සංවර්ධන සම්බන්ධීකරණ කමිටුවට යන්නය කියලා. ගියාට වැඩක් නැහැ. එතැනදී අපට මතයක් ඉදිරිපත් කරන්න තියා මොනවත් කියන්න හම්බ වෙන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔබතුමා එහෙම කියන කොට පාර්ලිමේන්තුවටත් ඇවිල්ලා වැඩක් නැහැ කියන්න පුළුවන් නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාත් විපක්ෂයේ හිටියානේ. ඔය කථාව හොඳට දන්නවානේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඔබතුමා හොඳට වැඩ කරන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පාර්ලිමේන්තුවේ අපට කථා කරන්න පුළුවන්. ඒක නොවෙයි මා කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා. ආණ්ඩු පක්ෂයේ නොවී ප්‍රාදේශීය සංවර්ධන සම්බන්ධීකරණ කමිටුවට ගියාට වැඩක් නැහැ. ඒ ඇයි? ආණ්ඩු පක්ෂයේ අයෙකුයි එතැන මූලසුන ගන්නේ. ඔහුට උවමනා දේවල් තමයි කරන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒක හරි. ආණ්ඩුව දීලා තිබෙන්නේ ඒකටනේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ගිහිල්ලාත් වැඩක් නැහැ. එතැන රණ්ඩු වෙලා, ගහගෙනයි එළියට එන්න වෙන්නේ. ඒකයි අපි කියන්නේ, මන්ත්‍රීවරයකුට යම් කිසි මුදලක් දෙන්න, එවිට අපි යම් කිසි සම්බන්ධීකරණයක් කරලා මේවා කරන්නම් කියලා. ගරු ඇමතිතුමා අපෙන් අහලාද මේවා කරලා තිබෙන්නේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ප්‍රශ්නය තිබෙන්නේ මන්ත්‍රීවරුන්ගේ නමට මුදල් වෙන් කරලා නැති එකයි. මන්ත්‍රීවරයාට වෙන් කරපු රුපියල් ලක්ෂ සියය නොවෙයි, ඊට වැඩිය යනවා ප්‍රාදේශීය සංවර්ධන සම්බන්ධීකරණ කමිටුවට.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ප්‍රශ්නය වෙලා තිබෙන්නේ අපි යවාපු යෝජනා ටිකට වෙච්ච දෙයක් හොයා ගන්න බැරි එකයි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔබතුමන්ලා යෝජනා ඉදිරිපත් කරන්න. ඔබතුමන්ලා දැනට අපට යෝජනා එවනවා නම් අපි ඒවා ඔක්කෝම යවන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
යවලායි තිබෙන්නේ. පසු ගිය දෙසැම්බර් මාසයේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔබතුමන්ලාගේ යෝජනා ක්‍රියාත්මක නොවෙනවා නම්, ඒකට ප්‍රමුඛත්වයක් ලැබෙන විධියට කටයුතු සකස් කර ගන්න ප්‍රාදේශීය සංවර්ධන සම්බන්ධීකරණ කමිටුවෙන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒකට ගිහිල්ලා ඒ වැඩේ කරන්න හම්බ වෙන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියන්නේ මන්ත්‍රීවරුන්ට මුදල් දෙන්නේ නැහැ කියලා මෙතැනදී මතයක් ඇති කරන්න නරකයි කියන එකයි. මන්ත්‍රීවරුන්ට නොවෙයි මේක දෙන්නේ. මන්ත්‍රීවරයා වියදම් කරන මුදල් ප්‍රාදේශීය සංවර්ධනයට ඵලදායි ලෙස වියදම් කිරීමේ ක්‍රමවේදයක් මේ සකස් කරලා තිබෙන්නේ. ඒ මුදල් ඵලදායී ලෙස වියදම් කරන්න සකස් කරලා තිබෙන්නේ ඇයි? පසු ගිය වකවානුව බැලුවාම එක දිස්ත්‍රික්කයට විමධ්‍යගත මුදල් කියලා මිලියන 3,000ට වැඩිය දීලා තිබෙනවා. ඒ මිලියන 3,000 තුළ ව්‍යාපෘති ඔක්කෝම අරගෙන පෙළ ගහලා බැලුවොත් තත්ත්වය මොකක්ද? පාරක් හදනවා නම් ඒකෙ කොටසකට පළාත් සභාවෙනුත් මුදල් දීලා තිබෙනවා. ඒ වාගේම ඒ පාරෙම කොටසක ප්‍රාදේශීය සභාවෙනුත් වැඩ කරනවා. මන්ත්‍රීවරයෙකුත් කීයක් හරි දීලා කොන්ක්‍රීට් දානවා මීටර් පණහක් විතර. එහෙම දාලා තව පාරක කොන්ක්‍රීට් දානවා. අන්තිමට බැලුවාම පළාත් සභාවත් ඒකට උඩින් කොන්ක්‍රීට් දාලා තිබෙනවා. මේවා මේ විධියට ගැටිලා තිබෙනවා පසු ගිය වකවානුව ඇතුළත. ඒ නිසා තමයි මේ ක්‍රමවේදය හදලා තිබෙන්නේ. ප්‍රාදේශීය සංවර්ධන සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ඇතිව, දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය ඇතිව, ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය ඇතිව මේ සියලු යෝජනා පෙළ ගැස්වීමේ වැඩ පිළිවෙළක් හැටියටයි අපි මේක ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. ඒ නිසා මේකෙන් ජනතාවට අසාධාරණයක් වන්නේ නැහැ. ජනතාවට අවශ්‍ය විධියට මේ මුදල් පරිහරණය කිරීමේ ක්‍රමවේදයකුයි අපි මේ සකස් කරලා තිබෙන්නේ. ඒ නිසා එදා මන්ත්‍රීවරයාගේ නමින් වෙන් කරපු ලක්ෂ පණහ නැහැ කියලා රටට මතයක් ගෙන යන්න බැහැ. ඊට වඩා විශාල මුදල් ප්‍රමාණයක් කොට්ඨාසවලට බෙදලා දීලා මේ ක්‍රියාදාමය ක්‍රියාත්මක කිරීම තමයි රජය කරලා තිබෙන්නේ. ඊට අමතරව දැන් මේ වන කොට රජයේ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරනවා. "දිවි නැගුම" වෙන්න පුළුවන්; වෙනත් වෙනත් ව්‍යාපෘති වෙන්න පුළුවන්. ඒ සියල්ලම මහ ජනතාවට යහපතක් වන ආකාරයට ප්‍රදේශයේ ක්‍රියාත්මක කරනවා. [බාධා කිරීමක්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ, ඒකාධිපති ක්‍රමයක් තමයි තිබෙන්නේ.[බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ, නැහැ. ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙනවා නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වුණාට වඩා හොඳයි ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් වුණා නම්.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, භාණ්ඩාගාරය විසින් අපිට පෙන්වා දීලා තිබෙනවා පසු ගිය වකවානුවේ මුදල් වැය කිරීමේදී සමහර තැන්වල බරපතළ ලෙස වෙච්ච විෂමතාවන් සහ විනාශයන්. ඒ නිසා මේ අමාත්‍යාංශයේ ඇමතිවරයා හැටියට කටයුතු කරන ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට මේක සම්බන්ධයෙන් වග කියන්න ඕනෑ, පාර්ලිමේන්තුවට. මේ ක්‍රියාදාමය අපි ක්‍රියාත්මක කරලා තිබෙන්නේ ඒවා නිවැරදි කරලා මේ කටයුතු ඉදිරියට ගෙන යන්නයි. අප ඒ සඳහා කටයුතු කරනවාය කියන එක ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ අතේ මොකක්දෝ ආලෝකයක් පත්තු වෙනවා.[බාධා කිරීමක්] ඒක off කිරීම හොඳයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.05 ට, 2011 ජූනි 22 වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 7.05 மணிக்கு பாராளுமன்றம், 2011 யூன் 22, புதன்கிழமை மு. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 7.05 p.m. until 1.00 p.m. on Wednesday, 22nd June, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.